326 වන කාණ්ඩය - 07 වන කලාපය
தொகுதி 326 - இல. 07
Volume 326 - No. 07

2026 මැයි 07වන බ්‍රහස්පතින්දා
2026 மே 07, வியாழக்கிழமை
Thursday, 07th May, 2026

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**

2026 මැයි 08වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන [තීරුව 1193]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 1195]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 1196-1240]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන මිලදී ගැනීමේ සහ සැපයීමේ ක්‍රියාවලිය [තීරුව 1241]

හමුදාව විසින් අත්පත් කරගත් උතුරු ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම් නිදහස් කිරීම [තීරුව 1250]

**වට්ටක්කච්චි කෘෂිකර්ම පාසල සහ ගොවිපළ නැවත ආරම්භ කිරීම:**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1253]

**දුප්පත්කම තුරන් කිරීමේ රජයේ වැඩ පිළිවෙළ:**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තීරුව 1256]

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

මාස් පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා] - පළමුවන වර කියවන ලදී [තීරුව 1272]

**ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත:**

නියෝග [තීරු 1274-1300]

**මෝටර් වාහන පනත:**

නියෝග [තීරුව 1301]

**ආගාමික හා විගාමික පනත:**

නියෝග [තීරුව 1301]

**මහජන ආරක්ෂක ආඥාපනත:**

යෝජනා සම්මතය [තීරු 1302– 1403]

**අත්‍යවශ්‍ය මහජන සේවා පනත:**

යෝජනා සම්මතය [තීරුව 1404]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**

2026 மே 08ஆம் நாளன்று விசேட பாதுகாப்பு ஒழுங்குகள் [ப: 1193]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 1195]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 1196-1240]

**தனி அறிவித்தல் மூல வினா:**

இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் எரிபொருள் கொள்முதல் மற்றும் விநியோகச் செயன்முறை [ப: 1241]

வடக்கில் இராணுவத்தால் கையகப்படுத்தப்பட்டிருக்கின்ற தனியார் காணிகளை விடுவித்தல் [ப: 1250]

**வட்டக்கச்சி விவசாயப் பாடசாலையையும் பண்ணையையும் மீள ஆரம்பித்தல்:**

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று [ப: 1253]

**வறுமையை ஒழிப்பதற்கான அரசாங்கத்தின் வேலைத்திட்டம்:**

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரினது கூற்று [ப: 1256]

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

மாஸ் மன்றம் (கூட்டிணைத்தல்) - [மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்] - முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1272]

**தேசிய போக்குவரத்து ஆணைக்குழுச் சட்டம்:**

ஒழுங்குவிதிகள் [ப: 1274-1300]

**மோட்டார் வாகனச் சட்டம்:**

ஒழுங்குவிதிகள் [ப: 1301]

**குடிவருவோர் மற்றும் குடியகல்வோர் சட்டம்:**

ஒழுங்குவிதிகள் [ப: 1301]

**பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்:**

தீர்மானம் [ப: 1302-1403]

**அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டம்:**

தீர்மானம் [ப: 1404]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:

Special Security Arrangements on 08th May, 2026 [Col. 1193]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1195]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1196-1240]

QUESTION BY PRIVATE NOTICE:

Fuel Purchase and Supply Process of Ceylon Petroleum Corporation [Col. 1241]

Release of Private Lands in the North Acquired by the Military [Col. 1250]

RECOMMENCEMENT OF VADDAKKACHCHI AGRICULTURE SCHOOL AND FARM:

Statement by Minister of Agriculture, Livestock, Land and Irrigation [Col. 1253]

GOVERNMENT INITIATIVE FOR POVERTY ALLEVIATION:

Statement by Minister of Rural Development, Social Security and Community Empowerment [Col. 1256]

PRIVATE MEMBERS' BILLS:

Mass Foundation (Incorporation) - [The Hon. M.A.M. Thahir] - Read the First time [Col. 1272]

NATIONAL TRANSPORT COMMISSION ACT:

Regulations [Cols. 1274-1300]

MOTOR TRAFFIC ACT:

Regulations [Col. 1301]

IMMIGRANTS AND EMIGRANTS ACT:

Regulations [Col. 1301]

PUBLIC SECURITY ORDINANCE:

Resolution [Col. 1302– 1403]

ESSENTIAL PUBLIC SERVICES ACT:

Resolution [Col. 1404]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2026 මැයි 07වන බ්‍රහස්පතින්දා***
*2026 மே 07, வியாழக்கிழமை*
*Thursday, 07th May, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### 2026 මැයි 08වන දින විශේෂ ආරක්ෂක විධිවිධාන
### 2026 மே 08ஆம் நாளன்று விசேட பாதுகாப்பு ஒழுங்குகள்
### SPECIAL SECURITY ARRANGEMENTS ON 08TH MAY, 2026

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 මැයි 08වන සිකුරාදා වියට්නාම් සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති සහ කොමියුනිස්ට් පක්ෂයේ නායක ටෝ ලාම් මහතා විසින් පාර්ලිමේන්තුව ඇමතීමේ උත්සවයට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දන්වනු කැමැත්තෙමි.

2026 මැයි 07 බ්‍රහස්පතින්දා

- මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලම මෙදින ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

2026 මැයි 08 සිකුරාදා

අ) පාර්ලිමේන්තු ගොඩනැඟිල්ලේ හඳුනාගත් අධි ආරක්ෂිත/ විශේෂිත වූ ප්‍රදේශ, මෙදින ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

ආ) මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ලැබේ. අමුත්තන් සඳහා වන ආරාධනා පත්‍ර පාර්ලිමේන්තුව වෙතින් නිකුත් කරනු ඇත.

ඇ) පාර්ලිමේන්තුවට පැමිණීමේදී හැකිතාක් දුරට රියැදුරෙකු කැටුව පැමිණෙන ලෙසට ද අමුත්තන් කැටුව පැමිණීමෙන් වැළකී සිටින ලෙස ද, ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ඈ) තමන් විසින්ම, තම රථය පදවාගෙන එන මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථ ගාලෙහි ගාල් කිරීම සඳහා මන්ත්‍රී පිවිසුමෙහි, කාර්ය මණ්ඩල පිවිසුමෙහි සහ මහජන පිවිසුමෙහි පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් සේවයේ යොදවන බව ද, දන්වනු කැමැත්තෙමි.

ඉ) මහජන ගැලරිය ආරාධිත අමුත්තන් වෙනුවෙන් සීමා කර ඇති බැවින්, තමන් සමඟ ආරාධිත අමුත්තෙක් පැමිණෙන්නේ නම් ජයන්තිපුර පිවිසුමේදී සේවයේ නියුතු අදාළ පොලිස් නිලධාරින් වෙත ආරාධනා පත්‍රය සමඟ තම අනන්‍යතාව තහවුරු කර මහජන පිවිසුම දක්වා පැමිණීමට හැකියාව පවතින බව දන්වා සිටිමි.

ඊ) මෙදින අතිගරු වියට්නාම් ජනාධිපතිතුමන් ගරු පාර්ලිමේන්තුව අමතන අවස්ථාවේදී වියට්නාම් ප්‍රධාන සන්ධාන නිලධාරිවරයා ද සභා ගර්භය තුළ රැඳී සිටින බව දන්වනු කැමැත්තෙමි.

උ) මෙදින ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ කැමරා ශිල්පියෙකු ද කැමරාවක් සමඟ සභා ගර්භයට පිවිස කැමරාකරණ කටයුතු සිදු කරනු ලැබේ.

ඌ) පාර්ලිමේන්තු රථගාල මෙදින වසා තබන බැවින් මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථගාල් වෙත යොමු කරනු ලැබේ.

ඹ) රථ වාහන පොලීසිය සහ සමීප පොලිස් ස්ථාන විසින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඉහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන සම්බන්ධව සියලු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන අතර, වේත්‍රධාරී සමඟ ද, ආරක්ෂක අංශ සමඟ ද, සහයෝගීව කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික මහ ලේකම් කාර්යාලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Hon. Speaker, on behalf of the Chairman of the Committee on Public Finance, I present the Report of the Committee on Public Finance on the Regulations made by the Minister of Public Security and Parliamentary Affairs under Section 52 read with Section 23 of the Immigrants and Emigrants Act, (Chapter 351) on 23rd April, 2026, which were referred to the said Committee.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, with your permission, I would like to say that the Committee was of the opinion that Sri Lanka should look at extending the visa-on-arrival scheme for all countries, which would be good for tourism in this country.

Thank you, Sir.

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

Hon. Speaker, I present,

(1) A petition from Mrs. H.A.P. Dinusha Sumali Dharmasena of No. 43/1 A, near Regional Health Centre, Dhanyagama, China Bay; and

(2) A petition from Mrs. S. Siwaneswari of No. 256/44, Inner Harbour Road, Trincomalee.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, මීනුවන්ගොඩ, මාතම්මන, සල්මල් උයන, අංක 123/52 යන ලිපිනයෙහි පදිංචි නලීන් සමන්ත වීරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඕපනායක, පතාන, ඉලුක්කුඹුර යන ලිපිනයෙහි පදිංචි ජේ.බී. රොෂාන් අනුරාධ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කන්තලේ, වාන්ඇල, ජයන්තිගම, අංක 345/2 (69) යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ජී. දීපිකා ප්‍රියන්ති වතුලියද්ද මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம)
(The Hon. (Prof.) L.M. Abeywickrama)

Hon. Speaker, I present a petition from Mr. H.K. Kamal Udaya Kumara of K.B.N Ceylon Tea Factory, Narangala, Matara and two others.

**ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා**
(மாண்புமிகு லெப்டினன் கமாண்டர் (ஓய்வுபெற்ற) பிரகீத் மதுரங்க)
(The Hon. Lieutenant Commander (Rtd.) Prageeth Madhuranga)

ගරු කථානායකතුමනි, යක්කල, වැරැල්ලවත්ත, 3 වන පටුමග, අංක 158 යන ලිපිනයෙහි පදිංචි වෛද්‍ය ආර්.එම්.ආර්.කේ. චන්ද්‍රසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

*ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.*

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -765/2025- (1), ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 -815/2025- (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

## මොරටුව, ධර්මරතන විද්‍යාලය, ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලය සහ සුනන්දෝපනන්ද ප්‍රාථමික විද්‍යාලය: වර්තමාන තත්ත්වය

## மொரட்டுவை, தர்மரதன வித்தியாலயம், லக்ஷபதிய சிக்ஷாதான வித்தியாலயம் மற்றும் சுனந்தோபனந்த ஆரம்பப் பாடசாலை: தற்போதைய நிலை

## DHAMMARATHANA VIDYALAYA, LAKSHAPATHIYA SHIKSHADHANA VIDYALAYA AND SUNANDOPANANDA PRIMARY SCHOOL IN MORATUWA: CURRENT STATUS

840/2025

**3. ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මොරටුව, ධර්මරතන විද්‍යාලය, ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලය සහ සුනන්දෝපනන්ද ප්‍රාථමික විද්‍යාලය යන පාසල්වල මේ වන විට ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට එම පාසල් වැසී යන තත්ත්වයකට පත්වී තිබෙන බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) மொரட்டுவை, தர்மரதன வித்தியாலயம், லக்ஷபதிய சிக்ஷாதான வித்தியாலயம் மற்றும் சுனந்தோபனந்த ஆரம்பப் பாடசாலை ஆகிய பாடசாலைகளில் தற்போது கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி பாடசாலைகள் தற்போது மூடப்படும் நிலைக்குத் தள்ளப்பட்டுள்ளமையை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of students currently studying in the Dhammarathana Vidyalaya, Lakshapathiya Shikshadhana Vidyalaya and Sunandopananda Primary School in Moratuwa, separately;

(ii) whether she is aware that these schools are currently in a state leading to closure; and

(iii) if so, what measures will be taken in this regard?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

| අනු අංකය | පාසලේ නම | ශිෂ්‍ය සංඛ්‍යාව (2026) |
|---|---|---|
| 01 | ධම්මරතන විද්‍යාලය | 110 |
| 02 | ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලය | 30 |
| 03 | සුනන්දෝපනන්ද ප්‍රාථමික විද්‍යාලය | 63 |

(ii) මෙම කාරණයට අදාළව අපි විස්තරාත්මක වාර්තාවක් අරගෙන තිබෙනවා, අවුරුදු 4ක සිසුන් ඇතුළත් වීමේ නැඹුරුතාව සහ ශිෂ්‍ය සංඛ්‍යාව අනුව.

මෙම පාසල් තුනෙහි පසුගිය වර්ෂ 4ක ශිෂ්‍ය සංඛ්‍යාව පහතින් දක්වා ඇත.

| අනු අංකය | පාසලේ නම | ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|
| | | 2023 | 2024 | 2025 | 2026 |
| 01 | ධම්මරතන විද්‍යාලය | 89 | 100 | 96 | 110 |
| 02 | ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලය | 48 | 36 | 36 | 30 |
| 03 | සුනන්දෝප නන්ද ප්‍රාථමික විද්‍යාලය | 81 | 80 | 62 | 63 |

මේ පාසල් තුන වෙන වෙනම ගත්තොත්, ධම්මරතන විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාවේ යම්කිසි වැඩිවීමක් අපට පෙනෙන්න තිබෙනවා, 2023 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා. නමුත්, 2026දීත් ඉන්නේ ශිෂ්‍යයන් 110යි. ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලයේ මේ වසර 4 තුළදී සුළු අඩුවීමක් නිරීක්ෂණය වෙනවා. මේ වසර 4 තුළම එහි ශිෂ්‍යයන් සංඛ්‍යාව 50ට අඩුයි. ඒ වාගේම තමයි, සුනන්දෝපනන්ද ප්‍රාථමික විද්‍යාලයේ මේ වනකොට ශිෂ්‍ය සංඛ්‍යාවේ සුළු අඩුවීමක් දක්නට ලැබෙනවා. 2026 වර්ෂයේ 63ක ශිෂ්‍ය සංඛ්‍යාවක් තමයි ඉන්නේ.

ඒ අනුව, මේ පාසල් තුන ගත්තොත්, ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලයේ සිසුන් අඩුවීමක ස්වභාවයක් දකින්නට තිබෙනවා. නමුත්, මෙම පාසල්වලට අදාළව නිසි ක්‍රමවේද සහිතව ඉගැන්වීම් කටයුතු මේ වෙද්දී සිද්ධ වෙනවා.

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා ]

(iii) ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව මේ වන විට අඩුවීමක් පැවතිය ද පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සියලුම පහසුකම් පාසල වෙත ලබා දී ඇත. ඒ වාගේම, මෙම පාසල පිහිටා ඇති පෝෂිත ප්‍රදේශය තුළ ශිෂ්‍ය ගහනය අඩුවීම ද මේකට බලපා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, ඒ අවට තවත් පාසල් 4ක් තිබෙනවා. ඒවා ඉතාම ආසන්නයේයි තිබෙන්නේ. එම නිසා එම පාසල්වලට ශිෂ්‍යයන් පැමිණීමේ නැඹුරුතාවකුත් තිබෙනවා. එම පාසල්වලට අදාළ විස්තර පහත වගුවේ දැක්වෙනවා.

| අනු අංකය | පාසලේ නම | පාසල් වර්ගය | පාසලේ සිට ඇති දුර |
|---|---|---|---|
| 01 | බප/පිළි/පොදුජය විද්‍යාලය | 3 වර්ගය | 2.5 km |
| 02 | බප/පිළි/සැලීනා විදුහල | 3 වර්ගය | 3 km |
| 03 | බප/පිළි/උයන කනිෂ්ඨ විද්‍යාලය | 2 වර්ගය | 3 km |
| 04 | බප/පිළි/ රාවතාවත්ත මෙතෝදිස්ත විදුහල | 2 වර්ගය | 2.5 km |

සෑම ශිෂ්‍යයෙකුටම ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමේ රජයේ ප්‍රතිපත්තිය තහවුරු කිරීමේ අරමුණින් ප්‍රාථමික පාසල් සංවර්ධන ව්‍යාපෘතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම තමයි, 2027 වර්ෂයේදී සංවර්ධනය කිරීමට නියමිත පාසල් ලේඛනයේ ලක්ෂපතිය ශික්ෂාදාන විද්‍යාලය ආසන්නයේ ඇති සැලීනා විද්‍යාලය ද තිබෙනවා. එම නිසා ලක්ෂපතිය විද්‍යාලයේ යම්කිසි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා නම්, අවශ්‍ය නම් මේ සැලීනා විද්‍යාලයට යෑමේ හැකියාව තිබෙනවා. ඒ අතරම ලක්ෂපතිය විද්‍යාලයේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු ද නිසි ආකාරයෙන් සිද්ධ වෙනවා.

(ආ) අදාළ නොවේ.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් දන්නවා, ගොඩක් පාසල්වල ළමයින් අඩු වීමේ ප්‍රවණතාවක් කාලයක සිට තිබෙන බව. ඒකට හේතුව තමයි, විශේෂයෙන්ම ප්‍රාථමික අංශවලට ළමයින් බඳවා ගැනීමේදී පළමුවැනි වසරේ ඉඳන්ම අධික ළමයින් ප්‍රමාණයක් බඳවා ගන්නා එක. 2012 වර්ෂයේදී අපේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් ලබා දුන්නා, පාසල්වල පළමුවැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීමේදී එක් පන්තියකට ළමයි 35ක ප්‍රමාණයක් රඳවා ගැනීම 2016 වර්ෂයේ ඉඳන් ක්‍රියාත්මක කරන්න කියලා. ජාත්‍යන්තර වශයෙනුත් පන්තියක ළමයි 25ක් වාගේ තමයි සාමාන්‍යයෙන් ඉන්න ඕනෑ. 2016දී එවකට හිටපු අධ්‍යාපන ඇමති අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ඒක ක්‍රියාත්මක කළා. 2016 වර්ෂයේ ඉඳන් හැම අවුරුද්දකම එක් පන්තියකට ළමයින් ගන්නා සංඛ්‍යාව එක එක අඩු කරලා, 2020, 2021 වනකොට පන්තියකට ළමයි 35ක් වන ආකාරයට ගෙන එන්න තමයි සැලසුම් කර තිබුණේ. නමුත්, 2020දී ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බලයට පත් වුණාට පස්සේ නැවත වතාවක් Cabinet Paper එකක් දාලා, ශ්‍රේෂ්ඨාධිකරණයේ ඒ තීන්දුව වෙනස් කරලා පළමුවැනි වසර සඳහා ළමුන් බඳවා ගැනීමේදී පන්තියක සිසුන් සංඛ්‍යාව 42ක් කළා. ඔබතුමන්ලා පසුගිය කාලයේම මේ අධ්‍යාපන අර්බුදය ගැන නිතර කථා කළා, පන්ති කාමරයක ළමයින් සංඛ්‍යාව වැඩි වීම ගැන. නමුත් ඔබතුමන්ලාත් දැන් මීට කලින් පැවැති ආණ්ඩුව ක්‍රියාත්මක කළ ආකාරයටම පළමුවැනි වසර පන්ති කාමරයක් සඳහා ළමයි 42 සීමාවම තමයි අරගෙන යන්නේ. ඉතින් එහෙම කරනකොට අනිවාර්යයෙන්ම ජනප්‍රිය පාසල්වලට යන ළමයි සංඛ්‍යාව වැඩි වෙනවා. කුඩා පාසල්වලට එන ළමයි සංඛ්‍යාව අඩු වෙනවා. ඉතින් ඇයි අර ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට නැවත නොයන්නේ? පළමුවන වසර පන්ති කාමරයක් සඳහා ළමයි 35ක සීමාවට නැවත නොයන්නේ ඇයි?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු මන්ත්‍රීතුමනි, ඔව්. පාසලක පන්ති කාමරයක් සඳහා ඇතුළත් කර ගන්නා ළමුන් සංඛ්‍යාව තීරණය කරන්නේ, නිශ්චිත විද්‍යාත්මක නිර්ණායකවලට අනුව. දැන් මේ වෙනකොට තිබෙන ගැටලුව, ගොඩක් පාසල්වල ඔය කියන සංඛ්‍යාව නාමිකව තිබුණාට 40ට එහා ළමයි ඉන්නවා. ද්විතීයික පාසල්වලත් ඔය ගැටලුව තිබෙනවා, ප්‍රාථමික පාසල්වලත් ඔය ගැටලුව තිබෙනවා. ඒ වාගේම ද්විතීයික පාසල්වල පන්තියක 45ට එහා ළමයි සංඛ්‍යාවක් ඉන්නවා, අපි ආණ්ඩු බලය ලබා ගන්නකොටත්, ගරු මන්ත්‍රීතුමනි. ඒක ලොකු ගැටලුවක් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ අවුරුද්ද ඇතුළත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පටන් ගත්තා. ඒ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළත් යම් කිසි ගුරුවරයෙකුට හෝ ගුරුවරියකට දැරිය හැකි ළමයි සංඛ්‍යාවක් ඉන්නවා. ඒ ප්‍රමාණය අඩු විය යුතුයි. අඩු විය යුතුයි. අපි කියන්නේ 35ටත් වඩා අඩු විය යුතුයි කියලායි. නමුත් ඒක ක්‍රමිකව සිද්ධ වෙන්නේ. ඒක ක්‍රමිකවයි සිද්ධ වෙන්නේ. අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී, මම කලින් පිළිතුර ලබා දෙනකොටත් කියපු විධියට පාසල් නාමකරණය කරලා, ඒ පාසලට අදාළ සියලු යටිතල පහසුකම් ලබා දෙනවා. ඒකත් එක්ක අපට පුළුවන්, ඔබතුමා සඳහන් කරපු නගරබද පාසල්වල තිබෙන තදබදය අඩු කරගන්න. දැන් තිබෙන 40 කියන සංඛ්‍යාවත් සමහර පාසල්වල ක්‍රියාත්මක වෙන්නේ නැහැ. නමුත්, අපි ඒ විධියට ගත්තේ නැහැ. අපි ද්විතීයික පාසල්වල පන්තියක සිසුන් 40ට වැඩි කළේත් නැහැ, 45න් එහාට ගත්තේත් නැහැ. අපි වැඩි කළේ නැහැ. නමුත් ඉදිරියේදී ප්‍රතිසංවිධාන ක්‍රියාවලිය සහ යටිතල පහසුකම් ගොඩ නැඟීම කියන ක්‍රියාවලිය ඇතුළත පර්යන්තයේ තිබෙන ඔය ප්‍රාථමික පාසල් ගොඩක් ප්‍රමාණයකට පන්ති කාමර පහසුකම් ලැබෙයි සහ ගුරුවරුන් සංඛ්‍යාවක් ලැබෙයි. ඒකත් එක්ක පන්ති කාමරයේ ඉඩ ප්‍රමාණය අනුව මේ සීමා කිරීම් කළ හැකියි. ඒ දක්වා අපි යනවා. ඒක තමයි ක්‍රියාදාමය, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු කථානායකතුමනි, මම අහන ප්‍රශ්නයට නොවෙයි එතුමා උත්තරය දෙන්නේ. කෙසේ නමුත්, දැන් ඔබතුමන්ලා මේ ගැටලු විසඳන්න නේ ආවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔව්, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා ගැටලු විසඳන්න නේ ආවේ. ඉතින් දැන් ගැටලු විසඳන්න එපායැ. ඔබතුමන්ලා බලයට ආවාට පස්සේ 2025 පළමුවැනි වසරට ශිෂ්‍යයන් බඳවා ගත්තා. 2026ටත් බඳවා ගත්තා. ඒ අවස්ථා දෙකේදීම අර කලින් ආණ්ඩුව කැබිනට් පේපර් එකක් දාලා 35ට තියන්න ඕනෑ එක 40ක් කරලා වෙනස් කරපු එක තමයි තවම යන්නේ. ඒ කියන්නේ, ඔබතුමන්ලා ඒක වෙනස් කරලා නැහැ.

ඊළඟ කාරණය මේකයි. ඔබතුමන්ලා ජනප්‍රිය පාසල්වල සමාන්තර පන්ති වැඩි කරනවා. ඉතින්, ජනප්‍රිය පාසල්වල සමාන්තර පන්ති වැඩි කළාම කුඩා පාසල් කොහොමත් වැහෙනවා. ඒක තමයි මම මේ කියන්නේ. මේක සම්පූර්ණයෙන්ම වෙනස් කරනවා කියලා තමයි ඔබතුමන්ලා ප්‍රතිසංස්කරණවලදී කිව්වේ. මේ දේ කරන්න විශාල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අවශ්‍ය නැහැ.

ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබුණු තීන්දුවක් තිබෙනවා, පළමුවැනි වසර පන්ති කාමරයකට ළමයි 35ක් බඳවා ගන්න කියලා. ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්නේ නැතිව ළමයි 40ක් බඳවා ගන්නත්, ජනප්‍රිය පාසල්වල සමාන්තර පන්ති වැඩි කරන්නත් ගියොත් මේ අවට තිබෙන කුඩා පාසල් අනිවාර්යයෙන්ම වැසීගෙන යනවා. ඒ නිසායි මම මෙහෙම කියන්නේ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමන්ලා මේ පිළිබඳව දැනුවත් වෙලා ඉන්නවා. ඔබතුමන්ලා මේ ගැන දන්නවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලැබුණු තීන්දුවක් තිබෙනවා. යහ පාලන ආණ්ඩුව කාලයේදී අකිල විරාජ් ඇමතිතුමා ඒක ක්‍රියාත්මක කළා. කනගාටුව වුණේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඇවිල්ලා කැබිනට් තීන්දුවක් අරගෙන නැවත වතාවක් ඒක 40 කරපු එක. ඉතින් ඔබතුමන්ලාත් ඇවිල්ලා ඒ 40 කරපු එක දිගටම අරගෙන යනවා. ඒ වාගේම ජනප්‍රිය පාසල්වල සමාන්තර පන්තිත් වැඩි කරනවා. එතකොට කොහොමත් කුඩා පාසල් වැහෙනවා.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු මන්ත්‍රීතුමනි, අපි මේ පිළිබඳව නිවැරදි කිරීමක් කරන්න ඕනෑ. ජනප්‍රිය පාසල්වල සමාන්තර පන්ති වැඩි කිරීමක් කිසිසේත්ම කරලා නැහැ. වැඩි කරන්නේ නැහැ. එහෙම කරලා තිබෙනවා නම් ඔබතුමා ඉදිරිපත් කරන්න. අපි ව්‍යුහ කමිටුවලට දමලා ඒවායේ තීරණ මත තමයි කටයුතු කරන්නේ. සමාන්තර පන්ති වැඩි කරනවා වෙනුවට අපි ඇත්තටම කරන්නේ, මේ මොහොතේ තිබෙන පන්ති කරගෙන යන අතරතුර පර්යන්තයේ තිබෙන ද්විතීයික පාසල් දියුණු කරන එක. අපි කිසිසේත්ම ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන නැහැ, ජනප්‍රිය පාසල්වල සමාන්තර පන්ති වැඩි කරන්න. ඒ වාගේම ළමයි ප්‍රමාණය වැඩි කරන්නේත් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අපි ඇත්තටම කරන්නේ පර්යන්තයේ තිබෙන පාසල්වලට මේ අධ්‍යාපනය ගෙනයන එකයි. ජනප්‍රිය පාසල්වල සමාන්තර පන්ති ලොකු ප්‍රමාණයක් වැඩි කරන්නේම නැහැ. ඒක අපේ තීරණයක්.

## කාන්තාවන්ට එරෙහි සයිබර් අපරාධ නඩු: විස්තර
## பெண்களுக்கு எதிரான இணையக் குற்ற வழக்குகள்: விபரம்
## CYBERCRIME CASES AGAINST WOMEN: DETAILS

1016/2025

**4. ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය වර්ෂ 03 තුළ කාන්තාවන්ට එරෙහි සයිබර් අපරාධ සම්බන්ධයෙන් විසඳා ඇති නඩු සංඛ්‍යාව සහ විමර්ශන සිදු කෙරෙමින් පවතින හෝ නඩු පැවරීමට නියමිත සයිබර් අපරාධ සිද්ධි සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එවැනි නඩු විසඳීම සඳහා සාමාන්‍යයෙන් ගතවන කාලය කොපමණද;

(iii) උතුරු පළාත ඇතුළුව සෑම පළාතකම එවැනි නඩු විභාග කිරීම සඳහා විශේෂිත සයිබර් අපරාධ ඒකක ස්ථාපිත කර තිබේද;

(iv) කෘත්‍රිම බුද්ධිය (AI) පදනම් කර ගත් අධීක්ෂණ පද්ධති, මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ දැඩි බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළුව කාන්තාවන් සඳහා ඩිජිටල් ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එලෙස ගනු ලැබූ පියවර පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 3 ஆண்டுகளில், பெண்களுக்கு எதிராக நடந்துகொண்டிருக்கும் இணையக் குற்ற வழக்குகளில், தீர்க்கப்பட்ட மற்றும் விசாரணைக்காக அல்லது வழக்குத் தொடருதலுக்காக நிலுவையில் உள்ள இணையக் குற்ற வழக்குகளின் எண்ணிக்கையை ஒவ்வொரு மாகாணத்துக்குமென வெவ்வேறாகவும்;

(ii) அத்தகைய வழக்குகளைத் தீர்ப்பதற்கு எடுக்கும் சராசரி காலம் யாது என்பதையும்;

(iii) வட மாகாணம் உட்பட ஒவ்வொரு மாகாணத்திலும் அவ்வகையான வழக்குகளை விசாரிக்க பிரத்தியேக இணையக் குற்றத் தடுப்புப் பிரிவுகள் நிறுவப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) செயற்கை நுண்ணறிவு (AI) அடிப்படையிலான கண்காணிப்பு அமைப்புகள், பொது மக்கள் விழிப்புணர்வுத் திட்டங்கள் மற்றும் இறுக்கமான அமுலாக்க நடவடிக்கைகள்மூலம் பெண்களுக்கான டிஜிட்டல் பாதுகாப்பை வலுப்படுத்த ஏதேனும் நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

(v) அவ்வாறெனில், அத்தகைய முன்னெடுப்புக்களின் விபரங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා]

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the number of cybercrime cases relating to offences against women that have been resolved and those that remain pending investigation or prosecution, separately for each province during the last three years;

(ii) the average time taken for the resolution of such cases;

(iii) whether dedicated cybercrime units have been established in each province, including the Northern Province;

(iv) whether any steps have been taken to strengthen digital safety for women, including use of AI-based monitoring systems, public awareness programmes and stricter enforcement measures; and

(v) if so, the details of such initiatives?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

| පළාත | කාන්තාවන්ට එරෙහිව වාර්තා වූ මුළු සයිබර් අපරාධ සංඛ්‍යාව | | | ඒ අතුරින් විසඳා ඇති සංඛ්‍යාව | | | විමර්ශන තවදුරත් සිදුවන හෝ නඩු පැවරීමට නියමිත සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2023 | 2024 | 2025 | 2023 | 2024 | 2025 | 2023 | 2024 | 2025 |
| බස්නාහිර | 3 | 26 | 32 | 3 | 23 | 25 | 0 | 3 | 7 |
| ඌව | 5 | 6 | 4 | 4 | 4 | 1 | 1 | 2 | 3 |
| වයඹ | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 0 |
| නැගෙනහිර | 1 | 1 | 5 | 1 | 1 | 5 | 0 | 0 | 0 |
| උතුරු | 10 | 22 | 10 | 10 | 22 | 8 | 0 | 0 | 2 |
| දකුණු | 13 | 15 | 24 | 13 | 15 | 21 | 0 | 0 | 3 |
| මධ්‍යම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| සබරගමුව | 8 | 6 | 26 | 8 | 5 | 20 | 0 | 1 | 6 |
| උතුරු මැද | 0 | 4 | 5 | 0 | 2 | 4 | 0 | 2 | 1 |
| අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සෘජුව වාර්තා වූ | 4063 | 3077 | 4636 | 716 | 910 | 488 | 3347 | 2167 | 4148 |
| **එකතුව** | **4103** | **3159** | **4742** | **755** | **982** | **572** | **3348** | **2177** | **4170** |

(ii) සයිබර් අපරාධ නඩු විසඳීම සඳහා ගතවන කාලය නිශ්චිතව කියන්න බැහැ. ඒක තීන්දු වෙන්නේ නඩුවේ ස්වභාවය අනුව. අවම වශයෙන් සමහර ඒවාට මාස කිහිපයක් ඇතුළතත් සමහර ඒවාට වසර දෙකක කාලයකුත් ගත වෙන්න පුළුවන්.

(iii) ඔව්.

(iv) ඔව්.

(v) **සයිබර් අවකාශයේ සිදුවන හිංසනයන් හඳුනා ගැනීමට කෘත්‍රිම බුද්ධිය (AI) තාක්ෂණය භාවිතා කිරීමේ පියවර,**

1. කාන්තාවන්ගේ රූප වැරදි ලෙස භාවිත කරමින් සිදු කරන අපරාධ හඳුනා ගැනීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය ජාත්‍යන්තර තාක්ෂණික සහාය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

2. Facebook, Instagram වැනි ප්‍රධාන සමාජ මාධ්‍ය ජාලයන් එක්ව, AI මගින් කාන්තාවන්ට එරෙහි ලිංගික හිංසනයන් ස්වයංක්‍රීයව හඳුනාගෙන ඉවත් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම.

කාන්තාවන් ඉලක්ක කරගත් සයිබර් අපරාධ අවම කිරීමට ශ්‍රී ලංකා පොලිසිය ප්‍රමුඛ විවිධ ආයතන මඟින් සිදුකරනු ලබන මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය වැඩි කරලා තිබෙනවා.

1. පාසල් දැරියන් සහ රැකියාවල නියුතු කාන්තාවන් සඳහා ඩිජිටල් අවකාශයේ සීමාවන් සහ ආරක්ෂක උපක්‍රම පිළිබඳ පොලිස් සයිබර් අපරාධ විමර්ශන අංශය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය යටතේ පවතින ආයතන විසින් වැඩමුළු පවත්වමින් ඉන්නවා.

2. වංචනික ඇමතුම්, පෞද්ගලික තොරතුරු සොරකම් කිරීම සහ සමාජ මාධ්‍ය ගිණුම් ආරක්ෂා කර ගන්නා ආකාරය පිළිබඳව රූපවාහිනී සහ ගුවන් විදුලි මාධ්‍ය හරහා පොලිස් මාධ්‍ය කොට්ඨාසය මඟින් නිරන්තරයෙන් දැනුවත් කිරීම් සිදු කිරීම.

කාන්තාවන් ඉලක්ක කරගත් සයිබර් අපරාධ අවම කිරීම හා සම්බන්ධිත නීතිය ක්‍රියාත්මක කිරීමේ දී පහත යන්ත්‍රණයන් ශක්තිමත් කර තිබෙනවා.

1. 2024 අංක 09 දරන අන්තර්ජාල අරක්ෂණ පනත යටතේ පිහිටුවා ඇති "අන්තර්ජාල ආරක්ෂණ කොමිෂන් සභාව" මඟින් කාන්තාවන්ට එරෙහිව සිදුවන අඩන්තේට්ටම් සම්බන්ධයෙන් ඉතා කඩිනමින් ක්‍රියාත්මක වීම සඳහා බලය තිව්‍ර කරලා තිබෙනවා.

2. පසුගිය කාලවකවානුවට අදාළව කොළඹ ප්‍රදේශය කේන්ද්‍ර කරගත් සයිබර් විමර්ශන, මේ වන විට යාපනය, මාතර, මහනුවර වැනි ප්‍රදේශ කරා ව්‍යාප්ත කර තිබීම හේතුවෙන් කාන්තාවන්ට සිය ප්‍රදේශය තුළදීම පැමිණිලි කිරීමේ අවස්ථාව ලැබිලා තිබෙනවා.

3. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වාර්තා කිරීමට 1938 (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය) හෝ පොලිස් හදිසි අංක 1929 හරහා ක්ෂණික සහාය ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

(ආ) පැන නොනඟී.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

2025ஆம் ஆண்டு யாழ்ப்பாண மாவட்டத்தில் Computer Crime Investigation Subunit நிறுவப்பட்டது. உண்மையிலே அது நல்லதொரு முயற்சியாகும். யாழ்ப்பாணம் உட்பட வடக்குப் பகுதிகளில் நடைபெறுகின்ற இணையக் குற்றங்கள் தொடர்பில் முறைப்பாடு செய்வதற்கு இது சிறந்ததொரு களமாகக் காணப்படுகின்றது. இருந்தபோதிலும், அங்கு ஆளணிப் பற்றாக்குறை காணப்படுகின்றது. இப்பிரிவின் செயற்பாடுகளை இன்னும் அதிகரிக்கவேண்டிய தேவை அப்பிரதேச மக்களுக்குக் கணப்படுகின்றது. பெண்கள் மற்றும் சிறுவர்களுக்கு இழைக்கப்படுகின்ற அநீதியால் சமூகத்தில் பலர் பாதிப்படைந்து இருக்கிறார்கள். அவர்களை நாங்கள் திட்டமிட்ட ரீதியில் ஆற்றுப்படுத்த வேண்டிய தேவையிருக் கின்றது. எனவே, அவர்களுக்கான மானநஷ்டஈட்டை அல்லது அவர்களுடைய உளவியல் தாக்கங்களுக்கான பரிகாரங்களை நாங்கள் கொடுக்கவேண்டி இருக்கின்றது. அவ்வாறான திட்டங்கள் ஏதும் இருக்கின்றதா அல்லது அதற்கான நிதி ஒதுக்கீடுகள் ஏதும் செய்யப்பட்டு இருக்கின்றதா? எனக் கேட்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, මේ පිළිබඳ විමර්ශන කටයුතු සඳහා පොලීසියට බලය පවරා තිබෙනවා. ඒ සඳහා උතුරු පළාතේ සයිබර් අපරාධ සම්බන්ධයෙන් ඒකකයක් ස්ථාපිත කරලා තිබෙනවා. එම පැමිණිලි පිළිබඳව විමර්ශනය කරලා, කඩිනමින් අධිකරණ ක්‍රියාමාර්ග ගන්න කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ට ඒ සම්බන්ධයෙන් යම් වන්දි මුදලක් ගෙවීම පිළිබඳව තීන්දු තීරණ ගත යුත්තේ අධිකරණය හරහායි. නමුත්, පොලීසිය සහ සයිබර් අපරාධ විමර්ශන ඒකකය උතුරු පළාතෙන් වාගේම අනෙකුත් පළාත්වලින් ලැබෙන පැමිණිලි පිළිබඳවත්, පවත්නා නීති රාමුව යටතේ විමර්ශන කිරීමට කටයුතු කරමින් ඉන්නවා.

**ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා**
(மாண்புமிகு றஜீவன் ஜெயச்சந்திரமூர்த்தி)
(The Hon. Rajeevan Jeyachandramoorthy)
கௌரவ சபாநாயகர் அவர்களே, என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

வடக்கு மற்றும் ஏனைய பிரதேசங்களில் கிராமப் புறங்களிலுள்ள பெண்கள் மற்றும் சிறுவர்கள்தான் இதனால் கூடுதலாகப் பாதிக்கப்படுகின்றார்கள். அவ்வாறு பாதிக்கப் படுகின்ற அவர்கள், பொலிஸ் நிலையங்களில் அல்லது ஏனைய நிறுவனங்களில் முறைப்பாடு செய்வதற்குக் கஷ்டமாக இருப்பதால், கிராமங்களில் அல்லது பொதுவான இடங்களில் mobile unitsஐ ஏற்படுத்தி, அவர்களுடைய முறைப்பாடுகளைப் பெறுவதற்கான வசதிகள் ஏதும் செய்யப்படுமா? எனக் கேட்கின்றேன்.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු කථානායකතුමනි, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශයේ 1938 ක්ෂණික අංකය ඔස්සේත්, පොලිස් හදිසි ඇමතුම් 1929 අංකය ඔස්සේත් මේ පිළිබඳව පැමිණිලි ඉදිරිපත් කිරීමට හැකියාව තිබෙනවා. ඒ අනුව එම පැමිණිලි විමර්ශනය කරන්න අවශ්‍ය පියවර අපි ගන්නවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය පිළිබඳව සඳහන් කරනවා නම්, උතුරු පළාතෙන් 2023 වසරේදී ලැබී තිබෙන්නේ පැමිණිලි 10යි. 2024 වසරේදී පැමිණිලි 22ක් ලැබී තිබෙනවා. 2025 වසරේදී පැමිණිලි 10ක් ලැබී තිබෙනවා. 2023 වසරේදී ලැබුණු පැමිණිලි 10ම විසඳා තිබෙනවා. 2024දී ලැබුණු පැමිණිලි 22ත් විසඳා අවසන් කර තිබෙනවා. 2025 වසරේ ලැබුණු පැමිණිලිවලින් 08ක් විසඳා තිබෙනවා. මට පැහැදිලි නැහැ, මේ අය යම් සිද්ධියක් සම්බන්ධයෙන් පැමිණිලි කරන්නේ නැතුවද, එහෙම නැත්නම් විමර්ශන පුළුල් වෙලා තිබියදීත් ජනතාවට ඒ සම්බන්ධයෙන් තිබෙන දැනුවත්භාවය පිළිබඳ ගැටලුවක්ද මෙතැන තිබෙන්නේ කියලා. කෙසේ වෙතත්, මේ පිළිබඳව සොයා බැලීමක් කරන්නම්. එවැනි ජංගම සේවාවක අවශ්‍යතාවක් තිබෙනවාද කියන කාරණය පිළිබඳවත් සොයා බැලීමක් කරන්නම්, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -1188/2025- (1), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## අම්පාර දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නිලධාරින් සහ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරි (දෙමළ) තනතුරු: පුරප්පාඩු

### அம்பாறை மாவட்டத்தில் விளையாட்டு அலுவலர் மற்றும் மாவட்ட இளைஞர் சேவை அலுவலர் (தமிழ்) பதவிகள்: வெற்றிடங்கள்

### POSTS OF SPORTS OFFICERS AND DISTRICT YOUTH SERVICE OFFICER (TAMIL) IN AMPARA DISTRICT: VACANCIES

1337/2025

**6. ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 20හි සේවය කරනු ලබන ක්‍රීඩා නිලධාරින්ගේ නම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දීර්ඝ කාලයක සිට එම දිස්ත්‍රික්කයේ ක්‍රීඩා නිලධාරි තනතුරේ පුරප්පාඩු 13ක් පවතින බව දන්නේද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය සිට පානම දක්වා සිංහල ජනතාව වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශ සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් (සිංහල) සහ දෙමළ ජනතාව වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශ සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් (දෙමළ) පත්කර තිබූ නමුත් මේ වන විට දෙමළ දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, එම ප්‍රදේශ සඳහා දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරියෙක් (දෙමළ) පත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாறை மாவட்டத்தின், 20 பிரதேச செயலகப் பிரிவுகளிலும் பணியாற்றும் விளையாட்டு அலுவலர்களின் பெயர்கள் பிரதேச செயலகப் பிரிவு வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) நீண்டகாலமாக மேற்படி மாவட்டத்தில் விளையாட்டு அலுவலர் பதவியில் 13 வெற்றிடங்கள் காணப்படுவதை அறிவாரா என்பதையும்;

(iii) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்கு மேற் கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அம்பாறை மாவட்டத்தின், தெஹியத்தகண்டிய தொடக்கம் பானம வரை சிங்கள மக்கள் அதிகளவில் வசிக்கும் பிரதேசங்களுக்கு மாவட்ட இளைஞர் சேவை அலுவலரொருவரும் (சிங்களம்) தமிழ் மக்கள் அதிகளவில் வசிக்கும் பிரதேசங்களுக்கு மாவட்ட இளைஞர் சேவை அலுவலரொருவரும் (தமிழ்) நியமிக்கப்பட்டு இருந்தபோதிலும், இன்றளவில் தமிழ் மாவட்ட இளைஞர் சேவை அலுவலரொருவர் கடமையில் இல்லை என்பதை அறிவாரா;

(ii) ஆமெனில், மேற்படி பிரதேசங்களுக்கு மாவட்ட இளைஞர் சேவை அலுவலரொருவர் (தமிழ்) நியமிக்கப்படுவாரா;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House -

(i) the names of the Sports Officers serving in the 20 Divisional Secretaries' Divisions of the Ampara District, separately by each Divisional Secretary's Division;

(ii) whether he is aware that there are 13 vacancies in the post of Sports Officer in the said district for a long time; and

(iii) the steps that have been taken to fill the vacancies referred to above?

(b) Will he also inform this House -

(i) whether he is aware that despite the fact that a District Youth Service Officer (Sinhala) and a District Youth Service Officer (Tamil) had been appointed, respectively, for the areas where the Sinhalese population is predominant and for areas where Tamil population is predominant from Dehiattakandiya to Panama in the Ampara District, there is presently no District Youth Service Officer (Tamil); and

(ii) if so, whether a District Youth Service Officer (Tamil) will be appointed for those areas?

(c) If not, why?

vacancies in Sports Officers and District Youth Service Officer (Tamil): Ampara District

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ක්‍රීඩා නිලධාරින් අනුයුක්ත කර ඇත්තේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට පමණි. ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ක්‍රීඩා නිලධාරින් සේවය කරනු නොලැබේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සේවය කරන ක්‍රීඩා නිලධාරින් අයත් වන්නේ පළාත් සභාවටයි.

(ii) පැන නොනඟී.

(iii) පැන නොනඟී.

(ආ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ මේ වන විට දමිළ මාධ්‍ය ජ්‍යෝෂ්ඨ තරුණ සේවා නිලධාරියෙකු නොමැති අතර, සිංහල මාධ්‍ය නිලධාරියෙකු ජ්‍යෝෂ්ඨ තරුණ සේවා නිලධාරි (ආවරණ) රාජකාරි ඉටු කරනු ලබයි. අදාළ ප්‍රදේශීය ලේකම් කොට්ඨාස භාර තරුණ සේවා නිලධාරින් දමිළ මාධ්‍ය කොට්ඨාස සඳහා යොදවා ඇත.

(ii) මේ වන විට පුරප්පාඩුව පවතින ජ්‍යෝෂ්ඨ තරුණ සේවා නිලධාරි තනතුරට උසස්වීම් ලබා දීමට අනුමැතිය ලැබී ඇති අතර, ඒ සඳහා අයදුම්පත් කැඳවීම් සිදු කර ඇත. ඉදිරියේදී එම තනතුරට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා තනතුරු ලබා දීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පැන නොනඟී.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
கௌரவ அமைச்சர் அவர்களே, அம்பாறை மாவட்டத்தில் தமிழ் மொழி பேசுகின்ற மக்கள் வசிக்கும் பிரதேசங்களுக்கு மாவட்ட இளைஞர் சேவை அலுவலரொருவர் தற்காலிகமாக நியமிக்கப்பட்டு இருக்கின்றார். தற்பொழுது, உங்களுடைய அமைச்சினால் புதிதாக இளைஞர் சேவை அலுவலர்களை நியமனம் செய்வதற்கான ஏற்பாடுகள் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. இதன்போது எமது அம்பாறை மாவட்டத்தில் தமிழ் மொழி பேசுகின்ற மக்கள் வசிக்கும் பிரதேசங்களுக்கு மாவட்ட இளைஞர் சேவை அலுவலர் ஒருவரை நிரந்தரமாக நியமிப்பதற்கான ஏற்பாடுகளை மேற்கொள்வீர்களா? எனக் கேட்கின்றேன்.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
ඒක තමයි දැන් කිව්වේ, අපි interview කරගෙන යනවා, ස්ථිර කෙනෙක් පත් කරනවා.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
Thank you.

මගේ ඊළඟ අතුරු ප්‍රශ්නය මෙයයි. நான் நினைக்கின்றேன், அம்பாறை மாவட்டத்தில் 13 விளையாட்டு அலுவலர் வெற்றிடங்கள் - vacancies - இருக்கின்றன என்று. இந்த நிலையில், அம்பாறை மாவட்டத்தில் மாவட்ட மட்ட விளையாட்டு நிகழ்வுக்கான திகதிகள் அறிவிக்கப்பட்டு, அதற்கான ஏற்பாடுகளும் நடைபெற்றுக்கொண்டு இருக்கின்றன. எமது அட்டாளைச்சேனை பிரதேச செயலாளர் பிரிவிலுள்ள அட்டாளைச்சேனை, பாலமுனை, ஒலுவில், திராய்க்கேணி, தீகவாபி போன்ற பிரதேசங்கள் மூவின மக்களும் வாழ்கின்ற பிரதேசங்கள் என்பது உங்களுக்குத் தெரியும். கௌரவ அமைச்சர் அவர்களே, அந்தப் பிரதேச செயலாளர் பிரிவில் விளையாட்டு உத்தியோகத்தர் ஒருவரும் இல்லாத காரணத்தால் அந்தப் பிரதேசத்துக்கான பிரதேச மட்ட விளையாட்டு நிகழ்வை நடாத்த முடியாமல் உள்ளது. எமது அட்டாளைச்சேனை பிரதேசத்துக்குரிய பிரதேச விளையாட்டு நிகழ்வை நடாத்தாமலே, மாவட்ட விளையாட்டு நிகழ்வை நடாத்துவதற்கான நிகழ்ச்சிநிரல் தயாரிக்கப்பட்டு இருக்கின்றது. அதை நான் சபைக்குச் ***சமர்ப்பிக்கின்றேன்.**

எனவே, அட்டாளைச்சேனை பிரதேசத்துக்கான பிரதேச மட்ட விளையாட்டு நிகழ்வை நடாத்திவிட்டு, அம்பாறை மாவட்டத்துக்கான மாவட்ட விளையாட்டு நிகழ்வை நடாத்துமாறு கௌரவ அமைச்சர் அவர்களைக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු සුනිල් කුමාර ගමගේ මහතා**
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ක්‍රීඩා නිලධාරින් පත් කරන්නේ පළාත් සභාව යටතේයි. අපි දැනටමත් පළාත් සභාවත් එක්ක ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරගෙන යනවා. මොකද, ගොඩක් ප්‍රදේශවල පළාත් සභාවෙන් මේ ක්‍රීඩා නිලධාරින් පත් කරලා නැති නිසා පුරප්පාඩු පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒක ක්‍රීඩාවට අදාළ නිසා අපි උත්සාහ කරනවා, ඉදිරි කාලයේදී පළාත් සභාවත් එක්ක සාකච්ඡා කරලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලටත් ක්‍රීඩා නිලධාරින් පත් කරන්න.

## මුලතිව්, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල තැපැල් කාර්යාල: පුරප්පාඩු
## முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்ட தபால் அலுவலகங்கள்: வெற்றிடங்கள்
## POST OFFICES IN MULLAITIVU, MANNAR AND VAVUNIYA DISTRICTS: VACANCIES

1457/2025

7. **ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මුලතිව්, මන්නාරම සහ වවුනියාව යන දිස්ත්‍රික්කයන්හි තැපැල් කාර්යාල සඳහා අනුමත, මේ වනවිට සේවය කරන සහ පුරප්පාඩු පවතින සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත සේවක පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) මේ වනවිට ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාල ස්ථාපිත කර නොමැති දිස්ත්‍රික්ක කවරේද;

(iv) වවුනියාවේ පවත්වාගෙන යනු ලබන මුලතිව් දිස්ත්‍රික්කයට අයත් තැපැල් අධිකාරි කාර්යාලය නැවතත් මුලතිව්හි ස්ථාපිත කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) තැපැල් බෙදා හැරීමේ කටයුතු සඳහා මේ වනවිට වාහන පහසුකම් නොමැති දිස්ත්‍රික්ක කවරේද;

(ii) කාර්යක්ෂම තැපැල් සේවාවක් ලබා දීම පිණිස ඉහත දිස්ත්‍රික්ක සඳහා වාහන/ප්‍රවාහන පහසුකම් ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) முல்லைத்தீவு, மன்னார் மற்றும் வவுனியா மாவட்டங்களிலுள்ள தபால் அலுவலகங்களுக்கு அங்கீகரிக்கப்பட்ட, இன்றளவில் சேவையாற்று கின்ற மற்றும் வெற்றிடங்களாகக் காணப்படும் ஆளணியின் எண்ணிக்கை வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) மேற்படி ஆளணி வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(iii) இன்றளவில் பிரதேச தபால் அத்தியட்சகர் அலுவலகங்கள் நிறுவப்படாத மாவட்டங்கள் யாவை என்பதையும்;

(iv) வவுனியாவில் இயங்குகின்ற முல்லைத்தீவு மாவட்டத்துக்குரிய தபால் அத்தியட்சகர் அலுவலகத்தை மீளவும் முல்லைத்தீவில் நிறுவு வதற்கு மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இன்றளவில் தபால் விநியோக நடவடிக்கை களுக்கு வாகனவசதிகள் காணப்படாத மாவட்டங்கள் யாவை என்பதையும்;

(ii) வினைத்திறனுடன் கூடிய தபால் சேவையை வழங்குவதற்கு மேற்படி மாவட்டங்களுக்கு வாகன/போக்குவரத்து வசதிகளை வழங்கு வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health and Mass Media

(a) Will he inform this House -

(i) the approved cadre, the number of officers currently in service, and the number of vacancies in the post offices of Mullaitivu, Mannar, and Vavuniya Districts, separately;

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

(ii) the measures that will be taken to fill the said vacancies;

(iii) the districts in which Divisional Superintendents of Post Offices have not yet been established; and

(iv) the steps that have been taken to relocate the Mullaitivu District Divisional Superintendent of Post Offices in Mullaitivu, which is currently being operated in Vavuniya?

(b) Will he also inform this House -

(i) the districts where vehicle facilities for mail delivery are not presently available; and

(ii) the steps that will be taken to provide vehicle/transport facilities to the above districts to ensure an efficient postal service?

(c) If not, why?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) **මුලතිව් දිස්ත්‍රික්කය:**

| තනතුර | අනුමත | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| තැපැල් සේවා නිලධාරි I පෙළ | 03 | 00 | 03 |
| තැපැල් සේවා නිලධාරි II/III පෙළ | 12 | 11 | 01 |
| උප තැපැල් ස්ථානාධිපති | 17 | 14 | 03 |
| තැපැල් සහායක | 81 | 74 | 07 |
| ලියාපදිංචි ආදේශක | 29 | 18 | 11 |
| **එකතුව** | **142** | **117** | **25** |

**මන්නාරම දිස්ත්‍රික්කය:**

| තනතුර | අනුමත | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| තැපැල් සේවා නිලධාරි I පෙළ | 06 | 04 | 02 |
| තැපැල් සේවා නිලධාරි II/III පෙළ | 27 | 18 | 09 |
| උප තැපැල් ස්ථානාධිපති | 35 | 27 | 08 |
| තැපැල් සහායක | 118 | 110 | 08 |
| ලියාපදිංචි ආදේශක | 42 | 37 | 05 |
| **එකතුව** | **228** | **196** | **32** |

**වවුනියාව දිස්ත්‍රික්කය:**

| තනතුර | අනුමත | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| සහකාර අධිකාරි (ප්‍රධාන තැපැල් කාර්යාල) | 01 | 01 | 00 |
| තැපැල් සේවා නිලධාරි I පෙළ | 05 | 02 | 03 |
| තැපැල් සේවා නිලධාරි II/ III පෙළ | 25 | 20 | 05 |
| උප තැපැල් ස්ථානාධිපති | 34 | 27 | 07 |
| තැපැල් සහායක | 124 | 111 | 13 |
| ලියාපදිංචි ආදේශක | 42 | 14 | 28 |
| **එකතුව** | **230** | **174** | **56** |

(ii) 2025.12.31 දිනට අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන/ තාක්ෂණික නිලධර ගණයේ II/III පෙළ නිලධාරින් 4,288ක් අනුමත කාර්ය මණ්ඩලය වේ. නමුත්, ඉන් දැනට සේවය කරනු ලබන්නේ 2,714ක් පමණක් වන අතර, පවතින පුරප්පාඩු සංඛ්‍යාව 1,574කි. ඒ අනුව එම පුරප්පාඩු පිරවීම සඳහා 2025.10.25 දින තරග විභාගයක් පවත්වා දිස්ත්‍රික් පදනමින් 600ක් බඳවා ගැනීමට කටයුතු කළා.

අපි 600ක් බඳවා ගැනීමට කටයුතු කළත් ගරු මන්ත්‍රීතුමනි, මේ විභාගය සහ සම්මුඛ පරීක්ෂණය සමත් වෙලා බඳවා ගන්න පුළුවන්කම ලැබුණේ 326ක් පමණයි. එයින්, මුලතිව් දිස්ත්‍රික්කයට එක්කෙනෙක්, මන්නාරම දිස්ත්‍රික්කයට තුන්දෙනෙක් සහ වවුනියාව දිස්ත්‍රික්කයට දෙදෙනෙක් හැටියට බඳවා ගැනීමට නියමිතයි.

(iii) කිලිනොච්චි හා මුලතිව්.

(iv) මුලතිව්හි ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලයක් ස්ථාපිත කිරීමට තරම් ප්‍රමාණවත් තැපැල් කාර්යාල, උප තැපැල් කාර්යාල සංඛ්‍යාවක් නොමැති නිසා, මුලතිව් සඳහා වෙනමම ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලයක් මේ වෙලාවේදී විවෘත කරන්න හැකියාවක් නැහැ.

මුලතිව් ප්‍රාදේශීය තැපැල් අධිකාරි කොට්ඨාසයේ තැපැල් කාර්යාල 04ක් සහ උප තැපැල් කාර්යාල 17ක් තිබෙනවා. කිලිනොච්චිය ප්‍රාදේශීය තැපැල් අධිකාරි කොට්ඨාසයේ තැපැල් කාර්යාල 04ක් සහ උප තැපැල් කාර්යාල 36ක් පවතිනවා. මම කලින් කිව්වා වාගේම එය තැපැල් අධිකාරි කොට්ඨාසයක් පැවැත්වීමට තරම් ප්‍රමාණවත් නොවන නිසා කොට්ඨාස දෙකේම රාජකාරි වවුනියාව ප්‍රාදේශීය තැපැල් අධිකාරිය යටතට පවරා තිබෙනවා.

(ආ) (i) තැපැල් බෙදා හැරීමේ කටයුතු සඳහා මේ වනවිට ප්‍රවාහන පහසුකම් නොමැති දිස්ත්‍රික්ක නැත.

(ii) වවුනියා දිස්ත්‍රික්කය වෙත වෑන් රථ දෙකක් ලබා දී ඇති අතර, එම වෑන් රථ මඟින් වවුනියාව තැපැල් කාර්යාලයේ සිට තලෛයිමන්නාරම, වවුනියාව හා මුලතිව් තැපැල් කාර්යාලය දක්වා තැපැල් ප්‍රවාහනය කරනවා.

තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අඩුපාඩුවක්ව තිබුණු ප්‍රවාහන කටයුතු සම්පූර්ණ කරන්න අපි පසුගිය කාලයේ කටයුතු කළා. ඒ අනුව නව ලොරි රථ 10ක් සහ කෲ කැබ් රථ 20ක් ලබා

දුන්නා. මේවායින් අදාළ තැන්වලට ප්‍රවාහන පහසුකම් සලසමින් ඉන්නවා. ඊට අමතරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ ලංගම මඟිනුත් මේ ප්‍රවාහන කටයුතු සලසා ගන්නවා.

(ඇ) අදාළ නොවේ.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ அமைச்சர் அவர்களே, வாடகைக் கட்டிடங்களில் இயங்கும் அஞ்சல் அலுவலகங்கள் தொடர்பாக என்னால் 2026.04.08ஆம் திகதியன்று கேட்கப்பட்ட வாய்மூல விடைக்கான வினாவின்போது கேட்கப்பட்ட இரண்டாவது மேலதிக வினாவில், முல்லைத்தீவு மற்றும் மன்னாருக்குரிய அஞ்சல் பரிவர்த்தனை வாகனங்கள் தொடர்பில் கேள்வி எழுப்பியிருந்தேன். மிக விரைவாக மேற்படி வாகனங்கள் முல்லைத்தீவு மற்றும் மன்னார் மாவட்டங்களுக்கு வழங்கப் படுமென அன்றைய நாள் மாலைப்பொழுதிலேயே தங்களுடைய பிரதி அமைச்சர் கௌஷல்யா ஆரியரத்ன அவர்கள் குறிப்பிட்டிருந்தார். அதற்கு அமைவாக, மன்னாருக்கு உடனடியாக குறித்த வாகனம் வழங்கப்பட்டபோதும், முல்லைத்தீவுக்கு வாகனம் வழங்கப்படுவதில் ஒரு மாத காலமாக இழுபறி நிலை நீடிக்கிறது.

மாகாண அளவிலான அஞ்சல் சேவை வழங்கலிலும் முல்லைத்தீவு சமத்துவ நிலையில் இன்றுவரை அணுகப் படவில்லை என்பதற்கு இதுவும் ஒரு சான்று என்பதை தங்களுக்குக் கூறிக் கொள்கின்றேன். மேலும், காலதாமதமின்றி வவுனியாவிலிருந்து முல்லைத்தீவுக்குரிய அஞ்சல் பரிவர்த்தனை வாகனத்தை வழங்குவதற்கு தங்களின் விசேட தலையீட்டை மீண்டும் ஒரு முறை கோரி நிற்கின்றேன். இது தொடர்பான தங்களின் பதிலை எதிர்பார்க்கின்றேன். நீங்கள் மன்னாருக்கு வாகனம் அனுப்பியதற்கு நன்றி கூறுகின்றேன். முல்லைத்தீவுக்கு வழங்குவதற்கு ஒழுங்கு செய்யப்பட்ட வாகனம் யாழ்ப்பாணத்தில் இருப்பதாக நான் அறிகின்றேன். இருந்தாலும், எல்லா மாவட்டங்களையும் சமத்துவமாகப் பார்க்க வேண்டும். இவ்வாறான செயற்பாடுகளால்தான் முல்லைத்தீவு பின்னோக்கிச் செல்கின்றது என்ற விடயத்தை உங்களுக்குச் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු මන්ත්‍රීතුමා, අපි තැපැල් ප්‍රවාහනය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ ලොරි රථ යොදාගෙන ප්‍රධාන මාර්ග පහකින් මේ බෙදා හැරීම් කටයුතු සිදු කරනවා. ඒ අනුව අපේ ප්‍රධාන ලොරි රථ මඟින් වවුනියාව මාර්ගයේ වවුනියාව, කිලිනොච්චිය, යාපනය දක්වා ආවරණය කරනවා. මඩකලපුව මාර්ගයේ කොළඹ, කුරුණෑගල, මාතලේ, අනුරාධපුරය, පොළොන්නරුව, මඩකලපුව ආවරණය කරනවා. බදුල්ල මාර්ගයේ කොළඹ, රත්නපුර, බදුල්ලත්, පුත්තලම මාර්ගයේ කොළඹ, ගම්පහ, පුත්තලමත්, මාතර මාර්ගයේ දකුණු කොටසත් ආවරණය කරනවා. එතැනින් එහාට අපේ crew cabs සහ අනෙකුත් රථවලින් තමයි ප්‍රවාහන කටයුතු කරන්නේ. කෙසේ නමුත් දැනට මේ ප්‍රවාහන අවශ්‍යතාවන් සම්පූර්ණ කරගෙන යන නිසා මේ දිස්ත්‍රික්කවල තිබෙන ඉල්ලීම් පිළිබඳව සලකා බලන්න පුළුවන්. ඊළඟ අවුරුද්දේ අය වැයේදී අපි තව වාහන ප්‍රමාණයක් මිලදී ගන්නට සැලසුම් කර තිබෙනවා.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

முல்லைத்தீவு மாவட்டத்துக்குள் மட்டும் அஞ்சல் அலுவல கங்களில் தற்போது எட்டு ஊழியர்கள் பதிவுசெய்யப்பட்ட பதிலாளிகளாக இயங்குகின்றனர். கடந்த காலங்களில் இவ்வாறான பதிவுசெய்யப்பட்ட பதிலாளிகளுக்குரிய அஞ்சல் உதவியாளர் நியமனம் காலதாமதமின்றி வழங்கப்பட்ட நிலையில், தற்போது அவர்கள் தங்களுக்குரிய நியமனத் துக்காக நீண்டகாலம் காத்திருக்க வேண்டிய நிலை காணப்படுகின்றது.

இவ்வாறாகப் பதிவுசெய்யப்பட்ட பதிலாளிகளுக்குத் தாங்கள் கூறும் பதில் என்ன? இவர்களுக்குரிய நியமனங்கள் அனைத்தும் தேக்க நிலையின்றி இவ்வாண்டே வழங்கப்படும் வாய்ப்பு உள்ளதா? இது தொடர்பில் நீங்கள் ஏற்கனவே சில விடயங்களைக் குறிப்பிட்டு இருந்தாலும், இதற்கு விரிவான பதிலை எதிர்பார்க்கின்றேன். அவ்வாறு நியமனம் வழங்கப்படும்போது, அவர்களின் கடந்த கால சேவைக்காலம் கருத்திற்கொள்ளப்படுமா? இவற்றுக்கு கௌரவ அமைச்சர் அவர்கள் பதிலளிக்க வேண்டுமென தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

තැපැල් දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සෑහෙන්න දුරට අඩපණ වෙලායි තිබුණේ. පසුගිය වසර එකහමාර තුළ අපි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කළා. විශේෂයෙන්ම තැපැල් ආදේශකයින් 1,000ක් බඳවා ගැනීමට අපි කටයුතු කරමින් යනවා. ඒ අනුව ඔබතුමා කියන අඩුපාඩු සම්පූර්ණ වෙයි. මොකද, ඒ අය ගොඩක් කාලයක් බලාගෙන සිටියා. ඔවුන්ට රජයේ සේවයට ඇවිල්ලා කටයුතු කරන්න අවස්ථාව තිබෙනවා.

## දෙහිවල ජාතික සත්වෝද්‍යානය: අපද්‍රව්‍ය බැහැර කිරීම
## தெஹிவளை, தேசிய மிருகக்காட்சிச்சாலை: கழிவகற்றுதல்
## NATIONAL ZOOLOGICAL GARDENS, DEHIWALA: WASTE DISPOSAL

1471/2025

**8. ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දෙහිවල, ජාතික සත්වෝද්‍යානයේ කැළි කසළ බැහැර කිරීම විධිමත් පරිදි සිදු නොවන බව දන්නේද;

(ii) සත්වෝද්‍යානය නරඹන්නන්ට ආහාර ගැනීම සඳහා මේ වනවිට පවතින ස්ථාන ඒ සඳහා සුදුසු යැයි පිළිගන්නේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා නිසි ස්ථානයක් ඉදිකිරීමට අපේක්ෂා කරන්නේද;

[ගරු චානක මාදුගොඩ මහතා]

(iv) සත්වෝද්‍යානයේ මාසික ආදායම සහ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) සත්වෝද්‍යානයේ ඉදිරියේදී සිදු කිරීමට නියමිත නවීකරණ කටයුතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தெஹிவளை, தேசிய மிருகக்காட்சிச்சாலையின் கழிவுகள் முறையாக அகற்றப்படுவதில்லை என்பதை அறிவாரா என்பதையும்;

(ii) மிருகக்காட்சிச்சாலையைப் பார்வையிட வருப வர்கள் உணவருந்துவதற்காக தற் போதுள்ள இடங்கள் அதற்குப் பொருத்த மானவை என்று ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iii) இன்றேல், அதற்குப் பொருத்தமான இட மொன்றை நிர்மாணிக்க எதிர்பார்க்கப் படுகின்றதா என்பதையும்;

(iv) மிருகக்காட்சிச்சாலையின் மாத வருமானம் மற்றும் செலவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(v) எதிர்காலத்தில் மிருகக்காட்சிச்சாலையில் மேற் கொள்ளப்படவுள்ள நவீனமயப்படுத்தல் பணிகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he is aware that waste disposal is not being carried out properly at the National Zoological Gardens, Dehiwala;

(ii) whether the existing dining facilities for zoo visitors are considered fit for their intended purpose;

(iii) if not, whether it is intended to construct a suitable place for that purpose;

(iv) separately, the monthly income and expenditure of the zoo; and

(v) the future renovation work to be carried out at the zoo?

(b) If not, why?

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Anton Jayakody - Deputy Minister of Environment)

ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) • කැළි කසළ බැහැර කිරීම විධිමත්ව සිදු කරනු ලබයි.

• දෙහිවල සත්වෝද්‍යානය තුළ ජනනය වන අපද්‍රව්‍ය විධිමත් හා පරිසර හිතකාමී ක්‍රමවේදයන් යටතේ කළමනාකරණය කරනු ලබන අතර, එම ක්‍රියාවලිය තුළ අපද්‍රව්‍ය වර්ගීකරණය, ප්‍රතිචක්‍රීකරණය හා ආරක්ෂිත බැහැර කිරීම පහත පරිදි සක්‍රියව ක්‍රියාත්මක වේ.

**1. සත්ව මළ අපද්‍රව්‍ය කළමනාකරණය**

සත්වෝද්‍යානය තුළ ජනනය වන සත්ව මළ අපද්‍රව්‍ය සෘජුව බැහැර නොකර, කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගනු ලැබේ. විශේෂයෙන් අලි වසුරු, වසුන් ද්‍රව්‍ය -bedding materials/mulch - ලෙස සකස් කර ගෝනපොළ සහ කහපොළ ගොවිපළවල කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතයට ගනු ලැබේ.

**2. ඉතිරි වන සත්ව ආහාර කළමනාකරණය**

සත්වයන්ට ලබා දීමෙන් අනතුරුව ඉතිරි වන ආහාර ද්‍රව්‍ය කාබනික ස්වභාවයේ බැවින්, එම ද්‍රව්‍යද කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගනු ලැබේ. තවද, මස් ආශ්‍රිත අපද්‍රව්‍ය, එනම් මස් කටු වැනි දෑ නිසි ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූලව දාහකය - incinerator - මඟින් දහනය කරනු ලැබේ.

අතිරේක වශයෙන් ඉදිරියේදී කාබනික අපද්‍රව්‍ය කාර්යක්ෂමව පොහොර බවට පත් කිරීමේ අරමුණින් Black Soldier Fly larvae භාවිත කරමින් නවීන ජීව විද්‍යාත්මක ක්‍රමවේදයක් යටතේ නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**3. පොලිතීන් ආශ්‍රිත අපද්‍රව්‍ය කළමනාකරණය**

සත්වෝද්‍යානය තුළ ජනනය වන පොලිතීන් ආශ්‍රිත අපද්‍රව්‍ය වෙන් කර, එකතු කර අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලැබේ.

**4. ප්ලාස්ටික්, වීදුරු සහ කාඩ්බෝඩ් අපද්‍රව්‍ය**

ප්ලාස්ටික් බෝතල්, වීදුරු සහ කාඩ්බෝඩ් වැනි ද්‍රව්‍ය වෙන් කර, එකතු කර ඒවා අදාළ එකතු කිරීමේ සහ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන වෙත භාරදෙනු ලැබේ.

**5. කරදියාන කසළ අංගණය වෙත කසළ බැහැර කිරීම**

දෙහිවල සත්වෝද්‍යානයේ කසළ දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව මඟින් පාලනය වන කරදියාන කසළ අංගණය වෙත බැහැර කිරීම සඳහා ගිවිසුම්ගත වී ඇති අතර, මෙම ගිවිසුම යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ලැබේ.

(ii) ඔව්.

I. නරඹන්නන්හට මිලදී ගන්නා ආහාර වර්ග එම ස්ථානයේ සිටම සුව පහසුවට ආහාරයට ගැනීමට හැකි වන පරිදි ප්‍රධාන ආපන ශාලාව සහ සුබසාධක අළෙවි සැල පිහිටුවා ඇත.

II. කෙටි කෑම වර්ග හා පාන වර්ග මිලදී ගැනීම සඳහා අලෙවි සැල් 7ක් පමණ ස්ථාපිත කර ඇත.

III. මෙයට අමතරව නරඹන්නන් විසින් රැගෙන එන ආහාර වර්ග ඔවුන්ට පහසුවෙන් භුක්ති විඳිය හැකි වන පරිදි කූඩාරම් - summer huts - ඉදි කර ඇති අතර, පානීය ජල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් ද ස්ථාපිත කර ඇත. එසේම විශාල පිරිසකට එකවර ඔවුන් රැගෙන එන ආහාර අපහසුවකින් තොරව භුක්ති විඳීම සඳහා අලි රංග පීඨය 1 හා 2 ද භාවිත කළ හැක. මෙයට අමතරව හංස විල, මුව අරණ ඉදිරිපිට, බෙංගාල ව්‍යාඝ්‍ර අරණ සහ මුහුදු සිංහ රංග පීඨය වැනි ස්ථාන වලද විශාල ප්‍රමාණයකට ආහාර ගැනීමට පහසුකම් සලසා ඇත.

IV. මෙම ස්ථාන අතරින් දැනට සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කලාප කිහිපයක් පමණක් මහජනයාට තාවකාලිකව වසා ඇති අතර, ඉතිරි සියලුම ස්ථාන වසර පුරාම ජනතාවට විවෘතව පවතී.

(iii) * නැත.

* අලුතින් ස්ථාන ඉදිකිරීම අවශ්‍ය නොවේ. නමුත් මෙම ස්ථානවල අලුත්වැඩියා සහ සංවර්ධන කටයුතු වාර්ෂිකව සහ කාලීන අවශ්‍යතා මත සිදු කෙරේ. වාර්ෂික ප්‍රතිපාදන යටතේ මෙම ස්ථාන නවීකරණය වාර්ෂිකව සිදු කරනු ලැබේ.

(iv) මාසික ආදායම සහ වියදම මෙසේයි.

| Year | Month | Income | Recurrent Expenditure |
|---|---|---|---|
| 2025 | January | 22,660,785.12 | 20,704,755.75 |
| | February | 18,928,710.09 | 20,784,523.75 |
| | March | 19,366,766.49 | 23,123,675.65 |
| | April | 20,974,847.39 | 26,893,422.40 |
| | May | 15,778,302.20 | 74,708,079.17 |
| | June | 19,957,946.59 | 35,611,684.76 |
| | July | 29,566,593.34 | 24,015,541.27 |
| | August | 57,903,751.73 | 31,562,320.95 |
| | September | 33,451,319.44 | 38,241,033.48 |
| | October | 18,619,536.94 | 34,022,870.21 |
| | November | 26,325,815.25 | 35,555,085.42 |
| | December | 20,444,761.88 | 66,400,742.78 |
| 2026 | January | 23,182,169.85 | 18,825,497.51 |
| | February | 20,633,180.35 | 41,659,867.68 |
| | March | 19,567,025.41 | 30,192,671.21 |

(v) දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ 2026 වසරේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති පහත සඳහන් කර ඇත.

Department of National Zoological Gardens
Action Plan - 2026 - Zoo Development and Welfare Fund

| **Vote Particulars of Allocation** | Activity No. | Activities | Allocation 2026 (Rs.Mn) |
|---|---|---|---|
| **6/26/25** | **1** | **Development of Dehiwala Zoological Garden** | **218.00** |
| | i | Removal of Hazardous wire - Continuation (Continuation of underground cabling project) | 82.00 |
| | ii | Muster room | 41.20 |
| | iii | Road no. 07 - Phase 02 | 34.75 |
| | iv | Renovation of quarters | 25.00 |
| | v | CCTV camera system | 10.00 |
| | vi | Improvements of Hippo treatment plant | 2.00 |
| | vii | Animal enclosure, staff and visitor facility developments | 3.25 |
| | viii | Animal enclosure, staff and visitor facility developments - 2025 payments | 3.80 |
| | ix | Removal of Hazardous wires - Phase 2 - Designing | 1.00 |
| | x | Aquarium development - Structural assessment and designing | 5.00 |
| | xi | No 05 - area development - Designing | 1.00 |
| | xii | Development of quarry area - Cleanup and embankment repair and surrounding area - Designing | 1.00 |
| | xiii | Construction of retaining wall for keepers access near quarry area | 1.00 |
| | xiv | Service area development - Designing | 1.00 |
| | xv | Animal Quarantine Centre at Gonapola - Designing | 1.00 |
| | xvi | Hydrotherapy Unit - Designing | 4.0 |
| | xvii | Repair works of boundary wall | 1.0 |

[ගරු ඇන්ටන් ජයකොඩි මහතා]

Department of National Zoological Gardens
Action plan - 2026 - Consolidated Fund

| Vote Particulars of Allocation | Activity No. | Activities | Allocation 2026 (Rs. Mn) |
|---|---|---|---|
| 1 | | Development of Dehiwala Zoo | 70.00 |
| 1-2001 | | Buildings and structures (Repairs/renovations) | 22.00 |
| | i | Renovation of animal enclosures and visitor facilities | 21.00 |
| | ii | Small-scale repairs (Annually) | 1.00 |
| 1-2104 | | Building and structures (Constructions) | 18.00 |
| | i | Construction of Toilet Complex - continuation | 17.00 |
| | ii | Small-scale development | 1.00 |
| 1-2105 | | Land and land improvements | 15.00 |
| | i | Kahapola Farm land development | 3.00 |
| | ii | Gonapola Farm land development | 2.00 |
| | iii | Construction of animal holding area at Gonapola | 10.00 |
| 1-2506 | | Infrastructure Development | 15.00 |
| | i | Road no. 07 repair - Phase 01 | 13.70 |
| | ii | Worker facility development | 1.30 |

(ආ) අදාළ නොවේ.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා එම පිළිතුර ලබා දීම සම්බන්ධව. මීට මාස 4කට පමණ පෙර මම ඒ සත්තු වත්තට ගියා. හැබැයි, ඔබතුමා කියන කැළි කසළ කළමනාකරණය සම්බන්ධයෙන් අපට සෑහීමට පත් වෙන්න බැහැ. අපි දැක්කා, තැන තැන කැළි කසළ තිබෙනවා. ඒ වාගේම, ජලයට මුසු වෙච්ච කැළි කසළ තිබෙනවා අපි දැක්කා. ඒ වාගේම පෙර තිබුණු දැකුම්කලුභාවය පිළිබඳ ගැටලුවක් තිබෙනවා, දෙහිවල සත්තු වත්තට ගිහින් බලන කොට. ඒ නිසා මම විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය තවදුරටත් යොමු කරන්න කියා ඉල්ලා සිටිනවා, එහි දැකුම්කලුභාවය සහ කැළි කසළ සම්බන්ධයෙන්.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. වෙනත් දියුණු රටවල තිබෙනවා වඳ වී යෑමේ තර්ජනයට ලක් වූ සතුන් බෝ කිරීමේ විශේෂ පර්යේෂණ ඒකක. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, වෙනත් රටවල තිබෙනවා වාගේ අපේ රටේත් වඳ වී යන සතුන් බෝ කරන්න, එහෙම නැත්නම් ඒ සතුන් ආරක්ෂා කරන්න යම් පර්යේෂණ ඒකකයක් දෙහිවල සත්වෝද්‍යානය තුළ ස්ථාපනය කරනවාද, එවැන්නක් කිරීමේ බලාපොරොත්තුවක් තිබෙනවාද කියන ප්‍රශ්නය.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු විධියටම කැළි කසළ සම්බන්ධ කාරණය විශේෂ අවධානයට යොමු කරන්නම්. ඒ වාගේම, ගල්වළ ප්‍රදේශයේ තිබෙන ජලය පිරිච්ච tank එකට විශාල අපද්‍රව්‍ය ප්‍රමාණයක් එකතු වෙනවා. මේ වන කොට අපි Clean Sri Lanka එකත් එක්ක එකතු වෙලා එය develop කිරීම සඳහා, එය හොඳ තත්ත්වයකට පරිවර්තනය කර ගැනීම සඳහා අවශ්‍ය කරන කටයුතු සූදානම් කරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් ගොඩක් වෙලාවට ඒ කෙරෙහි දැඩි අවධානයක් යොමු කර තිබෙනවා. දැන් එම කැළි කසළ බැහැර කිරීම ඉතාම නිසි ආකාරයෙන් සිද්ධ වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රධාන කර්තව්‍යයන් 5ක් කෙරෙනවා. ඒවා තමයි සත්ව සුබසාධනය, සත්ව අභිජනනය සහ සංරක්ෂණය, අධ්‍යාපන පර්යේෂණ, විනෝදාස්වාදය සහ ආදායම් ඉපැයීම. ඔබතුමා මතු කළ කාරණය අයත් වන්නේ මෙහි දෙවැනි කොටසට. ඒ යටතේ අපි විශේෂයෙන්ම අපේ රටේ කඳුකර කොටින් සම්බන්ධයෙන් අභිජනන වැඩසටහනක් ක්‍රියාත්මක කළා. එහිදී අභිජනනයට අවශ්‍ය කරන සිංචනය සිදු කරලා ඒ වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා. නමුත්, එහි පළමුවැනි ප්‍රයත්නය අසාර්ථක වුණා. මේ වනකොට ඊළඟට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරමින් යනවා. ඊට අමතරව, අනෙකුත් සතුන් සඳහාත් එවැනි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

බෙහෙවින් ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒ වාගේම, වයස්ගත හා රෝගී සතුන් වෙනුවෙන් සෞඛ්‍ය කළමනාකරණය පිළිබඳව විශේෂ අවධානය යොමු කරලා, වයස්ගත සතුන් පිළිබඳව, රෝගී සතුන් පිළිබඳව යම් වැඩ පිළිවෙළක් සත්තු වත්ත තුළ ක්‍රියාත්මක වෙනවා ද කියලාත් දැනගන්න කැමැතියි.

**ගරු ඇන්ටන් ජයකොඩි මහතා**
(மாண்புமிகு அன்ரன் ஜயக்கொடி)
(The Hon. Anton Jayakody)

ඇත්තටම වයසක සහ රෝගී සතුන් බලා ගැනීමේ වෙනම ක්‍රියාවලියක් තිබෙනවා. වියදම් සම්බන්ධයෙන් මා ඔබතුමාට ඉදිරිපත් කරපු කරුණු ඉතාම පැහැදිලියි, ගරු මන්ත්‍රීතුමනි. ගොඩක් වෙලාවට අපට යන වියදම්වලින්, Recurrent Expenditureවලින් සැලකිය යුතු මුදලක් මේ සඳහා වැය වෙනවා; විශේෂයෙන්ම බෙහෙත් ලබා ගැනීම සඳහා, බෙහෙත් වර්ග සහ ඊට අවශ්‍ය කරන පහසුකම් ලබා ගැනීම සඳහා වැය වෙනවා. එහි යම් හෝ අඩුපාඩුවක් තිබෙනවා නම් නැවත ඒ පිළිබඳව අවධානය යොමු කරන්නම්.

## ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති: වවුනියාව දිස්ත්‍රික්කය
சமுதாய நீர் வழங்கல் கருத்திட்டங்கள்: வவுனியா மாவட்டம்
COMMUNITY WATER SUPPLY PROJECTS: VAVUNIYA DISTRICT

1823/2026

**9. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එසේ නම්, මේ වන විට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු කවරේද;

(iv) එම ව්‍යාපෘති අතරින් ජනතාවට ජලය සපයන ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(v) එම ජල ව්‍යාපෘතිවලින් ප්‍රතිලාභ ලබන ප්‍රදේශ කවරේද;

(vi) මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින ජල සැපයුම් ව්‍යාපෘති තිබේද;

(vii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(viii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(ix) එම ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති සක්‍රිය මට්ටමට ගෙන ඒම සඳහා කටයුතු කරන්නේද;

(x) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வவுனியா மாவட்டத்தில் சமுதாய நீர் வழங்கல் கருத்திட்டங்கள் அமுல்படுத்தப்படுகின்றனவா;

(ii) ஆமெனில், தற்போது அமுல்படுத்தப்பட்டு வருகின்ற கருத்திட்டங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) மேற்படி கருத்திட்டங்கள் பற்றிய தகவல்கள் யாவை என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டங்களில் மக்களுக்கான நீர் வழங்கல் கருத்திட்டங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) மேற்படி நீர் வழங்கல் கருத்திட்டங்களினால் பயனடையும் பிரதேசங்கள் யாவை என்பதையும்;

(vi) தற்போது அமுலாக்கப்படாத நிலையிலுள்ள நீர் வழங்கல் கருத்திட்டங்கள் உள்ளனவா என்பதையும்;

(vii) ஆமெனில், அக்கருத்திட்டங்கள் யாவை என்பதையும்;

(viii) மேற்படி கருத்திட்டங்கள் அமுலாக்கப்படாமைக் கான காரணங்கள் யாவை என்தையும்;

(ix) அவ்வாறு அமுலாக்கப்படாத கருத்திட்டங்களைச் செயற்பாட்டுக்குக் கொண்டுவர நடவடிக்கை மேற்கொள்ளப்படுமா என்தையும்;

(x) ஆமெனில், அந்தத் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Housing, Construction and Water Supply:

(a) Will he inform this House -

(i) whether community water supply projects are being implemented in the Vavuniya District;

(ii) if so, the number of such projects currently in operation;

(iii) the details of the projects;

(iv) the number of projects providing water to the public, out of those projects;

(v) the areas benefiting from the water projects referred to above;

(vi) whether there are any water supply projects that are not currently operational;

(vii) if so, such projects;

(viii) the reasons for those projects not being operational;

(ix) whether action will be taken to bring those non-operational projects into operation; and

(x) if so, the date?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ව්‍යාපෘති 73ක් ක්‍රියාත්මක වෙමින් පවතී.

(iii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, එම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු මෙසේයි.

- වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 36
- වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 16
- වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 11
- වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 09
- වෙඩ්ඩිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 01

මෙම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව ඇමුණුම 1 මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) ව්‍යාපෘති 50කි.

(v) 1. **වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ නම්,**

මරක්කරම්පලෙයි, ඊච්චංකුලම්, කාලික්කුලම්, ඕමන්තයි, පරනද්දකල්, සස්තිරිකූලන්කුලම්, 224 ආසිකුලම්, චෙක්කඩිපිලවු, මාකිලන් කුලම්, කාන්තපුරම්, කතරසින්නකුලම්, මහරම්බයිකුලම්, මලනකුලම්, ආසිකුලම්, සමනංකුලම, මූන්රුමුරිප්පු, පූවරසන්කුලම්, පඹයිමඩු,රාසෙන්දිරන්කුලම්, චෙක්කඩිපුලවු, තර්සින්නකුලම්, යාය 07, ස්ලම්බයිකුලම්, මරුතන්කුලම්,ඉරසෙන්දිරකුලම්,සමන්කුලම්, කල්ලිකුලම්, පරණදහල්.

2. **වෙන්ගලචෙඩ්ඩිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ නම්,**

පෙරියතම්පනෙයි, කන්දසාමි නගර්, පාවට්කුලම් ඒකකය 02, ආණ්ඩියපුලියන් කුලම්, පෙරියපුලියන්කුලම්, කන්කන්කුලම්, සින්නප්පිකුලම්,මාන්කුලම්, සුදුවෙන්තාපුලවු, පිරමනලන්කුලම්, පෙරියකට්ටු.

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

3. **වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ නම්,**

මදුකාන්ත, කුඩකච්චාකොදා, අවරන්තලාව, පිරප්පන්මඩුව, පුතුපුලන්කුලම, පෙරියඋලුක් කුලම්, අවුසතාපිටිය, අග්බෝපුර.

4. **වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ නම්,**

පරන්තන්, සින්නදම්පන්, සින්නදඹ, නයිනමඩු, පුලියන්කුලම උතුර, මරුතෝඩෙයි, පරසන්කුලම්, පද්දිකුඩිඉරිප්පු.

5. **වෙඩිඩිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ නම්,**

මුතාලියකුලම්.

(vi) ඔව්.

(vii) දැනට ක්‍රියාත්මක නොවන ජල ව්‍යාපෘති 23ක් ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එම ව්‍යාපෘති මෙසේයි.

1. වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 12
2. වෙන්ගලචෙඩිඩිකුලම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 05
3. වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 01
4. වවුනියාව උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 04
5. වෙඩිඩිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ව්‍යාපෘති - 01

මෙම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු සවිස්තරාත්මකව ඇමුණුම 2 මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම් 1 සහ 2 **සභාගත*** කරමි.

(viii) එම ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීමට හේතු ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට නොව, පොදු හේතු විධියට මම ඉදිරිපත් කරන්නම්.

1. ලක්ෂයකට ආසන්න හිඟ විදුලි බිල්පත් පවතින බැවින්, විදුලි සබඳතාව විසන්ධි කර තිබීම.
2. ජල පිරිපහදු මධ්‍යස්ථාන සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අරමුදල් ප්‍රජා මූල සංවිධාන සතුව නොමැති වීම.
3. සමහර ප්‍රදේශවල ජල සමිති පවත්වාගෙන යෑමට අවශ්‍ය ප්‍රජා දායකත්වය සහ උනන්දුව ඉතා අවම මට්ටමක පැවතීම.
4. පද්ධතිවල පවතින කාන්දු සහ අක්‍රමිකතා නියමිත වේලාවට පිළිසකර කිරීමට නොහැකි වීම.
5. ඇතැම් ජල මූලාශ්‍රවල ජල මට්ටම පහත වැටීම.
6. යන්ත්‍රෝපකරණ පැරණි වීම සහ ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම නිසා ජනතාවට පිරිසිදු පානීය ජලය සැපයීමට නොහැකි වීම.
7. ඇතැම් ප්‍රදේශවල ප්‍රජා ජල ව්‍යාපෘති අතහැර දමා ජනතාව පෞද්ගලික මට්ටමෙන් වෙනත් ක්‍රම ඔස්සේ ජලය ලබා ගැනීමට පෙලඹීම.

(ix) සක්‍රිය කිරීමට හෝ එසේ නොමැති නම් සුදුසු ජල සම්පාදන ක්‍රමයක් සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලබයි.

(x) ඉදිරි වසර දෙක ඇතුළත මෙම ව්‍යාපෘති සක්‍රිය මට්ටමට ගෙන ඒම සඳහා කටයුතු කරනු ලබයි.

(ආ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி. கௌரவ அமைச்சர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

சமுதாய நீர் வழங்கல் திட்டம் எங்களுடைய வரண்ட பிரதேசங்களுக்கு மிகவும் முக்கியமானது. ஆனால், கடந்த காலங்களில் உருவாக்கப்பட்ட பல சமுதாய நீர் வழங்கல் திட்டங்கள் மக்களுடைய உண்மையான தேவையை அறிந்து உருவாக்கப்படவில்லை என்பதை ஏற்றுக்கொள்ளத்தான் வேண்டும். இவ்வாறான பொறுப்பற்ற கடந்த காலச் செயற்பாடுகளால் இந்த நாட்டினுடைய பாரிய நிதி வளம் தேவையற்ற வகையில் செலவு செய்யப்பட்டு இருக்கிறது. செயற்படுத்தப்படாமல் இருக்கின்ற திட்டங்கள் மில்லியன் கணக்கான ரூபாய் அல்ல, பல கோடிக்கணக்கான ரூபாய் செலவில் உருவாக்கப்பட்ட திட்டங்களாகும். அவற்றைச் செயற்படுத்த முடியாமைக்கான பொதுவான காரணங்களை நீங்கள் சொல்லியிருக்கிறீர்கள். ஒவ்வொரு திட்டத்தையும் ஆராய்ந்து, அவை செயற்படாமைக்குரிய காரணம் என்ன என்பதைக் கண்டறிய விசேட குழுவொன்றை நியமிக்க முடியுமா? என கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ඔබතුමාගේ කරුණු පැහැදිලි කිරීම හරි. මේ ප්‍රජා ජල දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වන ග්‍රාමීය ජල ව්‍යාපෘතිවල ගැටලුවක් තිබෙනවා. ප්‍රජා ජල දෙපාර්තමේන්තුව මඟින් මෙහෙය වන, නඩත්තු කරන ප්‍රජා ජල ව්‍යාපෘති 4,000ක් පමණ - 3,800කට වැඩි ප්‍රමාණයක් - ලංකාව පුරා තිබෙනවා. එයින් 2,000ක් විතරම මේ වාගේ ගැටලුසහගත තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒකට මූලික හේතුව වෙලා තිබෙන්නේ මේ ප්‍රජා ජල දෙපාර්තමේන්තුව දෙපාර්තමේන්තුවක් බවට පත් කරලා තිබුණාට එයට අදාළ බලාත්මක පනතක් නැතිකම. ඒ වාගේම එහි කාර්ය මණ්ඩල නැහැ. ඒ වාගේම තාක්ෂණික හැකියාව සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා, ඒ දෙපාර්තමේන්තුවේ. ඒ නිසා මන්ත්‍රීතුමා අපි දැනටමත් ඒ ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම සඳහා පනත සකස් කරලා ඉවරයි. අපි බලාපොරොත්තු වෙනවා නුදුරේදීම පාර්ලිමේන්තුවට ගේන්න ඒ පනත. පනත සම්මත කරන්න ඕනෑ. පනත සම්මත කළාට පස්සේ තමයි මේ ප්‍රජා ජල සමිතිවලට මැදිහත් වීමේ බලයක්, අයිතියක් එන්නේ රජයට. ඒ දෙපාර්තමේන්තුවට තාක්ෂණික හැකියාව නැති වුණත්, මුදල්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තිබෙනවා. අපි ඒ දෙපාර්තමේන්තුවට මුදල් වෙන් කරලා තිබෙනවා. නමුත් ඒ මුදල් පාවිච්චි කරලා මේ සමිතිවල තිබෙන අඩුපාඩු සකස් කරගන්න බැරි වෙලා තිබෙනවා දෙපාර්තමේන්තුවට. එහි තාක්ෂණික හැකියාවේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සඳහා අපි විසඳුම් යොදලා තිබෙනවා, දෙපාර්තමේන්තුවේ ව්‍යුහාත්මක වෙනස්කම් කරන්න. අපි දැනටමත් කැබිනට් මණ්ඩලය විධියට ඒ සම්බන්ධයෙන් තීන්දු තීරණ අරගෙන තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරමින් තිබෙනවා. අපි නුදුරේදීම, මාස කීපයක් ඇතුළත මේවා විසඳීමට අදාළ වැඩ පිළිවෙළ සකස් කරන්න පොරොන්දු වෙනවා.

ගරු මන්ත්‍රීතුමා, ප්‍රජා ජල සැපයුම් පිළිබඳව සොයා බලන්න මම දිස්ත්‍රික්ක කීපයකට ගියා. වවුනියාව දිස්ත්‍රික්කයේත් මම ටිකක් බැලුවා. වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රජා ජල ව්‍යාපෘතිවල තිබෙන තත්ත්වය පිළිබඳව සොයා බැලීමට මමත් දවසක පැමිණෙන්නම්. අපි එකතු වෙලා මේ ගැන හොයලා බලලා වැඩ පිළිවෙළක් හදමු.

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

நன்றி, கௌரவ அமைச்சர் அவர்களே! என்னுடைய இரண்டாவது மேலதிக வினாவைக் கேட்கின்றேன்.

வவுனியா மாவட்டத்தில் மேற்கொள்ளப்பட்ட பேராறு நீர்த்தேக்கத் திட்டம் சம்பந்தமாகச் சொல்ல வேண்டும். இந்த நீர்த்தேக்கத் திட்டத்தை உருவாக்குவதற்காக விவசாயத்தை அடிப்படையாகக் கொண்ட குடும்பங்கள் தங்களுடைய விளைபூமிகளை - விவசாய நிலங்களை - தானமாகக் கொடுத்திருக்கிறார்கள். அதன்போது அந்த விவசாயிகளுக்குப் பல உறுதிமொழிகள் வழங்கப்பட்டன. குறிப்பாக, மாற்றுக் காணிகள் வழங்குவதாகச் சொல்லப்பட்டு, அவை வழங்கப்பட்டும் இருக்கின்றன. ஆனால், இன்று 13 வருடங் களாகியும் அந்த மாற்றுக் காணிகளுக்கான வயல் நிலங்களுக்கான உறுதிப்பத்திரங்கள் எதுவும் வழங்கப் படவில்லை. இது முதலாவது விடயம்.

இரண்டாவது, புதிதாக வழங்கப்பட்ட வயல் நிலங்களுக்குச் செல்வதற்கான பாதைகள் அமைத்துக் கொடுக்கப்படுமெனவும் அவர்களுக்கு உறுதிமொழி வழங்கப்பட்டது. எனினும், இன்றுவரை அவை அமைத்துக் கொடுக்கப்படவில்லை. இது தொடர்பாக மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் கேட்டால், அதற்கான நிதி ஒதுக்கப்படும், செய்யப்படும் என்று சொல்கிறார்கள். ஆனால், இன்றுவரை அது செய்யப் படவில்லை. மூன்றாவது, வழங்கப்பட்ட வயல் காணிகளுக்கு மழை காலங்களில் விவசாயிகள் செல்ல முடியாத நிலைமை காணப்படுகின்றது. அந்தப் பாதை வழியாக அணைக்கட்டின் கழிவுநீர் செல்வதால், இங்கிருந்து வயலுக்குப் போனவர்களால் மீண்டும் வர முடியாத நிலையும், இங்கிருந்து வயலுக்கும் போக முடியாத நிலையும் காணப்படுகின்றது. இந்தப் பிரச்சினைக்குத் தீர்வாக அங்கு மேம்பாலமொன்றை அமைத்துத் தருவீர் களானால், அவர்களால் அந்த விவசாய நிலங்களுக்குப் போய் வரக்கூடியதாக இருக்கும். ஏன் இதை உங்களிடம் கேட்கிறேன் என்றால், அந்த விவசாயிகள் இந்த நீர்த்தேக்கத் திட்டத்துக்காகத்தான் தங்களுடைய பாரம்பரிய விவசாய நிலங்களை இழந்தார்கள். எனவே, இந்தப் பிரச்சினையைத் தீர்த்துக்கொடுக்க வேண்டிய பொறுப்பு உங்களுக்கு இருக்கின்றது. ஆகவே, மேற்குறித்த பாதைகளையும், ஆற்றைக் கடந்து செல்வதற்கு மேம்பாலம் ஒன்றையும் உங்களுடைய அமைச்சினூடாக அமைத்துக் கொடுக்க முடியுமா? எனக் கேட்கின்றேன்.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)

ගරු මන්ත්‍රීතුමනි, පේරාවු ජලාශ ව්‍යාපෘතිය බලන්න මම ගියා, සංචාරයක යෙදුණ ගමන්. නමුත් ඔබතුමා ඉදිරිපත් කරපු කරුණු පිළිබඳව මා දැනුවත් කරලා නැහැ. මේක, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයිති ජලාශයක් මිස ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට අයිති ජලාශයක් නොවෙයි. ඔබතුමන්ලා මේ තිබෙන ගැටලු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරලා ලැබෙන නිර්දේශ සහ තොරතුරු අපේ අමාත්‍යාංශයට ලැබීමට සලස්වන්න. ඒ අනුව අපට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග මොනවාද කියලා සොයා බලා කඩිනමින් ක්‍රියාත්මක වෙන්නම්. ඔබතුමා මේ ප්‍රශ්නය නඟපු නිසා ඊට අමතර වශයෙන් මම ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් තිබෙන තත්ත්වය මොකක්ද, ගැටලු මොනවාද, ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග මොනවාද කියා සොයා බලා අදාළ කටයුතු කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 -1854/2026- (1), ගරු රොෂාන් අක්මීමන මහතා.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන වටය.

## පාස්කු ඉරිදා ප්‍රහාරයේ මූලික විමර්ශන සඳහා සම්බන්ධ වූ නිලධාරීන්: ඉවත් කිරීම
## உயிர்த்த ஞாயிறு தாக்குதல் தொடர்பான ஆரம்பக்கட்ட விசாரணைகளில் ஈடுபட்டிருந்த அலுவலர்கள்: நீக்கம்
## OFFICERS INVOLVED IN INITIAL INVESTIGATIONS INTO EASTER SUNDAY ATTACK: REMOVAL

765/2025

**1. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව, එම සිද්ධිය සම්බන්ධයෙන් ආරම්භ කළ විමර්ශන කටයුතු සඳහා මුල් අවස්ථාවලදී සම්බන්ධවූ නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

[ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා]

(ii) එම නිලධාරින් අතරින්, පසුව එම විමර්ශනවලින් ඉවත් කළ නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) එලෙස නිලධාරින් විමර්ශන කටයුතුවලින් ඉවත් කිරීමට හේතු කවරේද;

(iv) ඉහත (ii)හි සඳහන් නිලධාරින් විමර්ශන කටයුතු සඳහා නැවත සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) உயிர்த்த ஞாயிறு தாக்குதலுக்குப் பின்னர், அந்தச் சம்பவம் தொடர்பாக ஆரம்பிக்கப்பட்ட விசாரணை நடவடிக்கைகளின் ஆரம்ப கட்டங்களில் ஈடுபட்டிருந்த அலுவலர்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி அலுவலர்களில், பின்னர் குறித்த விசாரணை நடவடிக்கைகளிலிருந்து நீக்கப்பட்ட அலுவலர்களின் எண்ணிக்கை யாது;

(ii) அவ்வாறு அலுவலர்களை விசாரணை நடவடிக்கைகளிலிருந்து நீக்கியமைக்கான காரணங்கள் யாவை;

(iv) மேற்படி (ii) இல் குறிப்பிடப்பட்டுள்ள அலுவலர் களை விசாரணை நடவடிக்கை களுடன் மீண்டும் இணைத்துக்கொள்ள நடவடிக்கை மேற் கொள்ளப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா;

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) the number of officers who were initially involved in the investigation activities initiated after the Easter Sunday attack;

(ii) out of those officers, the number of officers who were later removed from those investigations;

(iii) the reasons for removing the said officers from the investigation activities; and

(iv) whether steps are taken to re-engage the officers mentioned in (ii) above for the investigation activities?

(b) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් 222කි.

(ii) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් 32කි.

(iii) 2019 නොවැම්බර් 16 දින පැවති ජනාධිපතිවරණයෙන් ජනාධිපතිවරයා දිවුරුම් දීමෙන් පසු, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි එස්. අබේසේකර මහතා ඇතුළු නිලධාරින් 32ක් ස්ථාන මාරු කර ඇති අතර, මෙම විමර්ශනය ඇතුළු රටෙහි ආන්දෝලනාත්මක විමර්ශන 08ක විමර්ශන කටයුතු පවත්වාගෙන ගිය අවස්ථාවක එම විමර්ශන කටයුතු අඩපණ කිරීමේ අදහසින් මෙම ස්ථානමාරු සිදු කර ඇති බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පොලිස්පති වෙත වාර්තා කර ඇත.

(iv) මේ වනවිට විශ්‍රාමික නිලධරයන් සහ පෞද්ගලික හේතූන් මත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට අනුයුක්ත වීමට අකමැති නිලධරයන් හැර, අනෙකුත් නිලධරයන් සම්බන්ධ කරගනිමින් විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

(ආ) පැන නොනඟී.

## 2015 සිට ලියාපදිංචි වී විදෙස්ගත වූ ගෘහ සේවිකාවන්: විස්තර

2015 முதல் புலம்பெயர்ந்த பதிவு செய்யப்பட்ட வீட்டுப் பணிப்பெண்கள்: விபரம்

INDIVIDUALS MIGRATED AS REGISTERED HOUSEMAIDS FROM 2015: DETAILS

815/2025

**2. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු හෙක්ටර් අප්පුහාමි මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி சார்பாக)
(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Hector Appuhamy)

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වූ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඔවුන්ගේ තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්ත පද්ධතියට ඇතුළත් කර තිබේද;

(iv) ඔවුන් අතරින් මියගිය, සිය දිවි නසා ගත් සහ වෙනත් අනතුරු හේතුවෙන් පීඩාවට පත්වී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඔවුන්ගේ සුබසාධනය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வெளிநாட்டலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலா அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு முதல் இற்றைவரை இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தில் பதிவுசெய்து வீட்டுப் பணிப்பெண்களாக வெளிநாடு சென்றுள்ளவர்களின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக யாது;

(ii) மேற்படி எண்ணிக்கை, ஒவ்வொரு நாடு வாரியாக வெவ்வேறாக யாது;

(iii) அவர்களின் தகவல்கள் இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் தரவுத் தளத்தில் பதிவேற்றம் செய்யப்பட்டுள்ளனவா;

(iv) அவர்களில் உயிரிழந்த, தற்கொலை செய்து கொண்ட மற்றும் வேறு விபத்துகள் காரணமாக பாதிக்கப்பட்டுள்ளவர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(v) அவர்களின் நலன்புரிக்காக இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகம் மேற் கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Foreign Affairs, Foreign Employment and Tourism:

(a) Will he inform this House -

(i) the number of individuals who got registered with the Sri Lanka Bureau of Foreign Employment and departed for overseas employment as housemaids each year from 2015 to the present, separately;

(ii) the number of them as per each country, separately;

(iii) whether the details of such individuals have been entered into the data system of the Sri Lanka Bureau of Foreign Employment;

(iv) those individuals, the number who died, committed suicide, or suffered from various accidents, separately; and

(v) the measures that will be taken by the Sri Lanka Bureau of Foreign Employment with regard to the welfare of them?

(b) If not, why?

**ගරු අරුන් හේමචන්ද්‍ර මහතා (විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு அருண் ஹேமச்சந்திரா - வெளிநாட்டலுவல்கள் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்புப் பிரதி அமைச்சர்)

(The Hon. Arun Hemachandra - Deputy Minister of Foreign Affairs and Foreign Employment)

ගරු කථානායකතුමනි, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර සභාගත* කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වූ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් පහත වගුවේ සඳහන් කර ඇත.

| වර්ෂය | ලියාපදිංචි සංඛ්‍යාව |
|---|---|
| 2015 | 74,316 |
| 2016 | 66,480 |
| 2017 | 57,518 |
| 2018 | 66,638 |
| 2019 | 63,582 |
| 2020 | 16,008 |
| 2021 | 31,354 |
| 2022 | 97,089 |
| 2023 | 100,879 |
| 2024 | 93,683 |
| 2025 | 86,080 |
| 2026.03.30 දිනට | 14,182 |
| එකතුව | 767,809 |

(ii) එම සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් පහත ඇමුණුම I හි දක්වා ඇත.

Statistics on Registrations for Domestic Housekeeping Assistant - country wise
From Year 2015 To 2026.03.30 at 4.00 pm

ඇමුණුම I

| | Country | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Kuwait | 22,837 | 17,771 | 23,639 | 31,868 | 28,523 | 5,280 | 8,621 | 52,606 | 42,923 | 52,777 | 55,285 | 8,481 | 350,611 |
| 2 | Saudi Arabia | 28,399 | 24,359 | 11,245 | 13,598 | 12,868 | 2,774 | 9,980 | 24,822 | 39,175 | 22,212 | 13,620 | 2,306 | 205,358 |
| 3 | U A E | 9,280 | 7,728 | 7,243 | 6,080 | 6,275 | 3,522 | 4,200 | 5,525 | 5,823 | 5,476 | 5,423 | 1,062 | 67,637 |
| 4 | Oman | 3,451 | 6,162 | 5,329 | 5,280 | 5,823 | 1,724 | 4,292 | 5,576 | 3,927 | 4,800 | 3,433 | 616 | 50,413 |
| 5 | Qatar | 3,194 | 2,815 | 2,738 | 2,880 | 3,060 | 468 | 894 | 1,896 | 1,970 | 1,820 | 1,731 | 348 | 23,814 |
| 6 | Cyprus | 1,234 | 1,668 | 1,715 | 1,729 | 1,888 | 596 | 1,174 | 2,044 | 2,467 | 2,288 | 2,372 | 452 | 19,627 |
| 7 | Lebanon | 2,000 | 2,073 | 1,931 | 1,785 | 1,583 | 443 | 601 | 1,065 | 979 | 983 | 949 | 176 | 14,568 |
| 8 | Bahrain | 1,144 | 1,131 | 1,078 | 976 | 1,145 | 473 | 890 | 1,364 | 1,270 | 1,375 | 1,197 | 234 | 12,277 |
| 9 | Singapore | 594 | 872 | 898 | 1,013 | 1,003 | 344 | 328 | 824 | 691 | 643 | 653 | 150 | 8,013 |
| 10 | Jordan | 1,090 | 896 | 711 | 626 | 539 | 139 | 144 | 453 | 358 | 361 | 364 | 77 | 5,758 |
| 11 | Hong Kong | 344 | 380 | 458 | 351 | 359 | 107 | 45 | 240 | 302 | 202 | 273 | 53 | 3,114 |
| 12 | Malaysia | 380 | 249 | 207 | 171 | 197 | 49 | 21 | 290 | 541 | 318 | 386 | 116 | 2,925 |
| 13 | Maldives | 114 | 156 | 137 | 151 | 169 | 45 | 105 | 244 | 358 | 350 | 316 | 91 | 2,236 |
| 14 | Israel | 176 | 96 | 50 | 17 | 14 | 4 | 5 | 9 | 7 | 6 | 9 | 1 | 394 |
| 15 | Egypt | 25 | 33 | 36 | 20 | 32 | 11 | 13 | 9 | 10 | 13 | 11 | 2 | 215 |
| 16 | Greece | 5 | 18 | 29 | 15 | 20 | 3 | 11 | 28 | 10 | 10 | 12 | 2 | 163 |
| 17 | Pakistan | 11 | 22 | 24 | 15 | 14 | 4 | 9 | 20 | 19 | 12 | 9 | 4 | 163 |
| 18 | Romania | 0 | 2 | 0 | 1 | 4 | 8 | 5 | 47 | 14 | 8 | 12 | 3 | 104 |
| 19 | Kurdistan | 20 | 22 | 9 | 19 | 17 | 1 | 3 | 1 | 2 | 1 | 2 | 2 | 99 |
| 20 | Seychelles | 1 | 4 | 13 | 13 | 14 | 2 | 5 | 7 | 12 | 13 | 10 | 4 | 98 |

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

| | Country | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2024 | Total |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 21 | Turkey | 1 | 0 | 3 | 5 | 12 | 3 | 1 | 2 | 0 | 5 | 1 | 0 | 33 |
| 22 | Italy | 0 | 2 | 1 | 3 | 8 | 3 | 2 | 3 | 2 | 2 | 1 | 1 | 28 |
| 23 | United Kingdom | 1 | 2 | 2 | 0 | 2 | 0 | 0 | 1 | 4 | 1 | 2 | 0 | 15 |
| 24 | Iraq | 1 | 1 | 3 | 0 | 1 | 0 | 0 | 1 | 4 | 0 | 3 | 0 | 14 |
| 25 | Russia | 0 | 4 | 0 | 4 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 10 |
| 26 | United State | 0 | 1 | 5 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 | 10 |
| 27 | Canada | 0 | 0 | 1 | 0 | 2 | 1 | 0 | 1 | 3 | 0 | 1 | 0 | 9 |
| 28 | North Cyprus | 6 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 8 |
| 29 | Thailand | 0 | 2 | 0 | 3 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 8 |
| 30 | Morocco | 1 | 1 | 2 | 3 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 7 |
| 31 | South Korea | 1 | 2 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 7 |
| 32 | Syria | 1 | 3 | 2 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 7 |
| 33 | Brunei | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 1 | 1 | 1 | 0 | 0 | 6 |
| 34 | Hungary | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 | 0 | 1 | 1 | 0 | 5 |
| 35 | Sudan | 2 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 5 |
| 36 | China | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 2 | 0 | 0 | 7 |
| 37 | Slovakia | 0 | 0 | 0 | 2 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 4 |
| 38 | Bulgaria | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 3 |
| 39 | India | 0 | 1 | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 3 |
| 40 | New Zealand | 0 | 0 | 0 | 2 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 3 |
| 41 | Albania | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 2 |
| 42 | Angola | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 43 | Bangladesh | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 44 | Iran | 0 | 1 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 2 |
| 45 | Myanmar | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 2 |
| 46 | Portugal | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 2 |
| 47 | Austria | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 48 | Azerbaijan | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 49 | Cayman Islands | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| 50 | Chile | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 51 | Eswatini(waziland) | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 52 | France | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| 53 | Germany | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| 54 | Indonesia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 |
| 55 | Japan | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| 56 | Kenya | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 57 | Lesotho | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 58 | Malta | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 |
| 59 | Palestine | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 60 | Republic of Dominican | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 61 | Serbia | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 1 |
| 62 | South Africa | 0 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 |
| 63 | Uganda | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 |
| 64 | Vietnam | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 1 |
| | Total | 74,316 | 66,480 | 57,518 | 66,638 | 63,582 | 16,008 | 31,354 | 97,089 | 100,879 | 93,683 | 86,080 | 14,182 | 767,809 |

(iii) විදේශ රැකියාවක් සඳහා විදේශගත වීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ගන්නා ශ්‍රමිකයින්ගේ දත්ත ලියාපදිංචිය ලබා ගන්නා අවස්ථාවේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පරිගණක දත්ත පද්ධතියට ඇතුළත් කිරීම සිදු කරනු ලබයි.

(iv) ඔවුන් අතරින් මියගිය, සිය දිවි නසාගත් සහ වෙනත් අනතුරු හේතුවෙන් පීඩාවට පත් වී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් පහත ඇමුණුම IIහි හා IIIහි දක්වා ඇත.

ඇමුණුම II

**Death in 2015 - 2026**
**Job Category - House maid & Gender - Fer**

| Year | Total |
|---|---|
| 2015 | 90 |
| 2016 | 81 |
| 2017 | 87 |
| 2018 | 54 |
| 2019 | 67 |
| 2020 | 42 |
| 2021 | 124 |
| 2022 | 92 |
| 2023 | 108 |
| 2024 | 103 |
| 2025 | 94 |
| 2026 | 7 |

*** Injuries in 2015 - 2026**
**Job Category - House maid**

| Year | Total |
|---|---|
| 2015 | 7 |
| 2016 | 7 |
| 2017 | 4 |
| 2018 | 3 |
| 2019 | 5 |
| 2020 | 17 |
| 2021 | 6 |
| 2022 | 16 |
| 2023 | 24 |
| 2024 | 42 |
| 2025 | 29 |
| 2026 | 4 |

ඇමුණුම III

| Death Reason | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Accident (Other Accident) | 3 | 9 | 9 | 3 | 2 | 1 | 1 | 2 | 6 | 4 | 2 | 0 |
| Accident (Road Accident) | 8 | 4 | 3 | 4 | 1 | 0 | 4 | 5 | 4 | 5 | 3 | 0 |
| Natural | 66 | 59 | 72 | 37 | 49 | 27 | 83 | 80 | 89 | 82 | 85 | 7 |
| Suicide | 12 | 5 | 3 | 7 | 6 | 1 | 6 | 2 | 8 | 8 | 4 | 0 |
| Homicide | 1 | 4 | 0 | 3 | 1 | 3 | 0 | 0 | 1 | 0 | 0 | 0 |
| Others | 0 | 0 | 0 | 0 | 8 | 10 | 9 | 0 | 0 | 4 | 0 | 0 |
| COVID 19 Pandamic | 0 | 0 | 0 | 0 | 0 | 0 | 21 | 3 | 0 | 0 | 0 | 0 |
| **Total** | **90** | **81** | **87** | **54** | **67** | **42** | **124** | **92** | **108** | **103** | **94** | **7** |

(v) 01. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශ රැකියා සඳහා පිටත්වන සියලුදෙනාට නොමිලයේ රක්ෂණ ආවරණයක් ලබා දීම සිදු කරන අතර, ඒ සඳහා වැයවන රක්ෂණ වාරික මුදල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සම්පූර්ණයෙන්ම ගෙවනු ලබයි.

එසේම ඉහත රක්ෂණ යෝජනා ක්‍රමයට වඩා වැඩි ප්‍රතිලාභ සහිත රක්ෂණ යෝජනා ක්‍රමයක් රක්ෂණලාභියාගේ කැමැත්ත මත තෝරා ගත හැකි අතර, එහිදී අමතර මුදලක් රක්ෂණලාභියා විසින් ගෙවා මෙම ප්‍රතිලාභ වැඩි ක්‍රමය තෝරා ගැනීමට පහත පරිදි අවස්ථාව ලබා දී ඇත. (අවුරුදු 02ක කොන්ත්‍රාත් කාලය සඳහා අමතරව රුපියල් 935.66ක මුලක්ද, අවුරුදු 03ක කොන්ත්‍රාත් කාලය සඳහා රුපියල් 1087.38ක මුදලක්ද ඒ සඳහා ගෙවිය යුතු වේ.)

| රක්ෂණ ප්‍රතිලාභය | නොමිලේ ලබා දෙන රක්ෂණ හිමිකම (පළමු තේරීම) | අමතර ගෙවීමක් කර තෝරා ගැනීමට හඳුන්වා දී ඇති වැඩි ප්‍රතිලාභ හිමි රක්ෂණ හිමිකම (දෙවන තේරීම) |
|---|---|---|
| ලියාපදිංචිය වලංගු කාලය තුළ විදෙස් සේවයේ නියුක්තව සිටියදී මුහුණ දීමට සිදු වූ බරපතළ රෝගී තත්ත්වයක් හෝ හදිසි අනතුරක් හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණ මාස 03ක් ගතවීමට පෙර ජීවිතක්ෂයට පත්වීම | රු. 250,000 | රු. 500,000 |
| ලියාපදිංචිය වලංගු කාලය තුළ විදෙස් සේවයේ නියුක්තව සිටියදී මුහුණ දීමට සිදුවූ හදිසි අනතුරක් හේතුකොටගෙන පූර්ණ හෝ අර්ධ ආබාධිත තත්ත්වයට පත්වීම. · ලංකාවට පැමිණීමෙන් පසු දැරීමට සිදුවන වෛද්‍ය වියදම් සඳහා | උපරිමය රු. 500,000 උපරිමය රු. 50,000 | උපරිමය රු. 600,000 උපරිමය රු. 150,000 |
| ලෙඩ රෝග/හදිසි අනතුරු/වධහිංසා ආදිය හේතුවෙන් ලංකාවට පැමිණීමෙන් පසු දැරීමට සිදුවන වෛද්‍ය වියදම් සඳහා ආදී වශයෙන් තවත් ප්‍රතිලාභ ඇත. | උපරිමය රු. 50,000 | උපරිමය රු. 150,000 |

02. විදේශගතව සිටින විගමණික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා සහ විදේශගතව සිට ශ්‍රී ලංකාවට පැමිණ වසර 05ක් ඇතුළත අයදුම්කරන විගමණික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් සඳහා රු. 10,000ක් වටිනා පාසල් උපකරණ කට්ටල ලබා දීම. මෙහිදී ශ්‍රී ලංකා විදේශ කාර්යාංශයේ ලියාපදිංචි වී තිබීම මූලික සුදුසුකමක් වන අතර, දරුවා පාසලේ අධ්‍යාපනය ලබන බවට විදුහල්පතිගේ නිර්දේශය තිබීම අත්‍යවශ්‍ය වේ.

03. විගමණික ශ්‍රමිකයන්ගේ දූ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය (05 වසර - රු. 25,000 අ.පො.ස (සා.පෙළ) - රු. 30,000 අ.පො.ස (උ.පෙළ) - රු. 40,000)
මෙම ප්‍රතිලාභ ලබා දීම සඳහා පහත නිර්ණායකයන් සලකා බලනු ලැබේ.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගතව සිටින හෝ නැවත ලංකාවට පැමිණ ඇති ශ්‍රමිකයින්ගේ දූ දරුවකු විය යුතුය. (විභාගයට පෙනී සිටි දින සිට වසර 05කට පෙර කාලයක් ඇතුළත අයදුම්කරුගේ මව/පියා ගේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය සලකා බලනු ලැබේ.)
- අදාළ වර්ෂය සඳහා පුවත්පත් මඟින්, සමාජ මාධ්‍ය මඟින්, පාසල්වල විදුහල්පතිවරු මඟින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංවර්ධන නිලධාරීන් (විදේශ රැකියා) මඟින් හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය හරහා මේ පිළිබඳ දැනුවත් කරන අතර මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉල්ලුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- පහ වසර ශිෂ්‍යත්වය සඳහා එම වර්ෂයට අදාළ දිස්ත්‍රික් කඩඉම් ලකුණු මට්ටම ලබා සමත් වී තිබිය යුතුය.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සමත්විය යුතුය. (අවම වශයෙන් ගණිත විෂය ඇතුළුව විෂයන් 06ක් සමත් විය යුතු අතර, විෂයන් 03ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව උසස් පෙළ හදාරමින් සිටිය යුතුය.)
- අ.පො.ස. (උසස් පෙළ) සමත් වී රජයේ හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන උපාධි පාඨමාලාවක් හෝ ජාතික කාර්මික විද්‍යාලයක හෝ වෙනත් රජයේ අධ්‍යාපන ආයතනයක වසර 2කට වැඩි කාලයක් සඳහා වූ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරිය යුතුය.

04. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ ගතව සිටින ශ්‍රමිකයන්ට බහු විධ ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීම. (සියයට 8 පොලිය යටතේ රු. ලක්ෂ 20ක් දක්වා ණය ලබා දීම.)

05. විවිධ හේතූන් මත රක්ෂණාවරණය යටතේ හිමිකම් නොලැබෙන විගමණික ශ්‍රමිකයින් සඳහා සේවක සුබසාධක අරමුදල මඟින් එම අරමුදල් කමිටුවේ තීරණය මත වෛද්‍ය ප්‍රතිකාර සඳහා රු. 150,000ක උපරිමයකට යටත්ව මූල්‍යාධාර ලබා දීම සිදු කරන අතර, මරණයකදී රු. 300,000ක් ලබා දීම සිදු කෙරේ.

06. විදේශගතව සේවය කර ආපසු පැමිණි විගමණික ශ්‍රමිකයන් ව්‍යවසායකයින් බවට පත් කිරීම සඳහා ව්‍යවසායකත්ව සහාය ලබා දීමට මූල්‍ය ආධාර ලෙස එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට පස්දෙනා බැගින් තෝරාගෙන රු. 1,000,000ක ආධාර එකක්, රු. 500,000ක ආධාර එකක් සහ රු. 250,000ක ආධාර 03ක් වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා රු. 2,250,000ක මුදලක් ලබා දීම සිදු කරනු ලබයි.

07. විගමණික ශ්‍රමිකයා හෝ ඔවුන්ගේ යැපෙන්නන් රෝහල්ගතවී ඇත්නම් ඔවුන් මුහුණ දෙන අසීරු තත්ත්වයන් සමනය කර ගැනීමට ලබා දෙන සහනයක් ලෙස ඒ රෝගීන් පිළිබඳව සොයා බැලීම සහ වෛද්‍ය උපදෙස් මත අවශ්‍ය ඖෂධ, අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය හා මූල්‍යාධාර ලබා දීම.

08. විදේශ රැකියාවක නියුක්තව සිටිය දී අනතුරක් හේතුවෙන් පූර්ණ ආබාධිත තත්ත්වයට පත්ව ලංකාවට පැමිණි නිවසක් නොමැති ශ්‍රමිකයින්ට (පූර්ණ ආබාධිත තත්ත්වය සියයට 65කට වඩා වැඩි අය සඳහා) තමන්ට අයත් ඉඩමක් තිබේ නම් ඒ අය සඳහා නිවසක් සාදා දීම.

09. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒකාබද්ධව විදේශ සේවා නියුක්තිකයන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.

10. විදේශ රැකියාවල නියුතු ශ්‍රමිකයින්ගේ පවුල්වල සිදුවන හදිසි ආපදා තත්ත්වයන් සඳහා මූල්‍යමය ආධාර ලබා දීම.

ප්‍රධාන අදියර 02ක් යටතේ ක්‍රියාත්මක කරයි.

I. හදිසි මූල්‍ය සහන - හදිසි ආපදාවක් හේතුවෙන් යම් බලපෑමක් ඇති වී ඇති ශ්‍රමික පවුල් සඳහා වියළි ආහාර ලබා ගැනීමට රු. 15,000 මූල්‍ය සහනයක් ලබා දීම.

II. ස්වාභාවික හදිසි ආපදාවක් හේතුවෙන් යම් භෞතික හානියක් සඳහා රු. 50,000 යටත්ව මූල්‍යාධාරයක් ලබා දීම. (හානි පූර්ණය සඳහා)

[ගරු අරුන් හේමචන්ද්‍ර මහතා]

11. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ප්‍රථම වරට ගෘහස්ථ අංශයේ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රමික කාන්තාවන්ගේ පවුල් සඳහා රු. 10,000ක් වටිනා සතොස වවුචර්පත් ලබා දීම.

12. විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල විශේෂ අවශ්‍යතාවය ඇති දූ දරුවන්ගේ ප්‍රතිකාර සඳහා මූල්‍යමය ආධාර ලබා දීම හා සමස්ථ ලංකා මට්ටමින්, ජාත්‍යන්තර මට්ටමින්, විශේෂ දක්ෂතා ඇති දරුවන් සඳහා එම දක්ෂතා වැඩි දියුණු කර ගැනීම සඳහා අවශ්‍යතාව අනුව මූල්‍යමය ආධාර ලබා දීම හා විගමණික ශ්‍රමිකයන්ගේ දූ දරුවන්ට පෝෂණ හා අධ්‍යාපනික කටයුතු සහ මූල්‍යාධාර සැපයීම.

ඉදිරිපත් වන ඉල්ලීම් (සෘජුව/ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින්/ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල) පිළිබඳව සලකා බලා සනාථ කිරීම් අදාළ පාර්ශ්ව මඟින් සිදු කර ගැනීමෙන් පසු විදේශ සේවා නියුක්ති කාර්යාංශ සභාපති වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනා ඇතුළත් වාර්තාවකට අනුව මූල්‍ය ප්‍රදානයන් සිදු කරනු ලැබේ.

13. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන ශ්‍රමිකයන්ගේ මරණයකදී රක්ෂණාවරණය යටතේ රු.600,000ක මුදලක් යැපෙන්නන් හට ලබා දෙනු ලබයි. මෙම මුදලට අමතරව සේවක සුබසාධන අරමුදලද මිය ගිය අය වෙනුවෙන් තවත් රු. 1,40,000ක මුදලක්, එනම් මුළු මුදල රු. 2,000,000ක් දක්වා ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

14. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී විදේශ රැකියාවක නිරතව සිටියදී මිය යන අයගේ අවමංගල්‍ය කටයුතු සිදු කර ගැනීම සඳහා මෙතෙක් ලබා දුන් රු. 40,000ක මුදල රු. 100,000ක් දක්වා වැඩි කර මේ වන විට ලබා දෙනු ලැබේ.

(ආ) අදාළ නොවේ.

## කිලිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්ක: සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කෘෂි ගොවිපොළවල්

### கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா மற்றும் மன்னார் மாவட்டங்கள்: சிவில் பாதுகாப்புத் திணைக்கள விவசாயப் பண்ணைகள்

### KILINOCHCHI, MULLAITIVU, VAVUNIYA AND MANNAR DISTRICTS: AGRICULTURAL FARMS OF CIVIL SECURITY DEPARTMENT

1188/2025

**5. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා වෙනුවට)**

(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு சிவஞானம் சிறீதரன் சார்பாக)

(The Hon. Gayantha Karunathilleka on behalf of the Hon. Sivagnanam Shritharan)

UYCමහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) කිලිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් කෘෂි ගොවිපොළ පවත්වාගෙන යනු ලබන බව දන්නේද;

(ii) එම ගොවිපොළ පිහිටි ස්ථානය එක් එක් දිස්ත්‍රික්කය සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගොවිපොළවල විශාලත්වය සහ සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) උතුරු සහ නැඟෙනහිර පළාත්වල ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට ආරක්ෂක අංශවල මැදිහත්වීමක් පවතින බව දන්නේද;

(ii) හමුදාවේ මැදිහත්වීමෙන් පවත්වාගෙන යනු ලබන මෙවැනි ගොවිපොළ අතරින්, උතුරු පළාත් සභාවට පවරා දිය යුතු ගොවිපොළ මෙතෙක් පවරා නොදීමට හේතු කවරේද;

(iii) අදාළ ගොවිපොළ පවරා දීමට කටයුතු කරනු ලබන කාලවකවානුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிளிநொச்சி, முல்லைத்தீவு, வவுனியா மற்றும் மன்னார் மாவட்டங்களில் சிவில் பாதுகாப்புத் திணைக்களத்தால் விவசாயப் பண்ணைகள் நடத்தப்படுகின்றது என்பதை அவர் அறிவாரா என்பதையும்;

(ii) மேற்படி விவசாயப் பண்ணைகள் அமைந்துள்ள இடங்கள், மாவட்டங்கள் மற்றும் பிரதேச செயலகங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) இந்த விவசாயப் பண்ணைகளின் பரப்பளவு மற்றும் அவற்றில் பணிபுரிகின்ற ஊழியர்களின் எண்ணிக்கை தொடர்பான விபரங்கள் மாவட்ட வாரியாக வெவ்வேறாக யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) வடக்கு மற்றும் கிழக்கு மாகாணங்களில் வசிக்கும் மக்களின் அன்றாட இயல்பு வாழ்க்கையில் பாதுகாப்புப் படையினரின் தலையீடு காணப்படுகின்றதை அவர் அறிவாரா என்பதையும்;

(ii) இராணுவத்தால் நடத்தப்படுகின்ற இவ்வாறான விவசாயப் பண்ணைகளில், வடக்கு மாகாண சபையிடம் ஒப்படைக்கப்பட வேண்டிய விவசாயப் பண்ணைகள் இதுவரை ஒப்படைக் கப்படாமைக்கான காரணங்கள் யாவை என்பதையும்;

(iii) குறித்த விவசாயப் பண்ணைகளை ஒப்படைப் பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படவுள்ள காலப்பகுதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Security and Parliamentary Affairs:

(a) Will he inform this House -

(i) whether he is aware that the Civil Security Department maintains agricultural farms in the Districts of Kilinochchi, Mullaitivu, Vavuniya and Mannar;

(ii) the location of those farms, separately according to each district and Divisional Secretary's Division; and

(iii) the extent of each farm and the number of personnel employed therein, separately, according to each district?

(b) Will he also inform this House -

(i) whether he is aware that there is interference by the security forces in the daily lives of the people in the Northern and Eastern Provinces;

(ii) the reasons for not handing over the farms that should have been handed over to the Northern Provincial Council, out of such farms maintained with the intervention of the military; and

(iii) the time frame during which the relevant farms will be thus handed over?

(c) If not, why?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කිලිනොච්චිය, මුලතිව්, වවුනියාව යන දිස්ත්‍රික්කවල පමණක් කෘෂි ගොවිපොළ පවත්වාගෙන යයි.

(ii) සහ (iii) සඳහා පිළිතුරු පහත වගුවේ දැක්වේ.

| (i) | (ii) | (iii) | (iv) | (v) |
|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කෘෂි ව්‍යාපෘතිය - පිහිටි ස්ථානය | ගොවි පොළෙහි විශාලත්වය (අක්කර) | සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව |
| කිලිනොච්චි දිස්ත්‍රික්කය | කරච්චි | අම්බාල්නගර්, ශාන්තපුරම්, ඉරණමඩු | 3 | 5 |
| | | අම්බාල්නගර්, ශාන්තපුරම් | 9.75 | 1 |
| | | වට්ටකච්චි | 9 | 9 |
| | | වට්ටකච්චි | 81 | 81 |
| | | වට්ටකච්චි | 67 | 67 |
| | පූනගිරි | සින්නපල්ලවරායන්කට්ටු, ජයපුරම් | 85 | 9 |
| | | සින්නපල්ලවරායන්කට්ටු, ජයපුරම් | 19 | 2 |
| | කන්ඩාවලෙ | විශ්වමඩු | 1 | 2 |
| | | කොලොන්දුපුලව් | 36.26 | 76 |
| | එකතුව | | 311.01 | 252 |
| මුලතිව් දිස්ත්‍රික්කය | පුදකුඩිඉරිප්පු | භාරතිපුරම් | 32 | 55 |
| | | භාරතිපුරම් | 2 | |
| | | භාරතිපුරම් | 6 | |
| | | භාරතිපුරම් | 4 | |
| | | භාරතිපුරම් | 4 | |
| | | තොට්ටිඅඩි | 6 | 12 |
| | | තොට්ටිඅඩි | 3 | |
| | | සුදන්දිරපුරම් එච්කිව් | 11.1 | 139 |
| | | සුදන්දිරපුරම් ඒ | 6.91 | |
| | | දේව්පුරම් ඒ | 6.5 | |
| | | කෙවෙලි එච්කිව් | 5.36 | 65 |
| | | කෙවෙලි ඒ | 24.46 | |
| | | දේව්පුරම් | 20.59 | 51 |
| | | දේව්පුරම් එච්කිව් | 45.24 | |
| | | උඩයාර්කට්ටු එච්කිව් | 42.29 | 96 |
| | | උඩයාර්කට්ටු ඒ | 15.51 | |
| | | තේරාවිල් | 18.61 | 44 |
| | එකතුව | | 253.57 | 462 |

[ගරු ආනන්ද විජේපාල මහතා]

| (i) | (ii) | (iii) | (iv) | (v) |
|---|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කෘෂි ව්‍යාපෘතිය - පිහිටි ස්ථානය | ගොවි පොළෙහි විශාලත්වය (අක්කර) | සේවය කරන පුද්ගලයන් සංඛ්‍යාව |
| වවුනියාව දිස්ත්‍රික්කය | වවුනියාව දකුණ | පහලඅළුත්වැව | 18 | 26 |
| | | පහලඅළුත්වැව | 4 | 17 |
| | | තීරුවේගම | 50 | 18 |
| | | මයිලන්කුලම | 33 | 69 |
| | | උළුක්කුලම | 20 | 50 |
| | | සුමතිපුර | 5 | 42 |
| | | කැළෑ සියඹලාව | 18 | 64 |
| | | මලයාපරිත්තිකුලම | 12 | 37 |
| | | දික්වැව | 9 | 47 |
| | | මහකච්චකොඩිය | 10 | 31 |
| | වවුනියාව උතුර | මාමඩුව | 20 | 94 |
| | නෙඩුන්කේනි | බෝගස්වැව | 10 | 32 |
| | එකතුව | | 209 | 527 |

(ආ) (i) උතුරු සහ නැඟෙනහිර පළාත්වල ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට සිවිල් ආරක්ෂක බලකායන්හි රාජකාරි නිරත නිලධාරින්ගේ මැදිහත්වීමක් නොමැත.

(ii) සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ පවත්වාගෙන යනු ලබන ගොවිපොළවල් උතුරු පළාත් සභාවට පවරාදෙන ලෙස ඉල්ලීමක් මෙතෙක් විධිමත්ව ඉදිරිපත් වී නොමැත.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை இல. 92(2) மற்றும் 33(1)ஐ உங்களுடைய கவனத்துக்குக் கொண்டுவருகின்றேன். இன்றைய தின ஒழுங்குப் பத்திரத்தில் கௌரவ சிறீதரன் அவர்கள் வழங்கிய முக்கியமானதொரு வினா இடம்பெற்றுள்ளபோதிலும், அவர் இன்று சபைக்கு வரவில்லை. நிலையியற் கட்டளை இல. 33 ( 1 ) இல் தெளிவாகச் சொல்லப்பட்டு இருக்கிறது, எவரேனும் உறுப்பினர் இரண்டுக்கு மேற்படாத மேலதிக கேள்விகளைக் கேட்கலாம் என்று. ஆகவே, இந்த வினாவுக்கான மேலதிக கேள்விகளைக் கேட்பதற்கு கௌரவ ஸ்ரீநேசன் அவர்களுக்கு அல்லது எவரேனும் உறுப்பினருக்கு -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒකට ඒ ගරු මන්ත්‍රීතුමාගේ අවසරය තිබෙන්න ඕනෑ. අතුරු ප්‍රශ්න ඇසීමේ අවස්ථාව වෙනත් මන්ත්‍රීවරයෙකුට ලබා දෙන්න නම් ඒ මන්ත්‍රීතුමාගේ අවසරය අවශ්‍යයි.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මහ බැංකුවේ වාර්තාව පාර්ලිමේන්තුවට නිසියාකාරව ඉදිරිපත් කර තිබෙනවා. සාමාන්‍ය සිරිත වන්නේ ඒ ගැන පුළුවන් තරම් ඉක්මනට විවාද කිරීමයි. ඒක මේ සුමානයේ කළ යුතු දෙයක්. ඒක කවදාද වෙන්නේ කියලා දැනුවත් කළොත් අගය කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය විධියට අපි මේ පිළිබඳව Parliamentary Business Committee එකේදි දැනුම් දුන්නා. එතැනදී දැනුම් දුන්නා, මේ පිළිබඳව අපි විවාදයක් කරන්න බලාපොරොත්තු වෙන බව. නමුත්, මේ සතියේ අපි බලාපොරොත්තු වුණා, Rescue, Rehabilitation and Insolvency (Corporate and Personal) Bill එක ඉදිරිපත් කිරීමට. ඒ නිසා අපි මේක ලබන පාර්ලිමේන්තු සතියේදී මේක කරන්න බලාපොරොත්තු වෙනවා. හෙට පැවැත්වෙන Parliamentary Business Committee එකේදි මේ පිළිබඳව අපි යෝජනා කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ගිය සුමානයේ ඇහුවා වරප්‍රසාද ප්‍රශ්නයක්. මහ බැංකුව මේ උත්තරීතර සභාවට ප්‍රශ්න 11කට උත්තර දීලා නැහැ. වරප්‍රසාද ප්‍රශ්නය තුළින් මට ඒකට නිසියාකාරව උත්තරයක් ලැබුණේ නැහැ, මේ සුමානේ. කවදාද ඒක ලබා ගන්න පුළුවන් වන්නේ? මොකද, බැංකු ක්ෂේත්‍රයට මීට වඩා හානියක් වෙන්න ඉස්සෙල්ලා පාර්ලිමේන්තුව දැනගන්න අවශ්‍යයි රට කොයිබටද යන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඉන්ධන මිලදී ගැනීමේ සහ සැපයීමේ ක්‍රියාවලිය
### இலங்கை பெற்றோலியக் கூட்டுத்தாபனத்தின் எரிபொருள் கொள்முதல் மற்றும் விநியோகச் செயன்முறை
### FUEL PURCHASE AND SUPPLY PROCESS OF CEYLON PETROLEUM CORPORATION

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මෙරට ඉන්ධන සැපයුම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා මිලදී ගැනීම්වල පාරදෘශ්‍යභාවය සහ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් පවතින ගැටලු සැලකිල්ලට ගනිමින් විශේෂයෙන් ලංකා ඛනිජ තෙල් සංස්ථාව - Ceylon Petroleum Corporation එක - ඉන්ධන මිලදී ගැනීම් හා සැපයුම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන කරුණු විමසීමේ අරමුණින් පහත සඳහන් ප්‍රශ්න මම යොමු කරමි.

1. පසුගිය මාස 12 තුළ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නව සැපයුම්කරුවන් කී දෙනෙකු ලියාපදිංචි කර තිබේද? ඔවුන් කවුරුන්ද?
2. පසුගිය මාස 12 තුළ කිසියම් සැපයුම්කරුවෙකු (නව හෝ පැරණි) ඔවුන්ගේ බෙදා හැරීම පැහැර හැර තිබේද? එසේ නම් කවුද සහ කවදාද?
3. එසේ පැහැර හැරීමක් සිදු කළ අවස්ථාවකදී සැපයුම්කරුවන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ගය කුමක්ද?
4. පසුගිය මාස 12 තුළ ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් කැඳවා ඇති හදිසි මිලදී ගැනීම් - spot tenders/ short-term tenders - හා දිගුකාලීන ගිවිසුම් යටතේ සිදු කරන ලද මිලදී ගැනීම් - term tenders - ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද?
5. එම මිලදී ගැනීම් සඳහා භාවිත කරන තාක්ෂණික - technical - හා වාණිජ - commercial - ඇගයීම් හා ඒවායේ නිර්ණායක මොනවාද? එම නිර්ණායක අනෙකුත් විදේශ් රාජ්‍යයන්හි මිලදී ගැනීම් සමඟ සැසඳීමක් ඉදිරිපත් කරන්නේද?
6. කාලීන කොන්ත්‍රාත්තුවක වලංගුභාවය තුළ ස්ථානීය ටෙන්ඩර් ප්‍රදානය කිරීමට කිසියම් තීරණයක් ගෙන තිබේද? මෙම තීරණ Standing Cabinet Appointed Procurement Committee - SCAPC - විසින් අනුමත කර තිබේද? දිගුකාලීන ගිවිසුම් මිල හා හදිසි මිලදී ගැනීම් මිල අතර සංසන්දන වාර්තාවක් සභාවට ඉදිරිපත් කළ හැකිද?

   ඒක අහන්න ප්‍රධානතම හේතුව තමයි, පසුගිය දිනවල මිලදී ගැනීම් පිළිබඳව බොහෝ තැන්වල ආරංචි වුණා, රටට අලාභදායී ආකාරයට මිලදී ගැනීමේ ක්‍රියාවලිය සිදුවුණා කියලා. ඒ නිසා මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීම තුළින් අපි පැහැදිලි කර ගැනීමක් කරගන්න කැමැතියි, procurement process එක, ඒ මිලදී ගැනීමේ ක්‍රියාවලිය ගැන.
7. පසුගිය මාස 12 තුළ වඩාත්ම මිල අධික බෙදාහැරීම් තුන සඳහා ලබා දුන් ලංසු ගණන කොපමණද? එම ටෙන්ඩර් ප්‍රදානය කළ සැපයුම්කරුවන් කවුද?
8. සපුගස්කන්ද පිරිපහදුවේදී ඉරාන ලයිට් වර්ගයේ තෙල් වෙනුවට මර්බන් වර්ගයේ තෙල් භාවිත කිරීමෙන් පිරිපහදු නිෂ්පාදන ප්‍රතිශත, පිරිපහදු වියදම්, අවසන් මිල කෙසේ වෙනස් වී තිබේද?
9. ප්‍රසම්පාදන තීරණ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සහ කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අතර වෙනස්කම් ඇතිවූ අවස්ථා තිබේද?

   ඉහළ වටිනාකමක ඉන්ධන මිලදී ගැනීම් සඳහා පසුව සිදු කරන ලද විගණන ක්‍රමවේදයක් තිබේද? එවැනි විගණන වාර්තා සභාවට ඉදිරිපත් කළ හැකිද?

විශේෂයෙන්ම මම මේ ප්‍රශ්නය අහන්නේ මේ නිසා. පසුගිය කාලයේ term tender එකක් ලබා දුන් සැපයුම්කරුවෙක් ඒ term tender එක ක්‍රියාත්මක කළේ නැහැ. ඒ සැපයීම අත්හැරියා. හැබැයි, මේ හදිසි මිලදී ගැනීම් තුළ spot tender එකක් හරහා ඒ ටෙන්ඩරය ගිහිල්ලා තිබෙන්නේත් අර term tender එක ක්‍රියාත්මක නොකරපු, රටට ඒ පොරොන්දු වුණු සැපයුම ලබා නොදුන් කණ්ඩායමට, ආයතනයට. ඒ වාගේම ඒ ආයතනයට මේ spot tender එක දීලා තිබෙන්නේ, ඇත්ත වශයෙන්ම ඉතා ඉහළ මිලකට. ඒ නිසා අදාළ අමාත්‍යවරයාගෙන් මේ බරපතළ ප්‍රශ්නයට, ගැටලුවට මේ මොහොතේ පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.

ස්තූතියි.

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation and Minister of Energy)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු විපක්ෂ නායකතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

[ගරු අනුර කරුණාතිලක මහතා]

1. 12දෙනෙකි. ඔවුන් පහත දැක්වේ.

| # | Name of Supplier |
|---|---|
| 1 | Nayara Energy Singapore Pte. Limited |
| 2 | Welbred Trading, UAE |
| 3 | Abu Dhabi National Company (ADNOC) |
| 4 | Chevron USA Inc., Singapore Branch |
| 5 | Petrolimex Singapore Pte. Ltd. |
| 6 | Penthol SA, Switzerland |
| 7 | Petraco Energies DMCC, UAE |
| 8 | KB Oil DMCC, UAE |
| 9 | Chevron USA Inc., Singapore Branch |
| 10 | Trafigura Pte. Ltd., Singapore |
| 11 | TOTSA Total Energies Trade SA (TOTAL) |
| 12 | Petco Trading Labuan, Malaysia |
| 13 | Aramco Trading Company, Saudi Arabia (SAUDI ARAMCO) |

2. පසුගිය කාලය තුළ සංස්ථාවේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවන්ගෙන් තෙල් මිලදී ගැනීම සඳහා ලබා දුන් කැබිනට් අනුමැතිය අනුව නව සැපයුම්කරුවෙකුගෙන් තෙල් මිලදී ගැනීමේදී එම නව සැපයුම්කරු පැහැර හැරීමක් කරලා තිබෙනවා. ඒ පැහැර හැරපු අය තමයි, Verrington UAE කියන සමාගම. ඒක සිද්ධ වෙලා තිබෙන්නේ 2026 අප්‍රේල් මාසයේදී.

3. මේ Verrington UAE කියන සමාගම පැහැර හැරපු අවස්ථාවේදී සිදු වෙලා තිබෙන්නේ මේකයි. ඇණවුම් ලබා දීම වෙනුවෙන් එකඟ වෙලා තිබෙන කොන්දේසි වෙනස් කරමින්, පෙර ගෙවීම් කරන ලෙස කරන ලද ඉල්ලීම සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කර තිබෙනවා. නමුත්, සාමාන්‍යයෙන් සංස්ථාවේ සම්ප්‍රදාය තමයි, Bid Security Guarantee එකක් සහ Performance Security Guarantee එකක් මත සැපයීම් කරන එක. ඒකෙන් අදාළ තාක්ෂණික වාර්තා සම්මත වුණාට පස්සේ ඒ අනුව තමයි ගෙවීම් කරන්නේ. මේ මූලික කරුණුවලට එකඟ නොවීම තුළ ඉන්ධන සැපයීම සම්බන්ධයෙන් එළැඹි කොන්දේසි සහ නියමයන් ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සංස්ථාවේ අප්‍රසාදය අදාළ සමාගම වෙත මේ වෙනකොට විද්‍යුත් තැපැල මඟින් දැනුම් දීලා තිබෙනවා.

4. මේ පිරිපහදු කළ ඉන්ධන සඳහා term tenders අටක් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

**2025.01.01 දින සිට 2026.05.06 දින දක්වා පිරිපහදු කළ ඉන්ධන:**

| නො. | වාර ගිවිසුම් අංකය | නිෂ්පාදිතය | කාල පරාසය | සැපයූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | BK/TERM/GAS OIL (0.05% M.S)/ DTB - MUTHU/2025-2026 | ඔටෝ ඩීසල් | 15/11/2025 - 14/06/2026 | 2 |
| 2 | BK/TERM/GASOLINE 92 UNL/ DTB - MUTHU/2026 | පෙට්‍රල් 92 | 15/03/2026 - 14/09/2026 | 1 |
| 3 | BK/TERM/GASOLINE 92 UNL/ DTB - MUTHU/2025-2026 | පෙට්‍රල් 92 | 15/09/2025 - 14/03/2026 | 5 |
| 4 | BK/TERM/GASOLINE 92 UNL/ DTB - MUTHU/2025 | පෙට්‍රල් 92 | 15/04/2025 - 14/10/2025 | 5 |
| 5 | BK/TERM/GAS OIL (0.05% M.S)/ DTB - MUTHU/2025 | ඔටෝ ඩීසල් | 01/06/2025 - 30/11/2025 | 5 |
| 6 | BK/TERM/GAS OIL (0.05% M.S)/ DTB - MUTHU/2024-2025 | ඔටෝ ඩීසල් | 15/12/2024 - 14/06/2025 | 4 |
| 7 | BK/TERM/GASOLINE 92 UNL/ DTB - MUTHU/2024-2025 | පෙට්‍රල් 92 | 15/07/2024 - 14/01/2025 | 5 |
| 8 | BK/TERM/GASOLINE 92 UNL/ DTB - MUTHU/2024-2025-A | පෙට්‍රල් 92 | 01/12/2024 - 31/05/2025 | 5 |

බොරතෙල් සැපයීම සඳහාත් මේ වාගේම වාර ගිවිසුම් ක්‍රියාත්මක වෙලා තිබෙනවා. Murban crude oil තමයි මිලදී ගැනීම කරන්නේ.

**2025.01.01 දින සිට 2026.05.06 දින දක්වා වාර ගිවිසුම් යටතේ බොරතෙල් සැපයීම් පිළිබඳ විස්තර:**

| | වාර ගිවිසුම් අංකය | නිෂ්පාදිතය | කාල පරාසය | සැපයූ ප්‍රමාණය |
|---|---|---|---|---|
| 1 | CR/TERM/CRUDE OIL/ MURBAN/2024-2025(A) | MURBAN CRUDE OIL | 15/11/2024 - 14/04/2025 | 3 |
| 2 | CR/TERM/CRUDE OIL/ MURBAN/2024-2025(B) | MURBAN CRUDE OIL | 15/11/2024 - 14/04/2025 | 3 |
| 3 | CR/TERM/CRUDE OIL/ MURBAN/2025(A) | MURBAN CRUDE OIL | 01/04/2025 - 31/08/2025 | 6 |
| 4 | CR/TERM/CRUDE OIL/ MURBAN/2025(B) | MURBAN CRUDE OIL | 01/09/2025 - 31/12/2025 | 4 |
| 5 | CR/TERM/CRUDE OIL/ MURBAN/2026(A) | MURBAN CRUDE OIL | 01/01/2026 - 30/04/2026 | 3 |
| 6 | CR/TERM/CRUDE OIL/ MURBAN/2026(B) | MURBAN CRUDE OIL | 15/04/2026 - 14/08/2026 | 1 |

| හදිසි කැඳවීම් | වර්ගය | සැපයීම් සිදු කළ යුතු කාල පරාසය |
|---|---|---|
| BK/21/2026 | ඩීසල් හා ගුවන් යානා ඉන්ධන | 30,31 මාර්තු 2026 |
| BK/15/2026 | ඩීසල් | 6,7 අප්‍රේල් 2026 |
| BK/18/2026 | ඩීසල් හා සුපර් ඩීසල් | 7,8 අප්‍රේල් 2026 |
| BK/19/2026 | ගුවන් යානා ඉන්ධන | 10,11 අප්‍රේල් 2026 |
| BK/16/2026 | දැවි තෙල් - Fuel Oil | 12,13 අප්‍රේල් 2026 |
| BK/20/2026 | පෙට්‍රල් 92 | 17,18 අප්‍රේල් 2026 |
| BK/17/2026 | පෙට්‍රල් සහ සුපර් පෙට්‍රල් | 29,30 අප්‍රේල් 2026 |

5. මිලදී ගැනීම සඳහා භාවිත කරන ලද තාක්ෂණික හා වාණිජ ඇගයීම් නිර්ණායක ඇමුණුම 01හි දක්වා තිබෙනවා. එම ඇමුණුම **සභාගත*** කරනවා.

ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා අසා තිබෙනවා, විදෙස් රාජ්‍යයන්හි මිලදී ගැනීම් සමඟ සැසඳීමක් ඉදිරිපත් කරන්න පුළුවන්ද කියලා.

මෙම නිර්ණායක තීරණය කිරීමේදී පහත සඳහන් අයුරින් කටයුතු කර ඇති බව දන්වා සිටිමි.

ඉන්ධන මිලදී ගැනීමේදී ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වෙළෙඳ නිර්ණායක හා තාක්ෂණික නිර්ණායක පදනම් කර ගනිමින් ආයතනය සතුව ඇති යටිතල පහසුකම්වලට වඩා යෝග්‍ය වන අයුරින් ආයතනයට ගැළපෙන අයුරින් අදාළ නිර්ණායක තීරණය කර ඇත.

ගරු විපක්ෂ නායකතුමනි, ඇත්තවශයෙන්ම ඔබතුමා අසා තිබෙන විදෙස් රාජ්‍යයන්හි මිලදී ගැනීම් සමඟ සැසඳීමක් ඉදිරිපත් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නයට පිළිතුරු දෙන්න ටිකක් අමාරුයි. මොකද, ඔබතුමා නිශ්චිත වශයෙන් රාජ්‍යයන් සඳහන් කරනවා නම්, එම රාජ්‍යයන්ගේ නිර්ණායක හා අපේ නිර්ණායක අතර සංසන්දනාත්මක ඉදිරිපත් කිරීමක් කරන්න පුළුවන්.

---

*** පුස්තකාලයේ තබා ඇත.**

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

6. ඔව්.

මෙම තීරණය Standing Cabinet Appointed Procurement Committee - SCAPC - විසින් අනුමත කර තිබෙනවාද කියා අසා තිබෙනවා.

ඔව්.

දිගු කාලීන ගිවිසුම් මිල හා හදිසි මිලදී ගැනීම් මිල අතර සංසන්දන වාර්තාව පහත දැක්වේ.

A. ඔටෝ ඩීසල්

| වාර ගිවිසුම්/ (පෙර සැලසුම් කළ) අංකය | සැපයුම් කාල සීමාව | නිෂ්පාදිතය | සැපයුම්කරු | Premium අගය (USD/Bbl) |
|---|---|---|---|---|
| BK/TERM/GAS OIL (0.05% M.S)/DTB-MUTHU/2025-2026 | 15/11/2025-14/06/2026 | ඔටෝ ඩීසල් | Trafigura Singapore | 4.08 |
| BK/18/2026 | 07-08/04/2026 | ඔටෝ ඩීසල් | Aditya Birla Singapore | 50.691 |
| | | සුපර් ඩීසල් | | 57.720 |

| හදිසි මිලදී ගැනීම් අංකය | සැපයුම් කාල සීමාව | නිෂ්පාදිතය | සැපයුම්කරු | Premium අගය (USD/Bbl) |
|---|---|---|---|---|
| BK/15/2026 | 06-07/04/2026 | ඔටෝ ඩීසල් | Aditya Birla Singapore | 45.642 |
| BK/21/2026 | 30-31/03/2026 | ඔටෝ ඩීසල් | Trafigura Singapore | 48.00 |
| BK/28/2026 | 05-06/05/2026 | ඔටෝ ඩීසල් | Vitol Asia Singapore | 39.170 |
| BK/31/2026 | 09-10/05/2026 | ඔටෝ ඩීසල් | Aditya Birla Singapore | 30.567 |

B. පෙට්‍රල් 92

| වාර ගිවිසුම්/ (පෙර සැලසුම් කළ) අංකය | සැපයුම් කාල සීමාව | නිෂ්පාදිතය | සැපයුම්කරු | Premium අගය (USD/ |
|---|---|---|---|---|
| BK/TERM/GASOLINE 92 UNL/DTB-MUTHU/2026 | 15/03/2026-14/09/2026 | පෙට්‍රල් 92 | Epdesa Singapore | 3.80 |

| හදිසි මිලදී ගැනීම් අංකය | සැපයුම් කාල සීමාව | නිෂ්පාදිතය | සැපයුම්කරු | Premium අගය (USD/Bbl) |
|---|---|---|---|---|
| BK/20/2026 | 16-17/04/2026 | පෙට්‍රල් 92 | Aditya Birla Singapore | 18.642 |

මෙහිදී පැහැදිලි කිරීමක් කළ යුතුයි. කාලීන ටෙන්ඩරයක වලංගු කාලය තුළ තෙල් සැපයිය යුතු දිනය මසකට කලින් ඒ අදාළ සැපයුම්කරුට දැනුම් දෙන්න ඕනෑ. ඒ අනුව ඔවුන් අතර එකඟතාවක් එනවා, සැපයිය යුතු දිනය සම්බන්ධයෙන්. එම එකඟතාවෙන් තහවුරු කොට තිබියදී ඒ අතර කාල සීමාව තුළ හදිසි අවශ්‍යතාවක් ඇති වුවහොත් හදිසි මිලදී ගැනීමක් සිදු කරන අවස්ථා තිබෙනවා.

විශේෂයෙන්ම 2026 මාර්තු මස පළමු සතිය තුළ අපි දැක්කා, panic buying situation එකක් තිබුණු බව. විවිධ සමාජ මාධ්‍ය හා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ඇතුළු කණ්ඩායම් සිදු කළ සමහර ප්‍රකාශ එක්ක කලබලයට පත් වුණු ජනතාව මිලදී ගැනීම් කළ නිසා මාර්තු මස පළමු සතිය තුළ මෙට්‍රික් ටොන් 56,000ක් අලෙවි කරන්න සිදු වුණා. ඒකත් එක්ක CPC එක සතු තොග ප්‍රමාණවත් නොවන නිසා හදිසි මිලදී ගැනීම් සඳහා යන්න සිද්ධ වුණා.

7.

| යොමු අංකය | වර්ගය | ඉදිරිපත් වූ ලංසු ගණන | ප්‍රදානය කළ සැපයුම්කරු |
|---|---|---|---|
| BK/15/2026 | ඩීසල් | 02 | Aditya Birla Global Trading, Singapore |
| BK/18/2026 | ඩීසල් + සුපර් ඩීසල් | 02 | Aditya Birla Global Trading, Singapore |
| BK/19/2026 | JET A-1 | 01 | Vitol Asia (Pvt.) Ltd., Singapore |

8.

| නිෂ්පාදනය | නිෂ්පාදන ප්‍රතිශතය (%) | |
|---|---|---|
| | Iranian Light | Murban |
| පෙට්‍රල් 92 | 9.2 | 10.2 |
| කෙරෝසින්/ජෙට් A1 | 15.7 | 17.0 |
| ඩීසල් (Auto Diesel) | 19.5 | 30.2 |
| දැවි තෙල් 800 | 16.7 | 28.3 |
| දැවි තෙල් 1500 | 18.4 | - |
| දැවි තෙල් 3500 | 6.7 | - |
| රසායනික නැප්තා | 5.0 | 9.0 |
| බිටුමන් | 1.9 | - |
| LPG (ද්‍රව පෙට්‍රෝලියම් වායුව) | 1.3 | 1.3 |

2012 වසරෙන් පසු ශෝධනාගාරයේ Iranian Light වර්ගයේ බොරතෙල් පිරිපහදු කිරීම සිදු නොවී ඇති බැවින්, එයට අදාළ පැරණි මිල දත්ත වර්තමාන මිල ගණන් සමඟ සෘජුව සසඳා බැලිය නොහැක.

9. ප්‍රසම්පාදන තීරණ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සහ කැබිනට් මට්ටමේ ප්‍රසම්පාදන කමිටු නිර්දේශ අතර වෙනස්කම් ඇති වූ අවස්ථා නැත.

ඉහළ වටිනාකමක ඉන්ධන මිලදී ගැනීම් සඳහා පසුව සිදු කරන විගණන ක්‍රමවේදයක් තිබෙනවා. එවැනි විගණන වාර්තා සභාවට ඉදිරිපත් කළ හැකිද කියා අහනවා. ඇත්තටම සමහර අවස්ථාවලදී විගණකාධිපතිවරයා විසින් අදාළ විගණන වාර්තා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරනවා. ඒ හරහා ඒ වාර්තා ලබා ගන්න පුළුවන්.

ඔබතුමා අවසානයේදී අසා තිබෙනවා, term tender එකක් cancel කරපු සැපයුම්කරුවෙක් spot tender එකට දාලා spot tender එක හරහා තෙල් සපයා තිබෙනවාද කියලා. ඒ සැපයුම්කරු කවුද කියලා ඔබතුමා නිශ්චිත වශයෙන් සඳහන් කරනවා නම්, මට ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙන්න පුළුවන්. මොකද, වැරදි තොරතුරු ගණනාවක් සමාජයේ ප්‍රචාරය වනවා, term tender එකක් cancel කරපු සැපයුම්කරුවෙක් spot tender සඳහා ඉදිරිපත් වෙලා ඒ හරහා සැපයුම් කරලා තිබෙනවා කියලා. ඔබතුමා නිශ්චිත වශයෙන් ඒ සැපයුම්කරු කවුද කියන එක සහ අදාළ දින වකවානු ප්‍රකාශ කරනවා නම්, මට ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙන්න පුළුවන්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඇත්තවශයෙන්ම මිල ගණන් පිළිබඳව ලොකු ආන්දෝලනයක්, කලබලයක් නිර්මාණය වුණේ එක එක අය මත ප්‍රකාශ කරපු හින්දා නොවෙයි. මැද පෙරදිග, එහෙම නැත්නම් බටහිර ආසියාවේ සිදු වුණු යුද්මය තත්ත්වය නිසා ලොකු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ප්‍රශ්නයක් ඇති වුණා. මොකද, 30 per cent of oil, 30 per cent of fertilizer සහ ගෑස් එන්නේ Strait of Hormuz හරහා. ඒ කලබගෑනිය ඇති වුණේ මේ යුද්ධමය තත්ත්වය තුළ. ඔබතුමා කිව්වා, මම නම් සඳහන් කළොත්, ටෙන්ඩර් එක සඳහන් කළොත් ඔබතුමාට උත්තර දෙන්න පුළුවන් කියලා. මම ඔබතුමාගෙන් කාරුණිකව මේ කාරණාව අහන්න කැමැතියි. Term tender එකක්, ඒ කියන්නේ යම්කිසි දිගු කාලීන ටෙන්ඩරයක් හරහා සැපයුමක් භාර අරගෙන එනමුත් සැපයීම නොකළ ආයතනයකට මේ හදිසි මිලදී ගැනීම් සඳහා spot tender එකක් ලබා දුන්නාද, නැද්ද කියන එක ගැන ඔබතුමාට බොහොම සරලව උත්තරයක් දෙන්න පුළුවන්. ඒ කියන්නේ කවුරු හරි term tender එකක, දිගු කාලීන ටෙන්ඩර් එකක terms ගරු කරපු නැති ආයතනයකට හදිසි මිලදී ගැනීමකට spot tender එකක් - ඇත්තටම අගරු ක්‍රියාවක් කළ ආයතනයකට - දුන්නාද, නැද්ද කියලා ඔබතුමාට බොහොම ලෙහෙසියෙන් ප්‍රකාශ කරන්න පුළුවන්.

අවසාන කාරණාව ලෙස මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමාගේ මතකය මම ගෙන යනවා, ජනාධිපතිවරණ සහ මහ මැතිවරණ සමයට. ඔබතුමන්ලා පක්ෂයක් හැටියට, දේශපාලන බලවේගයක් හැටියට ඉතාම පැහැදිලිව රටට පොරොන්දුවක් දුන්නා, - ඕනෑ නම් ඒවායේ පටිගත කිරීම් තිබෙනවා - වරායෙන් ගොඩබාන මිලටම අපේ රටේ පාරිභෝගිකයින්ට ඉන්ධන ටික ලබා දෙනවා කියලා. ඒ කියන්නේ තිබෙන බදු - taxes - ඉවත් කරලා, Treasury එකට ගෙවන්න තිබෙන මුදල ඉවත් කරලා, ඒ වාගේම ඔබතුමන්ලා කියපු ඇමතිවරුන්ට සහ නිලධාරීන්ට යන යම් යම් සන්තෝසම්, කොමිස් මුදල් ඔක්කෝමත් ඉවත් කරලා වරායේ ගොඩබාන මිලටම ඉන්ධන ටික ලබා දෙනවා කිව්වා. මම අහන්න කැමැතියි, ඒ ප්‍රතිපත්තිය අද අනුගමනය නොකරන්නේ ඇයි කියලා. මොකද, මේ මොහොත විශේෂයෙන්ම ජනතාව අතිශය පීඩනකාරී තත්ත්වයකට මුහුණ දී තිබෙන මොහොතක් නිසා. වෙනත් රටවල් ඇත්තටම ඉන්ධන මත දාපු බදු දැන් අඩු කරමින් සිටිනවා. ඇයි, ඔබතුමන්ලාගේ රජය අඩුම තරමින් මේ මොහොතේදීවත් අර මැතිවරණ පොරොන්දුව ක්‍රියාත්මක කරන්න කටයුතු නොකරන්නේ?

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)

ඔබතුමා අහන ප්‍රශ්නය වන term tender එකකට ගරු කරපු නැති සැපයුම්කරුවෙක් spot tender එකකට ඉදිරිපත් වෙලා තිබෙනවාද කියන කාරණය ගැන මම 2වැනි ප්‍රශ්නයට පිළිතුර හැටියට ඉතා පැහැදිලිව සඳහන් කළා, 2026 අප්‍රේල් මාසයේදී ඒ සැපයුම පැහැර හැරලා තිබෙන්නේ Verrington UAE කියන සමාගම කියලා. ඒක තමයි මේ කාලය තුළ වාර්තා වන එකම එක. ඒ වාගේම මම කලින් සඳහන් කළා වාගේ ඔබතුමා නිශ්චිත වශයෙන් කියනවා නම්, මෙන්න මේ සැපයුම්කරු term tender එකට ගරු කරන්නේ නැතිව spot tender එකට - *[බාධා කිරීමක්]* ඉන්න, මම පැහැදිලි කරන්නම්. මේක spot tender එකක්. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා කියන්න උත්සාහ කරන්නේ term tender එකට ගරු කරන්නේ නැතිව spot tender එක හරහා කිසියම් සමාගමක් තෙල් සැපයීම කරලා තිබෙනවා කියලා නේ. ඒක තමයි මම කියන්නේ, මට ලැබී තිබෙන දත්ත අනුව එහෙම එකක් නැහැ කියලා. ඔබතුමා නිශ්චිත වශයෙන් කියනවා නම්, අහවල් සමාගම ඒ term tender එක violate කරලා තිබෙනවා, හැබැයි spot tender එක දීලා තිබෙනවා කියලා, මට නිශ්චිත වශයෙන් කියන්න පුළුවන්, ඒක එහෙම වෙලාද, නැද්ද කියන එක. එහෙම නැතිව ඒ සමාගම හැරෙන්න වෙන සමාගමක් පිළිබඳ තොරතුරු මා සතුව නැහැ, එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ.

මම දැක්කා, ඊයේත් මන්ත්‍රීවරයෙක් ඔය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අහලා තිබුණා. හැබැයි, එතුමා උත්තරය දැනගෙන පස්සේ ඒක හෙළිදරව් වුණාම අපහසුතාවට පත් නොවී ඉන්න එතුමා පාර්ලිමේන්තුවට ආවේ නැහැ. ඒ හින්දා එතුමාට ප්‍රශ්නයෙන් බේරෙන්න පුළුවන්කම ලැබුණා. මේ සම්බන්ධව සමාජය තුළ විවිධ තොරතුරු හුවමාරු වනවා. හැබැයි, වගකිවයුතු මහජන නියෝජිතයෝ හැටියට අපට කරන්න තිබෙන දේ තමයි, ඒ පිළිබඳ නිශ්චිත තොරතුරු පදනම් කරගෙන ප්‍රශ්න අහන එක. එහෙමයි කළ යුත්තේ.

ගරු විපක්ෂ නායකතුමනි, ඒ වාගේම ඔබතුමා තවත් කාරණයක් සඳහන් කළා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තමයි අපේ රටේ ජනතාවට අපි දුන් පොරොන්දුව. එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අහවල් පිටුවේ තිබෙන ආකාරයට අපි ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියලා ඔබතුමා අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පිටු අංක සඳහන් කරලා නිශ්චිතව කියනවා නම්, මට ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්න පුළුවන්.

ඒ වාගේම දැන් ඔබතුමා ඇහුවා නේ, අපි මේ සමහර සහන පාරිභෝගිකයින්ට ලබා දෙන්නේ නැත්තේ ඇයි කියලා. ඇත්තටම ගත්තොත්, ඔබතුමාත් නිවැරදිව සඳහන් කළා වාගේ මැද පෙරදිග ඇති වෙලා තිබෙන යුද්ධමය තත්ත්වයත් එක්ක අපි බලාපොරොත්තු වනවාට වඩා වැඩි මුදල් ප්‍රමාණයකින් තෙල් මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. හැබැයි, මේ තෙල් මිල ඉහළ යෑමේ සම්පූර්ණ බර පාරිභෝගිකයා මත පටවන්න අපි කටයුතු කරලා නැහැ. උදාහරණයක් හැටියට ඩීසල් ගත්තොත්, මේ කාලය වන විට නියමිත මිල සූත්‍රයට අනුව මිල ගළපනවා නම් සාමාන්‍යයෙන් ඩීසල් ලීටරයක මිල රුපියල් 750ක් විතර වනවා. හැබැයි, අවසාන මිල වැඩිවීමත් එක්ක දැන් අපි ඩීසල් ලීටරයක් දෙන්නේ රුපියල් 410කට. මෙතැනදී මහා භාණ්ඩාගාරය විසින් හැම ඩීසල් ලීටරයකටම රුපියල් 100ක වියදමක් දරනවා. ඒ අනුව රුපියල් බිලියන 15ක් ඒ වෙනුවෙන් අපි වෙන් කර තිබෙනවා. ඒ වාගේම සහනාධාර හැටියට පෙට්‍රල් ලීටරයකට රුපියල් 20ක වියදමක් මහා භාණ්ඩාගාරයෙන් දරනවා.

ඒ විතරක් නොවෙයි. දැන් මේ අදාළ සමාගම්වලට සමහර මාසවල ලාභයක් තිබෙනවා, සමහර මාසවල පාඩුවක් තිබෙනවා. උදාහරණයක් හැටියට මේ කාලය ගත්තොත්, පාඩු පිට තමයි ඒ සමාගම් කරගෙන යන්න වෙන්නේ. තමන්ගේ එක් එක් මාසයේ ලාභය හා අලාභය මත පදනම් වෙන්නේ නැතුව සම්පූර්ණ අවුරුද්ද තුළ පාඩුවක් ඇති නොවන විධියට ඒ සමාගම් තමන්ගේ ව්‍යාපාරික සැලැස්ම සකස් කර ගනීවි කියලා අපි විශ්වාස කරනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, ජනවාරි මාසයේ හෝ පෙබරවාරි මාසයේ කිසියම් ලාභයක් ආවා නම් මැයි මාසයේ හෝ ජූනි මාසයේ ඇති වන පාඩුව පියවා ගැනීම සඳහා ඔවුන් ඒ අනුව කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. ඒ හරහා තමයි මැද පෙරදිග යුද්ධමය තත්ත්වය නිසා ඇති වෙච්ච පීඩනය සම්පූර්ණයෙන්ම ඉන්ධන පාරිභෝගිකයින්ට ලබා දෙන්නේ නැතුව කොටසක් රජය විසින් දරමින්, ඒ වාගේම තවත් කොටසක් ඒ ඒ operatorsලාට, එහෙම නැත්නම් ඉන්ධන බෙදා හරින සමාගම්වලට දරන්න කියමින් අපි කටයුතු කරන්නේ. ඒ නිසා තමයි වගකිව යුතු රජයක් හැටියට මේ සමස්ත පීඩනය පාරිභෝගිකයින්ට ලබා දීම සඳහා අපි කටයුතු නොකරන්නේ.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
( மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු කථානායකතුමනි, මීට පෙර ස්ථාවර නියෝග 27(2) යටතේ මම ඉදිරිපත් නොකළ ප්‍රශ්නයක් පිළිබඳව ඔබතුමාගෙන් කරපු ඉල්ලීමකට අනුව ඔබතුමා Parliamentary Business Committee එකේදී කිව්වා, point of Order එකක් අරගෙන ඒ ගැන අහන්න කියලා. මේ සභාව තුළ මම ඉදිරිපත් නොකරපු ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයකට රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන ඇමතිතුමා මීට සති දෙකකට පෙර පිළිතුර සභාගත කරලා තිබුණා. ඒ, මම ඉදිරිපත් නොකළ ප්‍රශ්නයකට. ඒ ප්‍රශ්නයට ලැබුණේ නැති උත්තරයක් පිළිබඳව එතුමාගෙන් අහන්න ඕනෑ කියලා අවස්ථා කීපයකදීම මම හිතුවා. හැබැයි, අදත් එතුමා මේ සභාවේ නැහැ. ඒ නිසා මට මේ සම්බන්ධව කියන්න අවස්ථාව ලබා දෙන්න, ගරු කථානායකතුමනි. මම විනාඩියකින් අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, මම මේ සභාවේදී විශ්‍රාමික වැටුප් පිළිබඳ ප්‍රශ්නයක් මතු කළා. මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ නැතුව ගරු ඇමතිතුමා ඊට පිළිතුර සභාගත කරලා තිබුණා. ඒ ප්‍රශ්නය යටතේ මම ඍජුවම ප්‍රශ්න තුනක් අහලා තිබුණා, ගරු කථානායකතුමනි. එක ප්‍රශ්නයක් තමයි, pensionersලාගෙන් Withholding Tax කපන එක නවත්වන්න කියන එක. දැනට මේ රටේ තිබෙන ආර්ථික තත්ත්වයත් එක්ක pensionersලාට Withholding Tax එක නැති කරලා, ඊට පස්සේ ඒකට ක්‍රමවේදයක් හදන්න පුළුවන්ද කියලා යෝජනාවක් සහ ඉල්ලීමක් මම මේ පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරලා තිබුණා.

දෙවැනි ප්‍රශ්නය හැටියට මම අහලා තිබුණා, දැනට භාණ්ඩාගාරයේ මුදල්වලින් මාසිකව pension ගෙවන්නේ නැතිව pension fund එකක් හදන එක ගැන. නමුත්, ඒ ප්‍රශ්නයටත් හරියට පිළිතුරක් ලැබුණේ නැහැ, ගරු කථානායකතුමනි.

මම අහපු අවසාන ප්‍රශ්නය මේකයි. Casual laborersලා විධියට ඉඳලා පසුව ඒගොල්ලන් permanent වුණාට පස්සේ casual කාලයයි, permanent කාලයයි ගත්තාම, අවුරුදු 45න් පස්සේ permanent වුණාද, නැද්ද කියලා බලලා pension නොගෙවන තත්ත්වයක් තිබෙනවා. ශ්‍රී ලංකාව තුළ එය ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. මේ වාගේ විශාල පිරිසක් ඉන්නවා. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, ඒ වාගේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩ කරපු විශාල පිරිසකුත් ඉන්නවා. ඒ පිළිබඳව මේ රජය මැදිහත්වීමෙන් කමිටුවක් පත් කරලා ඒ කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ කාරණා පිළිබඳව පිළිතුරක් ලැබුණේ නැහැ, ගරු කථානායකතුමනි. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් පිළිතුරක් ලබා දෙන ලෙසට. ගරු කථානායකතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා.

## II

## හමුදාව විසින් අත්පත් කරගත් උතුරු ප්‍රදේශයේ පෞද්ගලික ඉඩම් නිදහස් කිරීම
## வடக்கில் இராணுவத்தால் கையகப்படுத்தப்பட்டிருக்கின்ற தனியார் காணிகளை விடுவித்தல்
## RELEASE OF PRIVATE LANDS IN THE NORTH ACQUIRED BY THE MILITARY

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ சபாநாயகர் அவர்களே, பாராளுமன்ற நிலையியற் கட்டளை 27(2)இன்கீழ் கௌரவ பாதுகாப்பு அமைச்சரிடம் கேள்வி கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

இலங்கைக் குடிமகன் ஒருவனின் அடிப்படைத் தேவைகள் மூன்றில் உறைவிடமும் ஒன்று. சிலருக்கு இது தெரியவே தெரியாது. இந்த நாட்டில் இனரீதியான உள்நாட்டுப் போர் முடிவடைந்து 16 வருடங்களாகிவிட்டன. "கடந்த 76 வருடங்களாக இந்த நாட்டை மாறி மாறி ஆட்சி செய்த அரசாங்கங்கள் இந்த நாட்டின் சாபங்கள்" என்றும் "சிங்கள, தமிழ் மக்களுக்கு இடையில் புதியதோர் உறவை மேம்படுத்துவோம்" என்றும் பரப்புரைசெய்து, தங்களுடைய அரசாங்கம் மக்களின் பெருமளவான ஆதரவைப் பெற்றது. தங்களுடைய சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் தமிழ் மக்களுக்குக் கொடுத்த வாக்குறுதிகளில் இதுவரை சிலவற்றையேனும் மனச்சுத்தியுடன் நிறைவேற்றவில்லை. 2000ஆம் ஆண்டில் தங்களுடைய JVP கண்டியிலிருந்து கொழும்பு நோக்கிப் பேரணியை மேற்கொண்டதை நான் இச்சந்தர்ப்பத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்தப் பேரணியில் கலந்துகொண்டிருந்த ராமலிங்கம் சந்திரசேகர் இப்பொழுது எனக்கு முன்னால் அமர்ந்திருக்கிறார். இருந்தும், மக்கள் தங்கள்மீது வைத்த நம்பிக்கைக்குத் தங்களுடைய சனாதிபதி “மக்களின் காணி மக்களுக்கே” என்ற தொனியில் தொடர்ந்தும் தமிழ் மக்களை ஏமாற்றி வருகின்றார் என்பதுதான் நிதர்சனம்!

வடக்கு, கிழக்கு மாகாணங்கள் தவிர்ந்த ஏனைய மாகாணங்களில் ஓர் இனத்துக்கு எதிரான இனரீதியிலான அடக்குமுறை இதுவரை கட்டவிழ்த்து விடப்படவில்லை. இருப்பினும், 40 வருட கால உள்நாட்டு யுத்தத்தால் பாதிக்கப்பட்ட தமிழ் மக்கள் தற்போதும் அதேநிலையில்தான் இருக்கிறார்கள் என்பதை நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். குறிப்பாக, இடப்பெயர்வின் பின்னர் தங்களுடைய சொந்த வாழ்விடங்களுக்குத் திரும்ப முடியாத வகையிலும், பரம்பரை பரம்பரையாகச் செய்துவந்த சொந்தத் தொழிலைச் செய்துகொள்ள முடியாத வகையிலும், இந்த அரசாங்கம் தமிழ் மக்களுக்கு எதிராக இன ரீதியிலான, அரசியல் ரீதியிலான வன்முறைகளைக் கட்டவிழ்த்து விட்டுக்கொண்டே இருக்கின்றது. இதன் ஓர் அங்கமாக இராணுவத்தால் கையகப்படுத்தப்பட்ட தமிழ் மக்களின் பூர்வீகக் காணிகளை விடுவிப்பதற்காக தமிழ் மக்கள் தசாப்தங்களாக அரசியல் ரீதியாகவும் ஜனநாயக ரீதியாகவும் போராடி வருகின்றார்கள். பலாலி வீதியின் கிழக்குப் பகுதியிலுள்ள காணிகளை விடுவிப்பதாக அண்மைய தினத்தில்கூட சனாதிபதி அவர்கள் சொல்லியிருக்கிறார். இந்த விடயம் சம்பந்தமாக நான் பின்வரும் வினாக்களைக் கேட்க விரும்புகின்றேன்.

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා]

1. வடக்கு மாகாணத்தின் ஐந்து மாவட்டங்களிலும் 'பாதுகாப்பு வலயம்' என்ற போர்வையில் இராணுவத்தால் தற்சமயம் கையகப்படுத்தப் பட்டு இருக்கின்ற பொதுமக்களின் அல்லது தனியாரின் காணிகள் எந்தெந்த இடங்களில் எத்தனை பரப்பளவு இருக்கின்றது? அதாவது, ஒவ்வொரு மாவட்டத்திலும் இராணுவத்தால் கையகப்படுத்தப்பட்ட காணிகளின் விஸ்தீரணத் தையும் அவற்றின் அமைவிடத்தையும் தனித் தனியாக குறிப்பிடவும்.

2. யாழ். மாவட்டத்தில் வலிகாமம் வடக்குப் பிரதேசத்தில் அமைந்திருக்கின்ற பலாலி சர்வதேச விமான நிலையம் சட்டரீதியாகக் கொண்டிருக்கின்ற மொத்த நிலப்பரப்பு எவ்வளவு? அதாவது, gazette பண்ணப்பட்ட மொத்த நிலப்பரப்பு எவ்வளவு?

3. பலாலி விமான நிலையம் தற்போது கொண்டிருக் கின்ற நிலப்பரப்பு எவ்வளவு? அதாவது, சட்டரீதியாக அங்கீகரிக்கப்பட்ட நிலப்பரப்புடன் தற்சமயம் கையகப்படுத்தி வைத்திருக்கின்ற பொது மக்களுடைய காணியை யும் சேர்த்து மொத்தக் காணியின் அளவு எவ்வளவு?

4. சட்டரீதியாக வழங்கப்பட்ட நிலப்பரப்பைத் தாண்டி, மேலதிக நிலப்பரப்பை பலாலி விமான நிலைய விஸ்தரிப்புக்கு வழங்குவதற்காக 'உயர் பாதுகாப்பு வலயம்' என்ற போர்வையில் இராணுவத்தால் கையகப்படுத்தப்பட்ட காணி களில் எத்தனை பரப்பு பலாலி விமான நிலையத்துக்கு வழங்கப்பட்டது?

அதாவது, 'உயர் பாதுகாப்பு வலயம்' என்ற போர்வையில் அந்த இடத்திலிருந்த மக்களை வெளியேற்றி, முழுக் காணியையும் இராணுவம் சுவீகரித்து, அங்கு விவசாயம் செய்துகொண்டு இருக்கின்றது. இந்த உண்மையை நான் சிங்கள மக்களுக்குச் சொல்ல ஆசைப்படுகின்றேன்.

5. பலாலி விமான நிலையம் தவிர்ந்த யாழ்ப்பாணத்தின் வலிகாமம் பிரதேசத்தில் இராணுவத்தால் பெருமளவான காணிகள் கையகப்படுத்தப்பட்டு, அவை இராணுவ நோக்கங்களுக்கு அல்லாமல் வியாபார நோக்கங்களுக்குப் பயன்படுத்தப் படுகின்றன. அவ்வாறு இராணுவம் விவசாயம் செய்யும் மொத்த நிலப்பரப்பு எவ்வளவு? நான் தனித் தனியாகக் கேட்கின்றேன்.

6. வலி. வடக்கில் மயிலிட்டிப் பிரதேசத்தில் இருக்கின்ற எந்தெந்தக் கிராம சேவையாளர் பிரிவுகளில், பொதுமக்கள் மீளக்குடியமர்வதற்கு வழங்க முன்வராமல் இருக்கின்ற இராணுவம் கையகப்படுத்தி வைத்திருக்கின்ற காணிகள் எவை? அவற்றின் மொத்த விஸ்தீரணம் எவ்வளவு?

7. வலி. வடக்கில் பலாலி வீதியின் கிழக்குப் புறமாக இராணுவம் ஆக்கிரமித்த பொதுமக்களின் காணிகளில் இராணுவ ஆதார வைத்தியசாலை ஒன்று கட்டப் படுகின்றதா? அண்மைய தினத்தில் சனாதிபதியுடன் நடைபெற்ற கூட்டத்தில் பாதுகாப்புப் பிரதானி சொல்லியிருந்தார், அந்த இடத்தில் வைத்தியசாலை ஒன்று கட்டப்படவில்லை என்று. ஆனால், அங்கு வைத்தியசாலை கட்டிமுடிக்கப்பட்டு இருக்கிறது. 2007 - 2025ஆம் ஆண்டு வரைக்கும் அந்த வைத்தியசாலை கட்டப்பட்டு இருக்கிறது. கௌரவ பாதுகாப்புப் பிரதி அமைச்சரும் அந்த meetingஇல் இருந்தார்.

8. ஆமெனில், அந்த வைத்தியசாலையின் மொத்த விஸ்தீரணம் எவ்வளவு? அங்கு வைத்தியசாலை ஒன்றைக் கட்டுகின்றீர்கள் என்றால், அதை எவ்வளவு விஸ்தீரணத்தில் கட்டுகின்றீர்கள் என்றுதான் கேட்கின்றேன்.

9. அந்த வைத்தியசாலைக்கு, இராணுவச் செலவுகளில் இந்த வருடம் ஒதுக்கப்பட்ட மொத்தப் பணம் எவ்வளவு? அதாவது, நீங்கள் அந்த வைத்திய சாலையை இராணுவத்துக்கென ஒதுக்கியிருந்தால், அதற்கு இந்த வருட Budgetஇல் எவ்வளவு நிதி ஒதுக்கியிருக்கிறீர்கள் என்றுதான் கேட்கின்றேன்.

10. இந்த வைத்தியசாலை பொதுமக்களின் காணியில் கட்டப்படுவதை பொதுமக்கள் எதிர்க்கிறார்கள் என்பதை பாதுகாப்பு அமைச்சராகத் தாங்கள் ஏற்றுக்கொள்கின்றீர்களா? அன்றைய தினம் சனாதிபதியுடன் நடந்த meetingஇல் நான் இது பற்றி கதைக்கும்போது, பாதுகாப்புப் பிரதானி எங்களுடைய பிரதி அமைச்சருக்கு 'இல்லை' என்று பொய் சொல்லியிருக்கிறார். நான் அதைச் challenge பண்ணியிருக்கிறேன். ஆகவே, தயவுசெய்து, இதற்குரிய பதிலைத் தரவும்.

11. "மக்களின் காணி மக்களுக்கு" என்று தங்களுடைய சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் யாழ். மாவட்டத்தில் நடந்த விசேட மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் தெரிவித்தது தங்களுக்குத் தெரியுமா?

12. அவ்வாறாயின், பலாலி வீதிக்குக் கிழக்குப் புறமாகவுள்ள பொதுமக்களின் காணிகள் இதுவரை அவர்களிடம் ஒப்படைக்கப்படாதது ஏன்? நீங்கள் ஆட்சிக்கு வந்து ஒன்றரை வருடங்களாகின்றன. இராணுவம் விவசாயம் செய்துகொண்டு இருக்கின்ற காணியில் சிறு பகுதியையேனும் இன்றுவரை மக்களுக்கு வழங்காதது ஏன்?

13. இந்த வைத்தியசாலை கட்டப்படும் நேரத்தில் தங்களுடைய சனாதிபதி அவர்கள் யாழ். மாவட்டத்தில் நடந்த பொதுக்கூட்டம் ஒன்றில், அது சட்டவிரோதமானது என்பதை ஏற்றுக்கொண்டு இருப்பதைத் தாங்கள் அறிவீர்களா? அண்மையில் நடந்த meetingஇல்கூட சனாதிபதி சொல்லி யிருக்கிறார், அது மக்களுடைய காணி என்றால் கட்டாயம் மக்களுக்கு வழங்கப்பட வேண்டும் என்று. வார்த்தைகளால் ஜாலம் காட்டுவதைத்தான் நான் இங்கு முக்கியமாகச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். தயவுசெய்து, பொய் சொல்வதை நிறுத்தவும்!

14. ஆமெனில், உடனடியாகப் பலாலி வீதிக்குக் கிழக்குப் புறமாகவுள்ள இந்தக் காணிகளை விடுவிக்கத் தங்களால் முடியுமா? அவ்வாறாயின், அவை விடுவிக்கப்படும் திகதி என்ன? 'ஆம்' என்று சொல்லி ஏமாற்ற வேண்டாம். தயவுசெய்து, அது விடுவிக் கப்படும் திகதியைக் குறிப்பிடவும். அண்மையில்

சனாதிபதி அவர்கள் சொல்லி இருந்தார், பிரதி அமைச்சரோடு சென்று அந்த இடங்களைத் தெளிவாகக் காட்டுமாறு. ஆனால், கஜேந்திரகுமார் பொன்னம்பலம் அவர்கள் ஏதோ தான்தான் அந்தக் காணியை விடுவிப்பதாகப் போய் நிற்கிறார். நாங்கள் அவருடைய அரசியலைப் பார்த்துக்கொள்வோம். ஏழைகளின் பிரதிநிதி என்ற அடிப்படையில், நான் இந்தக் கேள்விகளை வாழ்விடம் இல்லாமல் தவிக்கும் வலிகாமம் மக்கள் சார்பாகக் கேட்கின்றேன். இவற்றின் ஆழத்தை மாண்புமிகு சனாதிபதி அவர்களும் பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்களும் புரிந்துகொள்வார்கள் என்ற நம்பிக்கையுள்ளது. நன்றி!

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

ගරු මන්ත්‍රීතුමනි, මේක දීර්ඝ ප්‍රශ්නයක්. ඒකට සෑහෙන කාලයක් අවශ්‍යයි. ඒ පිළිතුර සැපයීම සඳහා කල් ඉල්ලනවා.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, ගරු කේ. ඩී. ලාල් කාන්ත මහතා. 2026.01.07 දින ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## වට්ටක්කච්චි කෘෂිකර්ම පාසල සහ ගොවිපළ නැවත ආරම්භ කිරීම: කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## வட்டக்கச்சி விவசாயப் பாடசாலையையும் பண்ணையையும் மீள ஆரம்பித்தல்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரினது கூற்று
## RECOMMENCEMENT OF VADDAKKACHCHI AGRICULTURE SCHOOL AND FARM: STATEMENT BY MINISTER OF AGRICULTURE, LIVESTOCK, LAND AND IRRIGATION

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු කථානායකතුමනි, ඒ මන්ත්‍රීතුමා මේ වෙලාවේ සභාවේ නැහැ. ඒ නිසා මම පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

වට්ටක්කච්චි කෘෂිකර්ම පාසල සහ ගොවිපළ, උතුරු පළාත් කෘෂිකර්ම හා ගොවිජන සේවා සත්ව පාලන වාරිමාර්ග ධීවර ජල සම්පාදන සහ පරිසර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක බැවින් මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ කෘෂිකර්ම අමාත්‍යාංශය සන්තකව එහි ඉඩම් පිළිබඳව හෝ වෙනත් කරුණු පිළිබඳව තොරතුරු පවත්වාගෙන නොමැත. එබැවින් ගරු මන්ත්‍රීතුමා විමසා ඇති කරුණු උතුරු පළාත් ප්‍රධාන ලේකම් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව යන ආයතන වෙතින් විමසා ලබාගත් තොරතුරු අනුව කරුණු ඉදිරිපත් කරමි.

1. මෙම ගොවිපළට අයත් මුළු ඉඩම අක්කර 441ක භූමි ප්‍රමාණයකින් යුක්ත බව උතුරු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අංක NP/31/03/VF/2026 හා 2026.03.20 දිනැති ලිපිය (ඇමුණුම 01-I)** මඟින් දන්වා ඇති නමුත්, කුඹුරු හා ගොඩ ඉඩම් වශයෙන් වෙන් කර දක්වා නොමැත.

   එකී දැනුම් දීම අනුව, 2026.03.10වන විට දිස්ත්‍රික් කෘෂිකර්ම මධ්‍යස්ථානයක් ලෙස අක්කර 45ක් ද, 2026.03.11 දින යුද හමුදාවෙන් නැවත නිදහස් කළ අක්කර 07ක් ද සමඟ අක්කර 52ක් උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පවතින බව දන්වා ඇත. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් ලද තොරතුරු අනුව එම දෙපාර්තමේන්තුව යටතේ මඩ ඉඩම් අක්කර 150ක් හා ගොඩ ඉඩම් අක්කර 15ක් වශයෙන් සමස්ත අක්කර 165ක් පවතින බව දන්වා ඇත. ඒ අනුව දැනට අනාවරණය කරගත හැකි භූමි ප්‍රමාණය අක්කර 52ක් සහ 165ක් වන අතර, සමස්ත ප්‍රමාණය අක්කර 271ක් වේ.

2. මීට පූර්වයෙන් යුද හමුදාව පරිහරණය කළ අක්කර 07ක ඉඩම් කොටස 2026.03.11 දින ආරක්ෂක හමුදා පාලනයෙන් නිදහස් කර උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත.

   සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සතුව වට්ටක්කච්චි ගොවිපළ සබැඳිව මඩ කුඹුරු අක්කර 150ක් හා ගොඩ ඉඩම් අක්කර 15ක් පවතින බවත් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත මෙම ඉඩම් කොටස ලබා දී ඇති බවත් ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලා සිටින අවස්ථාවකදී ආපසු ලබා දීමට හැකියාවක් පවතින බවත් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් 2026.01.07 දින ඉදිරිපත් කර ඇති ලිපියෙන් දන්වා ඇත. **(ඇමුණුම 02)****

   ඒ අනුව, උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන සංවර්ධන වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා සිවිල් ආරක්ෂක **දෙපාර්තමේන්තුව** භුක්ති විඳින අක්කර 165ක ඉඩම් කොටස නිදහස් කර ගැනීම වෙනුවෙන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව, මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය, උතුරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, උතුරු පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් - කිලිනොච්චිය හා ප්‍රාදේශීය ලේකම් - කිලිනොච්චිය විසින් ඉදිරි කටයුතු කළ යුතුව ඇත.

3. පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක NP/25/02/02/007/(2-3) හා 2026.03.19 දිනැති ලිපියෙන් දන්වා ඇති ගොවිපළ ඉඩම් අක්කර 416ක ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉදිරි වැඩසටහන් උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත අනුමැතිය හා ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. **(ඇමුණුම 01 - II)**** ඒ අනුව, රැකියා අවස්ථා සහ ආදායම් උපයන අංශයක් බවට පත් කිරීමට හැකිවනු ඇත.

4. ඔව්.

   - නව ප්‍රභේද බිහි කිරීම සඳහා අවශ්‍ය අභිජනන කටයුතු සිදු කිරීම, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණයන් වැඩිදියුණු කිරීම, එමෙන්ම ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම ආදිය අඛණ්ඩව සිදු කෙරේ.

   - විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති මඟින් නව ප්‍රභේද අභිජනනය හෙවත් වැඩිදියුණු කිරීම දෙමුහුම් හා නුමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම හා බීජ නිෂ්පාදන දේශගුණ විපර්යාසයන්ට ඔරොත්තු දෙන ලෙස ආහාර භෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම හා තාක්ෂණයන් ජනනය කිරීම විවිධ රෝග හා පළිබෝධ සඳහා ඔරොත්තු දෙන ප්‍රභේද අභිජනනයට අදාළ පර්යේෂණ සිදු කිරීම හා රෝග හා පළිබෝධ පාලන ක්‍රමවේද සඳහා පර්යේෂණ සිදු කිරීම සිදු කෙරේ.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

- ශ්‍රී ලංකාවේ රජය විසින් අතිරේක ආහාර භෝග (මිරිස්, ලූනු, බඩඉරිඟු, කුරක්කන්, උඳු, මුං, කව්පි, රටකජු, සෝයා, තල ආදී) සඳහා නව ප්‍රභේද සංවර්ධනය, නව තාක්ෂණ හඳුන්වා දීම සඳහා පර්යේෂණ කටයුතු සක්‍රියව සිදු කරනු ලබයි.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක දිවයින පුරා විසිරී ඇති ප්‍රධාන පර්යේෂණ ආයතන හතර (වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, පලතුරු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය හා උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය) හා ඊට අනුබද්ධ පර්යේෂණ ආයතන මඟින් විශාල ලෙස නව ප්‍රභේද හා නව තාක්ෂණයන් හඳුන්වා දී ඇත. **(ඇමුණුම 03)****

- නව සත්ව ප්‍රභේද සොයා ගැනීම ඉතා විශාල කාලයක් ගතවන හා විශාල විනිමය අවශ්‍යතාවක් පවතින පර්යේෂණ ක්‍රියාවලියකි. එබැවින් පවතින සම්පත් අනුව දැනට එවැනි නව සත්ව ප්‍රභේද සොයා ගැනීම සඳහා වන පර්යේෂණ සිදු නොකෙරේ.

- එබැවින්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ඉහළ නිෂ්පාදන හැකියාවක් සඳහා ජාන විභවතාව වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් ඉහළ නිෂ්පාදන හැකියාවක් ඇති ගව ශුක්‍ර වඩි නිෂ්පාදනය හා ආනයනය සිදු කර ඒ ඔස්සේ, පවතින සත්ව ගහනයේ ජානමය හැකියාව වැඩිදියුණු කිරීමට කටයුතු කරනු ලැබේ.

- රට තුළ නව ප්‍රභේද - Synthetic Breed - නිර්මාණය කිරීම, දේශීය සත්ව ගහනය ජානමය වශයෙන් උසස් කිරීම සහ නව ප්‍රභේද ආනයනය කිරීම පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු **ඇමුණුම 04**** සහ **ඇමුණුම 05**** මඟින් දැක්වේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 92(2)(ආ) යටතේ මම මේ කාරණය අහන්නේ. විපක්ෂයේ මන්ත්‍රී කෙනෙක් ප්‍රශ්නයක් අහන්නේ ඒක ලොකු ප්‍රශ්නයක් නිසා. විපක්ෂයේ ගොඩාක් කට්ටිය ඉන්නවා. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා අද උදේ ආවෙත් නැහැ. මේ ප්‍රශ්නයට උත්තර දෙන වේලාවේත් නැහැ. කරුණාකරලා ස්ථාවර නියෝග 33(1) අනුව වෙනම කෙනෙකුට අමතර ප්‍රශ්න අහන්න අවසර දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟ අමාත්‍යාංශ නිවේදනය, ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ අමාත්‍යතුමා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## දුප්පත්කම තුරන් කිරීමේ රජයේ වැඩ පිළිවෙළ: ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## வறுமையை ஒழிப்பதற்கான அரசாங்கத்தின் வேலைத்திட்டம்: கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரினது கூற்று
## GOVERNMENT INITIATIVE FOR POVERTY ALLEVIATION: STATEMENT BY MINISTER OF RURAL DEVELOPMENT, SOCIAL SECURITY AND COMMUNITY EMPOWERMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මහතා 2026 මාර්තු 19වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. මෙහිදී වර්තමානයේ ශ්‍රී ලංකාවේ දුප්පත්කමින් පෙළෙන ජනගහනය පිළිබඳව දිස්ත්‍රික්ක වශයෙන් අහන්නේ. ගරු කථානායකතුමනි, අපේ රටේ දුප්පත්කම සහ දුප්පත්කමින් පෙළෙන ජනගහනය පිළිබඳව වාර්තා නිකුත් කරනු ලබන්නේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවයි. ඒ අනුව අවසාන වතාවට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව අපේ රටේ දුප්පත්කමින් පෙළෙන ජනගහනය සහ දිළිඳු පුද්ගල ප්‍රමාණය දිස්ත්‍රික් වශයෙන් ගණනය කරලා තිබෙන්නේ 2019 වර්ෂයේදී. ඒ අනුව පුද්ගලයන් 3,042,256ක් දිළිඳු විධියට හඳුනාගෙන තිබෙනවා. ඊට අමතරව 2025 වර්ෂයේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සමීක්ෂණ කටයුතු අවසන් කරලා තිබෙනවා. ඒ සමීක්ෂණයේ ප්‍රතිඵල 2026 ඔක්තෝබර් මාසයේ නිකුත් කිරීමට නියමිතයි. ඒ අනුව තමයි අපට නිල සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීමට හැකියාවක් පවතින්නේ.

මීට අමතරව සමාජ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් අපේ රටේ දිළිඳු ප්‍රජාව හඳුනා ගැනීමක් සිදු කරනු ලබනවා. ඒ අනුව 2026 මාර්තු මාසය වනවිට පවුල් 1,695,843ක් දිළිඳු ප්‍රජාව විධියට සමාජ සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් හඳුනාගෙන තිබෙනවා. දිස්ත්‍රික්ක වශයෙන් ඒ තොරතුරු පහත වගුවේ සඳහන් වනවා.

| අනු අංකය | දිස්ත්‍රික්කය | පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | කොළඹ | 46,398 |
| 2 | ගම්පහ | 81,854 |
| 3 | කළුතර | 74,570 |
| 4 | මහනුවර | 93,634 |
| 5 | මාතලේ | 55,587 |
| 6 | නුවරඑළිය | 90,871 |

| අනු අංකය | දිස්ත්‍රික්කය | පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 7 | ගාල්ල | 100,465 |
| 8 | මාතර | 52,992 |
| 9 | හම්බන්තොට | 57,699 |
| 10 | යාපනය | 68,379 |
| 11 | මන්නාරම | 18,028 |
| 12 | වව්නියාව | 30,078 |
| 13 | මුලතිව් | 25,190 |
| 14 | කිලිනොච්චිය | 17,459 |
| 15 | මඩකලපුව | 78,006 |
| 16 | අම්පාර | 70,262 |
| 17 | ත්‍රිකුණාමලය | 57,902 |
| 18 | කුරුණෑගල | 112,583 |
| 19 | පුත්තලම | 73,806 |
| 20 | අනුරාධපුරය | 62,271 |
| 21 | පොලොන්නරුව | 45,251 |
| 22 | බදුල්ල | 111,849 |
| 23 | මොනරාගල | 60,620 |
| 24 | රත්නපුර | 127,515 |
| 25 | කෑගල්ල | 82,574 |
| | එකතුව | **1,695,843** |

2. රජය විසින් දුප්පත්කම නිර්වචනය කරන්නේ කෙසේද කියා අසා තිබෙනවා. ගරු කථානායකතුමනි, රජයේ නිල ආයතනය විධියට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව තමයි දිළිඳුකම නිර්වචනය කරන්නේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුගේ හෝ පවුලක දුප්පත්කම නිර්වචනය කරනු ලබන්නේ නිල දරිද්‍රතා රේඛාව පදනම් කරගෙනයි. ඒ අනුව, මූලික අවශ්‍යතා වශයෙන් එක් පුද්ගලයෙකු සඳහා දෛනිකව කිලෝ කැලරි 2,030ක් අවශ්‍ය බවට ගණනය කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය නිශ්චිත අවම පෝෂණ අවශ්‍යතාව සපුරාලීමට ප්‍රමාණවත් ආහාර සහ ආහාර නොවන ද්‍රව්‍යවල - උදාහරණ විධියට වාසස්ථාන, ඇඳුම්, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ප්‍රවාහනය, ජලය සහ විදුලිය, සන්නිවේදනය සහ පුද්ගලික සනීපාරක්ෂාව වැනි දේවල් - අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය පිරිවැය සම්පූර්ණ කර ගැනීමට නොහැකි නම්, ඒ අය නිල දරිද්‍රතා රේඛාවේ අගයට පහළ ආදායම් ලබන අය ලෙස සලකනවා. ඒ සියලු පුද්ගලයින් දුප්පතුන් ලෙස සැලකීම තමයි රජයේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල වශයෙන් සිදු කරනු ලබන්නේ. ඒ අනුව, 2026 මාර්තු ගණනය කිරීම්වලට අනුව එක් පුද්ගලයකු සඳහා Official Poverty Line එක රුපියල් 16,690ක් වනවා.

ඊළඟට, අපේ රටේ දුප්පත්කම නිසා ඇති විය හැකි බලපෑම පිළිබඳ රජයේ තක්සේරුව ගැන අසා තිබෙනවා, ගරු කථානායකතුමනි. දිළිඳුකම ආකාර කිහිපයකින් රටකට බලපාන්න පුළුවන්. ප්‍රධාන වශයෙන් ආර්ථික වශයෙන් බලපෑමක් ඇති කරනවා. ආර්ථික වශයෙන් ගත්තොත්, ආදායම් අඩුවීම සහ වියදම් සීමාවන් ඇතිවීම, නිෂ්පාදන ඵලදායිතාව පහළ යාම, රජයේ සුබසාධන වියදම් ඉහළ යාම, ආදායම් බෙදී යාමේ විෂමතාව ඉහළ යාම, නිපුණතා හිඟය. මම ඒකෙන් අදහස් කරන්නේ වෘත්තිකයන් හා පුහුණු ශ්‍රමිකයන් රට හැර යාම.

ඊට අමතරව, සමාජීය වශයෙන් බලපෑමක් ඇති කරනවා. අධ්‍යාපනයට, සෞඛ්‍ය ගුණාත්මකභාවයට, ඒ වාගේම සමාජ අසමානතාවට සහ ජනතාව අතර සමාජ අසහනය ඉහළ යාමටත්, ජනතාව යැපුම් හා සහනාධාර මානසිකත්වයකින් පෙළීමටත් දිළිඳුකම විශාල වශයෙන් බලපෑමක් ඇති කරනවා, ගරු කථානායකතුමනි.

3. ශ්‍රී ලංකාවේ දුප්පත්කම හඳුනා ගැනීම සඳහා භාවිත කරන දර්ශක ගැනයි මේ යටතේ අහලා තිබෙන්නේ.

i. නිල දරිද්‍රතා රේඛාව - Official Poverty Line: මෙය ගණනය කිරීමේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් මූලික අවශ්‍යතා පිරිවැය - cost of basic needs- භාවිත කරනවා.

භාවිත කරන දර්ශක:

* ඒක පුද්ගල මාසික පරිභෝජන වියදම

  පුද්ගලයකුට තම මූලික අවශ්‍යතා -මම කලින් කිව්වා වාගේ ආහාර සහ ආහාර නොවන - සපුරා ගැනීමට අවශ්‍ය අවම මාසික වියදම

* ජාතික පාරිභෝගික මිල දර්ශකය

  ඒ සම්බන්ධයෙන් කාලීනව උද්ධමනය වෙනස්වීම් සලකා බලනු ලබනවා.

පසුබිම් වූ නිර්ණායක:

* පෝෂණ අවශ්‍යතාව : පුද්ගලයකුට දිනකට අවශ්‍ය අවම කැලරි ප්‍රමාණය (කිලෝ කැලරි 2030) සපුරා ගැනීමට අවශ්‍ය ආහාර පාන සඳහා වන වියදම.

* ආහාර නොවන අවශ්‍යතා : වාසස්ථානය, ඇඳුම්, අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ප්‍රවාහනය, ජලය සහ විදුලිය, සන්නිවේදනය සහ පෞද්ගලික සනීපාරක්ෂාව වැනි අත්‍යාවශ්‍ය ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වන අවම වියදම සලකා බලනවා.

* ප්‍රාදේශීය මිල වෙනස්කම් - ප්‍රාදේශීය මිල වෙනස්වීම් පිළිබඳවත් මේ ගණනය කිරීමේදී මූලික වශයෙන් ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සලකා බැලීමක් සිදු කරනු ලබනවා. ඒ අනුව 2026 මාර්තු මාසයේදී දිස්ත්‍රික්ක වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ දත්ත පහත වගුවෙහි දැක්වෙනවා.

| අංකය | දිස්ත්‍රික්කය | නිල දරිද්‍රතා රේඛාව |
|---|---|---|
| 1 | කොළඹ | 18,000 |
| 2 | ගම්පහ | 17,908 |
| 3 | කළුතර | 17,520 |
| 4 | මහනුවර | 16,942 |
| 5 | මාතලේ | 16,918 |
| 6 | නුවරඑළිය | 17,551 |
| 7 | ගාල්ල | 16,958 |
| 8 | මාතර | 16,300 |
| 9 | හම්බන්තොට | 16,216 |
| 10 | යාපනය | 16,288 |
| 11 | මන්නාරම | 17,095 |
| 12 | වවුනියාව | 16,673 |
| 13 | මුලතිව් | 16,573 |
| 14 | කිලිනොච්චි | 16,124 |

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

| අංකය | දිස්ත්‍රික්කය | නිල දරිද්‍රතා රේඛාව |
|---|---|---|
| 15 | මඩකලපුව | 16,781 |
| 16 | අම්පාර | 16,823 |
| 17 | ත්‍රිකුණාමලය | 16,262 |
| 18 | කුරුණෑගල | 16,395 |
| 19 | පුත්තලම | 17,037 |
| 20 | අනුරාධපුරය | 16,288 |
| 21 | පොළොන්නරුව | 16,331 |
| 22 | බදුල්ල | 16,814 |
| 23 | මොනරාගල | 15,958 |
| 24 | රත්නපුර | 16,764 |
| 25 | කෑගල්ල | 17,451 |
| | ජාතික | 16,690 |

ii. බහුමාන දරිද්‍රතා දර්ශකය - Multidimensional Poverty Index.

බහුමාන දරිද්‍රතා දර්ශකය සඳහා ප්‍රධාන වශයෙන් මිනුම් තුනක් සහ අනු දර්ශක 10ක් භාවිතයට ගන්නවා, ගරු කථානායකතුමනි. ප්‍රධාන දර්ශක විධියට භාවිත කරන්නේ අධ්‍යාපනය, සෞඛ්‍ය, ජීවන තත්ත්වය. ජීවන තත්ත්වය යටතේ නිවාසවල ස්වභාවය, සනීපාරක්ෂාව, පානීය ජලය, ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන, වත්කම් සහ මූලික පහසුකම් සලකා බලනවා. සෞඛ්‍ය යටතේ නිදන්ගත රෝග, සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය සලකා බලනවා. අධ්‍යාපනය යටතේ පාසල් යන කාලය සහ පාසල් යන ප්‍රමාණය පිළිබඳව සැලකිල්ලට ලක් කරනු ලබනවා. එම මානයන් සහ දර්ශකයන් පහත වගුවෙහි දැක්වෙනවා.

| මානය | දර්ශකය | විහිනවීමේ සීමාව, ගෘහ ඒකකයක් හා එහි සියලුම සාමාජිකයින් විහින තත්ත්වයට පත්වීමට නම්, ගෘහ ඒකකය/ ඒකකයේ/ ඒකකයට | බර තැබීම |
|---|---|---|---|
| අධ්‍යාපනය (1/3) | පාසල් යන කාලය | ඔවුන් පාසල් යන කාලයේ පැවති අනිවාර්යය මට්ටමට (වයස අනුව වෙනස් වන) අඩු පාසල් මට්ටමක් සහිත හෝ කිසිදා පාසල් නොගිය හෝ විශේෂ අධ්‍යාපනය ලබන වයස අවුරුදු 17 හෝ ඊට වැඩි එක් සාමාජිකයෙක් හෝ සිටී. | 1/12 |
| | පාසල් යාම | පාසල් යන වයසේ (අවුරුදු 5-16) සිටින පාසල් නොයන එක් ළමයෙකු හෝ සිටී. | 1/4 |
| සෞඛ්‍ය (1/3) | නිදන්ගත රෝග | එක් මසක් හෝ වැඩි කාලයක් ඔවුන්ගේ සාමාන්‍ය කටයුතු හෝ රැකියාව නතර කිරීමට තරම් වූ නිදන් ගත රෝගයකින් පීඩා විඳින එක් සාමාජිකයෙක් හෝ සිටී. | |
| | සෞඛ්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය | සෞඛ්‍ය පහසුකම් සඳහා ළඟාවීමට විනාඩි 30කට සමාන හෝ වැඩි කාලයක් ගත වේ. | 1/6 |
| | නිවාස | නිවසේ බිත්ති, ගෙබිම හෝ වහල සඳහා ස්ථිර නොවන ද්‍රව්‍ය යොදා ගෙන ඇත. | 1/18 |
| ජීවන තත්ත්වය (1-3) | සනීපාරක්ෂාව | වැඩි දියුණු නොකළ පහසුකම් හෝ වෙනත් ගෘහ ඒකකයක් සමඟ හවුලේ භාවිත කරන. | 1/18 |
| | පානීය ජලය | ආරක්ෂාකාරී පානීය ජල ප්‍රභවයක් නොමැති හෝ ඒ සපයා ගැනීම සඳහා විනාඩි 15කට සමාන හෝ වැඩි කාලයක් ගත වන හෝ දුර කිලෝමීටර් 1ට වැඩි හෝ පසුගිය මාසයේ පානීය ජලය ප්‍රමාණවත් නොවූ හෝ පානීය ජලයේ තත්ත්වය වැඩි දියුණු නොකළ තත්ත්වයේ ඇති. | 1/18 |
| | ආහාර පිසීමට පිරිසිදු ඉන්ධන | ආහාර පිසීම සඳහා දර, භූමිතෙල්, ලී කුඩු හෝ දහයියා යොදා ගනී. | 1/18 |
| | වත්කම් | රූපවාහිනී, රෙදි සෝදන යන්ත්‍ර, ශීතකරණ, පරිගණක, යතුරු පැදි, ත්‍රිරෝද රථ, කාර්, වෑන් , බස්, ලොරි ආදියෙන් එකක් හෝ අහිමි සහ ඉඩම්, සත්ව පාලන, කෘෂි කාර්මික/ ධීවර උපාංග (ට්‍රැක්ටර්, පාහින යන්ත්‍ර, සංයුක්ත අස්වනු නෙළීමේ යන්ත්‍ර, ධීවර බෝට්ටු, මාළු දැල්) ආදියෙන් එකකට වඩා වැඩියෙන් නොමැති. | 1/18 |
| | මූලික පහසුකම් | ආසන්නම බස් නැවතුමට ළඟා වීමට විනාඩි 15කට සමාන හෝ ඊට වැඩි කාලයක් හෝ ප්‍රාථමික හෝ ද්විතික පාසලට ළඟා වීමට විනාඩි 30කට සමාන හෝ වැඩි කාලයක් ගත වන. | 1/18 |

4. ගරු කථානායකතුමනි, දුප්පත්කම ජාතික ආර්ථිකයට ඇති කරන බලපෑම පිළිබඳව රජය විසින් අධ්‍යයන ගණනාවක් සිදු කර තිබෙනවා.

රජය, "ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය" ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හරහා වසර තුනකට වරක් නිල වශයෙන් සිදු කරනවා. ඊට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂිකව මහ බැංකු වාර්තා ඉදිරිපත් කරනවා. විශේෂයෙන්ම ඒ හරහා ඉතුරුම් පහත වැටීම සහ රජයේ සුබසාධන වියදම් ඉහළ යෑම ජාතික ආර්ථිකයට මොන විධියට බලපානවාද කියන එක පිළිබඳව පැහැදිලි කිරීමක් කරනවා.

ඊළඟට, මෑත කාලීනව සමාජ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟින් විශේෂයෙන්ම බහුවිධ දරිද්‍රතා විශ්ලේෂණයක් සිදු කරනවා. ඒ අනුව දිළිඳුකම නිසා ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට දායක විය නොහැකි පිරිස පිළිබඳව විශ්ලේෂණයක් සිදු කරනු ලබනවා.

ඊටත් අමතරව, ජාතික සංවර්ධන සැලසුම් සඳහා භාවිත කිරීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව අධ්‍යයනයන් සිදු කරනවා. ඒ වාගේම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ලෝක බැංකුව වැනි ජාත්‍යන්තර ආයතනත් අපේ රටේ දිළිඳුකම පිළිබඳව වරින් වර විවිධ අධ්‍යයන සිදු කරනවා. ලෝක බැංකුව අප්‍රේල් මාසයේදීත් මේ පිළිබඳ update එකක් ඉදිරිපත් කරනු ලැබුවා.

5. සමාජ ආරක්ෂණ වැඩසටහන් යටතේ විශේෂයෙන්ම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟින් "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන ක්‍රියාත්මක කරනවා. ඊට අමතරව ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ සමාජ සේවා දෙපාර්තමේන්තුව, ආබාධ සහිත තැනැත්තන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලය මඟින් ආබාධ සහිත

තැනැත්තන් සහ විශේෂයෙන්ම වැඩිහිටි පුද්ගලයින් සම්බන්ධයෙන් විවිධ සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් අවිධිමත් ක්ෂේත්‍රවල රැකියාවල නියුතු අයට දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා. ඒ, සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේයි. ඊට අමතරව, රේඛීය අමාත්‍යාංශය මඟින් විවිධ සමාජ ආරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතිනවා.

විශේෂයෙන්ම ආදායම් වැඩි කර ගැනීම සඳහා මේ වෙනකොට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් අඩු ආදායම්ලාභී පවුල් සවිබලගැන්වීමට ලෝක බැංකුවේ හා ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර සහ අපේ මහා භාණ්ඩාගාර අරමුදල් පාවිච්චි කරලා පස්වැදෑරුම් වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. එම සවිබලගැන්වීමේ වැඩසටහනේ කොටස් 5ක් තිබෙනවා, සමාජ ආරක්ෂණය, පුහුණු කිරීම හා උපදේශනය, ජීවනෝපාය ප්‍රවර්ධනය කිරීම, මනෝ සමාජයීය සවිබලගැන්වීම හා මූල්‍ය අන්තර්කරණය වශයෙන්. ඒ අංශ 5 තමයි ඒ යටතේ ක්‍රියාත්මක වෙන්නේ.

ඊට අමතරව, "ප්‍රජා ශක්ති" දිළිඳු බව තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය විධියට මේ වර්ෂයේදී ජාතික වශයෙන් දිළිඳු බව තුරන් කිරීමේ වැඩසටහනක් ආරම්භ කළා. එම වැඩසටහන යටතේ විශේෂයෙන්ම ප්‍රජා මට්ටමින් ප්‍රජාව සවිබලගැන්වීම් කරන අතර, ආදායම් උත්පාදන වැඩසටහනුත් ක්‍රියාත්මක කරනවා. මේ වර්ෂයේදී ඒ සඳහා රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා තිබෙනවා.

6. ඔව්.

7. ඔව්.

විශේෂයෙන්ම ජාතික තිරසර සංවර්ධන ඉලක්ක පදනම් කරගෙන 2024 වර්ෂයේදී ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තියක් සකස් කරලා තිබෙනවා. එම ප්‍රතිපත්තිය මත පිහිටලා 2025 සිට 2035 දක්වා වසර 10ක උපායමාර්ගික සැලැස්මක් සකස් කර තිබෙනවා. එම උපායමාර්ගික සැලැස්මේ ප්‍රධාන අංග කිහිපයක් තිබෙනවා. එකක් තමයි, සමාජ සහනාධාර. දෙවැනි එක සමාජ රැකවරණය. තුන්වැනි එක සමාජ රක්ෂණය - social insurance. අවසාන එක ශ්‍රම වෙළෙඳ පොළ සහ ඵලදායී ඇතුළත් කිරීම. ඒ පිළිබඳ විස්තර පහතින් දක්වා තිබෙනවා.

- සමාජ සහනාධාර - social assistance: දිළිඳු සහ අවදානමට ලක්විය හැකි පවුල් සඳහා ලබා දෙන මූල්‍ය ආධාර.
- සමාජ රැකවරණය - social care: තමන්ව රැකබලා ගැනීමට නොහැකි පුද්ගලයින් සඳහා වන සේවාවන්.
- සමාජ රක්ෂණය - social insurance: වැඩිහිටි වයස, අසනීප හෝ රැකියා අහිමිවීම් වැනි අවදානම් සඳහා වන රක්ෂණ ක්‍රම.
- ශ්‍රම වෙළෙඳ පොළ සහ ඵලදායී ඇතුළත් කිරීම: රැකියා අවස්ථා සහ පුහුණුව ලබා දීම මඟින් පුද්ගලයින් සවිබලගැන්වීම.

ඊට අමතරව, ප්‍රජා ශක්ති දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහනේ ප්‍රධාන කුලුනු 6ක් තිබෙනවා. ඒවා මෙසේයි.

| ක්ෂේත්‍රය | | යෝජිත ව්‍යාපෘති |
|---|---|---|
| 1 | සමාජ පරිසරය | ජල පහසුකම්, විදුලිය, සනීපාරක්ෂක, නගර උද්‍යාන වැනි ව්‍යාපෘති. |
| 2 | ආහාර සුරක්ෂිතතාව | භෝග ව්‍යාප්තිය, කෘෂි තාක්ෂණය, ධීවර පහසුකම් සංවර්ධනය, සමුපකාර කෘෂි ව්‍යාපාර. |
| 3 | මානව සම්පත් සංවර්ධනය | පුස්තකාල, ශරීර සුවතා මධ්‍යස්ථාන, කාර්මික විද්‍යාල ඇතුළු අධ්‍යාපන මධ්‍යස්ථාන, ක්‍රීඩා පහසුකම්, විනෝදාස්වාද පහසුකම්. |
| 4 | සැපයුම් ජාල සංවර්ධනය | මාර්ග, පාලම්, වෙළෙඳ පොළ, ගබඩා සහ ශීතාගාර, එකතු කිරීමේ මධ්‍යස්ථාන, ප්‍රවාහන ව්‍යාපාර. |
| 5 | රැකවරණය | ළමා රැකවරණ මධ්‍යස්ථාන, වැඩිහිටි රැකවරණ මධ්‍යස්ථාන, ආබාධිත ආදී ආන්තික ප්‍රජාව. |
| 6 | නිෂ්පාදන ආර්ථිකය | සංචාරක ව්‍යාපෘති, කර්මාන්ත යටිතල පහසුකම්, තාක්ෂණ මධ්‍යස්ථාන, සමුපකාර සමාගම්, නිෂ්පාදන කර්මාන්තශාලා. |

8. මම කලින් කිව්වා වාගේ, සුබසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් කණ්ඩායම් තුනක් දුප්පත් ලෙස හඳුනාගෙන තිබෙනවා.

| අ.අ. | පවුල් කාණ්ඩය | හඳුනාගෙන ඇති පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අන්ත දිළිඳු | 420,471 |
| 2 | දිළිඳු | 847,347 |
| 3 | අවදානමට ලක් වූ | 428,025 |
| මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | 1,695,843 |

මීට අමතරව, අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයින්, වැඩිහිටි පුද්ගලයින්, වකුගඩු රෝගීන් පහත පරිදි හඳුනාගෙන ඇත.

| | පුද්ගල කාණ්ඩය | දීමනා ලැබීමට හඳුනා ගත් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ආබාධ සහිත පුද්ගලයින් | 171,997 |
| 2 | වැඩිහිටි පුද්ගලයින් | 945,099 |
| 3 | වකුගඩු රෝගීන් | 53,044 |
| | මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 1,170,140 |

අඩු ආදායම්ලාභී පවුල්වල සුබසාධන වැඩසටහන් අවසි දුප්පත් පුද්ගලයන් අපි ඉහත කී පරිදි හඳුනාගෙන තිබෙනවා.

9. **a. සමාජ ආරක්ෂණ වැඩසටහන්**

මම පිළිතුරු අංක 5 යටතේ මේ පිළිබඳව ඉදිරිපත් කළා.

**b. සමාජ සුබසාධන වැඩසටහන්**

පිළිතුරු අංක 5 සහ අංක 8 යටතේ මම මේ පිළිබඳව පැහැදිලි කිරීමක් කළා.

**c. සමාජ සවිබලගැන්වීම් වැඩසටහන්**

ඒක මම කලිනුත් කිව්වා. පවුල් මට්ටමින් සමාජ සවිබලගැන්වීම ආකාර 5කින් සිද්ධ වෙනවා.

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

ඊට අමතරව, ප්‍රජා පාදක සවිබලගැන්වීම් වැඩසටහන් විශේෂයෙන්ම ග්‍රාමීය සංවර්ධන කාර්යාංශය මඟින් සිදු කරනු ලබනවා.

10. කෙටි කාලීන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවලින් එකක් තමයි, මූල්‍ය සහනාධාර හා සමාජ ආරක්ෂණය. මේ යටතේ, මා කලිනුත් සඳහන් කළා වාගේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන සහ වැඩිහිටි, ආබාධිත හා වකුගඩු රෝගී දීමනා ආදිය ලබා දීම සිදු කෙරෙනවා. ආහාර හා පෝෂණ ආරක්ෂාව, මිල ස්ථායිකරණය සහ සහනාධාර වැඩසටහන වාගේම ස්වාභාවික ආපදා වැනි අවස්ථාවලදී යම් යම් සහන ලබා දීම ආදිය සෙසු කෙටිකාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වනවා. ස්වාභාවික ආපදා වැනි අවස්ථාවලදී යම් යම් සහන ලබා දීම සම්බන්ධයෙන් උදාහරණයක් විධියට, "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව නැවත ගොඩනැඟීම පිණිස ඉදිරිපත් කළ රුපියල් බිලියන 500ක වැඩසටහන වාගේම මැදපෙරදිග යුද්ධය හේතුවෙන් ඇති වෙච්ච තත්ත්වය හරහා සහන සැලසීම සඳහා වන රුපියල් බිලියන 100ක වැඩසටහන හඳුන්වන්න පුළුවන්. එම වැඩසටහන් මේ වන විට ක්‍රියාත්මක වෙනවා.

දීර්ඝ කාලීන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග යටතේ ගත්තොත්, ප්‍රජාව සවිබලගැන්වීම තමයි මේකට තිබෙන එකම ක්‍රියාමාර්ගය. ඒ අනුව බහුමාන දරිද්‍රතාව තුරන් කිරීම සඳහා දිගු කාලීන වැඩ පිළිවෙළක් විධියට මා කලින් සඳහන් කළ විධියට විශේෂයෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පස් ආකාරයක පවුල් සවිබලගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ප්‍රජාශක්ති දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහනට අපි මේ වනකොට උපාධිධාරි සංවර්ධන නිලධාරින් 16,351ක් බඳවාගෙන තිබෙනවා, "ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරින්" කියලා. ඒ අය හරහා ප්‍රජාව සමස්තයක් වශයෙන් සවිබලගැන්වීම තමයි අපේ දිගු කාලීන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගය වන්නේ, ගරු කථානායකතුමනි. මේ පිළිබඳ සවිස්තරාත්මක පිළිතුර ද මා **සභාගත*** කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා, පිළිතුරු ලබා දීම ගැන. හැබැයි ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරෙන් ගම්‍ය වන කරුණු පිළිබඳව මම කිසිසේත් සෑහීමකට පත් වන්නේ නැහැ. මම ඔබතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. අපේ රට, පාස්කු ඉරිදා ප්‍රහාරය, කොරෝනා වසංගතය, බංකොලොත්භාවය, "දිට්වා" සුළි කුණාටුව, මැද පෙරදිග යුද්ධය ආදි ඛේදවාචකයන් රැසකට මුහුණ දුන්නු රටක්. මෙච්චර ඛේදවාචකයන් සිද්ධ වෙලාත්, ගෘහයක ආදායම් වියදම්-සමීක්ෂණය කරන්න පසුගිය ආණ්ඩුව උනන්දු වුණේ නැහැ; කනගාටුවට කාරණය, ඔබතුමන්ලාගේ ආණ්ඩුව උනන්දු වුණේත් නැහැ. ඔබතුමන්ලා මේ ආණ්ඩුව භාර ගත්තු වෙලාවේ මේක ක්‍රියාත්මක කරන්න තිබුණා. එහෙම කළා නම් ඔබතුමන්ලාට 2019 සංඛ්‍යාලේඛන මත පදනම් වෙලා දුප්පත්කම ගැන කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගත්තේ 2024 වසරේ ජනාධිපතිවරණයෙනුත්, මහ මැතිවරණයෙන් පසුවයි. ඔබතුමන්ලාට තිබුණා, ඒ දත්ත යාවත්කාලීන කිරීමක් කරන්න. ඔබතුමන්ලා දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේ කොහොමද? මොකද, ඔබතුමාගේම පිළිතුරේ කියනවා, 2025 සමීක්ෂණයේ ප්‍රතිඵල එළියට දමන්නේ 2026 ඔක්තෝබර් මාසයේයි කියලා. ඔබතුමා කියන විධියටම සංඛ්‍යාලේඛන ටික එළියට එන්නේ 2026 ඔක්තෝබර් මාසයේ නම්, මෙතෙක් කල් ඔබතුමන්ලා ආණ්ඩුව කරගෙන ආ මේ අවුරුදු එකහමාරට දෙකට අදාළව, ඔබතුමන්ලා පාලනය කරන කාල වකවානුවට අදාළව දරිද්‍රතා රේඛාව - Poverty Line එක - ගණනය කළේ කොහොමද?

ඒ වාගේම මම තවත් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරේ ඔබතුමා කියනවා, 2026 මාර්තු මාසයේ දරිද්‍රතා රේඛාව 16,690යි කියලා. ඔබතුමා ඒ නිගමනයට එළඹුණේ කොහොමද, ඔබතුමාම කියන ආකාරයට ගෘහයක ආදායම්-වියදම් සමීක්ෂණයත් එක්ක දරිද්‍රතා රේඛාව ගණනය කරලා එහි ප්‍රතිඵල එළියට එන්නේ 2026 ඔක්තෝබර් මාසයේදී නම්? මම ඔබතුමාට ගෞරවයෙන් කියන්න කැමැතියි, මෙය ඇත්ත වශයෙන්ම දෙපැත්තකින් නිවැරැදි වෙන්නට ඕනෑ බව. පසුගිය රජයත් හැටනව ලක්ෂයකගේ වරමකින් වගකීම භාර ගන්න කොට භූමියේ සැබෑ තත්ත්වය සොයා ගත්තේ නැහැ; 2019 ආදායම්-වියදම් සමීක්ෂණය මත පදනම් වෙලායි කටයුතු කළේ. ඒක භාගයක් දුරට කරගෙන ගිහිල්ලා ජනාධිපතිවරයෙකු පත් වෙනකොට, ඒ ජනාධිපතිවරයාවත් ගෘහයක ආදායම්-වියදම් සමීක්ෂණයක් කළේ නැහැ, තමන් භාර ගන්නේ දුප්පත්කම පැත්තෙන් මොන වාගේ රටක්ද කියන එක අවබෝධ කර ගන්න. ඒ වරදම, ඒ අඩුපාඩුවම ඔබතුමන්ලාත් කරලා තිබෙනවා. ඔබතුමන්ලා දුප්පත්කම ගැන කථා කරනවා නම්, දුප්පත්කම තුරන් කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා නම්, බහුමාන දුප්පත්කමට විසඳුම් ලබා දෙනවා නම්, 2024දී වගකීම භාර ගන්න කොට ඒ සංඛ්‍යාලේඛන, මහ පොළොවේ දත්ත ගැන ඇත්තටම අවබෝධ කරගෙනයි ඔබතුමන්ලා කටයුතු කරන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, මම ගෞරවයෙන් ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. ඇත්ත වශයෙන්ම අපේ රටේ දුප්පත්කම පිළිබඳ නිවැරැදි දත්ත ඔබතුමා කියන විධියටම එළියට එන්නේ නැහැ, 2026 ඔක්තෝබර් වනකල්. මේක අපේ රටේ තිබෙන ලොකු අඩුපාඩුවක්. ඒ නිසා මම යෝජනා කරනවා, දුප්පත්කම පිළිබඳ සංඛ්‍යාලේඛන සකස් කරන ක්‍රියාවලියට ඔබතුමාගේ අමාත්‍යාංශයත් ඒකාබද්ධ වෙලා අඩුම තරමින් වසර දෙකෙන් දෙකට හෝ ගෘහයක ආදායම්-වියදම් සමීක්ෂණය ගණනය කිරීම, ගෘහයකට අවශ්‍ය ආහාර සහ ආහාර නොවන වියදම් ගණනය කිරීම, ඒ වාගේම දරිද්‍රතා රේඛාව ගණනය කිරීම කළ යුතුයි කියලා. ඒ ආකාරයට ඒ කියන කරුණු කාරණා පිළිබඳ ගණනය කිරීම කරන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමා, දැන් අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

සමාවෙන්න, තවත් විනාඩියක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා විනාඩි 4ක් අරගෙන තිබෙනවා.

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එම ගණනය කිරීම කළේ නැත්නම්, හැම රජයක්ම කරන්නේ වැරදි දත්ත මත ප්‍රතිපත්ති සකස් කිරීමයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම, මම අවසාන වශයෙන් ඔබතුමාට පැහැදිලි කරන්න කැමැතියි, ගරු අමාත්‍යතුමනි-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා දැන් විනාඩි 5ක් අරගෙන තිබෙනවා. ගරු අමාත්‍යතුමා පිළිතුරු දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම සද්භාවයෙන් කියන්නේ, මේක අවසාන කාරණාව. මට තත්පර 15ක් ලබා දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණු පැහැදිලි කර ගැනීමට විනාඩි 3ක කාලයක් තමයි ලබා දෙන්නේ. ඔබතුමා විනාඩි 5ක් ලබා ගත්තා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දැන් පිළිතුර ලබා දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
තත්පර 5ක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, තත්පර 5ක් ලබා දෙන්නම්. ගණන් කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, කරුණාකර ඔබතුමන්ලා දුප්පත්කම තුරන් කිරීමේ විධිමත් වැඩසටහනක් නිර්මාණය කරන්න. ඒකට පාරිභෝජනය, ආයෝජනය, ඉතිරි කිරීම, නිෂ්පාදනය, අපනයනය යනාදී අංග ඇතුළත් කරන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා විනාඩි 5කටත් එහා ලබා ගත්තා. ගරු අමාත්‍යතුමා පිළිතුර ලබා දෙන්න.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු කථානායකතුමනි, මම එතුමාටත් ගෞරවයෙන් කාරණයක් කියන්න කැමැතියි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා පටලාගන්න එපා. ඔබතුමා පළමු ප්‍රශ්නයෙන් ඇහුවේ දුප්පත්කමෙන් පෙළෙන ජනගහනය දිස්ත්‍රික්ක වශයෙන්. ඒකට පිළිතුර වශයෙන් තමයි මම කිව්වේ, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ඒ අධ්‍යයනය ගැන. 2019 ඉඳලා 2024 වනකල්ම ආණ්ඩුවක් තිබුණා. ඒ කාලයේදී එය කරලාත් නැහැ. අපි 2025 වර්ෂයේදී එය කරලා තිබෙනවා. ඔක්තෝබර් මාසයේ තොරතුරු ඉදිරිපත් කරන්න ඒගොල්ලෝ සූදානමින් ඉන්නවා. ඒ වාර්තාව ඉදිරිපත් වෙනවා, 2026 ඔක්තෝබර් මාසයේදී. ඒ කියන්නේ මේ අවුරුද්දේ. හැබැයි, අපි තමයි ඒක කළේ, 2025 වර්ෂයේදී. 2019 ඉඳලා 2024 වනකල්ම ආණ්ඩු තිබුණා, ගරු කථානායකතුමනි.

ඊළඟට එතුමා අහනවා, Official Poverty Line එක ගැන. මේක ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මාසයෙන් මාසයට - හැම මාසයකම - ඉදිරිපත් කරනවා. ඒ වාර්තා තිබෙනවා. ඒවා Internet එකෙන් ඕනෑම කෙනෙකුට බලන්න පුළුවන්. ඒ තොරතුරු තමයි මම මේ ඉදිරිපත් කළේ. මම ඒවා සභාගත කර තිබෙනවා. ඒ තොරතුරු එහෙමම තිබෙනවා. ඒවා හැම මාසයකම ඉදිරිපත් කරනවා. ඒ තොරතුරු අනුව තමයි මා කිව්වේ, ජාතික දරිද්‍රතා රේඛාව 16,690ක් කියලා. දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ඒ දත්ත තිබෙනවා. උදාහරණයක් විධියට, කොළඹ 18,000යි. අඩුම තිබෙන්නේ මොනරාගල. එය, 15,958යි. ඒක දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට හැම මාසයකම ගණනය කරනවා. මේ තොරතුරු අප ළඟ තිබෙනවා.

ඊට අමතරව ගත්තොත්, ඔබතුමා නිතරම කියන ලෝක බැංකුව අධ්‍යයනයක් කළා, 2024 වර්ෂයේදී. ඒ අධ්‍යයනය අනුව දුප්පත්කම සියයට 24.8ක් විධියට ගණනය කළා. ආසන්න වශයෙන් සියයට 25ක් කියලා කියමු. දැන් මේ අප්‍රේල් මාසයේ ඒගොල්ලන් ආපසු එය update කරලා තිබෙනවා. දැන් සියයට 20.1යි. ඒ කියන්නේ දුප්පත්කම අඩු වෙලා තිබෙනවා. දළ වශයෙන් ජනගහනය මිලියන 2.2ක් විධියට ගත්තොත්, 2024දී දුප්පත්කම සියයට 25ක් කියලා ගත්තොත්, එම සංඛ්‍යාව මිලියන 5.5යි. ලෝක බැංකුව ඉදිරිපත් කරලා තිබෙනවා, 2026 අප්‍රේල් මාසයේ එය සියයට 20.1යි කියලා. ආසන්න වශයෙන් සියයට 20ක් විධියට ගත්තොත්, මිලියන 4.1යි. මිලියන 1.1ක අඩුවීමක් තිබෙනවා පසුගිය වසර එකහමාරක, දෙකක කාලය අතරතුර. ඉතින් මේ දත්ත තිබෙනවා. මේ දත්ත පාවිච්චි කරලා තමයි අප දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ඉල්ලපු තුන්වැනි දවස මේ. අඟහරුවාදාත්, බදාදාත් ඒ ඉල්ලීම කළා. අද බ්‍රහස්පතින්දා. මම මගේ උදේ වැඩ කටයුතු සියල්ල පැත්තකින් දාලායි ආවේ. කරුණු 19ක් මම ඔබතුමාට ඉදිරිපත් කරලා තිබෙනවා, මේ සම්බන්ධව. අද මට ලිපියක් එවා තිබෙනවා,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට විනාඩියක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ඒ ලැබී තිබෙන්නේ මගේ අනුදැනුම මත ලේකම් මණ්ඩලය විසින් සකස් කරන ලද ලිපිය. ස්ථාවර නියෝග 118 (2) (අ) යටතේ බැලූ බැල්මට **පෙනෙන** පරිදි වරප්‍රසාද කඩකිරීමක් බවට කථානායකවරයා සෑහීමකට පත් වන්නේ නම් විතරයි ඔබතුමාට එය ඉදිරිපත් කරන්න ඉඩ ලබා දීමට පුළුවන් වන්නේ. ඒ අනුව ඔබතුමා යොමු කර තිබෙන වරප්‍රසාද ප්‍රශ්නය බැලූ බැල්මට සෑහීමට පත්වීමට නොහැකියි. එම නිසා ඔබතුමා මතු කරන කාරණය point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මටත් ටිකක් කථා කරන්න දෙන්න.

ගරු කථානායකතුමනි, මෙයින් සෑහීමකට පත් වෙන්න ඕනෑ ඒ කමිටුව මිසක් ලේකම් මණ්ඩලය නොවෙයි. ඒ නිසා මම මේ වරප්‍රසාද ප්‍රශ්නය සභාගත කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා වැරදියි. ඔබතුමා ඒක සභාගත කරන්න අවශ්‍යතාවක් නැහැ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මේ කාරණය ගැන කථානායකතුමා සෑහීමකට පත් වෙන්නේ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කවුද සෑහීමකට පත් වෙන්නේ නැත්තේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කථානායකවරයා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
එහෙම නම් ඔබතුමාගේ අත්සනින් මට ඒක දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දැනුවත්ව තමයි ලේකම්තුමිය දුන්නේ. මම සියලුදේටම අත්සන් කරන්නේ නැහැ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ප්‍රශ්නයට වග කියන්න ඕනෑ ගරු විපක්ෂ නායකතුමායි, ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමායි. සාමාන්‍යයෙන් මැයි දිනයට මෙතුමා නැටුම් සන්දර්ශනයක් පවත්වනවා. මේ සැරේ මැයි දිනයේ නැටුම් සංදර්ශනයට විපක්ෂ නායකතුමා ආරාධනා කරලාත් නැහැ, චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා ආරාධනා කරලාත් නැහැ. ඒ නිසා මෙතැන නැටුම් උගන්වනවා. *[බාධා කිරීම්]*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Point of Order එකක් නැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]* ඔබතුමාට අදාළ නැහැ, ගරු මන්ත්‍රීතුමා. *[බාධා කිරීම්]*

ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම එතුමා ගැන කිව්වේ නැහැ නේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
කිව්වේ නැත්තේ මොකද?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔයාද රිළා නැටුම් නැටුවේ?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔයා තමයි නැටුම් නටන්නේ. මගෙන් අහගන්න එපා. ලජ්ජයි. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා තොප්පිය දා ගන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

# පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 3, 4 සහ 5 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27 හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මේ කාරණාවට ඔබතුමාගේ විශේෂ අවධානය යොමු වෙන්නට ඕනෑ. මම ඊයේත් මේ ගැන කථා කළා. නමුත්, කිසිම විසඳුමක් ලැබුණේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාගේ point of Order එක කියන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, පොඩ්ඩක් ඉන්න. මුලින්ම මට මේ කාරණය ඉදිරිපත් කරන්න දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා point of Order එකක් නොවෙයි නේ, ඉදිරිපත් කරන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට අවස්ථාව දෙන්න. ඔබතුමා අපේ කටවල් වහන්න එපා. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, සභාව පවත්වාගෙන යෑමේ ක්‍රමයේ යම් කිසි අවුලක් තිබෙනවා නම් තමයි ඔබතුමාට කථා කරන්න පුළුවන්. *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට ටිකක් කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, ඔබතුමා කථා කරන්න. *[බාධා කිරීම්]* ඔබතුමාට අවස්ථාව ලබා දීලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මස්කෙළිය Mocha Estate එකේ, නුවරඑළිය Delmar Estate එකේ වතු ප්‍රජාව විශාල හිංසනයකට ලක් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

ගරු සභානායකතුමනි, ඔබතුමා දෙවැනි යෝජනාව ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, හදිසි ප්‍රශ්නයක් නම් ඒක එතුමන්ලාට ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කරන්න තිබුණා. ඒ වාගේම, අතුරු ප්‍රශ්නවලදී ඉදිරිපත් කරන්න තිබුණා. නමුත්, දැන් විවාදයක් පවත්වන්න නියමිතව තිබෙනවා නේ. *[බාධා කිරීම්]* ඒක ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීම්]* ඒක ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීම්]* නැහැ, නැහැ. *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, වතු ජනතාව කියලා විශේෂයක් නැහැ. අපි මේ රටේ හැම ජනතාවකටම වග කියනවා. දැන් පාර්ලිමේන්තුවේ අවස්ථාවක් තිබෙනවා. හොඳ ද? *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණය point of Order එකක් නොවෙයි. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා point of Order එකක් කියන්නේ මොකක්ද කියලාවත් දන්නේ නැහැ නේ. *[බාධා කිරීම්]*

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මෙතුමන්ලා වතු ජනතාවගේ පඩි වැඩි කරන්න එපා කියලා කියපු අය. *[බාධා කිරීම්]* ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, මේ අය මලෙයහම් ජනතාවට පඩි වැඩි කරන්න එපා කියලා කියපු අය. හොඳ ද? *[බාධා කිරීම්]* මෙගොල්ලන් අල්ලස් කොමිසමට ගිහිල්ලා ඒකට විරුද්ධව පැමිණිලිත් කළා. *[බාධා කිරීම්]* සජිත් ප්‍රේමදාසලා ගිහිල්ලා අල්ලස් කොමිසමට පැමිණිලි කළා, වතු කම්කරුවන්ගේ පඩි වැඩි කළා කියලා. *[බාධා කිරීම්]* මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ අයත් එක්ක නොවෙයි, ඔබතුමා අපිත් එක්කයි ඉන්න ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී ඉතිරි යෝජනා ඉදිරිපත් කරන්න.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, 2026 මැයි 08 සිකුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 11.35 සිට අ.භා. 5.30 දක්වා විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2026 මැයි 08 සිකුරාදා පූ.භා. 11.35 වනතෙක් කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම, ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා ඔය ඉදිරිපත් කරන්නේ පෙර point of Order එක නම්, ඒක වැරදියි.

ගරු තාහිර් මන්ත්‍රීතුමා, ඔබතුමා පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න. *[බාධා කිරීම්]*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### මාස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### மாஸ் மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### MASS FOUNDATION (INCORPORATION) BILL

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே,பின்வரும் பிரேரணையை நான் சமர்ப்பிக்கின்றேன்:

" மாஸ் மன்றத்தைக் கூட்டிணைப்பதற்கான சட்ட மூலத்தைக் கொண்டுவர அனுமதி வழங்கப்படுமாக"

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***
***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*
*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education, Higher Education and Vocational Education for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රධාන වැඩ කටයුතු,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, අද දින,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව, එක මන්ත්‍රීවරයෙකුට තවත් මන්ත්‍රීවරයෙක් පිළිබඳව අයුතු ආකාරයට ඒ මන්ත්‍රීවරයා ඉදිරිපත් කරන දේ විවේචනය කරන්න බැහැ. ඒ නිසා ඒ මත මම-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, පුද්ගලයෙක් නම් කළේ නැහැ නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බිමල් රත්නායක ඇමතිතුමා මගේ නම සඳහන් කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නම් කළේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බිමල් රත්නායක ඇමතිවරයා ප්‍රකාශ කළා, වතු ක්ෂේත්‍රයේ ප්‍රජාවට වැඩි කරපු ඒ වැටුප්, වේතනවලට විරුද්ධව මම අල්ලස් කොමිසමට ගියාය කියලා. ඒක සම්පූර්ණයෙන්ම සාවද්‍ය ප්‍රකාශයක්; සම්පූර්ණයෙන්ම බොරුවක්; සම්පූර්ණ බොරුවක්; සම්පූර්ණ බොරුවක්. ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න. ඒක ඉල්ලා අස් කර ගන්න.\

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඉතා පැහැදිලිව කියනවා, එතුමන්ලා සහමුලින්ම විරුද්ධ වුණු බව, වතු කම්කරු ජනතාවට වැටුප් වැඩි කරනවාට. *[බාධා කිරීම්]* මෙතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරියක් ගිහිල්ලා පැමිණිලි කළා. මෙතුමා පක්ෂ නායකයා වශයෙන් අඩු ගණනේ ඒක ඉල්ලා අස් කර ගත්තේ නැහැ. ඔබතුමා ඉස්සර වෙලා ඒකට කනගාටුව ප්‍රකාශ කරන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 3 දක්වා අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු සභානායකතුමා.

## ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත: නියෝග
## தேசிய போக்குவரத்து ஆணைக்குழுச் சட்டம்: ஒழுங்குவிதிகள்
## NATIONAL TRANSPORT COMMISSION ACT: REGULATIONS

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 18, 24, 28 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 44 වගන්තියේ (ඌ) සහ (ඒ) ඡේද යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 17 දිනැති අංක 2471/68 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - මෝටර් වාහන පනත යටතේ නියෝග සහ විෂය අංක 3 - ආගාමික හා විගාමික පනත යටතේ නියෝග ද අනුමත කිරීම සඳහා මා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்துரைக்கப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Prasanna Gunasena. You may start the Debate and you have 12 minutes.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මීට පෙර මතු කළ කාරණය පිළිබඳව උනන්දුවක් තිබෙන මන්ත්‍රීවරයෙක් ඉන්නවා නම්, - ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා හෝ ගරු තොන්ඩමන් මන්ත්‍රීතුමා හෝ - අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා, එතුමාට

[ගරු බිමල් රත්නායක මහතා]

කියන්න. කරුණාකරලා වැදගත් විධියට ඇමතිතුමා එක්ක ඒ ගැන කථා කරන්න. ඔබතුමන්ලා මතු කරන යම් කිසි ගැටලුවක් තිබෙනවා නම්, ඇමතිතුමා සමඟ සාකච්ඡා කරන්න, මේ පාර්ලිමේන්තුව drama එකක් කර ගන්නේ නැතුව.

බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ප්‍රසන්න ගුණසේන නියෝජ්‍ය ඇමතිතුමා. *[බාධා කිරීම්]* We have to start the Debate. So, let him speak. Hon. Deputy Minister, you may commence your speech.

[පූ.භා. 11.36]

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, පනත් තුනක් යටතේ වන නියෝග අද දින ඉදිරිපත් කර තිබෙනවා. *[බාධා කිරීම්]* පළමුවැනි පනත තමයි 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත. ඒ යටතේ, මගී සේවා අවසර පත්‍රවල අයිතිය පැවරීමේ නියෝග ප්‍රකාශයට පත් කරන ලද අංක 2471/68 සහ 2026.01.17 දිනැති ගැසට් නිවේදනය මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය අනුව, එම පනතේ 24 වන වගන්තිය ප්‍රකාරව යම් කිසි පුද්ගලයෙක් මගී අවසර පත්‍රයක් තබාගෙන ඉන්නකොට වෙනත් යම් තැනැත්තෙකුට පැවරිය නොහැකි- *[බාධා කිරීම්]*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු කථානායකතුමනි, මගේ නම සඳහන් කළා. මගේ නම සඳහන් කළා නේ, මෙතැන. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. (Dr.) Prasanna Gunasena, you may continue.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- *[බාධා කිරීම්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Sajith Premadasa and Hon. Members of the Opposition, the Hon. Speaker was in the Chair before I came. He had refuted this. So, if I allow you now, I will be demeaning him. Please, understand that.

Hon. (Dr.) Prasanna Gunasena, would you please continue? - *[Interruption.]* Hon. (Dr.) Prasanna Gunasena, the Floor is yours.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 28වන වගන්තිය අනුව, එම පනතේ 24වන වගන්තිය ප්‍රකාරව මගී සේවා අවසර පත්‍රයක් යම් පුද්ගලයෙකුට පැවරුවාට පස්සේ එම මගී සේවා අවසර පත්‍රය තවත් කෙනෙකුට නීත්‍යානුකූලව පවරන්න බැහැ. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Members, please maintain silence and decorum in the House. The Hon. (Dr.) Prasanna Gunasena is on his feet.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

එලෙස පැවරීමක් සිද්ධ වුණොත්, අනිවාර්යයෙන්ම ඒක ශූන්‍ය වෙනවා; ඒ වාගේම බල රහිත බවට පත් වෙනවා. මේ නිසා, - *[බාධා කිරීම්]*

මගී සේවා ප්‍රවාහන පහසුකම් ලබා දීමේදී මේකත් එක්ක ගොඩ නැඟුණු අර්බුද ගොඩක් තිබුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් මගී සේවා අවසර පත්‍ර පැවරීමට නොහැකි වීම හේතුවෙන් මගී සේවා අවසර පත්‍රයක අයිතිය යම් පාර්ශ්වයකට හිමිව තිබියදී බොහෝ ප්‍රමාණයක අවසර පත්‍ර ඇටෝර්නි බලපත්‍ර මඟින් තෙවන පාර්ශ්වයකට පවරා තිබෙන බව අපට නිරීක්ෂණය වුණා. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Members, you all can speak when the Opposition gets the chance to participate in the Debate.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Ramanathan Archchuna, when the opportunity is given to the Opposition, you can express your views.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
රීති ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. The Hon. (Dr.) Ramanathan Archchuna.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! உங்களுக்கு தமிழ் தெரியும் என்றபடியால், நான் தமிழில் சொல்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
சொல்லுங்கள்!

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! பாராளுமன்ற நிலையியற் கட்டளை பற்றி சிலநேரம் கௌரவ சபாநாயகர் அவர்களுக்குத் தெரியாமல் இருந்திருக்கும். பாராளுமன்ற நிலையியற் கட்டளை 91(ச)இல் தெளிவாகச் சொல்லப் பட்டிருக்கிறது, time allocateக்கு Speaker பொறுப்பாகவிருக்க வேண்டுமென. இது நீதிப் பிரச்சினை! மலையக மக்கள் தாக்கப்பட்ட விடயம் தொடர்பாகக் கதைப்பதற்கு கௌரவ சபாநாயகர் அவர்கள், கௌரவ ஜீவன் தொண்டமான் அவர்களுக்கு ஒரு நிமிடம்கூட ஒதுக்கவில்லையென்றால், ஏன் இந்த ஆளுங்கட்சியினர் இந்த சபையிலிருக்கு கதைத்துக் கொண்டிருக்கின்றார்கள். ஒரு நிமிடம்தானே அவர் கேட்கின்றார்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. (Dr.) Ramanathan Archchuna, your point was taken. We will put it to the Hon. Speaker, who was in the Chair at the time.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Jeevan Thondaman?

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Thank you, Hon. Deputy Speaker.

I would like to say in this House that the Hon. Minister mentioned my name, which is why I wanted to raise a point of Order. He told me to ask from the Minister of Defence. I would like to remind this House that just a few days ago, when the Hon. Mano Ganesan brought that matter up, the Minister in charge said, "We will prevent it from happening." There is a Deputy Minister for the upcountry here, who also mentioned that. But, yesterday and the day before, two more people had been assaulted.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You can talk it out with the Hon. Minister when we break up.

Hon. (Dr.) Prasanna Gunasena, please carry on.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition, why are you on your feet? What is your point of Order?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා මට මේ අවස්ථාව දෙන්න. මම තත්පර 30යි ඉල්ලන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, I am timing it here.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ක්ෂේත්‍රයේ අහිංසක පුද්ගලයෙකුට වතු ආරක්ෂක පුද්ගලයෙක් කළ හිංසනයක් පිළිබඳව මම මේ සභාවේ අවධානය යොමු කළා. දැන් මේ හිංසනය මස්කෙළියේ Mocha Estate එකේත් ක්‍රියාත්මක වෙනවා, නුවරඑළියේ Delmar Estate එකේත් ක්‍රියාත්මක වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
That is not a point of Order, Hon. Leader of the Opposition. You are due to speak from the Opposition.

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Najith Indika, why are you on your feet?

**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நஜித் இந்திக்க)
(The Hon. (Dr.) Najith Indika)
Hon. Deputy Speaker, ස්ථාවර නියෝග 92 (2) (ආ) යටතේ මේ කියන්නේ. දිගින් දිගටම, දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, I cannot allow that.

Hon. (Dr.) Prasanna Gunasena, would you please continue?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
Hon. Deputy Speaker, I rise to a point of Order. My name had been mentioned.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
No, your name was not mentioned by anybody.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
My name had been mentioned here.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Mano Ganesan, be reasonable. Your name was not mentioned.

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Minister of Public Security. - *[Interruption.]*

Now, you all can listen to him. That is about your issue, Hon. Mano Ganesan. So, would you please sit down?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු තොන්ඩමන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය සම්බන්ධයෙන් මම අද උදෑසනත් සබරගමුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාට කථා කළා. *[බාධා කිරීම්]* මේ පිළිබඳව ක්‍රියාමාර්ග ගන්න කියලා මම දැනුම් දීමක් කළා. ගත් ක්‍රියාමාර්ගය මොකක්ද කියලා පැය භාගයක පමණ කාලයක් ඇතුළත මම ඔබතුමාට දැනුම් දෙන්නම්. *[බාධා කිරීමක්]* ඒ සම්බන්ධයෙන් වහාම විමර්ශනයක් ආරම්භ කරන්නය කියලා අවශ්‍ය උපදෙස් දීලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Members, now, please settle down. He has addressed your issue. We will take it up in half an hour. - [*Interruption.]* Okay, Hon. Mano Ganesan, you seem to want to raise something.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු විජේපාල ඇමතිතුමනි, ඔබතුමාගේ අවධානයට මම මේ කාරණය කිහිප වතාවක් ගෙනැල්ලා තිබෙනවා. මාතර, ගාල්ල, රත්නපුර, කළුතර - හැම තැනම - මිනිස්සුන්ට ගහනවා. මම ආණ්ඩුවට චෝදනා එල්ල කරනවා නොවෙයි. තේරුම් ගන්න. මේක දේශපාලනීකරණය කරගන්න එපා. මේ කාරණය ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරනවා. මේ, ආණ්ඩුව. මේ පිළිබඳව ආණ්ඩුවේ අවධානය යොමු කරන්නේ නැතිව අපි වෙන කාටද කියන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, Hon. Mano Ganesan, your point is taken.

Could we now proceed with the Business of the House? Hon. (Dr.) Prasanna Gunasena, would you please speak? - *[Interruption.]* Hon. Mano Ganesan, your point is taken. We understood and the Hon. Minister replied to you.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
දිගින් දිගටම මගී අවසර පත්‍ර පැවරීමේ නොහැකියාව නිසා අපි නීතිය ක්‍රියාත්මක කිරීමේදී ලොකු ගැටලුවකට මුහුණ දී තිබෙනවා. *[බාධා කිරීමක්]* මෙහිදී අපට හොයා ගන්න බැහැ යම්කිසි මගී අවසර පත්‍ර ලාභියෙක් ඔහුගේ, -

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Prasanna Gunasena, may we interrupt you? Yes, Hon. Ananda Wijepala? - *[Interruption.]* Hon. Mano Ganesan, please sit down and listen to him.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඊයේ මට පෞද්ගලිකව මේ කාරණය ගැන කිව්වා. අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. මට තව පැය භාගයක කාලයක් දෙන්න. මේ සිද්ධිය සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග මම ඔබතුමාට දැනුම් දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි. ඒ වාගේම මේ සම්බන්ධයෙන් කිසිදු - *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Okay, the Hon. Minister wants half an hour.

Hon. (Dr.) Prasanna Gunasena, you may speak now. - *[Interruption.]* Hon. Member, the Hon. Minister is very reasonable. He wants half an hour. We will get back to it in half an hour. - *[Interruption.]* He has replied. - *[Interruption.]*

Yes, Hon. Mano Ganesan?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

අහගන්න කෝ, විජේපාල ඇමතිතුමා. මස්කෙළිය Mocha Estate එකේ මැයි මාසයේ 05වැනි දා යම් සිදුවීමක් වෙලා තිබෙනවා. අනෙක් එක, නුවරඑළිය Delmar Estate එකේ ශ්‍රීතරන් කියන පුද්ගලයෙකුට ගහලා තිබෙනවා. Mocha Estate එකේ ශිවකුමාර කියන පුද්ගලයෙකුට ගහලා තිබෙනවා. එක්කෙනෙකුට වත්තේ Manager ගහලා තිබෙනවා. අනෙක් එක්කෙනාට Field Officer ගහලා තිබෙනවා. මේවා හැමදාම වෙනවා. ඒක නවත්වන්න. මම ඔබතුමාට යෝජනාවක් ඉදිරිපත් කරනවා. පැය භාගයෙන් උත්තර දෙන්න. සද්භාවයෙන් කියනවා. හොඳයි, ප්‍රශ්නයක් නැහැ. RPCs 22ක් තිබෙනවා. ඔබතුමා ඒක දන්නවා. ඒවාත් කැඳවන්න. IGPත් කැඳවන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Mano Ganesan, you can send the note you have with you to him.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ඉස්සෙල්ලාම මිනිස්සුන්ට ආරක්ෂාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

You can send that note to him, Hon. Member. - *[Interruption.]* Hon. (Dr.) Prasanna Gunasena, please carry on.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

පැය භාගයක් ඉන්න, උත්තර දෙන්නම් කිව්වා නේ. ගරු මන්ත්‍රීතුමා, පැය භාගයකින් උත්තරය දෙන්නම් කියලා ඇමතිතුමා කිව්වා නේ. පොඩ්ඩක් අහගනිමු. පැය භාගයක් ඉවසාගෙන ඉන්න කෝ, යන්නේ නැතුව. උත්තරය දෙන්නම් කිව්වා නේ. දැන් නැඟිටලා යන්නේ නැතුව ඉන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Member, wait for half an hour, please. - *[Interruption.]*

Hon. (Dr.) Prasanna Gunasena, would you please carry on?

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

මේ ආකාරයට නීත්‍යානුකූලව මඟී අවසර පත්‍ර පැවරීමට නොහැකිවීම නිසා ලොකු අර්බුදයකට මුහුණ දී තිබෙනවා. සේවාව නියමාකාරයෙන් පවත්වා ගෙන යනවාද, නැද්ද කියන එක නියාමනය කිරීමට සහ වැරදි විධියට කටයුතු කරනවා නම් ඒ සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ලැබී නැහැ. හැබැයි, මේ විධියට පැවරීමේ හැකියාව නොතිබුණත්, නීත්‍යානුකූල නොවුණත්, දිගින් දිගටම මඟී අවසර බලපත්‍ර පැවරීමක් සිදු වෙලා තිබෙන බව ඇටෝර්නි බලපත්‍ර මඟින් අපට නිරීක්ෂණය වෙලා තිබෙනවා. මේ ගැටලුව නිරාකරණය කරන්න තමයි අපි 2025 අංක 8 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා (සංශෝධන) පනත මඟින් ඉහත විධිවිධාන සංශෝධනය කරන ලද සංශෝධන පනතේ 28 වන වගන්තිය අනුව මඟී සේවා අවසර පත්‍රයක් වෙනත් පාර්ශ්වයක් වෙත පැවරීමට අවශ්‍ය ප්‍රතිපාදන ඇතුළත් කර තිබෙන්නේ. ඒ හරහා අපට මේ වෙනකොට විශාල යෝජනා ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා, මඟී අවසර බලපත්‍ර නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තෙන්ම මේ පැවරීම සිදු කරනකොට එම උප වගන්තිය හරහා අපි කිසියම් නිර්ණායක ප්‍රමාණයක් බලනවා. එහිදී අපි බලනවා, මෙච්චර කාලයක් මේ බස් රථය ධාවනය කළේ කෙසේද කියන එක. ඒ වාගේම අදාළ මඟී සේවා අවසර පත්‍රය සම්බන්ධයෙන් යම් අධිකරණ කටයුත්තක් තිබෙනවාද කියලා අපි නිරීක්ෂණය කරනවා. දිගින් දිගටම මහජන පැමිණිලි ඇවිල්ලා තිබෙනවාද කියලා නිරීක්ෂණය කරනවා; ඒ වාගේම යම්කිසි ආයතනික විමර්ශනයක්, අභ්‍යන්තර විමර්ශනයක් පවතිනවාද කියලා අපි බලනවා. මේ ආකාරයට නිරීක්ෂණය කරලා ඊට පසුව තමයි අලුත් පැවරුම්කරුවා වෙත මේ පැවරීමට අදාළ අවසරය අපි ලබා දෙන්නේ. මේ ආකාරයට තවත් නියෝග කිහිපයක් අපි සලකා බලනවා. උදාහරණයක් විධියට ගත්තොත්, මඟී අවසර බලපත්‍රය තමන්ගේ නමට පවරන්න ඉල්ලීම කරන පුද්ගලයා සහ පවරන පුද්ගලයා පැවරීම කරන දිනය දක්වාම අනිවාර්යයෙන්ම ඒ බස් රථය තමන්ට ලබා දුන් route එකේ ධාවනය කළ යුතුයි. ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, මේ හුවමාරු අන්තර් කාලය තුළ සේවාව කඩාකප්පල් වීමක් නොමැතිව අඛණ්ඩව තබා ගැනීමටයි. ඒ වාගේම අපි මේකට වගන්තියක් එකතු කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මඟී අවසර බලපත්‍රයක් පවරනකොට අලුතෙන් බලපත්‍රය ලබා ගන්න පුද්ගලයාගේ ගිණුමක - account එකක - පසුගිය මාස හය තුළ මිලියන 2ක ශේෂයක් පවත්වා ගෙන යන්නට ඕනෑ. මේ කටයුත්ත ජාවාරමක් වෙලායි තිබුණේ; buying and selling එකක් වෙලායි තිබුණේ. ඒ කියන්නේ බලපත්‍ර ගන්නවා, ඊට පසුව වැඩි ගණනකට තව පුද්ගලයෙකුට විකුණනවා. මේ විධියට, chain එකක් විධියට, බලපත්‍ර සම්බන්ධ බිස්නස් එකක් තිබුණා. මේ සේවාවේ නියැළෙන බස් හිමියන් යම්කිසි මූල්‍ය හැකියාවක් තිබෙන, මේ සේවයට ලැදි පිරිසක් විය යුතුයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒක නිරීක්ෂණය කිරීම සඳහා, පරීක්ෂණයකට ලක් කිරීම සඳහා මාස 6ක් තුළ රුපියල් මිලියන 2ක මුදලක් ජංගම ගිණුමේ තබා ගත යුතුයි.

[ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා]

ඒ වාගේම හදිසියේ බස් රථයක් අනතුරට ලක් වුණොත් අපි හිතමු, insurance එකෙන් එය හදාගන්න පුළුවන් කියලා. නමුත් බස් රථයක් යම්කිසි කාර්මික දෝෂයකට ලක් වුණොත් එහෙම එය නිවැරදි කිරීම සඳහා බස් හිමියා සතුව යම්කිසි මූල්‍ය හැකියාවක් තිබෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් අපට service එක දිගටම දෙන්න අවස්ථාව ලැබෙන්නේ නැහැ. බස් එක හදලා නැවත පාරට දානකම් සැහෙන කාලයක් බස් එක ධාවනය නොකර තියන්න වෙනවා. ඉතින් මේ කාරණය නිසා තමයි අපි මේ රුපියල් මිලියන දෙකක් පසුගිය මාස හය තුළ තිබිය යුතුයි කියන නිර්ණායකය මෙයට ඇතුළත් කරන්නේ. මේ ආකාරයෙන් නිර්ණායක කිහිපයක් ඇතුව තමයි අපි මේ බස් රථ පැවරීම ලබා දෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙබරවාරි මාසයේ 12වෙනි දා වනකොට අපට ලැබිලා තිබෙනවා, අයිතිය විධිමත් කිරීම සඳහා ඉදිරිපත් වූ අයදුම් පත් 320ක්. ඒකෙන් 98කට මේ වනකොට අපි අනුමැතිය දීලා තිබෙනවා, නව බස් පැවරීම සඳහා. ඒගොල්ලන් දැන් බස් එක තමන්ගේ නමට පවරාගෙන තිබෙනවා. ඒත් එක්කම 38ක් සම්බන්ධයෙන් මේ දෙවෙනිදා වනකොටත් නිරීක්ෂණය කරගෙන යනවා. එතකොට මේ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරපු කිසිදු බස් හිමියෙකුගෙන් අපට චෝදනාවක් ඉදිරිපත් වෙලාවත්, ඉල්ලීමක් ලැබිලාවත්, මැසිවිල්ලක් නඟලාවත් නැහැ, මේ මූල්‍ය ශක්‍යතාව තහවුරු කර ගැනීම සඳහා රුපියල් මිලියන දෙකක ශේෂයක් තබා ගන්නවා කියන එක සම්බන්ධව. ඉතින් අපි බලාපොරොත්තු වනවා, මේක ඉදිරියටත් තිබේවි, මේ විධියට ක්‍රමානුකූලව මේක මාරු කර ගන්න පුළුවන් වේවි කියලා.

ඒ වාගේම සමාජයේ කතිකාවක් තිබෙනවා, ලොකු ඉල්ලීමක් තිබෙනවා, මාර්ගවලට නව බලපත්‍ර ලබා ගන්නේ කෙසේද, කවදාද මේ බලපත්‍රය පිරිනමන්නේ කියලා. අපි දන්නවා, ඉතිහාසය පුරාවටම මෙම බලපත්‍ර ලබා දීමේ නිසියාකාර ක්‍රමවේදයක් තිබුණේ නැහැ කියන එක. අපි කැබිනට් අනුමැතිය ලබා ගත්තා, ලකුණු ලබා දීමේ ක්‍රමවේදයක් සඳහා. පාරකට බස් රථයක් දානවා නම්, ඒ අයදුම්කරුවාට ලකුණු දීමේ ක්‍රියාපටිපාටියක් සඳහා ඒ අනුව අපි කැබිනට් අනුමැතිය අරගෙන තිබෙනවා. මේ ක්‍රමවේදය අනුව තමයි ඉදිරියට අපි බස් permit ලබා දෙන්නේ. එතකොට ඒකේ විනිවිදභාවයක් තිබෙනවා. තමන්ටම ලකුණු ගාණ ගණන් කරගත හැකියි. ඒ අනුව තමන්ට මේක හිමි වෙනවාද කියන එක තීරණය කර ගත හැකියි. අපි හිතනවා, මේ හරහා පාරදෘශ්‍යභාවයකින් යුතුව දේශපාලනඥයා පස්සේ යන්නේ නැතුව මේ බලපත්‍ර ලබා ගන්න හැකියාව තිබෙනවා කියලා.

මේ වනකොට ජාතික ගමනාගමන කොමිෂන් සභාව සතුව විධිමත් ලෙස නියමිත මාර්ගයේ ධාවනය වන බස් රථ සඳහා නිකුත් කරන ලද බලපත්‍ර 2,493ක් තිබෙනවා. ඒ වාගේම බලපත්‍ර සහිතව වෙනත් මාර්ගවල ධාවනය වන බස් රථ සඳහා නිකුත් කරන ලද බලපත්‍ර - route permits - 75ක් තිබෙනවා. එතකොට නිකුත් කරපු බස් බලපත්‍රවල එකතුව ගත්තොත් 2,568ක් කිසි ගැටලුවක් නැතුව ධාවනය වනවා. ඒක අපට නිරීක්ෂණය වනවා. GPS තාක්ෂණයෙනුත් අපි එය බලනවා. ඒවායෙන් ලැබෙන මැසිවිලි ප්‍රමාණයත් අඩුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හැබැයි අපට නිරීක්ෂණය වෙලා තිබෙනවා, තොරතුරු තිබෙනවා, දැනට වාර්තාගත වී තිබෙන ධාවනයෙන් ඉවත් වෙච්ච බස් රථ permit 49ක් සම්බන්ධයෙන්. ඒ කියන්නේ 49 දෙනෙක් permit එක අරගෙන ඔවුන් තමන්ගේ permit එක ජාතික ගමනාගමන කොමිෂන් සභාවට නිසියාකාරයෙන් භාර දීලා තිබෙනවා, ඔවුන්ට මේක කරගෙන යන්න බැහැ කියලා. එතකොට 49ක් අප සතුව තිබෙනවා, permit issue කරපු දැනට ධාවනය නොවන. ඊට අමතරව permit issue කරපු 308ක් තිබෙනවා. මේ 308ට මොනවාද වුණේ කියලා වගේ වගක් නැහැ. ඒ කියන්නේ ඒවා ධාවනය කරන්න බැහැ කියලා භාර දීලාත් නැහැ, නමුත් ධාවනය වෙන්නේත් නැහැ. එතකොට එකතුව ගත්තොත් මෙතැන තිබෙනවා, බස් රථ permit 357ක් - permit එක issue කරලා තිබෙනවා, හැබැයි පාරේ එම බස් රථ ධාවනය වෙන්නේ නැහැ.

මේ 357ට දීලා තිබෙනවා, ජූනි 30 වෙනතුරු සහන කාලයක්. ඒ කියන්නේ ජූනි 30ට කලින් නිසියාකාරයෙන් බස් රථය පාරේ ධාවනය කරලා පෙන්වන්න ඕනෑ. එතකොට පළමු අදියර විධියට ජාතික ගමනාගමන කොමිෂන් සභාව බලාපොරොත්තු වෙන්නේ එයයි. එහෙම වුණොත් මේ permit එකේ validity එක තබාගෙන continue කරන්න පුළුවන්. එහෙම නැත්නම් ජූනි 30න් පස්සේ අපි මේ 357 සම්බන්ධව ගන්නා පළමු පියවර විධියට කැබිනට් මණ්ඩලයේ අනුමත කර ගත් ලකුණු ක්‍රියාපටිපාටිය අනුව ටෙන්ඩර් කරනවා. එතකොට කැමැති කෙනෙකුට ඒ ක්‍රමවේදය අනුව ලකුණු ලබාගෙන බස් රථ permit එක ලබා ගත හැකියි. දෙවන අදියර හැටියට, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු හරහා ලැබී තිබෙන යෝජනා අපි ක්‍රමිකව ක්‍රියාත්මක කරනවා. මොකද, survey එක දැන් පටන්ගෙන තිබෙනවා. ඒ දත්ත අනුව demand එකක් තිබෙනවා නම්, මගී ඉල්ලුමක් තිබෙනවා නම්, ඒ පාරවල් සඳහාත් බස් රථ බලපත්‍ර issue කරන්න අපි ටෙන්ඩර් කැඳවනවා, මේ ජූනි 17 පහුවුණාට පසුව.

අනික් කාරණය තමයි, දැනටමත් අපේ ජනතාවගෙන් ලැබෙන ඉල්ලීමක් තිබෙනවා, මේකට permit එකක් ඕනෑ, මේකට AC permit එකක් ඕනෑ කියලා. මේ තුන්වන ආකාරයේ survey එක කරලා ඉවර වෙලා ඇත්තටම ඉල්ලුමක් - demand එකක් - තිබෙනවා නම්, අලුතෙන් බස් රථ permit එකක් issue කිරීම නිසා එතැන මගී ධාවනය අවුලකට පත් වන්නේ නැහැ කියන තක්සේරුවට ආ පසු අපි මේ ආකාරයෙනුත් permits issue කරනවා. මේ වෙනුවෙන් අපි නිතරම උපදේශක කාරක සභාවලදී සාකච්ඡා කළා. ගරු ජගත් විතාන මන්ත්‍රීතුමාත් මේ කාරණා ගැන සංවේදී වුණා. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාට ඕනෑ නම් පුළුවන්, පරණ permits ටික අරගෙන ඉවර වෙලා, වෙල්ගම හිටපු ප්‍රවාහන ඇමතිතුමාගේ wifeගේ නමට තිබුණු permits එහෙම ඕනෑ නම් ඔබතුමාගේ නමට පවරා ගන්න. පොඩ්ඩක් වටේ කැරකුණොත් ඔබතුමාට කිහිපයක් හොයාගන්න පුළුවන්, සමහර විට ගෙදර යද්දි. කොහොම හරි ඒක නිසියාකාරයෙන් පවරා ගැනීමේ බලය ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෝටර් වාහන පනත යටතේ වූ නියෝග හැටියට, මෝටර් සයිකල්, මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් රථ හැර වෙනත් සියලු මෝටර් වාහන සඳහා දැනට නිකුත් කරනු ලබන අංකවලින් ඉදිරියට අංක ලක්ෂයක් දක්වා විශේෂ අංක වෙන් කිරීම සඳහා ගාස්තු නියම කිරීම පිණිස ප්‍රකාශයට පත් කරන ලද අංක 2470/14 දරන 2026 ජනවාරි 05 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයත් උත්තරීතර පාර්ලිමේන්තුවේ අනුමැතියට අද ඉදිරිපත් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකෙන් සංශෝධිත එම නියෝගවල 4වැනි උප ලේඛනයේ 14, 16, 18, 20, 22 දරන අයිතම මඟින් අපි කලින් සඳහන් කරපු වාහන වර්ග තුන හැර සියලු මෝටර් රථ වාහන සඳහා තමන්ගේ වාහනයට අංකයක් ගැනීමේදී ඉදිරියට අංක ලබා ගන්න පුළුවන්. හැබැයි, ඒ සඳහා මුදල් අය කිරීමක් සිද්ධ වනවා. උදාහරණයක් විධියට ගත්තොත්, අද issue වන අංකයට 10,000ක් ඉදිරියෙන් අංකයක් ඉල්ලනවා නම්, ඔහුට රුපියල් ලක්ෂයක් ගෙවා ඒක ලබා ගන්න පුළුවන්. 20,000ක් ඉදිරියෙන් අංකයක් බලාපොරොත්තු වනවා නම්, රුපියල් ලක්ෂ දෙකක් ගෙවන්න ඕනෑ. 30,000ක් ඉදිරියෙන්

අංකයක් ඉල්ලනවා නම් රුපියල් ලක්ෂ තුනක් ගෙවන්න ඕනෑ. 40,000ක් ඉදිරියෙන් නම් රුපියල් ලක්ෂ 4ක් ගෙවන්න ඕනෑ. 50,000ක් ඉදිරියෙන් නම් රුපියල් ලක්ෂ 5ක් ගෙවන්න ඕනෑ. වාහන අංක 50,000 සිට 100,000 දක්වා රුපියල් ලක්ෂ 10ක් ගෙවලා ඉදිරි අංකයක් තමන්ගේ වාහනය සඳහා ගැනීමේ හැකියාව තමයි මේ නියෝගය හරහා ලැබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Prasanna Gunasena, your time is up.

**ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසන් කරනවා, මට තව තත්පර 30ක් දෙන්න.

මේ වනකොට සමාජයේ වාහන අංක තහඩු නිකුත් කරන දින වකවානු පිළිබඳව කතිකාවක් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධව අපි අලුත් ටෙන්ඩරයක් නිකුත් කරලා තිබෙනවා. ඒ ටෙන්ඩරය අනුව එම කටයුත්ත පිරිනමා තිබෙනවා. ඒක අත්සන් කරලා තිබෙන්නේ 2026.03.10වන දින. ඒ agreement එක අනුව මාස තුනක් ඇතුළත ඔහු number plate print කරන්න පටන් ගන්න ඕනෑ. එතකොට 2026.06.10 වනකොට අංක තහඩු මුද්‍රණය කිරීම පටන් ගැනීමේ හැකියාව තිබෙනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, Hon. Gayantha Karunathilleka. You have seven minutes.

[පූ.භා.11.54]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝග සහ මෝටර් වාහන පනත යටතේ නියෝග අනුමත කරන මේ අවස්ථාවේ, ගරු නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළ පරිදි මේ හරහා යම් කෙනකු තමන්ගේ වාහනයක් ලියාපදිංචි කරනකොට වැඩිපුර මුදල් ගෙවා ලක්ෂයක වාගේ ප්‍රමාණයකට එහා අංකයක් ලබා ගැනීමට පුළුවන් වන විධියට කටයුතු කිරීමෙන් රජයට අමතර මුදලක් ලබා ගැනීමට හැකියාව ලැබෙයි කියලා අපි හිතනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අන්තර් පළාත් මගී බස් රථ සේවා අවසර පත්‍ර - route permits - වෙනත් පාර්ශ්වයකට පැවරීමේදී මෙච්චර කාලයක් ගැටලු රාශියක් තිබුණා. මෙම නියෝග හරහා ඒ සඳහා නව නීති රාමුවක් හඳුන්වා දීමෙන් මෙතෙක් තිබුණු ගැටලු මඟහරවා ගන්නට පුළුවන් වෙයි කියලාත් මා විශ්වාස කරනවා. එම නිසා ඒ හා සම්බන්ධව වැඩියෙන් යමක් ප්‍රකාශ කරන්න නැති නිසා, මට ලැබුණු සුළු කාලයෙන් ඉතිරි කාලය මේ ආණ්ඩුව පිළිබඳව යමක් ප්‍රකාශ කළොත් හොඳයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, සාමාන්‍යයෙන් රියදුරු බලපත්‍රයක් නැතුව පුහුණුවක් ලබන අවස්ථාවේදී ඕනෑම කෙනෙක් "L" Board එකක් ගහගෙන තම වාහනය පදවන්න ඕනෑය කියන එක. මේ ආණ්ඩුවටත් දැන් වයස අවුරුදු එකහමාරක් වුණාට, පසුගිය කාලය පුරාවටම වෙච්ච දේවල් දිහා බලන කොට මේ ආණ්ඩුවත් තවම ක්‍රියා කරන්නේ "L Board ආණ්ඩුවක්" විධියටයි කියලා අපට කියන්න සිද්ධ වනවා. තමුන්නාන්සේලා බලයට එද්දි නම් කිව්වේ, භාණ්ඩාගාරයට ලැබෙන සෑම ශතයක්ම සාංඝික දේපළ වාගේ ආරක්ෂා කරනවා කියලායි. එහෙම තමයි බලය ගත්තේ. සාංඝික දේපළ වාගේ ආරක්ෂා කිරීම කෙසේ වෙතත්, ජනතාවගේ බදු මුදල් ආරක්ෂා කර ගන්නවත් බැරි ආණ්ඩුවක් බවට මේ වනකොට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. උගන්ඩාවෙන් ඩොලර් ගේන හැටි කියලා බලය ගත්තාට, භාණ්ඩාගාරයේ ඩොලර් ආරක්ෂා කර ගන්න බැරි තත්ත්වයට දැන් මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. මේ වාගේ "L Board ආණ්ඩුවකින්" මීට වැඩිය දෙයක් බලාපොරොත්තු වන්න පුළුවන්කමකුත් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම වංචාවක් සිද්ධ වුණාම, දූෂණයක් සිද්ධ වුණාම, ඒ වාගේම නොසැලකිලිමත්කමක් වුණාම මේ ආණ්ඩුව හැසිරෙන්නේ හරියට වරදක් කළත් සිතකින් නොවේ කියන හැඟීමෙන් යුතුවයි. සමහර ජේවීපී නායකයෝ කියනවා අපි දැක්කා, මුදල් අමාත්‍යාංශයේ වෙච්ච මේ දේ අතපසුවීමක් කියන එක. වග කිව යුතු ආණ්ඩුවකට එහෙම කියන්න පුළුවන්ද කියලා මම අහන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තමුන්නාන්සේලා මැතිවරණයට කලින් නම් කිව්වේ, ඇවිදින පුස්තකාල කියලායි. මාළු අල්ලන්නේත් App එකෙන් කියලා ආපු ආණ්ඩුවකට මේ වෙද්දි භාණ්ඩාගාරය පරිස්සම් කර ගන්න බැරිවීම ගැන අපට කනගාටුයි. පසුගිය කාලයේ දිගින් දිගටම ආණ්ඩුවේ ප්‍රගති වාර්තාව - report එක - දිහා බැලුවොත්, minus points ලැබුණු කාලයක් හැටියට තමයි අපි දකින්නේ. එහෙම වුණේ ආණ්ඩුවට වැඩ බැරි නිසා, හරි පාරෙන් යනවා වෙනුවට වැරදි පාරෙන් ගිය නිසා, ජනතාවට බොරු කරන නිසා සහ වංගු ගහන නිසා කියලා ජනතාව අද කියන්න පටන් ගෙන තිබෙනවා. අද ජනතාව මේ ආණ්ඩුව ගැන කියන කථා දිහා බලන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "වෙහෙර ගිලපු එකාට අග්ගලාවත් කජ්ජක්ද?" කිව්වා වාගේ "බාල ගල් අඟුරු නැව් පිටින් ගිලපු අයට භාණ්ඩාගාරයත් කජ්ජක්ද?" කියන තත්ත්වයට ජනතාව අද මේ ආණ්ඩුව ගැන කථා කරනවා.

ජනතාවට දීපු පොරොන්දු ඉටු කර ගන්න බැරිව ආණ්ඩුව දිනපතාම ජනතාව මත බර පටවනවා; අසීමිතව බදු ගහනවා, හැම එකකටම. අකාර්යක්ෂම පාලනය නිසා ඉන්ධන මිල ඉතිහාසයේ කවදාවත් නැති විධියට ඉහළ ගිහින් තිබෙනවා. සියයට 33කින් අඩු කරනවා කියපු විදුලි බිල දිගින් දිගටම වැඩි වෙමින් පවතිනවා. ගොවීන්ට නියමිත වෙලාවට පොහොර ටික දෙන්න අපොහොසත් වෙලා තිබෙනවා. බඩු මිල දිනපතාම රොකට් වේගයෙන් ඉහළ යනවා. ජනතාවට මේ කිසිවකට විසඳුම් නොදී ආණ්ඩුවට එරෙහිව පීඩන එනකොට, හොරු අල්ලනවා කිය කියා දැන් මේ ආණ්ඩුවේ ප්‍රධානීන් තරගෙට උසාවියේ තීන්දු ප්‍රකාශයට පත් කරන්න පටන් ගෙන තිබෙනවා.

අපි දැක තිබෙනවා, ඉස්සර මැයි දින සැමරුම් පවත්වන දවසට වෘත්තීය සමිති අයිතිවාසිකම්, පෞද්ගලීකරණයට එරෙහි සටන් පාඨ, ජීවන බරට එරෙහි සටන් පාඨ සින්නකරව ලියා ගෙන හිටපු මැයි දින වේදිකාව තමයි ජනතා විමුක්ති පෙරමුණේ වේදිකාව කියා. එදා කිව්වේ, අපේ ආණ්ඩුවකින් හොරකමක් වුණොත් ඉස්සෙල්ලාම අපි තමයි පාරට බහින්නේ කියායි. මේ රජය බලයට ඇවිත් පවත්වපු දෙවැනි මැයි දින සැමරුම තමයි මෙවර පැවැත්වූයේ. ආණ්ඩුවේ ස්වර්ණමය අවස්ථාවක තිබුණු මැයි දිනයක් හැටියට තමයි හරි නම් දෙවැනි මැයි දිනය අපි දකින්න

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඕනෑ. එදා වැඩ කරන ජනතාව සිහින මැව්වේ දෙවැනි මැයි දින වේදිකාවේදී ආණ්ඩුව පැත්තෙන් තම පාලන කාලය තුළ විශේෂයෙන්ම කම්කරු පන්තියට දිනා දීපු ජයග්‍රහණ ගැනත්, ඉදිරියේදී දිනා දෙන්න බලාපොරොත්තු වන ජයග්‍රහණ ගැනත් අහන්න පුළුවන් වෙයි කියායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම තමුන්නාන්සේලාගේ දේශපාලන ජීවිතය පුරාවටම මැයි දිනවලදී කථා කරපු විධියට මිනිස්සු හිතුවේ, "ඔන්න අපි පෞද්ගලීකරණය නැවැත්වූවා" වාගේ උදාන වාක්‍ය තමයි මේ ආණ්ඩුවේ දෙවැනි මැයි දින වේදිකාවේදී අහන්න ලැබෙන්නේ කියායි. බලය ගන්නට ඉස්සෙල්ලා එහෙමයි මිනිස්සු හිතුවේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් ඒ කිසිවක් පිළිබඳව නොවෙයි, තමුන්නාන්සේලාට කථා කරන්න වුණේ. හැම වේදිකාවකම අපට ඇහුණේ මොනවාද? මේ රජය බලයට එන විට තිබුණාට වඩා වැඩ කරන කම්කරු ජනතාවගේත්, ගොවි ජනතාවගේත් ජීවත් වීමේ අමාරුකම දැන් වැඩි වෙලා තිබෙනවා. එම නිසා අපි දැක්කා, හැම රැස්වීමකදීම තමුන්නාන්සේලා හැමෝටම කියන්න වුණේ මොකක්ද කියලා. හැමෝම මොකක්ද කිව්වේ? "අපි මේක අත්හැර යන්නේ නැහැ. අපි ගත්තේ දෙන්න නොවෙයි. ඊළඟ ආණ්ඩුව හදන්නේ අපිම තමයි. අපෙන් මේක ගන්න බැහැ." වාගේ කථා විතරයි අහන්න වුණේ.ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ හැම රජයක්ම යන්න ළං වෙනකොට ඔහොම තමයි කිව්වේ. මේවා භය ඇරෙන්න කියන කථා වාගේ හිතට හයිය ගන්න කියන කථා විතරයි කියන එක අපි දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට ඉස්සෙල්ලාත් ඔය වාගේ ආණ්ඩු ඕනෑ තරම් තිබුණා. අපි විපක්ෂයේ සිටියදී ආණ්ඩු පක්ෂය පැත්තේ ඉස්සරහ පේළියේ හිටපු උදවිය -අද පාර්ලිමේන්තුවේ නැති උදවිය- අපිට කථා කරපු හැටි මේ අවස්ථාවේදී මතක් වෙනවා. සදාකාලික ආණ්ඩු හැටියට තමයි ඒ ආණ්ඩු ගැන ඒ අය කථා කළේ. අපි ඒවා දිහා බලාගෙන විපක්ෂයේ ඉඳිමින් එදාත් ඒවාට මුහුණ දුන්නා. සදාකාලිකව බලයේ ඉන්න හිතපු කිසිම ආණ්ඩුවක් කැමැත්තෙන් "ඔන්න අපි යනවා" කියලා නොවෙයි ගෙදර ගියේ. අපි දැක්කා, එහෙම තමයි ඉතිහාසයේ හැම දාම සිද්ධ වුණේ කියන එක. කවුරුවත් "අපි හැමදාම ඉන්නවා" කියලා ආවට, "ඔන්න අපි යනවා" කියලා ගියේ නැහැ. ජනතාව තමයි ඒ හැම රජයක්ම ගෙදර යැව්වේ.

බලන්න, අද වෙනකොට තෙල් මිල, විදුලි බිල්පත, ජල බිල්පත, අත්‍යවශ්‍ය හැම භාණ්ඩයකම මිල දරා ගන්න අමාරු වෙලා තිබෙනවා. ඉතිහාසයේ කවදාවත් නැති මිල ගණන් තමයි අද ඒවා වෙනුවෙන් ජනතාවට ගෙවන්න වෙලා තිබෙන්නේ. අත්‍යවශ්‍ය භාණ්ඩ හැම එකකම මිල දරා ගන්න අමාරුයි. VAT එක zero කරනවා කිව්වා. අද ඒවා වෙලාද කියලා අපට අහන්න සිද්ධ වෙනවා. බස් ගාස්තු දෙස බැලුවත් එහෙමයි. අද ප්‍රවාහන අමාත්‍යාංශයට අදාළ නියෝග සම්බන්ධයෙනුත් කථා කරනවා. ජනතාවගේ ප්‍රවාහන ගාස්තු සම්බන්ධයෙන් තමුන්නාන්සේලා බලයට එනකොට පැවැති තත්ත්වයයි, අද පවතින තත්ත්වයයි අතර මොන තරම් වෙනසක් තිබෙනවාද කියලා කල්පනා කරන්න කියා අපි කියනවා. බෙහෙත් මිල ගත්තත් එහෙමයි. මේ ආකාරයට සකලවිධ භාණ්ඩ හා සේවා මිල ගණන් අද වෙනකොට සම්පූර්ණයෙන්ම වැඩි වෙලා තිබෙනවා.

එදා බලය ගනිද්දි කිව්වේ, "මාස හයෙන් අපි රට හදා පෙන්වන්නම්" කියායි. එහෙම නම් තමන්ගේ දක්ෂකමින් මොනවා හෝ ව්‍යාපෘතියක් කරලා දැන් හෝ පෙන්වන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. එහෙම නැති වුණොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාල සීමාව ලස්සන කථා අහපු වසර පහක් විතරක් වේවි. බඩගින්නේ ඉන්න මිනිස්සුන්ට, විරැකියාවෙන් පෙළෙන මිනිස්සුන්ට, ණය ගෙවා ගන්න බැරිව ඉන්න මිනිස්සුන්ට හැම දාම "අපි හොරු අල්ලනවා" කිය කියා ඉඳලා හරි යන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gayantha Karunathilleka, your time is up.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
මම මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හොරු අල්ලන්න ආපු ආණ්ඩුවට දැන් හොරු අල්ලන්න පටන් ගන්න හොඳ වෙලාවක් ඇවිත් තිබෙනවා. ඒ සඳහා පෝය දෙකක් ඉන්න ඕනෑ නැහැ. පැය දෙකෙන් අල්ලන්න පුළුවන්. හොරු අල්ලන්න ආණ්ඩුව ඇතුළෙන්ම පටන් ගන්න දැන් තමුන්නාන්සේලාට පුළුවන්කම තිබෙනවා, ආණ්ඩුවේ සිදු වෙන දේවල් දිහා බලනකොට. මේ ආණ්ඩුවේ ජපන් ජබර ඉවත් කිරීමේ විහිළුව, රිළා සංගණන සහ රිළවුන් ඇල්ලීමේ විහිළුව, ක්ලීන් ශ්‍රී ලංකා විහිළුව, මේසයට ගසා හාල් මිල අඩු කිරීමේ විහිළුව, තහඩු කැල්ලට රුපියල් ලක්ෂ 10ක් දීමේ විහිළුව, රේල් පාර විවෘත කරලා ඇමතිවරු නටා පෙන්වපු විහිළුව යනාදී මේ සියල්ලම දේශපාලන වේදිකාවේ රඟ කථා හැටියට ඉතුරු වෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, passport ටෙන්ඩර් මගඩිය, කන්ටේනර් 323 මගඩිය, මහා පරිමාණ බාල ගල් අඟුරු මගඩිය, ඇමෙරිකානු ඩොලර් මිලියන ගණනක් අතුරුදහන් වීමේ මගඩිය කියන සියල්ල ජනතාවට විහිළු වාගේ අමතක නොවන ඒවා බව මතක තබා ගන්න කියා අපි අවසාන වශයෙන් ආණ්ඩුවට මතක් කරනවා.

බස්වල route permits වෙනත් පාර්ශ්වයකට පැවරීමේදී මතු වන ගැටලු නිරාකරණය කිරීමටත්, අලුතින් වාහනයක් ලියාපදිංචි කරනකොට ඉදිරි අංකයක් ලබා ගැනීමට අමතර මුදලක් ගෙවන්න වාහන ලක්ෂයකට අවස්ථාවක් ලබා දීමත් ප්‍රයෝජනවත් වේ යැයි අපි විශ්වාස කරන බව ප්‍රකාශ කරමින් මට ලැබී ඇති කාලය අවසන් නිසා මගේ කථාව මම අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Prof.) Ruwan Ranasinghe. You have eight minutes.

[අ.භා.12.03]

**ගරු (මහාචාර්ය) රුවන් රණසිංහ මහතා (සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ருவன் ரணசிங்ஹ - சுற்றுலாப் பிரதி அமைச்சர்)
(The Hon. (Prof.) Ruwan Ranasinghe - Deputy Minister of Tourism)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර කථා අහගෙන ඉන්නකොට අපිට හිතෙන්නේ මේ අය කථා කරන්නේ කටින් ද නැත්නම් වෙන කොහෙන් හරි ද කියන එකයි. මොකද, දශක ගණනාවක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරලා, අමාත්‍යාංශ හසුරුවලා, විනාශ කරපු -බංකොලොත් කරපු- රටක් තමයි අපි භාර ගත්තේ. දැන් ඇවිල්ලා අපට උපදෙස් දෙනවා, අපේ ප්‍රගති වාර්තාව, "L" board එක ගැන. ඒ අයට තමයි අපි ඊයේ Rescue,

Rehabilitation and Insolvency (Corporate and Personal) Bill එක ගෙනාවේ. ඒගොල්ලන්ගේ වැරදි ආර්ථික උපාය මාර්ග, වැරදි ප්‍රතිපත්ති නිසා කාලාන්තරයක් තිස්සේ විනාශ වුණේ ව්‍යාපාර, ආයතන විතරක් නොවෙයි. ඒගොල්ලන්ගේ දේශපාලන පක්ෂත් දැන් බංකොලොත් වෙලා -විනාශ වෙලා- යන එන මං නැතිව, නන්නත්තාර වෙලා තිබෙන්නේ. ඉතින්, මම හිතන්නේ අපි ඊයේ සම්මත කර ගත් පනතින් නැවත ඔළුව ඔසවා ගන්න යම්කිසි ක්‍රමවේදයක් හදා ගන්න පුළුවන් වෙයි කියායි.

මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමාට මම සඳහන් කරන්න කැමැතියි, අපි රට භාර අරගෙන අවුරුද්දක් ඇතුළත -පසුගිය අවුරුද්දේ- ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදිතය ඩොලර් බිලියන 109 ආසන්නයට වැඩි වුණු බව. ඒ වාගේම ඉතිහාසයේ පළමුවැනි වතාවට අපේ රටේ ඒක පුද්ගල ආදායම ඩොලර් 5,000 ඉක්මවා තිබෙනවා. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවේ මේවා ලියා තිබෙනවා. ඒවා ගිහිල්ලා බලන්න. ඔයගොල්ලන් අවුරුදු ගණනක් විනාශ කරපු ආර්ථිකය ඔයගොල්ලන් කියපු "L" board ආණ්ඩුව මේ අවුරුදු එකහමාර ඇතුළත ඉතාම යහපත් ස්ථාවර ආර්ථිකයක් විධියට හදලා තිබෙනවා. ඒ නිසා තමයි ජනාධිපතිතුමා එදා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වේ, "දිට්වා" ව්‍යසනයෙන් සිදු වුණු හානිය ප්‍රතිපූරණය කරන්න -නැවත ගොඩනඟන්න- එක රුපියලක්වත් ණය ගන්නේ නැතිව මහා භාණ්ඩාගාරයේ ඉතුරු කරපු අරමුදල්වලින් තමයි අපි ඒවාට මුදල් වෙන් කළේ කියලා. අපි, අපේ ආණ්ඩු කාලය තුළ ආර්ථිකය යහපත් තැනකට ගෙනැල්ලා තිබෙනවා විතරක් නොවෙයි, නීතිය යහපත් තැනකට ගෙනැල්ලා තිබෙනවා.

අපි දන්නවා, බොහොමයක් ඒවාට මේ රටේ නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ කියලා. දැන් කට්ටිය භය වෙලා ඉන්නවා; සෙනග රැස් කරමින් ඉන්නවා; ඒ වාගේම ප්‍රකාශ නිකුත් කරමින් ඉන්නවා. සමහර අයට කනගාටුයි ලු මේවා ගැන. තව කනගාටු වෙන්න වෙයි, ගොඩක් අය පෝලිමට ඇතුළට යනකොට. පොඩි මිනිස්සුන්ට විතරක් ඔයගොල්ලන් ක්‍රියාත්මක කරපු නීතියක් තිබුණේ. මෙච්චර කාලයක් සොයා නොබලා යට ගහලා තිබුණු ඒවා අපි නැවත සොයා බලා, වැරදි කරපු අයට -විශේෂයෙන් දූෂණ, වංචාවල නිරත වුණු අයට- තරාතිරම නොබලා දඬුවම් දෙන්න ඒ ආයතන ස්වාධීන කරලා, ශක්තිමත් කර තිබෙනවා. දැන් නීතිය ක්‍රියාත්මක වෙන්න පටන් අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, සමහර විට දකින්න ඇති, විශේෂයෙන් අපේ ආර්ථිකයේ, සංචාරක කර්මාන්තයට සම්බන්ධ විදේශිකයන් නීති විරෝධීව කරන ව්‍යාපෘති, ගනුදෙනු, ව්‍යාපාර සම්බන්ධයෙන් අපි නීතිය ක්‍රියාත්මක කරමින් ඉන්නවා. පසුගිය දවස්වල එවැනි නීති විරෝධීව කටයුතු කළ අය සිය ගණනක් අපි අත්අඩංගුවට ගත්තා. දැන් කියනවා නේ, "L" board කියලා. මේවා අත්දැකීම් තිබුණු කාලයේ සිද්ධ වුණු දේවල් නොවෙයි. නමුත්, "L" board ආණ්ඩුව දැන් ඒවා කරමින් ඉන්නවා. ඒ වාගේම අපේ ආණ්ඩුව පත් වුණු ගමන් මට මතකයි, මේ ආණ්ඩුව දෙසැම්බර්වල ඉවරයි, අප්‍රේල්වල ඉවරයි කියලා දින දමපු බව. යුද්ධය හේතුවෙන් අපට tariff එක වැඩි වෙනකොට ආණ්ඩුව වැටෙයි කියලා හිතලා ජනාධිපති වෙන්න, අනෙකුත් තනතුරුවලට ඇඳුම් මහ ගන්නවා. මට හිතෙන්නේ තව කාලාන්තරයක් ඒ විධියට ඇඟිලි ගැන ගැන, දින දමමින් ඇඳුම් මහගෙන ඉන්න වෙයි. මොකද, "L" board ආණ්ඩුව ඉතා හොඳින් ආර්ථිකය කළමනාකරණය කරලා, අපේ රටේ සමාජ, ආර්ථික සංවර්ධනය ඉදිරියට මෙහෙයවමින් ඉන්නවා.

අපි දන්නවා, සංචාරක කර්මාන්තය අපේ රටේ ආර්ථිකයේ ඉතාම වැදගත් අංශයක් බව. විශේෂයෙන් අපේ ජනාධිපතිවරයා පත් වනකොට අපේ රටේ වීසා දෙන එකත් විකුණලා තිබුණේ කියන එක මතකද? මේ අයට දැන් මේවා අමතක වෙලා තිබෙන්නේ. අපි ඒවා නැවත නිවැරදි කළා. විශේෂයෙන් tropical island එකක් විධියට අපි ලෝක සංචාරක වෙළෙඳ පොළ තුළ ඉන්නේ කියන එක අප දන්නවා.

අපි වාගේ රටවල් විශාල ගණනක් අපිත් එක්ක තරග කරනවා. වියට්නාමය, තායිලන්තය, චීනය, ලාඕසය වාගේ රටවල් නොමිලයේ වීසා පහසුකම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව තමයි අපි විශේෂඥ කමිටුවක් පත් කරලා ඒ කමිටුවේ නිර්දේශ අනුව රටවල් 39කට නොමිලයේ වීසා ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ, විශේෂයෙන් මාස 6ක කාල සීමාවකට. අපි දන්නවා visa fee එක විධියට අපට එතැනදී ඩොලර් මිලියන 65ක් විතර අහිමි වෙනවා. නමුත් අපි සියයට 10කින් සංචාරක පැමිණීම වර්ධනය කර ගත්තොත් සෘජුව භාණ්ඩාගාරයට එන ඒ ඩොලර් මිලියන 65 වෙනුවට ඩොලර් මිලියන 317ක් වාගේ ප්‍රමාණයක් උපයා ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ආර්ථිකයට, මේ ව්‍යාපාරයේ යෙදෙන අයට, සංචාරක කර්මාන්තයේ නිරත වෙලා ඉන්න අයට සහ පොදුවේ අපේ රටට ඩොලර් මිලියන 317ක ආදායමක් වැඩි වෙයි කියන බලාපොරොත්තුවෙන් තමයි අපි මේ වාගේ තීන්දුවක් අරගෙන තිබෙන්නේ. මාස 6ක් ඇතුළත මෙහි ප්‍රතිඵල review කරලා ඒ පිළිබඳව නැවත සලකා බැලීමේ යෝජනාව මත අපි එය ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

මේ වෙනකොට සංචාරක ක්ෂේත්‍රය දැවැන්ත අභියෝග ගණනාවකට මුහුණ දීලා තිබෙනවා මැද පෙරදිග යුද තත්ත්වයත් එක්ක. විශේෂයෙන් යුරෝපයෙන් අපේ රටට සංචාරකයන් විශාල වශයෙන් රැගෙන ආවේ මැද පෙරදිග -Middle East - හරහායි, Qatar Airways සහ Emirates වාගේ ප්‍රධාන ගුවන් සමාගම්. ඒවායේ පැමිණීමේ සීමා එක්ක අපි කටයුතු කරමින් ඉන්නවා IndiGo වාගේ airlinesවල, එහෙම නැත්නම් Turkish Airlinesවල ගමන් වාර වැඩි කර ගන්න. අපි අප්‍රේල් මාසයේ වියට්නාමයත් සමඟ ගිවිසුම් අත්සන් කළා සතියකට ගුවන් යානා 5ක් ගෙන්වා ගන්න. ක්ෂේත්‍රයට අදාළව අපි ඒ වාගේ විශාල සාර්ථකත්වයක් ළඟා කරගෙන තිබෙනවා. අපි දන්නවා දෙසැම්බර්, ජනවාරි, පෙබරවාරි වාර්තාගත ලෙස සංචාරක පැමිණීම් වැඩි වුණා. 2025දී ඒක 2,360,000 දක්වා වැඩි කර ගන්න පුළුවන් වුණා. ඔයගොල්ලන්ගේ අත්දැකීම් තිබුණු රජයන්වලින් කර ගන්න බැරි වුණු ඒ ඔක්කෝම දේවල් මේ "L board ආණ්ඩුවෙන්" කරලා තිබෙනවා.

ඉතාමත්ම සාර්ථකව අපි මේ ක්ෂේත්‍රය ඉදිරියට මෙහෙයවමින් ඉන්නවා. ඒ විතරක් නොවෙයි මම මුලින් කිව්වා වාගේ රටේ ආර්ථිකය, සමාජය, සියලු දේවල් අපි ඉතාමත් සාර්ථකව ඉදිරියට මෙහෙයවමින් ඉන්නවා. ඉතින් ඔබතුමන්ලාට ඔහොම කිය කියා තව කාලාන්තරයක් ඉන්න වෙයි. ඊයේ සම්මත කළ පනත හරහා ඔය බංකොලොත් දේශපාලන පක්ෂ නැවත ගොඩ නඟා ගන්න විධියක් ගැන කල්පනා කළොත් හොඳයි කියමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kathiravelu Shanmugam Kugathasan, you have five minutes.

[පි.ව. 12.10]

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, 2026ஆம் ஆண்டில் 2471/68 மற்றும் 2470/14ஆம் இலக்கங்களைக் கொண்ட சிறப்பு அரசிதழ்களில் வெளியிடப்பட்ட, தேசியப் போக்குவரத்து ஆணைக்குழுச் சட்டம் மற்றும் மோட்டார்

[ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා]

போக்குவரத்துச் சட்டத்தின் புதிய ஒழுங்குவிதிகளுக்கு ஒப்புதல் வழங்குவது தொடர்பான எனது கருத்துகளை இந்த அவையில் எடுத்துரைக்க விழைகின்றேன்.

இன்று ஒப்புதலுக்காக முன்வைக்கப்பட்டுள்ள மேற்கூறிய ஒழுங்குவிதிகள் இரண்டும், போக்குவரத்துப் பொருளாதாரத் தின் இரண்டு வெவ்வேறு துறைகளைக் கையாள்கின்றன. முதலாவது, தனியார் பேருந்துத் தொழிற்றுறையை முறைப்படுத்துகின்றது. இரண்டாவது, சிறப்பு வாகனப் பதிவு எண்களை வருமானமாக மாற்றுகின்றது. இந்தச் சீர்திருத்தங்கள் தன்னிச்சையாக உருவானவையல்ல. போக்குவரத்து நெரிசல் மற்றும் சாலை தொடர்பான திறமையின்மையால் ஆண்டுதோறும் ஏற்படும் மொத்த உள்நாட்டு உற்பத்தியின் 2 - 3 சதவீதம் வரையான இழப்பைக் குறைப்பதை நோக்கமாகக் கொண்டு, போக்குவரத்து அமைச்சரால் முன்வைக்கப்பட்ட "சாலைப் பாதுகாப்புச் செயல் திட்டம் 2025 - 2026"இன் ஒரு பகுதியாகும்.

திருத்தப் பிரிவு இலக்கம் 8ஆனது, 1991ஆம் ஆண்டின் 37ஆம் இலக்க, தேசியப் போக்குவரத்து ஆணைக்குழுச் சட்டத்தின் 44ஆம் பிரிவின் H மற்றும் J பந்திகளின்கீழ் உருவாக்கப்பட்டதும் 2026 சனவரி 16ஆம் திகதிய 2471/68ஆம் இலக்க சிறப்பு அரசிதழில் வெளியிடப்பட்ட ஒழுங்குவிதிகளைக் குறிக்கின்றது. இது, தனியார் பேருந்து உரிமங்களை மாற்றுவதை சட்ட அடிப்படையில் முறைப்படுத்துவதற்கான முதலாவது விரிவான முயற்சியாகும். இதற்கு முன்னர், இத்தகைய உரிம மாற்றங்கள் சட்ட அடிப்படையற்றதாகவும், முறைசாரா கறுப்புச் சந்தை முறையில் அமைந்ததாகவும் காணப்பட்டன. 1991ஆம் ஆண்டின் சட்டக் கட்டமைப்பின்கீழ், உரிமங்களை மாற்று வதற்கு சட்ட அடிப்படையிலான வழிமுறைகள் இருக்க வில்லை. இதனால் உரிமங்கள் முறையற்ற தனியார் ஒப்பந்தங்கள்மூலம் கைமாறின. 2026ஆம் ஆண்டின் தேசியப் போக்குவரத்து ஆணைக்குழு ஒழுங்குவிதிகள் இத்தகைய உரிம மாற்றங்களை முறைப்படுத்துகின்றன.

மேற்படி ஒழுங்குவிதிகளின் முதன்மையான கூறு "நிதித் திறன்" வரம்பை அறிமுகப்படுத்துவதாகும். அதாவது, உரிமத்தைப் பெற விரும்புபவர் விண்ணப்பத்தை அளிப்பதற்கு முந்தைய ஆறு மாத காலப்பகுதியில் தனது வங்கிக் கணக்கில் குறைந்தது 2 மில்லியன் ரூபாய் மீதியைப் பேணி வருவதை எண்பிக்க வேண்டும். அத்தோடு, உரிமத்தை வழங்குபவர் வாகனத்தின் முழுமையான உரிமையாளர் என்பதையும் அந்த உரிமம் எந்தவொரு நீதிமன்ற நடவடிக்கை, பொது முறைப்பாடு அல்லது நிறுவன விசாரணைகளில் இருந்து விடுபட்டது என்பதையும் உறுதிப்படுத்த வேண்டும். மேலும், அந்த உரிமம் தொடர்பாக ஏற்கனவே உள்ள எந்தவோர் அதிகார அளிப்பு ஆவணமும் நீக்கம் செய்யப்பட வேண்டும். பிரிவு எண் 9ஆனது, 2026 சனவரி 5ஆம் திகதிய 2470/14ஆம் எண்கொண்ட, சிறப்பு அரசிதழில் வெளியிடப்பட்ட மோட்டார் போக்குவரத்துச் சட்டத்தின் அத்தியாயம் 203இன் கீழான திருத்தங்களைக் கையாள்கிறது.

இது சிறப்பு எண்கொண்ட வாகனத் தகடுகளைப் பெறுவதற்கான வரம்பை விரிவுபடுத்துவதோடு, அதற்கான உயர்ந்த கட்டணத்தையும் நிர்ணயிக்கின்றது. வரலாற்று அடிப்படையில், சிறப்பு எண்கொண்ட ஒதுக்கீடுகள் 50,000 வரையிலான எண்கொண்ட வாகனங்களுக்கு மட்டுமே வழங்கப்பட்டிருந்தன. 2026ஆம் ஆண்டின் திருத்தமானது, மோட்டார் சைக்கிள் தவிர்ந்த அனைத்து வாகன வகுப்புகளுக்கும் 50,001 - 100,000 வரையிலான எண்களை இந்த வரம்புக்குள் கொண்டுவருகிறது. இந்தப் புதிய வரம்பில் ஒரு சிறப்பு எண்ணை ஒதுக்குவதற்கு ஒரு மில்லியன் ரூபாய் நிலையான கட்டணம் நிர்ணயிக்கப்பட்டுள்ளது. இது வசதி படைத்தவர்களுக்கு ஓர் ஆடம்பரச் சேவையை வழங்குவதோடு, மோட்டார் போக்குவரத்து திணைக்களத் துக்கு வரி அல்லாத வருமானத்தை ஈட்டித்தரும் நடவடிக்கை யாகவும் அமைகின்றது. இந்த மாற்றங்களின் முதன்மையைப் புரிந்துகொள்ள, 2026ஆம் ஆண்டின் புதிய கட்டமைப்பை 1951ஆம் ஆண்டின் மோட்டார் போக்குவரத்துச் சட்டம், 1991ஆம் ஆண்டின் தேசிய போக்குவரத்து ஆணைக்குழுச் சட்டம் ஆகியவற்றோடு ஒப்பிட வேண்டியது அவசியமாகும். பழைய சட்டச் சூழலில், சிறப்பு வாகன எண்களை ஒதுக்குவது பெரும்பாலும் அமைச்சின் தற்றுணிவின்கீழ் அல்லது உள்ளகச் சுற்றறிக்கைகள் மூலமாகவே கையாளப்பட்டது. இது வெளிப்படைத் தன்மையற்றதாகவும் கட்டணங்கள் சீரற்ற தாகவும் அமையக் காரணமாக அமைந்தன.

2026ஆம் ஆண்டின் மோட்டார் போக்குவரத்து ஒழுங்குவிதிகள் இதற்கு மாற்றாக ஒரு நிலையான சந்தைக் கட்டணத்தை அறிமுகப்படுத்துகின்றன. ஒரு மில்லியன் ரூபாய் கட்டணத்தை நிர்ணயிப்பதன்மூலம் சிறப்பு எண்களை ஓர் ஆடம்பரச் சொத்தாகக் கருதி நிதி திரட்டும் மாதிரியை நோக்கி அரசு நகர்கிறது. இரண்டு மில்லியன் ரூபாய் வைப்பக இருப்புத் தேவையை விதிப்பதன்மூலம், நிதி அடிப்படையில் உறுதியானவர் மட்டுமே பொதுப் போக்குவரத்துச் சேவையை முன்னெடுக்க முடியும் என்பதை அரசு உறுதி செய்கிறது. இந்த நடவடிக்கைகள் பாதுகாப்பு மற்றும் வருவாயை மேம்படுத்தும் என்று அரசு நியாயப்படுத்தினாலும், எதிர்க்கட்சிகள் மற்றும் தொழிற்சங்கங்களிடமிருந்து விமர்சனங்களை எதிர்கொண்டுள்ளன. சிறப்பு எண் கொண்ட வாகனங்களுக்கு ஒரு மில்லியன் ரூபாய் கட்டணம் அறவிடுவது, சாலைப் பயனாளர்களை செல்வத்தின் அடிப்படையில் பிரிக்கும் ஒரு கௌரவப் பண்பாட்டை உருவாக்குமென விமர்சகர்கள் வாதிடுகின்றார்கள். இரண்டு மில்லியன் ரூபாய் வைப்பக மீதியாகக் காட்டப்பட வேண்டுமென்ற கட்டுப்பாடு, சிறிய முதலீட்டாளர்கள் மற்றும் இளைஞர்கள் இத்துறைக்குள் நுழைவதைத் தடுக்கும் ஒரு தடையாகக் கருதப்படுகிறது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. Kathiravelu Shanmugam Kugathasan, you may finish now. Your time is up.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)

இத்தகைய விவாதமானது, இலங்கையின் போக்குவரத்துத் துறையில் ஒரு திருப்பு முனையாக அமையும். முன்மொழியப் பட்டுள்ள ஒழுங்குவிதிகள் போக்குவரத்துத் துறையை ஒரு தொழில்முறை சார்ந்த மற்றும் உயர்ந்த தரம்கொண்ட துறையாக மாற்றுவதற்கான முன்முயற்சியாகும். நிதித்திறன் மற்றும் வெளிப்படைத்தன்மை தொடர்பான கவலைகளை உரிய பாதுகாப்பு நடவடிக்கைகளோடு சமநிலைப் படுத்தினால், இத்தகைய திருத்தங்கள் இலங்கையின் பொருளாதார நிலைத்த தன்மைக்கு ஒரு தூணாக அமையும்.

இந்தத் தேசியப் போக்குவரத்து ஆணைக்குழுச் சட்டத்தின் புதிய ஒழுங்குவிதிகளுக்கு ஒப்புதல் அளிப்பது தொடர்பாகப் பேசுகின்ற இந்த வேளையில், நான் பிரதிநிதித்துவப்படுத்தும்

திருகோணமலை மாவட்டத்திலுள்ள போக்குவரத்துச் சிக்கல்கள் பற்றி கூறுவதும் பொருத்தமாக இருக்குமென நம்புகின்றேன். இலங்கை போக்குவரத்து சபையின் திருகோணமலை மாவட்ட அலுவலகத்துக்கு 37 பேருந்துகள் தேவை. எனினும், 26 பேருந்துகள் மட்டுமே அதனிடம் உள்ளன. இதனால் இலங்கை போக்குவரத்துச் சபையால் அங்கு சிறந்த சேவையை வழங்க முடியாதுள்ளது. எனவே, பழுதடைந்த நிலையில் காணப்படும் பேருந்துகளைத் திருத்துவதற்கு ஆவன செய்யுமாறும் குறைந்தது மேலும் பத்துப் புதிய பேருந்துகளைத் திருகோணமலை மாவட்டத்துக்கு வழங்குமாறும் வேண்டிக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up. Would you please wind up? We are short of time.

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasa
இலங்கை போக்குவரத்துச் சபையின் திருகோணமலை மாவட்ட அலுவலகத்தில் காணப்படும் 50 சதவீதமான ஆளணிப் பற்றாக்குறையை நிரப்ப ஆவன செய்யுமாறும் வேண்டிக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

**ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**
(மாண்புமிகு கதிரவேலு சண்முகம் குகதாசன்)
(The Hon. Kathiravelu Shanmugam Kugathasan)
Okay, Sir. Thank you.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Jeevan Thondaman, why are you on your feet? I cannot give you much time. Just say it briefly.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, எனக்கு நீண்ட நேரம் தேவையில்லை. என்னால் தெரிவிக்கப்பட்ட விடயம் தொடர்பாக, எடுக்கப்பட்ட நடவடிக்கை குறித்து பதிலை வழங்குவதற்காகக் கோரப்பட்ட 30 நிமிட கால அவகாசம், ஒரு நிமிடத்துக்கு முன்னர் நிறைவடைந்துள்ளது. அதற்கான பதிலை வழங்குமாறு வேண்டுகிறேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Jagath Vithana, you have five minutes.

[අ.භා.12.16]

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත යටතේ නියෝග ගැන වාගේම NTC එක ගැන කථා කරන කොට, ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය ඇමති අපේ ප්‍රසන්න ගුණසේන මැතිතුමා කියපු පරිදි මෙන්න මේ ගැටලු ටික මම ඉදිරිපත් කරනවා. මේවා කෙරෙහි අවධානය යොමු කළොත් හොඳයි.

A/C bus බස් කිව්වාම, ආසන 29, 33 බස් තමයි එකක් රුපියල් ලක්ෂ 200කට විතර අපි ගත්තේ. නමුත් දැන් හොඳ, A/C balloon type බස් එකක් රුපියල් ලක්ෂ 500ක්, 550ක් විතර වෙනවා. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට පහසුකමක් දීලා තිබෙනවා. ඒ කියන්නේ, අධිසුඛෝපභෝගී බස් රථ සේවාවක් - super luxury service - දීලා තිබෙනවා. නමුත් පෞද්ගලික අංශයේ බස් රථ ගත්තු කට්ටියට රුපියල් ලක්ෂ 550ක් දීලා බස් එකක් අරගෙන සුඛෝපභෝගී බස් රථ ටිකට් එකකින් තමයි ඒවා ධාවනය කරන්න සිදු වෙලා තිබෙන්නේ. මේ වනකොට ඒ බස් රථ ගෙවල්වල තියාගෙන ඉන්නවා, ධාවනයට යොදවන්න බැරුව. මොකද, වියදම දරාගන්න බැහැ, balloon type බස් රථ හින්දා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කළොත් හොඳයි.

ඒ වාගේම, මාස 6ක් තිස්සේ බැංකුවක රුපියල් ලක්ෂ 20ක තැන්පතුවක් තිබෙන්නත් ඕනෑ, අලුතින් මේ ක්ෂේත්‍රයට එනවා නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිටරටවල -කොරියාව, ජපානය ආදී රටවල- වැඩ කරන අපේ තරුණයන් මේක ආයෝජනය කිරීමේ අවස්ථාවක් විධියට ගත්තොත්, ඒ ගොල්ලෝ අපේක්ෂා භංගත්වයට පත් වෙනවා. මාස 6ක් ලක්ෂ 20ක තැන්පතුවක් බැංකුවේ තියන්න කිව්වාම ඒක ඒ ගොල්ලන්ට දරාගන්න අමාරුයි. මම ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ බස් දෙකතුන ගැනත් කියලා ඔබතුමා කිව්වා, transfer කර ගන්න කියලා. මිලියන 100ක් කිව්වත්, එය තියලා මම certificate එක ඉදිරිපත් කරන්නම්. ඒකේ ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ ක්ෂේත්‍රයට අලුතින් කවුරුවත් ඉදිරිපත් වෙන එකක් නැහැ, මේ නීතිය අනුව. ඒ නිසා මේ ගැනත් කල්පනා කරලා බලන්න. රුපියල් ලක්ෂ 300ක්, 400ක්, 500ක් දීලා බස් එකක් ගන්න මිනිහෙක් ඒ බස් එක අවුරුද්දක්, දෙකක්වත් ධාවනය නොකර තියාවි කියලා හිතනවාද? එයා ඒ බස් එක ධාවනයට යොදවනවා. අපව විවිධ නීති-රීතිවලට යටත් කරනවා; නියාමනය කරනවා. ඒ සියලු දේවලට යටත්ව තමයි අප මේ බස් කර්මාන්තය කරගෙන යන්නේ. මේ නීතිය ගැනත් කඩිනමින් හිතලා බැලුවොත් හොඳයි.

අනෙක් කාරණය ගැන මට වේගයෙන් කියාගෙන යන්න වෙනවා. හිතන්න එපා, මේ කර්මාන්තය අධිලාභ ලබන කර්මාන්තයක් කියලා. මෙහි ලොකු ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ඒ ප්‍රශ්න නිරාකරණය කරන්න තමයි බස් හිමියන් කටයුතු කරගෙන යන්නේ. ඒ නිසා ඒ බස් හිමියන් ගැනත් අනුකම්පාසහගතව බලන්න. NTC එකට ගියොත් -මමත් NTC එකට ඊයේ පෙරේදා දවසක ගියා- දකින්න ලැබෙනවා, සැහෙන පිරිසක් NTC එකට ගිහිල්ලා දවස් ගණන් රස්තියාදු වන ආකාරය. ඒ නිසා මම යෝජනාවක් කළා, එදා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී. ඔබතුමන්ලා ඒක පිළිගත්තා. ඒකට බොහොම ස්තුතියි. වාහනයේ අයිතිය සංශෝධනය කරද්දී අලුත් අයිතිය ගන්න කෙනායි පරණ අයිතිය තියෙන කෙනායි දෙදෙනාම එක දවසේ ආපු වෙලාවට නීත්‍යානුකූලව ඒ දෙදෙනාගෙන්ම ගන්න තිබෙන documents අත්සන් කරලා ඉවර වෙලා ඊට පස්සේ තමයි මේ ටික

[ගරු ජගත් විතාන මහතා]

කරගෙන යන්න කියලා නව අයිතිකරුට භාර දෙන්නේ. ඇත්ත වශයෙන්ම දැන් ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන් තත්ත්වයක තිබෙනවා.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ගත්තොත්, අකමැතිම කාරණාවක් ගැන තමයි දැන් කථා කරන්න සිදු වෙන්නේ. දැන් මා ළඟ ඉන්න මේ ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමාත් ඩීමෝ සමාගමෙන් brand new වාහනයක් අරගෙන බලාගෙන ඉන්නවා. ඒකට registration එක දෙන්නේ නැහැ. සුමාන දෙකතුනක් යනවා registration එක ගන්න. නමුත්, ලියා පදිංචිය online ක්‍රමයට කරනවා කියලායි කිව්වේ. කෝ, online ක්‍රමයට එය සිද්ධ වුණාද? දැන් බලන්න, මේ දක්වාම වෙච්ච දේවල්. මට වෙලාව නැති නිසා ඒවා ගැන කෙටියෙන් කියන්නම්. මා හිතන්නේ මට තවත් විනාඩි දෙකක් හම්බ වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ, නැහැ, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මට විනාඩි 7ක් කියලා තමයි දාලා තිබෙන්නේ. කමක් නැහැ, මම ඒ කාරණයත් ඉදිරිපත් කරන්නම්. ඒ, නීත්‍යානුකූල පදනමකින් තොරව සිදු කළ ගාස්තු අය කිරීමක් ගැනයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 ඔක්තෝබර් 05 දිනැති අංක 2352/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රතිපාදන ඉක්මවා යමින් කටයුතු කර තිබෙනවා, හිටපු මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමා. ඔහු තමන්ට උචිත විධියට, තමන්ට අවශ්‍ය විධියට, අභිමතය පරිදි ගාස්තු අය කරගෙන තිබෙනවා. මම අද **සභාගත*** කරනවා, ජාතික විගණන කාර්යාලයෙන් 2026.01.14 දිනැතිව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්තුමාට යොමු කළ පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීම/විමසීම.

ඒ ගොල්ලෝ මේ සම්බන්ධයෙන් විමර්ශනයක් කරලා තිබෙනවා. රුපියල් කෝටි ගණනක අලාභයක් සිදු කරලා තිබෙන බව කියනවා. මොකද, ජනප්‍රිය numbers ගන්න වෙලාවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්තුමා වෙන් කරනවා, numbers ටිකක්. ඒ numbers ටිකත් මා සභාගත කළ ලේඛනයේ සඳහන් වෙනවා. ඒ numbers ටික වෙන් කළාට පස්සේ, එතැන රුපියල් ලක්ෂ 10ක් ගහලා වෙන් කරපු numbers තිබෙනවා සැහෙන ප්‍රමාණයක්. ඒවාට මොකද වුණේ කියලා සඳහනක් නැහැ. හැබැයි ඒ numbers සහිත වාහන ටික පාරේ දුවනවා. මේ තත්ත්වයට මමත් මුහුණ දුන්නා. මමත් ජනප්‍රිය numbers සහිත වාහන තුනහතරක් ගත්තා. නමුත් මේ අලුත් ගැසට් එකෙන් තමයි මේක නීත්‍යානුකූල තත්ත්වයට පත් වෙන්නේ. එතකොට ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2023 ඉඳලා මේ දක්වාම; අද මේ පනත යටතේ නියෝග සම්මත කරන අතරතුර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අනීතිකව වැඩ කරන්න කොහෙන් හෝ අලිඛිතව ලැබුණු අධිබලයක් පාවිච්චි කරලා තිබෙනවා. ඒ නිසා මේවා ගැන විමර්ශනය කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Jagath Vithana, your time is up.

**ගරු ජගත් විතාන මහතා**
(மாண்புமிகு ஜகத் விதான)
(The Hon. Jagath Vithana)
මගේ වෙලාව දැන් ඉවරයි. නමුත්, කරුණු කාරණා ගොඩක් තිබෙනවා, කියන්න. මේක සද්භාවයෙන් කියන කාරණයක්.

DMT එක ගැන තිබෙන චිත්‍රය තමයි, "වැඩක් කරගන්න අමාරුයි, කල් යනවා" කියන එක. ඒ නිසා ඒ ආයතනය නිවැරැදි ක්‍රමවේදයට ගෙන එන්න. මා සභාගත කළ ලියවිල්ල විගණකාධිපති දෙපාර්තමේන්තුව විමර්ශනය කරලා තහවුරු කළ ලියවිල්ලක්. ඒ ලියවිල්ලේ ඔක්කෝම කාරණා ටික තිබෙනවා. ඒවා ගැන විමර්ශනය කරන්න. එවැනි ක්‍රියා නවත්වන්න කටයුතු කරන්න. විශේෂයෙන්ම NTC එකේ permits ටික transfer කරන කොට මීටත් වඩා මානුෂික වෙන්න කියලා මම ඒ සභාපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ananda Wijepala, you have ten minutes.

[අ.භා. 12.22]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආගාමික හා විගාමික පනත යටතේ නියෝග සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කිරීමට පෙරාතුව මීට ස්වල්ප මොහොතකට පෙර ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත්, ගරු තොණ්ඩමන් මන්ත්‍රීතුමාත් ඉදිරිපත් කළ කාරණා කිහිපයක් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න අවශ්‍යයි.

විශේෂයෙන් එතුමන්ලා ඉදිරිපත් කළා වතු ආශ්‍රිත පහර දීම් කිහිපයක් පිළිබඳව. පළමුවෙනි කාරණය අප්‍රේල් 21වන දා පැල්මඩුල්ල වත්තක නීලගම කොටසේ සිදු වූ පහරදීමක් සම්බන්ධවයි. අනවසර ඉදිකිරීමක් සම්බන්ධයෙන් ඒ ගම්මානයේ පුද්ගලයකුට ආරක්ෂක නිලධාරීන් පහර දීමක් සිදු කළා කියලා පැමිණිල්ලක් ලැබුණා. ඒ පිළිබඳව පොලීසිය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරීන් 11දෙනෙකු අත් අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කරලා තිබෙනවා, නඩු අංක 23445 යටතේ. එහි ඊළඟ නඩු දිනය අගෝස්තු 03 දක්වා කල් දමා තිබෙනවා.

ඒ අතරතුර ඊයේ රාත්‍රියේ මොකාවත්තේදී manager විසින් තමන්ගේ ආහාර පිසින බඩ්රිාමන් සිවකුමාර් නමැත්තාට කනට පහරක් එල්ල කරලා තිබෙනවා. ඒ managerව අද උදේ 9.00ට අත් අඩංගුවට අරගෙන තිබෙනවා. තව ස්වල්ප මොහොතකින් ඔහු උසාවියට ඉදිරිපත් කරන්න කටයුතු කරනවා.

ඊළඟට, ඊයේ රාත්‍රියේ දොළහමාරට විතර නුවරඑළිය-මස්කෙළිය උඩුපුස්සැල්ලාව, ඩෙල්ටා වතු යායේ උප වතු අධිකාරී විසින් වතු කම්කරුවකු වන ශ්‍රීදරන් මහතාට පහර දීමක් කරලා තිබෙනවා. අද උදෑසන ඔහු අත්අඩංගුවට ගත්තා. තව ස්වල්ප මොහොතකින් ඔහු උසාවියට ඉදිරිපත් කරලා ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා.

---
* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කිසිදු පහර දීමක් අපි අනුමත කරන්නේ නැහැ වාගේම, නීතිය කාට වුණත් සමානයි. වතු අධිකාරිද, වෙනත් කෙනෙක්ද කියන එක අදාළ නැහැ. ඒ සියලු දෙනා වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. කාල වේලාව නැති නිසා තවදුරටත් ඒ පිළිබඳ කරුණු පැහැදිලි කරන්න හැකියාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, (351 වන අධිකාරය වූ) ආගමික හා විගාමික පනතේ 23 වන වගන්තිය සමඟ කියවිය යුතු 52වන වගන්තිය යටතේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු ඇමතිවරයා හැටියට 2026 අප්‍රේල් 23වන දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබූ නියෝග පිළිබඳ පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳ ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මෙම නියෝග,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ananda Wijepala-

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට නියමිත කාලය අවම වෙලා තිබෙනවා. මම නැවත වතාවක් හවස කථා කරනකොට ඒ ගැන පැහැදිලි කරන්නම්.

විශේෂයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, do you give your consent to be interrupted?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මට කාලය කළමනාකරණය කර ගන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please make it very short.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
විශේෂයෙන් නව රජයේ ආර්ථික උපාය මාර්ග අනුව යමින් විශේෂයෙන් ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන,-

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමා,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You may pose your question, but make it very short, please.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමා, බොහොම ස්තුතියි.

මමත්, අපේ ජීවන් තොන්ඩමන් මැතිතුමාත් raise කරපු ප්‍රශ්නයට උත්තර දුන්න එක හොඳයි. ඔබතුමන්ලා arrest කරපු එක හොඳයි. නමුත් ඇප දීලා එළියට එනවා. ඒක හැම දාම වෙනවා. ඒකයි ප්‍රශ්නය. ඒක දේශපාලන වශයෙන් අපි නායකයෝ විධියට තීරණය කරන්න ඕනෑ. කරුණාකරලා යෝජනා කරන්නම්. මම කියපු විධියට RPC එකේ ප්‍රධානීන් ඔක්කෝම කැඳවන්න. IGP කැඳවන්න. ඔබතුමාත් එන්න. අපිත් එන්නම්. වාඩිවෙලා කථා කරලා විසඳා ගනිමු. මේක දේශපාලනික වශයෙන් විසඳා ගන්න ඕනෑ. හැම දාම arrest කරනවා; ආපහු එනවා. ඒක හරියන්නේ නැහැ නේ. ඒ නිසා කරුණාකරලා අවධානය යොමු කරන්න. සද්භාවයෙන් කියන්නේ. මේක අපි ආණ්ඩුවේ අවධානයට ගෙනෙනවා. ඔයගොල්ලන්නේ ආණ්ඩුව. අපි විපක්ෂයනේ. ඉතින් අපි කාගේ අවධානයටද ගෙනෙන්නේ?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. Member, your point has been taken.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මම ඒ පිළිබඳව හවස පැහැදිලි කරන්නම්.

විශේෂයෙන් මේ නියෝග අනුමත කිරීම හරහා කරන්නේ අපේ රටේ ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන උපාය මාර්ගයක් වන සංචාරක ව්‍යාපාරය, නැත්නම් විදේශ ඉපැයීම්,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ananda Wijepala, there is another interruption coming in. Are you taking it?

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු විපක්ෂ නායකතුමනි, මට පොඩි වෙලාවයි තිබෙන්නේ. ඔබතුමා දිවා ආහාරයෙන් පස්සේ ප්‍රශ්නය මතු කරන්න. මේ කථාව අස්සේ බාධා කරමින් වෙනත් ප්‍රශ්නයක් මතු කරන්න ගියොත් මට මේ කථාව කර ගන්න බැරි වෙනවා. ඒකට තවදුරටත් ඉඩ දෙන්න බැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Hon. Ananda Wijepala, you may continue.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

විශේෂයෙන් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍යයි. ඒ නිසා පසුගිය කාලයේ මේ පිළිබඳව විශේෂයෙන්ම විදේශ කටයුතු ඇමතිතුමාත්, මමත් ඒකාබද්ධව අමාත්‍යතුමාට සංදේශයක් ඉදිරිපත් කරලා ආගමික විගාමික පනත සංශෝධනය කරලා රටවල් 40කට නිදහස් ගමන් බලපත්‍ර - free visa - ලබා දීමට අවශ්‍ය පියවර ගත්තා. ඒ කරුණු තමයි අද අනුමත කරන්නේ. විශේෂයෙන් මීට පෙරාතුව ඉන්දියාව, තායිලන්තය, ඉන්දුනීසියාව, රුසියාව, මැලේසියාව, ජපානය වාගේ රටවල් හතකට සංචාරක ගාස්තු අය කිරීමකින් තොරව දින 30ක කාලයක් සඳහා සංචාරක වීසා ලබා දෙන්න තීන්දු කරලා තිබුණා. මේ පිළිබඳව දිගින් දිගටම විශේෂඥ කමිටුවක් හරහා අධ්‍යයනය කරලා වෙනත් රටවල මොන ආකාරයකට ද free visa භාවිත කරලා තිබෙන්නේ කියලා සොයා බැලුවා. මේ කමිටුව විසින් තායිලන්තය, ජපානය, මැලේසියාව, වියට්නාමය, සිංගප්පූරුව වාගේ රටවල සිදු කරනු ලැබූ අධ්‍යයනයකින් පසුව තීන්දුවක් අරගෙන තිබෙනවා, වසරක කාලයක් සඳහා free visa ලබා දීමට අවශ්‍ය අනුමැතිය ලබා ගන්න. එය මාස හයකින් පසු සමාලෝචනය කරලා තවදුරටත් මේක පවත්වා ගෙන යනවාද කියලා තීන්දු කරනවා.

ඇත්ත වශයෙන්ම 1956 පෙබරවාරි මස 24 වන දින අංක 10,896 දරන ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සඳහා වූ අතිරේකයේ පළ කරන ලද, කලින් කල සංශෝධිත, ආගමික හා විගාමික නියෝග, එහි 13 වන නියෝගයේ වගුවේ "2. සංචාරක වීසා" යන ශීර්ෂය යටතේ එහි දක්වා ඇති 1 වන, 2 වන සහ 3 වන අයිතම ඉවත් කර ඒ වෙනුවට අලුත් නියෝග සකස් කරනු ලබනවා. ඒ අලුත් නියෝග අනුව ඕස්ට්‍රේලියාව, ඔස්ට්‍රියාව, බහරේනය, බෙලරුස්, බෙල්ජියම, කැනඩාව, චීනය, චෙක් ජනරජය, ඩෙන්මාර්කය, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, ඊශ්‍රායලය, ඉතාලිය, ජපානය, කසකස්ථානය, කුවේට්, මැලේසියාව, නේපාලය, නෙදර්ලන්තය, නවසීලන්තය, නෝර්වේ, ඕමානය, පකිස්තානය, පෝලන්තය, කටාර් රාජ්‍ය, රුසියාව, සවුදි අරාබිය, දකුණු කොරියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය, ස්විට්සර්ලන්තය, තායිලන්තය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය යන මේ රටවල් 40 සඳහා දින 30ක සංචාරක වීසා නොමිලයේ ලබා දීම තමයි මේකේ ප්‍රධාන අරමුණ. මේ රටවල් 40 සඳහා දින 30ක සංචාරක වීසා නොමිලයේ ලබා දීම සිද්ධ වෙනවා. මෙහිදී සිද්ධ වන්නේ ETA හරහා වීසා ලබා දීමයි. හැබැයි, මුදලක් අය කරන්නේ නැහැ. මේ දක්වා මුදල් අය කළා. මේ රටවල් 40 ඇතුළේ ඇත්තටම SAARC countries සඳහා වීසා නිකුත් කරනකොට visit visa සඳහා ඩොලර් 20ක් ලබා ගත්තා. Business visa සඳහා ඩොලර් 30ක් ලබා ගත්තා. ඒ වාගේම අනෙකුත් countries සඳහා visit visa සඳහා ඩොලර් 30යි. Business visa සඳහා ඩොලර් 55ක් ලබාගෙන තිබුණා. මේ සියලු visa මේ රටවල් 40 සඳහා නොමිලේ නිකුත් කරන්න අවශ්‍ය කටයුතු කරනවා, කිසිම ගාස්තු අය කිරීමක් නැහැ.

එහෙත් මෙහිදී පැන නගින කාරණයක් තිබෙනවා. ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ආකාරයෙන් මේ කටයුතු කරන්න අපේ අදහසක් නැහැ. ඒ නිසා අපි ඉලෙක්ට්‍රෝනික සංචාරක අවසරපත් - ETA- අනිවාර්යය කරලා තිබෙනවා. ඒ හරහා වීසා ලබා ගැනීමක් සිද්ධ කරනවා. මෙහිදී සිද්ධ වන්නේ නොමිලේ වීසා ලබා දීම පමණයි. අනෙකුත් ක්‍රම ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන්න අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා. මේ හරහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවට නැත්නම් රජයට අහිමිවන මුදලක් තිබෙනවා. ඒ මුදල පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. විශේෂයෙන් මේ රටවල් 40 සම්බන්ධයෙන් සොයා බැලුවාම 2023, 2024, 2025 වර්ෂවල පිළිවෙළින් ගත්තාම, ඩොලර් මිලියන 1.4ක්, 1.2ක්, 1.8ක් වාගේ මුදලක් සංචාරක වීසා හරහා අපට ආදායමක් ලෙස ලැබුණා. මේ ආදායම තමයි අහිමි වෙන්නේ. මේ අනුව ඩොලර් මිලියන 75ක විතර මුදලක් අහිමි වෙයි කියලා අපි අපේක්ෂා කරනවා; ඇස්තමේන්තු කරලා තිබෙනවා. හැබැයි, අපේ ආර්ථික උපාය මාර්ගයේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන අංගයක්. ඒ ප්‍රධාන අංගය අනුව සංචාරක ව්‍යාපාරය හරහා මේ අහිමි වෙන මුදලට වඩා විශාල මුදලක් අපට උපයා ගන්න හැකිවෙයි කියලා ඊට අදාළව මේ වනවිට සංචාරක සංවර්ධන අධිකාරිය, විදේශ කටයුතු අමාත්‍යාංශය සැලසුම් සකස් කරලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have two more minutes.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ඒ අනුව සියයට 10ක්, එහෙම නැත්නම් 247,000ක ප්‍රමාණයක සංචාරකයන් ප්‍රමාණයක් ඉදිරි කාලයේදී මේ free visa වාසිය හරහා රටට ළඟා වෙයි කියලා අපි විශ්වාස කරනවා. එහෙම වුණොත් අපට ඇමෙරිකානු ඩොලර් මිලියන 317ක ආදායමක් උපයා ගන්න හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා සහ සැලසුම් කරලා තිබෙනවා; ඇස්තමේන්තු කරලා තිබෙනවා. මේක ශුද්ධ වශයෙන් ගණනය කරපුවාම ඇමෙරිකානු ඩොලර් මිලියන 242ක ආදායමක් ලැබෙනවා. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හරහා ඔබතුමන්ලා දන්නවා ගුවන් තොටුපොළ බද්ද - Embarkation Levy - හරහා ගුවන් මඟියෙකුගෙන් යම් මුදලක් අය කරගන්නවා කියලා. මේ ලැබෙන ආදායම් එක්ක ශුද්ධ ආදායම ලෙස ඇමෙරිකානු ඩොලර් මිලියන 242ක් ලබා ගැනීමට හැකි වේවි කියලා අපි විශ්වාස කරනවා.

විශේෂයෙන්ම ඔබතුමන්ලා දන්නවා, මේ සංචාරක ව්‍යාපාරය සංවර්ධනයේදී විශාලම සංචාරක පැමිණීමේ ප්‍රමාණය ගිය වසරේ තමයි වාර්තා වෙන්නේ කියලා. ඒ වාගේම ඉදිරියට ක්‍රියාත්මක වෙන ඉලෙක්ට්‍රෝනික වීසා ක්‍රමය - ETA - හරහා විශාල සංචාරකයන් ප්‍රමාණයක් රටට ඒවි. පසුගිය කාලයේ දෛනිකව 9,000ක් විතර රටට ඇතුළු වුණා. මේ දවස්වල එහි යම් අඩුවක් තිබෙනවා, මැද පෙරදිග කලාපයේ තිබෙන යුද තත්ත්වය හේතුවෙන්. පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය 4,800ක් වාගේ වෙලා තිබෙනවා. කෙසේ වෙතත්, සමස්තය ගත්තාම අද දින අනුමත කරන නියෝග හරහා අනාගතයේදී රටවල් 40ක සංචාරකයන්ට free visa බලපත්‍ර ලබා දෙනවා. ඒ වාගේම හැකියාව ලැබිලා තිබෙනවා, ජාතික ආරක්ෂාවට බලපාන කාරණා පිළිබඳව පෙර පරිදිම ඒවාට අවශ්‍ය වැට බැඳීම් කරන්න. ඒ වාගේම මේ සංචාරක වීසා නොමිලේ ලබා දීම පිළිබඳව වසරක කාලයකින් පස්සේ නැත්නම් මාස හයක කාලයකින් පස්සේ නැවත සමාලෝචනයක් කරන්නත්, එය දීර්ඝ කාලීන පවත්වාගෙන යනවාද නැද්ද කියන කාරණය පිළිබඳවත් අවශ්‍ය තීන්දු-තීරණ ගන්නත් අපි කටයුතු කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද දින සම්මත කර ගන්නා මේ නියෝග හරහා අනාගතයේදී සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට සුවිශේෂ මෙහෙයක් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

## මෝටර් වාහන පනත: නියෝග
## மோட்டார் வாகனச் சட்டம்: ஒழுங்குவிதிகள்
## MOTOR TRAFFIC ACT: REGULATIONS

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(203 අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 21, 22, 23, 24 සහ 24අ වගන්ති සමඟ කියවිය යුතු 237 වගන්තිය යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2026 ජනවාරි 05 දිනැති අංක 2470/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආගාමික හා විගාමික පනත: නියෝග
## குடிவருவோர் மற்றும் குடியகல்வோர் சட்டம்: ஒழுங்குவிதிகள்
## IMMIGRANTS AND EMIGRANTS ACT: REGULATIONS

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "(351 අධිකාරය වූ) ආගාමික හා විගාමික පනතේ 23 වගන්තිය සමඟ කියවිය යුතු 52 වගන්තිය යටතේ මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා විසින් 2026 අප්‍රේල් 23 දින සාදන ලදුව, 2026.05.05 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

න්‍යාය පත්‍රයේ විෂය අංක 4 සහ 5 අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා.

ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

## මහජන ආරක්ෂක ආඥාපනත: යෝජනා සම්මතය
## பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டம்: தீர்மானம்
## PUBLIC SECURITY ORDINANCE: RESOLUTION

[අ.භා. 1.00]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "1959 අංක 8 දරන පනතින් ද, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් ද සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ඉහත කී ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන 2026 අප්‍රේල් 28 වැනි දින සිට ශ්‍රී ලංකාව මුළුල්ලේම ක්‍රියාත්මක කරමින් කරන ලද ප්‍රකාශනය අනුමත කළ යුතු ය."

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 5 - අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය ද මා ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දින මහජන ආරක්ෂක ආඥාපනත යටතේ යෝජනා සම්මතය සහ අත්‍යවශ්‍ය මහජන සේවා පනත යටතේ යෝජනා සම්මතය පිළිබඳ විවාදය ආරම්භ කරමින් කරුණු කාරණා ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම මෙම මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වන විධිවිධාන කිහිපයක් සම්මත කර ගැනීම අපට අත්‍යවශ්‍ය වුණා. මොකද, මේ රටේ ඉතිහාසයේ බරපතළම ව්‍යසනය වන "දිට්වා" සුළි කුණාටුව හරහා රටට සිදු වුණු ආපදා තත්ත්වය, ඒ හරහා බිඳ වැටුණු ජන ජීවිත නැවත ගොඩනඟා ගැනීමත්, බිඳ වැටුණු යටිතල පහසුකම් ශක්තිමත්ව, සක්‍රියව ගොඩනැඟීමත්, ඒවා සංවර්ධනය කිරීමත් කියන කාරණා පෙරදැරි කරගෙන මීට මාස කිහිපයට පෙරාතුව මෙම හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කරන්නට සිදු වුණා. මෙය තවත් මසකින් දීර්ඝ කිරීම සඳහා ජනාධිපතිතුමා ඉදිරිපත් කළ ගැසට් නිවේදනය අනුමත කර ගැනීම සඳහා තමයි අද දින මේ විවාදය පැවැත්වෙන්නේ.

විශේෂයෙන් ඔබ දන්නවා, "දිට්වා" සුළි කුණාටුවෙන් ඇති වුණු අතිවිශාල ආපදා තත්ත්වයෙන් පසු ජන ජීවිතයේ යම් යම් බිඳවැටීම් සිදු වුණු බව. ඒවා ඉතාම කෙටි කාලයක් තුළ සක්‍රිය

[ගරු ආනන්ද විජේපාල මහතා]

කරගන්න හැකියාව ලැබුණා. විශේෂයෙන්ම මේ මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධාන යටතේ අපට හැකියාව ලැබුණා, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් පත් කරගන්න. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා හරහා අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩව පවත්වාගෙන යන්න අපට ඉඩකඩ ලැබුණා. පසුගිය මාස දෙක තුන පුරාම අපි මේ අත්‍යවශ්‍ය සේවා අඛණ්ඩවත්, විධිමත්වත් පවත්වාගෙන යමින් තිබෙනවා. ඒ වාගේම, මේ "දිට්වා" සුළි කුණාටුව ඇතිවීමත් සමඟ මේ සඳහා විශේෂ සහන පැකේජයක් ප්‍රකාශයට පත් කරමින් බිඳ වැටුණු ජන ජීවිත ගොඩනැඟීමටත්, බිඳ වැටුණු සියලු යටිතල පහසුකම් 2026 වර්ෂය තුළ නැවත ස්ථාපිත කරගැනීම සඳහාත් ක්‍රියාමාර්ග ගන්න, පියවර ගන්න අපට හැකියාව ලැබුණා. ඒ අනුව තමයි රුපියල් බිලියන 500ක මුදලක් මේ වෙනුවෙන් වෙන් කර ගැනීමට හැකියාව ලැබුණේ. මෙවැනි විපතක්, ව්‍යසනයක් නිසා බංකොලොත් වෙලා තිබුණු රටක් වසරක් වැනි ඉතා කෙටි කාලයක් තුළ නැවත ආර්ථික වශයෙන් ස්ථායිකරණයකට පත් කිරීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මේ මුදල අපට වෙන් කරගන්න හැකියාව ලැබුණේ.

ඔබ දන්නවා, ඒ පැවැති තත්ත්වය. ඒ කියන්නේ ආර්ථික වශයෙන් බිඳ වැටිලා, බංකොලොත් වෙලා, දැවැන්ත ව්‍යසනයකට රට මුහුණ දීලා තිබුණා. ආර්ථික වශයෙන් පමණක් නොවෙයි, සදාචාරාත්මක වශයෙන් ගත්තත් නීතියේ ආධිපත්‍යය බිඳ වැටිලා, ජාතීන් අතර අසමගිය ඇතිවෙලා, රටක් හැටියට මුහුණ දෙන්න තිබෙන සියලු ව්‍යසනයන්ට මුහුණ දීපු තත්ත්වයක් යටතේ තමයි වත්මන් රජය බලයට පත් වෙලා කෙටි කාලයක් තුළ දැවැන්ත ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්න හැකි වුණේ. මේ වනකොට මහ බැංකු වාර්තාව නිකුත් වෙලා තිබෙනවා. සියයට 5ක ස්ථාවර ආර්ථික වර්ධනයක් අප අත්පත් කරගෙන තිබෙනවා. මේ තුළින් දේශපාලන ස්ථාවරත්වයක් ගොඩනඟාගෙන තිබෙනවා. මේ හරහා ලබා ගත් ආර්ථික ජයග්‍රහණ පෙරළා මහජනතාව වෙත ලබා දෙන්න අපට හැකියාව ලැබී තිබෙනවා. හුඟක් වෙලාවට අපි අතීතයේ දැක්කේ, ලබාගත් ආර්ථික ජයග්‍රහණ එක පෙළැන්තියකට, කල්ලියකට සීමාවෙලා තිබුණු ආකාරයයි. නමුත්, මේ ආර්ථික ජයග්‍රහණ පීඩාවට පත් ජනතාව වෙනුවෙන් ආපසු ලබා දෙන්නට අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ නිසා තමයි "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් ජනතාව සඳහා ආර්ථික සහන පැකේජයක් ප්‍රකාශයට පත් කළේ. ඒ තුළ තිබුණා, නැවත පදිංචියට යනකොට රුපියල් 25,000ක දීමනාවක් දෙන්න ඕනෑ කියලා. මේ වෙනකොට සියයට සියයකටම - පවුල් 430,558කට - මේ රුපියල් 25,000ක දීමනාව ගෙවා තිබෙනවා.

ඒ සඳහා රුපියල් මිලියන 16,763ක් වැයකර තිබෙනවා. ඒ වාගේම රුපියල් 50,000ක් ලෙස දෙන උපකරණ දීමනාව යටතේ පවුල් 165,569කට රුපියල් මිලියන 8,278.5ක් ගෙවලා තිබෙනවා. ඒ කටයුතු සියයට 99ක් විතර අවසන් කර තිබෙනවා. ඒ වාගේම ආර්ථිකමය වශයෙන් පීඩාවට පත්වෙලා ජීවන තත්ත්වය බිඳ වැටුණු පවුල් යම්කිසි ප්‍රමාණයක් හිටියා. ඔවුන්ට, ඔවුන්ගේ ජීවනෝපාය පවත්වාගෙන යාම සඳහා මාස තුනක් ස්ථාවර මුදලක් ගෙව්වා. ඒ මුදල එම මාස තුන පුරාවටම ගෙව්වා. ඒකත් දැන් සම්පූර්ණ කර තිබෙනවා. ඒ වාගේම ආපදා තත්ත්වය හේතුවෙන් සම්පූර්ණයෙන්ම හානිවෙච්ච නිවසක් වුණත්, අර්ධ හානි වුණු නිවසක් වුණත් තවදුරටත් එම නිවස සුරක්ෂිත නිවසක් නොවන බවට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය තහවුරු කළාට පස්සේ ඒ ස්ථානවලින් සියලුම පිරිස ඉවත් කරලා ඔවුන්ට රුපියල් 25,000ක නිවාස කුලියක් ලබා දුන්නා. ඒක අඛණ්ඩව ලබා දෙමින් සිටිනවා. මේ වනකොට පවුල් 9,207කට ඒ කුලී මුදල ලබා දෙමින් සිටිනවා. අපි ඒ කටයුතු සිදු කළේ, අපේ රටේ ජනයාගේ ජන ජීවිත සුරක්ෂා කිරීමේ අරමුණ ඇතිවයි. අපි මේ කිසිවකට පැලැස්තර විසඳුම් ගෙනාවේ නැහැ.

අතීතයේ දී විවිධ ව්‍යසන අවස්ථාවලදී, ජනතාව පීඩාවට පත්වුණු අවස්ථාවලදී ඒ අවස්ථාවට පමණක් පැලැස්තර විසඳුම් ගෙනාපු හැටි අපි දැක්කා. නාය ගිහිල්ලා දින ගණනක් ගත වුණාට පස්සේ මිනිස්සුන්ට ඒ ස්ථානවලම පදිංචි වෙන්න ඉඩහැරියා. නමුත් අපි ඒ සියල්ල වෙනස් කරලා තිබෙනවා. අපේ පළමුවැනි අරමුණ වන්නේ, ජනයාගේ ජීවිතය සුරක්ෂිත කිරීමයි. සියලු ජනතාව රැකබලා ගැනීම සහ සුරක්ෂිත කිරීමයි. ඒ අනුව අපි නාය ගිය සෑම ප්‍රදේශයක් සඳහාම, නාය ගිය සෑම ගොඩනැඟිල්ලක් සඳහාම ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයෙන් සහතිකයක් ලබා ගැනීම අනිවාර්ය කර තිබෙනවා. අපිට තිරසාර වැඩ පිළිවෙළකට යන්න අවශ්‍යයි. අනාගතයේදී තවදුරටත් ජනයා බිල්ලට ගනිමින් සිද්ධ වෙන දේපොළ හානිය, යටිතල පහසුකම් හානිය වළක්වා ගැනීම සඳහා වන සුවිශේෂී වැඩ පිළිවෙළක් හැටියට තමයි අපි මේ වැඩ පිළිවෙළ දකින්නේ. ඒ සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ලබා ගැනීම සිදු කරනවා. ඒකෙන් අදහස් කරන්නේ මෙයයි. නැවත පදිංචි කිරීම - resettlement - හෝ නැවත ප්‍රතිස්ථානගත කිරීම - relocation - කියන කාරණා දෙකේදී, අනාගතයේ ඒ භූමියේ නැවත නාය යාමක් සිදුවේද, නැද්ද කියන සහතිකය තහවුරු කර ගැනීමෙන් පසුව තමයි ඕනෑම පවුලක් නැවත පදිංචි කරන්නේ. ඒ සඳහා යම් අභියෝගයක් තිබෙනවා. නමුත් ඒ කාරණය සිද්ධ වෙමින් පවතිනවා.

විපක්ෂයේ බොහෝ අය කිව්වා, සහන පැකේජය ප්‍රකාශයට පත් කළාට පස්සේ නිවාස ආධාර හැටියට රුපියල් ලක්ෂ 50 ගෙවන්නේ නැහැ කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පූර්ණ හානි වූ නිවාස වෙනුවෙන් ස්ථිර නිවසක් ඉදිකිරීම සඳහා රුපියල් ලක්ෂ 50ක මුදලක් ලබා දීමේ කටයුත්ත අපි මේ වෙනකොට ආරම්භ කර තිබෙනවා. මේ වෙනකොට ඒකේ පළමුවැනි වාරිකය හැටියට රුපියල් ලක්ෂ 20 බැගින් විශාල පිරිසකට ලබා දීලා තිබෙනවා. දෙවැනි වාරිකය රුපියල් ලක්ෂ 15යි. තුන්වැනි වාරිකය රුපියල් ලක්ෂ 15යි. ඒ විධියට ඒ වැඩකටයුතු ආරම්භ වෙමින් තිබෙනවා.

ඒ වාගේම තක්සේරු වාර්තාවක් නොමැතිව රුපියල් ලක්ෂ 5ක් ගෙවනවා කියලා කිව්වා. මේ වෙනකොට ඒ ආකාරයටම එම ගෙවීම් කටයුතු කරමින් පවතිනවා. ඒ සඳහා මුදල් වෙන්වෙලා තිබෙනවා. ඒ වාගේම අර්ධ හානි තක්සේරුවෙන් පසුව රුපියල් ලක්ෂ 25 දක්වා ගෙවීමේ කටයුතුත් ඊත් එක්කම සිදුවෙමින් පවතිනවා. ඒ වාගේ තවත් විශාල සහන ප්‍රමාණයක් ප්‍රකාශයට පත් කරලා තිබුණා. විශේෂයෙන්ම කෘෂිකාර්මික කටයුතු සඳහා වන්දි ගෙවීම, ධීවර කටයුතු සඳහා බෝට්ටු, දැල් ආම්පන්න වෙනුවෙන් වන්දි ගෙවීම, සත්ව පාලනයේදී අහිමි වූ සතුන් වෙනුවෙන් වන්දි ගෙවීම යන ඒ කටයුතුවලින් විශාල ප්‍රමාණයක් අපි අවසන් කර තිබෙනවා. තව යම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ නිසා මේ රෙගුලාසි මාසයක් වාගේ කාලයක් තවදුරටත් පවත්වාගෙන යන්න අවශ්‍යයි. ඒ වෙනුවෙන් තමයි අපි මේ වෙලාවේදී මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ මේ හදිසි තත්ත්වයන් පවත්වා ගත්තාට අපි කිසිම ආකාරයකින් මේ කාරණාවලට හැර වෙනත් කාරණයක් සඳහා මේ නීති පාවිච්චි කරලා නැහැ. විශේෂයෙන්ම ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කරන රටක්, භාෂණයේ නිදහස පිළිගන්නා රජයක් විධියට අපි ඒ අනුව කටයුතු කර තිබෙනවා. ඒ නිසා අපි මේ ආඥාපනතේ විධිවිධාන භාවිත කරන්නේ ජන ජීවිතය පවත්වාගෙන යාමට සහ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහායි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මැද පෙරදිග කලාපයේ ඇති වී තිබෙන යුදමය තත්ත්වය හේතුවෙන් - යුද ගැටුම් හේතුවෙන් - අපට යම් වක්‍ර බලපෑමක් ඇතිවෙලා තිබෙන බව අපි දන්නවා. එහි බලපෑම නිසා ඉන්ධන සැපයීමේදී, ගෑස් සැපයීමේදී වාගේම විදුලි බලය සම්බන්ධයෙන් ද මිල උච්චාවචනය වීම් සිදුවෙනවා. ඒ හරහා ජනතාවට යම් පීඩාවක් ඇතිවෙන අවස්ථාවලදී ජනතාවගේ පැත්තේ සිට ගනිමින් ජනතාවට සහන සැලසීම වඩාත් විධිමත් කිරීමත් මේ වෙනකොට අපි සිදුකරමින් පවතිනවා. ඒ සඳහාත් රුපියල් මිලියන 10,000ක මුදලක් වෙන් කරලා තිබෙනවා. අපි ඒකයි කිව්වේ, අපි ලබා ගත් ආර්ථික ජයග්‍රහණ මේ රටේ සාමාන්‍ය පන්තියේ මිනිසුන්ගේ ජන ජීවිතය සුරක්ෂා කිරීම වෙනුවෙන් හැම වෙලාවේදීම පාවිච්චි කරන්න අපි සූදානම් බව. ඒ අනුව ඉදිරියේදී විදුලි බිලෙහි යම් සංශෝධනයක් සිදු වුණොත්, රජයේ මුදලින් කොටසක් විදුලි බිලේ සහනාධාරයක් හැටියට භාවිත කරන්න අපට හැකියාව ලැබෙනවා. ඒ ගැන අපි මේ වෙනකොට ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. පොහොර සහනාධාරය වැඩිකරලා තිබෙනවා. පොහොර සහනාධාරය වැඩි කළා පමණක් නොවෙයි, මේ කන්නය තුළ පොහොර මිල ඉහළ ගියොත් පරණ මිලටම පොහොර ලබා දෙන්න රජය යම් මුදලක් දැරීමට තීන්දු කර තිබෙනවා. ඒ වාගේම අස්වැසුම සහනාධාරය මාස කිහිපයකට වැඩි කරලා තිබෙනවා. මේ සියල්ලේම අරමුණ වන්නේ, මේ රට වසරක් වැනි කෙටි කාලයක් තුළ ලබා ගත් ආර්ථික ජයග්‍රහණ, පෙරළා පීඩිත පන්තියේ මිනිසුන්, නැත්නම් විවිධ ව්‍යසන නිසා පීඩාවට පත් වුණු ජනතාව සුඛිත මුදිත කිරීම සඳහා ලබා දීමයි.

ඉතින්, මේ වෙනුවෙන් තමයි අත්‍යවශ්‍ය සේවා ශක්තිමත්ව පවත්වාගෙන යන්නේ. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යභාරය ශක්තිමත්ව පවත්වාගෙන යෑම වෙනුවෙන් මෙම විධිවිධාන තවදුරටත් පවත්වාගෙන යෑම අවශ්‍යයි කියන යෝජනාව තමයි අපි මේ වෙලාවේ කරන්නේ සහ එය අනුමත කර ගැනීම තමයි මේ විවාදය අවසානයේ අරමුණ වෙන්නේ.

මේ කාරණා වාගේම මට තවත් කාරණා කිහිපයක් මතු කර ගන්න අවශ්‍යයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මීට පෙර ඊයේ දිනයේත්, අද දිනයේත් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් වුණු කාරණා කිහිපයක් ගැන මේ වෙලාවේ මම කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පොලිස් නිලධාරින් බඳවා ගැනීමේදී සුදුසුකම් වෙනස් කිරීමක් පිළිබඳ කාරණාවකුත් මතු වුණා. ඒ වාගේම පොලිස් නිලධාරින්ගේ පුරප්පාඩු පිළිබඳ කාරණා කිහිපයකුත් මතු වුණා. අපි මේ වන විට උප පොලිස් පරීක්ෂකවරුන් 200ක් පුහුණු කිරීම සඳහා පොලිස් විද්‍යාලවලට බඳවා ගැනීම් කරලා තිබෙනවා. ඒ වාගේම තවත් 10,000ක් බඳවා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. 1,400කගේ සම්මුඛ පරීක්ෂණ අවසන් කර තිබෙන අතර, තව සතියක් වැනි කෙටි කාලයක් තුළ ඒ අය පොලිස් විද්‍යාල 5කට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර අපි අරන් තිබෙනවා. ඒ වාගේම මේ වනකොට 7,800ක් සඳහා සම්මුඛ පරීක්ෂණ ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. අපි පොලිස් සේවාවේ වැඩිදියුණුව -උන්නතිය-, ඒ වාගේම ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා, අධ්‍යාපන සුදුසුකම්වල යම් කිසි වෙනසක් සිද්ධ කළා. අපි ඒක සමාලෝචනය කරමින්, වැඩි පිරිසකට අවස්ථාව දීම සඳහා දැන් කටයුතු කරමින් ඉන්නවා. යම් වෙනසක් අවශ්‍ය නම්, ඉදිරියේදී ඒ සඳහා කටයුතු කරන්නත් අපට හැකියාව ලැබේවි.

මේ වෙලාවේ මම තවත් විශේෂ කාරණයක් අවධාරණය කරන්න අවශ්‍යයි. විශේෂයෙන්ම ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ e-passport ටෙන්ඩරය පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් මාධ්‍ය සාකච්ඡාවක් තුළින් මගේ නමත් සඳහන් කරමින් - පොලිසිය භාර ඇමතිවරයා ගැන සඳහන් කරමින් - වැරදි ප්‍රකාශ නිකුත් කරනවා මම දැක්කා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉදිරියේදී මම ඒ පිළිබඳව නීත්‍යනුකූලව යම් යම් ක්‍රියාමාර්ග ගන්න අපේක්ෂා කරනවා. මොකද, ඔය විපක්ෂයේ කණ්ඩායම් මේ රට පාලනය කරනකොට ටෙන්ඩර් සම්බන්ධයෙන් අනුගමනය කළ ක්‍රියාමාර්ග, ප්‍රතිපත්ති අපි හොඳින් දන්නවා. එක කාලයක් තිබුණා, අඩුම තරමින් ටෙන්ඩර් එකක්වත් කැඳෙව්වේ නැති. Unsolicited proposals ගෙනැල්ලා විනිවිදභාවයකින් තොරව ඒ කාලයේ කටයුතු කරමින් තිබුණා. ඒ හරහා ඇති වුණු අතිදැවැන්ත දූෂණ හා වංචා පිළිබඳව මේ රටේ මිනිස්සු දන්නවා.

මේ e-passport එක සම්බන්ධයෙන් කරපු ප්‍රකාශ සම්පූර්ණයෙන්ම අසත්‍යයි. මොකද, ඒ මන්ත්‍රීතුමා කියපු විධියට e-passport ටෙන්ඩරයක් මේ වනකොටත් දීලා නැහැ. ඒ ටෙන්ඩර් එක තවම process වනවා. මෙම e-passport සම්බන්ධ ටෙන්ඩරය ආරම්භ වන්නේ පසුගිය ආණ්ඩුව කාලයේ. සමහර සමාගම් ඒ පිළිබඳව අධිකරණ ක්‍රියාමාර්ගවලට ගිහිල්ලා තිබෙනවා. ඒ සම්බන්ධ යම් යම් සීමාවන්ට යටත්ව අපි කටයුතු කරනවා. අපි ආණ්ඩු බලයට එනකොට පාස්පෝට් පෝලිම කිලෝමීටර 2ක්, 3ක් දුරට තිබුණා. අපි ඇවිල්ලා පාස්පෝට් කාර්යාලය පැය 24ම විවෘත කරලා ඒ තත්ත්වය සමනය කරලා මේ වනකොට සාමාන්‍ය තත්ත්වයට පත් කරලා තිබෙනවා. ඒ දූෂිත ගනුදෙනු නිසා සමහර කොම්පැනි උසාවි ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම e-passport එකේ කොටසක් වන PKI, එහෙම නැත්නම් පුද්ගලාරෝපණ පද්ධතිය සම්බන්ධයෙන් මේ වනකොට ටෙන්ඩරයක් ගිහිල්ලා තිබෙනවා. ඒ ටෙන්ඩරයට යම් සමාගම් ප්‍රමාණයක් ඉදිරිපත්ව තිබෙනවා. එක සමාගමක් මේ සම්බන්ධව අභියාචනාධිකරණයට - Appeal Court එකට - ගිහිල්ලා තිබෙනවා. ඒ පිළිබඳව තවම අවසන් තීන්දුවක් අරගෙන නැහැ. එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වුණාම, එම කාරණා සම්බන්ධව ප්‍රසම්පාදන කොමිසමේ මතය ලබා ගැනීම සඳහා එම කොමිසමට යොමු කරනවා. ඒ හැර මේ ටෙන්ඩරය ප්‍රදානය කළේ කාටද කියලා කියන්නත් පෙරාතුව සමහර අයගේ ඕනෑ එපාකම් වෙනුවෙන්, සමහර කොම්පැනිවල ඕනෑ එපාකම් වෙනුවෙන් පෙනී සිටින විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්, අල්ලසට, දූෂණයට උඩගෙඩි දුන් අය, රට බංකොලොත් කරපු අය, ආර්ථික ඝාතකයෝ බවට පත් වුණු මිනිස්සු ඇවිල්ලා ආණ්ඩුවේ මේ ටෙන්ඩර් ක්‍රියා පිළිවෙතට ඇඟිල්ල දිගු කරනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේකේ යම් කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා තමයි අපට හිතෙන්නේ. මේ ටෙන්ඩරය මෙන්ම ජාතික ජන බලවේග ආණ්ඩුව බලයට ආවාට පසු ඉදිරිපත් කළ සියලු ටෙන්ඩර් අපි විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කර තිබෙනවා.

අපි මේ සභාවට සහතිකයක් දෙනවා, අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ඉඳලා ජනාධිපතිතුමා දක්වා දේශපාලන ක්‍රියාවලියේ ඉන්න කිසිම කෙනෙක් රුපියලක හෝ හොරකමකට, වංචාවකට සම්බන්ධ නැහැ කියලා. අපි එහෙම සම්බන්ධ වන්නේත් නැහැ. මේ රටේ ජනතාව ඒක දන්නවා. ඒක අපි සපථ කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මට තව විනාඩියක්, දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

[ගරු ආනන්ද විජේපාල මහතා]

ඔබතුමියත් දන්නවා, මේ ටෙන්ඩර් ක්‍රියාවලිය හරහා අලුත් වටයකින් වෙන වෙන ව්‍යාජ කාරණා මතු කරමින් ඉන්නවා කියලා. මේ හරහා රටේ සංවර්ධනය අඩාළ කිරීමට මේ පිරිස් උත්සාහ කරනවා කියලා තමයි අපට හිතෙන්නේ. මොකද, ටෙන්ඩර් ක්‍රියාවලියක යම් අකටයුත්තක් සිදු වෙලා තිබෙනවා නම්, නීති විරෝධී ක්‍රියාකාරකමක් සිදු වෙලා තිබෙනවා නම් ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඕනෑ තරම් තිබෙනවා. මෙහිදී උසාවි යන්න පුළුවන්, අභියාචනා මණ්ඩලවලට යන්න පුළුවන්. ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග තිබෙනවා. ඒ අනුව කටයුතු කරන්න පුළුවන්. ඕනෑම කෙනෙකුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන්. එහෙම ක්‍රියාමාර්ග ගන්නේ නැතිව නිකම් mikes දෙක තුනක් ඇල්ලුවාම පුරාජේරු දොඩන විපක්ෂයක් බවට අද මේ විපක්ෂයේ කණ්ඩායම් පත් වෙලා තිබෙනවා, ඔවුන් මේවාට වගකියන්න ඕනෑ.

ඒ වාගේම මහා භාණ්ඩාගාරයේ සිදුවීම සම්බන්ධයෙන් මෙතැන දිගින් දිගටම කරුණු මතු වුණා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට හැකියාවක් නැහැ, ඔහු ආධුනිකයි කියන කාරණා ඔවුන් කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හැබැයි ඔයිට වඩා expertsලා මුදල් අමාත්‍යාංශයේ ලේකම්ලා හැටියට හිටපු කාලයේ සිදුවෙච්ච දේවල් මතකද දන්නේ නැහැ. ගිං-නිල්වලා ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 4,012ක් දීලා තිබෙනවා. නමුත් අද වෙනකම් ඒ වෙනුවෙන් එක පස් පිඩැල්ලක්වත් කපලා නැහැ. ඒ දුන්නේ ඔය expert යැයි කියන භාණ්ඩාගාර ලේකම්ලා සිටි කාලයේ. ඒ, ඇමෙරිකානු ඩොලර් මිලියන 4,012ක්, ඇමෙරිකානු ඩොලර් මිලියන 2.5ක් නොවෙයි. අපේ කාලයේ වුණත්, පෙර කාලයේ වුණත් ආයතනයක මොනවා හරි සිද්ධියක් වුණා නම් ඒ පිළිබඳව අපි විමර්ශනයක් කරනවා. මේ සම්බන්ධව අපි ගැඹුරු විමර්ශනයක් කරමින් තිබෙනවා. මේ සම්බන්ධව CID එකට පැමිණිලි ඇවිත් තිබෙනවා. 21දෙනෙකුගෙන් කටඋත්තර - statements - අරගෙන තිබෙනවා. මේ පිළිබඳව විමර්ශනයක් සිද්ධ වනවා. විමර්ශනය අවසානයේ තුන්වැනි පාර්ශ්වයකට මුදල් ලැබීම සම්බන්ධයෙන් වගකිව යුත්තන් ඉන්නවා නම්, ඔවුන්ව නීතිය ඉදිරියට ගෙන ඒම පිළිබඳව කිසිදු විවාදයක් නැහැ. මම කියන්නේ මේක මේ රටේ සිද්ධ වෙච්ච පළමුවැනි මූල්‍ය අහිමිවීම නොවෙයි කියන එකයි.

කිරි හරක් ගෙන්වීම සඳහා ඕස්ට්‍රේලියාවේ වෙලාඩ් සමාගමට හිටපු ජනාධිපති ලේකම්ගේ නෝනායි, හැරිසන් කියන හිටපු ඇමතිවරයායි ඇමෙරිකානු ඩොලර් මිලියන 11.3ක් දීලා තිබෙනවා. නමුත්, අද වෙනකම් එක කිරි හරකෙක්වත් ගෙනැත් නැහැ. ඉතින්, මේ වාගේ වංචා, දූෂණවලට, මූල්‍ය නාස්තිවලට, අවභාවිතයන්ට ඇති තරම් සම්බන්ධ වෙච්ච පිරිස් තමයි අපට දැන් ඇඟිල්ල දිගු කරන්නේ. මේක බරපතළ කාරණාවක්. ඒ හින්දා ඉදිරියේදී සමහර කාරණා සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්න අපි බලාපොරොත්තු වනවා.

අපි හැම වෙලාවේම කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදීව භාෂණයේ නිදහසටත්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසටත් ගරු කරනවා කියලා. හැබැයි, සමහර අය ව්‍යාජ ප්‍රවෘත්ති මවමින්, මිනිසුන්ට අපහාස කරමින් නීත්‍යානුකූලව කරන විමර්ශනවලට බාධා කරනවා. සමහර අය හැම දාම මාධ්‍ය සාකච්ඡා තියමින් විමර්ශනවලට බාධා පැමිණවීම කරනවා. අපි ඉදිරියේදී සමහර දේවල් පිළිබඳව අධිකරණයටත් කරුණු වාර්තා කරනවා. අපි කිසිදු ආකාරයකින් මේ අයට ඉඩ දෙන්නේ නැහැ, මේ විධියට හැසිරෙන්න. රටේ ජන බලය තිබෙන්නේ ජාතික ජන බලවේගයට. ඒ, මේ රටට යුක්තිය ගේන්න, සාධාරණත්වය ගේන්න, නීතිය ඉදිරියේ කවුරුත් සමානයි කියන අරමුණින් කටයුතු කරන්න. ඒ වෙනුවෙන් අපි හැම වෙලාවේම තීන්දු තීරණ ගන්නවා.

ඒ වාගේම විපක්ෂයේ සාධනීය කාරණා පිළිබඳව අපි ඕනෑම අවස්ථාවක මැදිහත් වන්න සූදානම්. ඒ නිසා තමයි ගරු තොණ්ඩමන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණාවට අපි ක්ෂණිකව මැදිහත් වන්නේ. ඒ පිළිබඳව අපි විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. මම දිවා විවේකය වෙලාවේ පොලිස්පතිවරයාට උපදෙස් දුන්නා, ඒ පිළිබඳව සම්පූර්ණ විමර්ශනයක් කරන්න කියලා. අපි සූදානම්, සාධනීය විවේචනයන්ට ඇහුම්කන් දෙන්න. ඒ වාගේම අඩුපාඩු, දුර්වලතා පිළිගන්නත් අපි සූදානම්. මේ වෙලාවේ මැද පෙරදිග කලාපයේ ඇති වී තිබෙන තත්ත්වය නිසා ජනතාව යම් යම් පීඩාවන්ට පත් වන අවස්ථා තිබෙනවා. ඒ වෙනුවෙන් මැදිහත් වන්නත් අපි සූදානම්. අපි රජයක් හැටියට ඒ හැම දෙයක් වෙනුවෙන්ම කටයුතු කරනවා. අපිට දුන් ජන වරම පිළිබඳව අපට හොඳ අවබෝධයක් තිබෙනවා.

මම හැමෝටම චෝදනා කරන්නේ නැහැ. විපක්ෂයේ සමහර පිරිස් බංකොලොත්භාවය වසා ගන්න කරන ප්‍රකාශ තුළින් අපි පසුබට වෙන්නේ නැහැ. ඕනෑම අභියෝගයකට මුහුණ දෙන්න අපි සූදානම්. නීතිය හරියට ක්‍රියාත්මක කරලා රටට යුක්තියත්, සාධාරණත්වයත් ගෙනෙන්න අපි කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවස්ථාව ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ அமைச்சர் அவர்களே, -

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
My name was mentioned.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, නම කිව්වාට ඒක චෝදනාවක් කිරීමක් නොවෙයි නේද? ඔබතුමා කියපු එකටයි උත්තර දුන්නේ. නම කියපු ගමන් නැඟිටින්න ගියොත්,-

**ගරු ජීවන් තොණ්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
கௌரவ அமைச்சர் அவர்களே, நான் ஒரேயொரு விஷயத்தை உங்களிடம் சொல்ல விரும்புகின்றேன். நான் உங்களிடம் சொல்ல விரும்புகின்ற விஷயம் என்னவென்றால்,

1½ வருஷ காலமாக மலையக மக்கள்மீது தாக்குதல் நடத்தும்போது அரசியல்வாதிகள் அங்கு வரவேண்டுமென்று மக்கள், குறிப்பாக இளைஞர்கள் கோரிக்கை முன்வைக்கிறார்கள். அதன் காரணமாக நாங்கள் போகிறோம்;. அங்கு நடைபெற்ற விடயங்களை இங்கு வந்து உங்களிடம் சொல்கிறோம். நீங்கள் என்ன பண்ணுகின்றீர்கள்? நீங்கள் IGPயிடம் பேசிவிட்டு, 'arrest பண்ணிவிட்டார்கள், bailஇல் விட்டுவிட்டார்கள்' என்கிறீர்கள். அது எங்களுக்கும் தெரியும்! நாங்கள் கேட்பது என்னவென்றால், இதற்குத் தீர்வு என்ன என்றுதான்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஆளுந் தரப்பில் இருக்கின்ற உறுப்பினர்கள் தூங்கிக்கொண்டு இருக்கிறார்கள் என்றுதான் நான் நினைக்கின்றேன். ஏனென்றால், யாரையும் இங்கே காணவில்லை. இது சம்பந்த மாக தலைமைத்துவத்திடம் யாரும் பேசவில்லை. 1½ வருடமாக நாங்கள் கேட்டுக்கொண்டு இருக்கின்றோம். கௌரவ அமைச்சர் அவர்களே, எனக்கு உங்கள்மீது கோபம் இல்லை.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, සිද්ධියක් වුණාම ඒ සිද්ධිය පිළිබඳව විමර්ශනයක් කරන එක ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ වාගේ අපි පසුපසට දමලා නැහැ. පාන්දර 1.30ට වෙච්ච සිද්ධියක් සම්බන්ධයෙන් උදෑසන වෙනකොට අදාළ පුද්ගලයන් අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ පුද්ගලයන් මේ වෙනකොට උසාවියට අරගෙන යනවාය කිව්වා. සිද්ධි දෙකක් ඊයේ රාත්‍රී කාලයේ සිදු වුණා. ඒ සිද්ධි දෙක සම්බන්ධයෙන් පළමුවෙන්ම කරන්නේ පැමිණිල්ල අනුව අදාළ පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමයි. ඊට පස්සේ විමර්ශනයක් කරලා, ඔවුන් අධිකරණයට ඉදිරිපත් කරනවා. අධිකරණයේ නියෝග අනුව අපට කටයුතු කරන්න වෙනවා. ඒ අනුව කටයුතු කරමින් තිබෙනවා. සිද්ධි කිහිපයක් දිගින් දිගටම සිදු වෙලා තිබෙනවා. එක සිද්ධියක් සිදු වෙලා තිබෙන්නේ සබරගමුව පළාතේ. තව සිද්ධියක් සිදු වෙලා තිබෙන්නේ නුවරඑළිය ප්‍රදේශයේ. ඒ ආකාරයට සිද්ධි කිහිපයක් වාර්තා වෙලා තිබෙනවා. මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඒ පිළිබඳව ඊයේ දිවා ආහාර විවේකය වෙලාවේදීත් කථා කළා. අපි ඒ පිළිබඳව අවධානය යොමු කරලා තිබෙනවා. දිගින් දිගටම එවැනි සිදුවීම් වෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමා කියන කාරණය පැහැදිලියි, ගරු ඇමතිතුමනි.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඒක දේශපාලනික කාරණයක් නොවෙයි. ඒ වාගේ සිද්ධි වෙනවා. සිද්ධි වළක්වා ගැනීමට කටයුතු කරන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අපි අදාළ විවාදයට යොමු වෙමු.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමා, ඒ පිළිබඳව මෙතැන විවාදයක් අවශ්‍ය වෙන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඒ පිළිබඳව විවාදයක් අවශ්‍ය වෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය සම්බන්ධයෙන් මෙතැන දැන් විවාද කරන්න වෙලාවක් නැහැ.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
සිද්ධියක් වාර්තා වුණාම ඒ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් අපි කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔය කාරණය සම්බන්ධයෙන් අද දවසේ සෑහෙන වෙලාවක් ගත කළා. දැන් ඒ ගැන කථා කිරීම අවසන් කරමු.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ඊට පස්සේ පොලීසිය,- *[බාධා කිරීමක්]* හොඳයි. මේ පිළිබඳව පොලීසිය සමඟ ඔබතුමන්ලාට සාකච්ඡාවක් ලබා දෙන්න අපි සූදානම්. මනෝ ගනේසන් මන්ත්‍රීතුමා ඒ වත්තට ගිහිල්ලා, මැදිහත් වෙලා සාකච්ඡාවක් කළාය කියලා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා මට කිව්වා. අපි කැමැතියි, පොලීසිය සම්බන්ධ වෙලා පාර්ලිමේන්තුවේදී හෝ පිටතදී, එහෙම නැත්නම් නුවරඑළිය ප්‍රදේශයේදී,- *[බාධා කිරීමක්]* ඔබතුමන්ලා කියන්නේ,- *[බාධා කිරීමක්]* මේ මහජන නියෝජිතයන් සියලුදෙනාම මෙතැන ඉන්නවා. ඔබතුමන්ලා විතරක් නොවෙයි, අපේ මන්ත්‍රීවරුත් මේ පිළිබඳව අපට කරුණු වාර්තා කළා. ඒ කරුණු පිළිබඳව අපි අවධානය යොමු කරලා තිබෙනවා. එහෙම නැතුව කිසි දෙයක් පැහැර හැරලා නැහැ. කවුරුවත් නීතියේ රැහැනට හසුකර ගන්නේ නැතුව අපි ඉඳලා නැහැ. ඊයේ රාත්‍රී වෙච්ච සිද්ධි දෙක සම්බන්ධයෙනුත් මේ වෙනකොට ක්‍රියාමාර්ග අරගෙනයි තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා කියන්නේ කොහොමද, මේකට අපි මැදිහත් වෙන්නේ නැහැ කියලා? නැවත නැවත සිදු වීම,- *[බාධා කිරීමක්]*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මට විනාඩියක් දෙන්න, උත්තර දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විවාදයකට යන්න බැහැ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
නැහැ, නැහැ. උත්තර දෙන්න මට විනාඩියක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තත්පර කීපයකින් අවසන් කරන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු ඇමතිතුමනි, මම දේශපාලනය නොවෙයි කරන්න යන්නේ. ඔබතුමා සද්භාවයෙන් කියපු එක මම පිළිගන්නවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. දැන් හැමදාම වාගේ මේ වාගේ සිදුවීම් වෙනවා; විටින් විට මේ වාගේ සිදුවීම් වෙනවා. එවැනි සිදුවීම් සිදු වන එක නවත්වන්න ඕනෑ නේ. මේකේ දේශපාලන කාරණාවක් තිබෙනවා නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි, අවසන් කරන්න.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ඒ නිසා කරුණාකරලා ඔබතුමා වතු ආයතන - RPC - ප්‍රධානීන් ඔක්කෝම කැඳවන්න. ඔබතුමා එන්න. IGP කැඳවන්න. අපිත් එන්නම්. අපි සාකච්ඡා කරමු. එච්චරයි. මේක විසඳන්න පුළුවන්. ඒකයි කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීමක්]*

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඇමතිතුමනි, ඔබතුමා විනාඩියක කාලයක් ගන්න.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
මෙතුමන්ලා කරන යෝජනාව පිළිබඳව ගැටලුවක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. වතු අධිකාරිවරුන් එකතු කරලා, පොලිස්පතිතුමාත් ගෙන්වලා සාකච්ඡාවකට යන්න අපට පුළුවන්. ඒ සඳහා මැදිහත් වෙන්න මට කිසිම බාධාවක් නැහැ. මොකද, මලෙයහම් ජනතාව වෙනුවෙන්, ඒ සියලුදෙනාගේ ආරක්ෂාව සහතික කරන්න අපට වගකීමක් තිබෙනවා. *[බාධා කිරීමක්]* ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. *[බාධා කිරීමක්]* පැහැර හැරීමක් සිද්ධ වෙලා නැහැ කියන කාරණය මම කියන්නේ. *[බාධා කිරීමක්]* එවැනි සිදුවීම් දිගින් දිගටම සිද්ධ වෙනවා නම් ඒ පිළිබඳව ක්‍රියාමාර්ග ගන්න අවශ්‍ය පියවර ගන්නම්. *[බාධා කිරීමක්]* ඒක මම දිගින් දිගටම කියනවා නේ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා. *[බාධා කිරීම්]*

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
නැහැ, නැහැ. *[බාධා කිරීමක්]* වෙන කාරණාවක් නැහැ. ඔබතුමන්ලා නේ ගෙනෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් ඉඳගන්න.

ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.24]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ආදිවාසී උරුමය, සංස්කෘතිය, අනන්‍යතාව ආරක්ෂා කරමින් රතුගල ආදිවාසී ප්‍රජාව වෙනුවෙන් දිගු කලක් කැප වී සුවිශේෂී සේවාවක් ඉටු කළ දානිගල මහබණ්ඩලාගේ සුදා වන්නිලඇත්තන්ගේ අභාවය පිළිබඳව අපේ සාතිශය සංවේගය ප්‍රථමයෙන්ම පළ කර සිටිනවා. ඔහුගේ අභාවය රතුගල ආදිවාසී ප්‍රජාවට පමණක් නොව සමස්ත ශ්‍රී ලංකාවටම පිරවිය නොහැකි හිඩැසක් බව අප විශ්වාස කරනවා. අපි එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ඇත්තවශයෙන්ම මහජන ආරක්ෂාව පිළිබඳව සාකච්ඡාවට භාජන වන මේ අවස්ථාවේදී ඇමතිතුමා කරුණු කාරණා ඉදිරිපත් කරනකොට මට එක වෙලාවක හිතුණා, ඔබතුමා මේ කරුණු ඉදිරිපත් කරන්නේ මහ පොළොවේ ඉඳගෙනද, එහෙම නැත්නම් කැටි වලාකුළු, කෙඳි වලාකුළුවල ඉඳගෙනද කියලා. "දිට්වා" ව්‍යසනයෙන් විපතට පත් වුණු අයට සහන ලබා දීම පිළිබඳව ඔබතුමා දැන් කරුණු කාරණා ඉදිරිපත් කළා. ඔබතුමා බොහොම ලස්සනට රුපියල් 25,000ක, රුපියල් 50,000ක සහනාධාර ප්‍රමාණයන් ගැන කිව්වා. මට කියන්න, ගෙදරක වකරමක් ගිය කී දෙනෙකුට රුපියල් ලක්ෂ 10 ගාණේ දීලා තිබෙනවාද කියලා. නිවාසයක් හානි වුණාම රුපියල් ලක්ෂ 50ක් ලබා දෙනවාය කිව්වා. මට කියන්න, ඒ ආකාරයට රුපියල් ලක්ෂ 50 ඒවා කීයක් දීලා තිබෙනවාද කියලා. ඉඩමයි, නිවසයි දෙකම හානි වෙලා නම් රුපියල් කෝටියක් දෙනවාය කිව්වා. එවැනි වන්දි මුදල් කී දෙනෙකුට දීලා තිබෙනවාද? ඇත්තවශයෙන්ම මෙන්න මේ දේවල් සම්බන්ධවත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මොරගහකන්දේ පාලමක් තවමත් කැඩිලා තිබෙන්නේ. ඒ වාගේ පාලම් රැසක් කැඩිලා තිබෙනවා. මේ වනතෙක් ඒවා ප්‍රතිසංස්කරණය වෙලා නැහැ. නුවරඑළිය දක්වා දුම්රිය සේවාව තවදුරටත් ස්ථාපනය කරන්නට තවම හැකියාවක් ලැබිලා නැහැ.

ඇත්තවශයෙන්ම මහජන ආරක්ෂාව ක්‍රියාත්මක වන කාලයේ ඔබතුමන්ලාට බැරි වෙලා තිබෙනවා, මහා භාණ්ඩාගාරය ආරක්ෂා කරන්න; මුදල් අමාත්‍යාංශය ආරක්ෂා කරන්න. ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ක් රටට අහිමි වුණා. ඔබතුමාම කියන්නකෝ, අපේ රටේ සයිබර් ආරක්ෂාව සම්බන්ධව තිබෙන වර්තමාන තත්ත්වය මොකක්ද කියලා. මම විශේෂයෙන්ම මෙන්න මේ කාරණය අවධාරණය කරන්න කැමැතියි. දැන් මේ සිද්ධිය වෙලා දවස් කීයක්ද? පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව රැස් වුණා; සාකච්ඡා කළා. හැබැයි, ඒ සාකච්ඡා එළියට දෙන එක

නතර කළා. එම කාරක සභාවේ සභාපතිවරයාට වුවමනාව තිබුණා, ඒ වීඩියෝ පට සජීවීව ලබා දෙන්න. නමුත්, රාජ්‍ය පාර්ශ්වයෙන් ඒවාට විරුද්ධ වුණා. ඇයි, ඒවා හංගන්නේ? මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට කැඳවලා ප්‍රශ්න කරනකොට දුන් උත්තර ටික ඇයි හංගාගෙන ඉන්නේ? මම ඉල්ලීමක් කරනවා, අදවත් ඒවා එළියට දමන්න කියලා. එදා ඒවා සජීවීව ලබා දුන්නේ නැහැ. රටේ ජනතාවගෙන් මේ කරුණු කාරණා හැංගුවා. ඒ විතරක් නොවෙයි, නලින්ද ජයතිස්ස ඇමතිතුමා කියනවා, අර ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 25ට අමතරව Department of Posts මඟින් තවත් ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 6ක් අහිමි වෙලා කියලා, මහජන ආරක්ෂක ඇමතිතුමනි. අපි අහන්න කැමැතියි, ඒ මුදල්වලට මොකක්ද වුණේ කියලා.

දිස්ත්‍රික්ක කිහිපයකටම අස්වැසුම සහනාධාරය ඩබල් ගෙවලා. ඉතින්, ඩබල් ගෙවන එක රජයේ ප්‍රතිපත්තිය නම් ඉතුරු දිස්ත්‍රික්ක 23ටත් ඩබල් ගෙවන්න. අපි සතුටුයි, ඒක ගැන. ඒ කාරණය ගැනත් අවධානය යොමු කරන්න.

මහජන ආරක්ෂක අමාත්‍යතුමා පොහොර පිළිබඳවත් ප්‍රකාශ කළා. ඔබතුමා අවංකවම කියන්න, අද යූරියා, TSP, MOP හිඟයක් තිබෙනවාද, නැද්ද කියලා. ඒවායේ බරපතළ හිඟයක් තිබෙනවා. ඒවාට විසඳුමක් නැහැ; ඒවාට උත්තර නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මම යෝජනා කරනවා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ ඒ වාර්තාව එළිදක්වන්න, ඒ වීඩියෝ පට එළිදක්වන්න කියලා. සභාපතිතුමාට වුවමනාව තිබෙනවා, ඒ ඔක්කෝම කරන්න.

හැබැයි ඉතින්, ඒ කාරක සභාවේ සාමාජිකත්වය තුළ බහුතර බලය තිබෙන්නේ ආණ්ඩුවට. කරුණාකරලා ඒ දේ කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. අඩුම ගාණේ මහජන ආරක්ෂක ඇමතිතුමා මැදිහත් වෙලා ඒ දේ ඉෂ්ට සිද්ධ කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, තව විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ ඔබතුමාට.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව වේලාව ගන්නවා.

ඒ වාගේම මම තව කාරණයක් අහන්න කැමැතියි. දැන් ආණ්ඩුව IMF එකත් එක්ක එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, CESS එකයි, PAL එකයි ඉවත් කරන්න. CESS එකයි, PAL එකයි ඉවත් කරනකොට HS කේත 2,600කට බලපානවා. මේකෙන් කෙළින්ම බඩට ගහන්නේ දේශීය කර්මාන්තකරුවාගේ, දේශීය නිෂ්පාදකයාගේ. රජයක් විධියට ඔබතුමන්ලා අපේ රටේ කර්මාන්තවලට මේ තරම් විරුද්ධද? ඔබතුමන්ලා IMF එකත් එක්ක එකඟ වෙලා තිබෙනවා, 2026-2029 කාලය තුළ සම්පූර්ණයෙන්ම CESS එකයි, PAL එකයි ඉවත් කරන්න. මේකද, ඔබතුමන්ලාගේ දේශාභිමානී ආණ්ඩුව? රටට මුල් තැන දෙන ආණ්ඩුව මේකද?

මහජන ආරක්ෂක ඇමතිතුමනි, අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා අපි අහපු ප්‍රශ්නවලට උත්තර සැපයුවා. හැබැයි, විපක්ෂ නායකවරයා විධියට මේ ප්‍රශ්නය නඟන්න හදනකොට බිමල් රත්නායක සභානායකවරයා මේ සභා ගර්භයේදී අසත්‍ය කිව්වා. එතුමා කිව්වා, සජිත් ප්‍රේමදාස වතු ප්‍රජාවගේ වේතන වැඩි කිරීම්වලට, දීමනා වැඩි කිරීම්වලට විරුද්ධයි කියලා. මම ගිහිල්ලා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ඒකට විරුද්ධව පැමිණිල්ලක් දැම්මා ලු. මේ මොන බොරු කථාද?

මම ඔබතුමාගෙන් මේ කාරණය අහන්න කැමැතියි. අපි මේ ගැන ප්‍රශ්න කරන්නේ මලෙයගම් ප්‍රජාවට විරුද්ධව පිට පිටම සිද්ධීන් සමුදායක් සිදු වූ නිසායි. ඒක පටන් ගත්තේ කහවත්තේ, නිලගම ප්‍රදේශයේ තිබෙන estate එකෙන්. ඊට පස්සේ මස්කෙළියේ, Mocha Estate එකේ සිදුවීම. ඊට පස්සේ නුවරඑළියේ, Delmar Estate එකේ සිදුවීම. මේක වතු ප්‍රජාව පීඩනයට ලක් කරන, හිංසනයට ලක් කරන මර්දන රැල්ලක්. රජය පැත්තෙන් පණිවුඩයක් දෙන්න ඕනෑ, මේ මර්දනකාරී කොටස්වලට; කොටින්ම කියනවා නම් පාලන අධිකාරියට; ඔය වතු අයිති සල්ලිකාරයන්ට. පොඩි මිනිහාව මෙහෙම තළන්න බැහැ, වතු ප්‍රජාව මෙහෙම හිංසනයට ලක් කරන්න බැහැ කියන ඒ පණිවුඩය දෙන්නට ඕනෑ. තවම ඒ පණිවුඩය ගිහිල්ලා නැහැ. නුවරඑළියට ගිහිල්ලා මැයි දින රැලි පවත්වලා බොරු කිව්වාට හරියන්නේ නැහැ. වතු ප්‍රජාවගේ ජීවිත ආරක්ෂා කරන්න. වතු ප්‍රජාව ශක්තිමත් කරවන්න. වතු ප්‍රජාවට ලබා දෙනවා කියපු රැකවරණය, ආරක්ෂාව ලබා දෙන්නට ඔබතුමන්ලා කටයුතු කරන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කථා කළා, පාස්පෝට් සිද්ධිය ගැන. ඔබතුමා කිව්වා, පාස්පෝට් සිද්ධිය තුළ එහෙම දෙයක් වෙලා නැහැ කියලා. මට අහන්න තිබෙන්නේ එක ප්‍රශ්නයයි. පෝලන්ත රජය යුරෝපා හවුලට පැමිණිලි කරනවා යැයි කියා තිබෙන ඒ ආරංචිය අද මාධ්‍ය ක්ෂේත්‍රයේ පළ වෙනවා. එහෙම නම් ඔබතුමා රාජ්‍ය තාන්ත්‍රිකව පෝලන්තයේ නියෝජිතවරුන් එක්ක සාකච්ඡා කරලා, මෙහෙම ප්‍රශ්නයක් තිබෙනවාද, නැද්ද කියලා පාර්ලිමේන්තුවේ කියන්න. පෝලන්ත රජයෙන් අහලා කියන්න, එහෙම ප්‍රශ්නයක් තිබෙනවාද, නැද්ද කියලා. තිබෙන ආරංචි මාර්ග අනුව, ඒ අය යුරෝපා හවුලට - European Union එකට - පැමිණිලි කරනවාය කියලා තිබෙනවා.

විශේෂයෙන්ම මම තව කාරණයක් කියන්න කැමැතියි. ඔබතුමා පොහොර ගැන කථා කළා. පොහොර සහනාධාරයක් ලැබෙනවා කියලා කිව්වා. මම ඔබතුමාට යෝජනාවක් කරනවා. විශේෂයෙන්ම අද වනකොට ගොවි ජනතාව නඟන මැසිවිල්ලක් තමයි, අඩු මිලකට කසක්ස්තානයෙන් පොහොර ගන්න තිබියදී ඕමානයෙන් වැඩි මිලට පොහොර ගන්නවා කියන එක. බලන්න, එක පැත්තකින් පොහොර නැහැ. තිබෙන පොහොර සොච්චමත් ගිනි ගණන්. ඒ මදිවාට අඩු මිලට කසක්ස්තානයෙන් ගන්න පුළුවන් පොහොර ටික, වැඩි මිලකට ඕමානයෙන් ගන්නවා. මේක යුක්ති සහගතද? මේක සාධාරණද? විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී මහජන ආරක්ෂක ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි, මහජන ආරක්ෂක අමාත්‍යවරයා විධියට ඔබතුමා මහා භාණ්ඩාගාරය ආරක්ෂා කරන්න, මහ බැංකුව ආරක්ෂා කරන්න, රටේ ජනතාවගේ බදු මුදල් ආරක්ෂා කරන්න කියලා.

විශේෂයෙන්ම මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය කේන්ද්‍රීයව රටට අහිමි වුණු අරමුදල් - ඩොලර් ලක්ෂ 25 - පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ තිබෙන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සිදුවුණු සාකච්ඡාව හංගාගෙන ඉන්නේ නැතුව වීඩියෝ පට ටික එළියට දමන්න කටයුතු කරන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා විනාඩි තුනක කාලයක් වැඩිපුර ලබා ගෙන තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ලජ්ජයි කියන්න. ඒ කාරක සභාවේ සිටින රාජ්‍ය පාර්ශ්වය නියෝජනය කරන සමහර මන්ත්‍රීවරු හර්ෂ ද සිල්වා සභාපතිවරයා කෙරෙහි සැක පළ කර තිබෙනවා. හර්ෂ ද සිල්වා මැතිතුමා පෙරළා කියා තිබෙනවා, "ඔබට හර්ෂ ද සිල්වා ගැන විශ්වාසයක් නැත්නම් ඡන්දයක් තියලා සභාපතිකමෙන් ඉවත් කරන්න" කියලා. ඒ තැනට ඒ සාකච්ඡාව ගිහිල්ලා තිබෙනවා. ඒකයි ඒ වීඩියෝ පට ටික එළියට දමන්නේ නැත්තේ. ඒ නිසා කරුණාකර මේ සිදු වුණු මූල්‍ය අපරාධ පිළිබඳව ඔබගේ අවධානය යොමු කර, රට වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් යුක්තිය ඉෂ්ට කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රුවන් සෙනරත් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.35]

**ගරු පී. රුවන් සෙනරත් මහතා (පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ருவன் செனரத் - மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிப் பிரதி அமைச்சர்)
(The Hon. P. Ruwan Senarath - Deputy Minister of Provincial Councils and Local Government)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ඉතාම වැදගත් විවාදයක් තිබෙනවා. විශේෂයෙන්ම 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව "දිට්වා" සුළි කුණාටුව සමඟ ඇති වූ ආපදා තත්ත්වය සැලකිල්ලට ගනිමින් මෙරට මහජන හදිසි අවස්ථා තත්ත්වයක් පැවැතීම හේතු කොටගෙන විශේෂයෙන් මහජන ආරක්ෂාව සහ රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම මෙන්ම මහජන ජීවිතවලට අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වා ගෙන යාම සඳහා මෙම හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ කිරීමට පියවර ගෙන තිබෙනවා. ඒ පිළිබඳව තමයි අද මේ විවාදය පැවැත්වෙන්නේ.

මට පෙර කථා කරපු විපක්ෂ නායකතුමා කරුණු කාරණා ගණනාවක් පැහැදිලි කළා. එතුමා අපෙන් විමසුවා, විශේෂයෙන්ම ගරු ආනන්ද විජේපාල ඇමතිතුමාගෙන් විමසුවා, මහ පොළොවේ ඉඳලා ද කථා කරන්නේ, කැටි වලාකුළුවල ඉඳලා ද කථා කරන්නේ කියලා. හැබැයි, අපටත් තිබෙනවා ප්‍රශ්නයක් අහන්න. 2015-2019 කාලයේ ඇතිවෙච්ච තත්ත්වයන්වලදී වන්දි ගෙවීම් හා නැවත පදිංචි කිරීම් සම්බන්ධව ගත්තාම එතුමන්ලා කොතැනද හිටියේ, අහසෙද හිටියේ කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ පිළිබඳවත් මතක් කරන අතරේ, අද මේ ගරු සභාවට ඉදිරිපත් කරන ලද, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ යෝජනාව සාමාන්‍ය පරිපාලන ක්‍රියාවලියක් පමණක් නොවෙයි, මේ රටේ ජාතික ආරක්ෂාව ඒ වාගේම මහජන සාමය සහ ජන ජීවිතයේ සුරක්ෂිතභාවය සහ රටේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා ගත යුතු වගකීම් සහගත තීරණයක් බව මම ඉතා පැහැදිලිව සඳහන් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අප ජීවත් වෙන්නේ අභියෝගවලින් තොර ලෝකයක නොවෙයි. එක පැත්තකින් ත්‍රස්තවාදය, අනෙක් පැත්තෙන් සංවිධානාත්මක අපරාධ, මත්ද්‍රව්‍ය ජාවාරම්, සයිබර් තර්ජන, ආර්ථික අර්බුද, ස්වාභාවික ආපදා යන මේ සියල්ල අද රාජ්‍යයක ස්ථාවරත්වයට සෘජුවම බලපාමින් තිබෙනවා. ඒ නිසාම හදිසි නීතිය ගැන අපි බලන්න ඕනෑ දේශපාලන කෝණයකින් නොවෙයි කියලායි මම විශ්වාස කරන්නේ. අනෙක් පැත්තෙන් ගත්තොත්, ගෝලීයව ඇති වෙන අසාමාන්‍ය තත්ත්වයකදී රජයකට පුරවැසියන් ආරක්ෂා කර ගැනීමට තිබෙන ව්‍යවස්ථානුකූල ආරක්ෂක යන්ත්‍රණයක් ගැන තමයි අද අපි මේ සාකච්ඡා කරමින් සිටින්නේ.

පසුගිය කාල සීමාවේ ඇති වුණු තත්ත්වයන් තුළ ජාතික ආරක්ෂාව වාගේම මහජන ආරක්ෂාව වෙනුවෙන් සහ මහජන අත්‍යවශ්‍යතාවක් විධියට සැලකිල්ලට ලක් කරලා අපට සිදු වුණා මේ හදිසි නීතිය දීර්ඝ කරන්න. ස්වාභාවික ආපදාවලදීත් හදිසි නීතිය සහ අත්‍යවශ්‍ය මහජන ආරක්ෂක බලතලවල වැදගත්කම අපි දැකලා තිබෙනවා පසුගිය කාල සීමාවේ ඇති වෙච්ච තත්ත්වයන් තුළ. අපි දන්නවා, විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුව සහ ඒ සමඟ ඇති වූ ගංවතුර හා ආපදා තත්ත්වයන්වලදී ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා රජය ඉක්මන් සහ විධිමත් මැදිහත් වීමක් කළ බව. ඒ තත්ත්වය ඇතුළේ ආරක්ෂක අංශ ක්ෂණිකව මැදිහත්වීම් සිදු කළා. ඒ වාගේම අවදානම් ප්‍රදේශවල ජනතාව ඉවත් කිරීමේ කටයුතු අපි සිදු කළා. අත්‍යවශ්‍ය සේවා සැපයුම් අඩාළ වෙන්න නොදී ඒ අත්‍යවශ්‍ය සේවා සැපයුම්, බෙදා හැරීම් ආදි සියල්ල සිදු කරන්නට අදාළ මැදිහත්වීම අපි කළා. අනික් පැත්තෙන්, ප්‍රවාහනය සහ සන්නිවේදන පද්ධතිය ආරක්ෂා කිරීමට අවශ්‍ය කරන ඒ විශේෂ මැදිහත්වීම අපි සිදු කළා. ඒ වාගේම තමයි මහජන ආරක්ෂාවට තර්ජනයක් වන ක්‍රියා පාලනය කිරීමට අවශ්‍ය කරන මැදිහත්වීම මේ තුළ සිදු කරන්න අපට පුළුවන්කම ලැබුණා. විශේෂයෙන්ම රජයට විශේෂ නීතිමය බලතල අවශ්‍ය වුණා, මේ සඳහා කටයුතු කරන්න. එදා ජනතාව බලාපොරොත්තු වුණේ දේශපාලන වාද විතරක් නොවෙයි. අපි දැක්කා, මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ කණ්ඩායම් පසුගිය දවස්වල නිරන්තරයෙන් කර තිබෙන දේ. මම බැලුවා පසුගිය කාල සීමාව ඇතුළේ මේ හැන්සාඩ් වාර්තාවල ඇතුළත් වාද විවාද සහ කර තිබෙන විවිධ ප්‍රකාශ, විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව ඇති වෙච්ච තත්ත්වය පිළිබඳව පාර්ලිමේන්තුව නියෝජනය කරන විපක්ෂයේ කණ්ඩායම් දක්වපු අදහස්. විශේෂයෙන් මහජන ආරක්ෂාව සම්බන්ධව වාගේම, අත්‍යවශ්‍ය සේවා යටතේ හදිසි නීතිය පැනවීම සහ එය දීර්ඝ කිරීමේදී ඒ සම්බන්ධයෙන් කළ කථාවලදී දිගින් දිගටම ඔවුන් කියන්න උත්සාහ කරපු අදහසක් තිබුණා. නමුත් අපි දන්නවා, මේ හදිසි නීතිය පැනවීම සහ හදිසි නීතිය දීර්ඝ කිරීම අත්‍යවශ්‍ය මහජන සේවා විධිමත් කිරීම සඳහා අතිශය වැදගත් කාරණාවක් බව. ඒ පිළිබඳව අපි සාකච්ඡා කළා. නමුත් අපි දන්නවා, අපට චෝදනා කළාට ඉතිහාසයේ විපක්ෂයේ සමහර අය මෙම නීති යොදා ගත්තේ මහ ජනතාව මර්දනයටයි කියන එක. ඒ අය මහ ජනතාවට එරෙහිව තමයි මේවා පාවිච්චි කළේ. හැබැයි, වර්තමාන නව පාලනය - අපේ ආණ්ඩුව, අපේ රජය - මේවා යොදා ගෙන තිබෙන්නේ මේ රටේ ජනතාවගේ ආරක්ෂාව, ජනතාවගේ සුරක්ෂිතභාවය ඇතුළු ප්‍රධාන කාරණා මූලික කරගෙනයි. ඒ නිසා අපි විශ්වාස කරනවා, රටේ ජනතාවගේ ආරක්ෂාව, රටේ ජනතාවගේ සාමය පවත්වාගෙන යන්න රජයට විශේෂ බලතල අවශ්‍යයි කියලා. එදා ජනතාව බලාපොරොත්තු වුණේ දේශපාලන වාද නොවෙයි. ශක්තිමත් රාජ්‍ය මැදිහත්වීමක් ජනතාව එදා බලාපොරොත්තු වුණා. අපි ඒ වගකීම ඉටු කරමින් තමයි එවැනි මැදිහත්වීමක් කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපට මතකයි, 2019 අප්‍රේල් මාසයේ වුණු සිද්ධිය. ඒ තුළින් අපට හරිම පැහැදිලියි, රජයක් සූදානම් නොවුණොත්, අහිමි වෙන්නේ අහිංසක ජන ජීවිතයි කියන එක. එවැනි සිදුවීම්වලදී වන්දි

ගෙවන්න වෙන්නේ අහිංසක ජනතාවගේ ජීවිතවලින්. ඒ නිසා අපි විශේෂයෙන්ම ආරක්ෂාව පිළිබඳව හැම විටම අවධානය යොමු කිරීම වැදගත් වෙනවා. ඒ අනුව, පසුව ප්‍රතිචාර දක්වන රාජ්‍යයක් හැටියට නොවෙයි, පෙර සූදානම් වන රාජ්‍යයක් විදියට තමයි අප මේ කටයුතු කරමින් සිටින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, විපක්ෂයේ සමහර අය මෙය දේශපාලන විවේචනයට ලක් කරන්න උත්සාහ කරමින් සිටිනවා. නමුත් අපි විශ්වාස කරනවා, රටේ ආරක්ෂාව කියන්නේ දේශපාලන සටන් පාඨයකටත් වඩා අතිශය වැදගත් දෙයක් කියලා. අපට වැදගත්, ප්‍රසිද්ධ වීම නොවෙයි. අපට වැදගත් වන්නේ ජන ජීවිතය සුරක්ෂිත කරමින්, බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යැමයි. ඒ නිසා තමයි අපි මේ පිළිබඳව අද මේ කරුණු කාරණා සාකච්ඡා කරමින් සිටින්නේ.

අපි දන්නවා, මැද පෙරදිග වත්මන් යුද තත්ත්වය හමුවේ විශේෂයෙන් ගෝලීය තෙල් සැපයුමට සහ ගෑස් සැපයුමට විශාල ලෙස බාධා එල්ල වී තිබෙන බව. එවන් තත්ත්වයක් ඇතුළේ විශේෂයෙන්ම ආනයනික ඉන්ධන මත යැපෙන අප රටට ඉදිරියේදීත් එවැනි තත්ත්වයක් නිර්මාණය වුණොත්, සැපයුම් හිඟයකින් තොරව පවත්වාගෙන යෑම සඳහා, අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම, ගෙන්වා ගැනීම ඇතුළු කටයුතු අඛණ්ඩව කිරීම සඳහා අපට මේ හදිසි තත්ත්වය දීර්ඝ කිරීමට අවශ්‍ය වෙලා තිබෙනවා. අපි දන්නවා, පසුගිය කාලයේ විවිධ අක්‍රමිකතා සහ විවිධ දේවල් සිදු වුණු බව. බොහෝ භාණ්ඩ සඟවා තබාගෙන හිටියා. බොහෝ දේවල් ජනතාව අපහසුතාවට පත් වන ආකාරයට අධික මිලට විකුණන්න සූදානම් වෙලා තිබුණා. එවැනි තත්ත්වයක් ඇතුළේ ඒවා පාලනය කරන්නට විශේෂයෙන් මේ හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ කරන්න අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා බිඳ වැටීම වැළැක්වීමටත්, අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමටත් මෙය ඉවහල් වෙනවා කියා අපි විශ්වාස කරනවා.

අනික් පැත්තෙන් ගත්තොත්, අප බලයට පත් වෙලා වසරකට වැඩි කාලයක් ගත වන තෙක්, විශේෂයෙන් "දිට්වා" ආපදාව වනතුරුම හදිසි නීතිය පැනවීමේ අවශ්‍යතාවක් අපට තිබුණේ නැහැ. හැබැයි, "දිට්වා" සුළි කුණාටුව නිසා අපේ රටේ කිලෝමීටර 1,700ක් පමණ වන දුම්රිය මාර්ග පද්ධතිය කිලෝමීටර 450 දක්වා ප්‍රමාණයකට අඩු වෙලා තිබුණා. ඒ නිසා කෙසේ හෝ ශ්‍රී ලංකා දුම්රිය සේවය, ත්‍රිවිධ හමුදාව, ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, ඒ වාගේම රටේ අනෙකුත් රාජ්‍ය යන්ත්‍රණය, සාමාන්‍ය ජනතාව ආදි සියලු දෙනා එකතු වෙලා, ඒවා යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය කරන මැදිහත්වීම ඉතා කඩිනමින් සිදු කරමින් තිබෙනවා. තවදුරටත් ඒවා ප්‍රතිසංවිධානය කරන්න, ප්‍රතිසංස්කරණය කරන්න අපට කාල සීමාවක් අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, මේ කටයුතු කරද්දී විවිධ ගැටලු, බාධා නිර්මාණය වෙමින් තිබෙන බව. අපි පසුගිය සතියේ කැබිනට් තීරණයක් ගත්තා, මහනුවර, නුවරඑළිය, බදුල්ල සහ කෑගල්ල දිස්ත්‍රික්කවල ජනතාව වෙනුවෙන් අන්තර්කාලීන නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන්න. ඒ සඳහා අමතර වියදමක් යනවා. හැබැයි, සල්ලිවලට වඩා මිනිසුන්ගේ ජන ජීවිතය තමයි අපට වැදගත් වෙන්නේ. ඒක නිසා අපි ඊට අදාළ කරන මැදිහත්වීම් කරමින් සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුවෙන් අරගෙන ආපු වතුර වේළිලා ගියාට, ඒ මිනිසුන්ගේ ජීවිතවල කඳුළු තවම වේළිලා ගිහිල්ලා නැහැ. ඒ මිනිසුන්ගේ ජීවිත යථාවත් කරන්න, විශේෂයෙන්ම ඒ පැරුණු සිත් සුවපත් කරන්න, අපේ ඇමතිවරු, මන්ත්‍රීවරු, ආරක්ෂක අංශ, නිලධාරින් හා සේවකයින් තවමත් විශාල වෙහෙසක් ගනිමින් සිටිනවා. ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලවලදී සිදු වුණු ආපදාවලට මුහුණ දුන්නු මිනිසුන්ටත් ඒ අදාළ කරන වන්දි ගෙවීම්, ගෙවල් ලබා දීම් ආදි කටයුතු කරමින් තිබෙන්නේ අපමයි.

හදිසි නීතිය යනු ස්ථිර පාලන ක්‍රමයක් නොවෙයි. එය රට තුළ හෝ ලෝකයේ ඇති වන අසාමාන්‍ය තත්ත්වයකදී රටේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීමට භාවිත කරන, තාවකාලික නීතිමය පසුබිමක් කියලායි අප විශ්වාස කරන්නේ. එමෙන්ම එය ක්‍රියාත්මක වන්නේ, වත්මන් පාර්ලිමේන්තුවේ අධීක්ෂණය, ඒ වාගේම අධිකරණ පරීක්ෂාව සහ ව්‍යවස්ථානුකූල සීමා යටතේ බවත් අවධාරණය කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතිහාසය අපට උගන්වා තිබෙනවා, අවශ්‍ය මොහොතේ අවශ්‍ය තීරණ නොගත් රාජ්‍යයන්ට, පසුව විශාල වන්දි ගෙවීම් කරන්න සිද්ධ වෙලා තිබෙන බව. ඒ නිසා අවසාන වශයෙන් මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ස්වාභාවික ආපදා අවස්ථාවලදී ජාතික ආරක්ෂාව, මහජන සාමය, මහජන ආරක්ෂාව සහ රටේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන්, මෙම හදිසි නීතිය දීර්ඝ කිරීමේ යෝජනාවට මේ ගරු සභාවේ සහාය ලබා දෙන ලෙස.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

මීළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

**ගරු (මහාචාර්ය) ක්‍රිශාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු තුෂාරි ජයසිංහ මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. (MRS.) THUSHARI JAYASINGHA took the Chair.*

[අ.භා. 1.46]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

මා අද මේ කාරණය ගැන කථා කරන්න හිටියේ නැහැ. නමුත් ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා දැන් මෙහි ඉන්න නිසා මේ ගැන කථා කරන්නයි මා බැලුවේ. ගරු ඇමතිතුමා කිව්වා, මේ e-passport එක සම්බන්ධව කිසිම තීරණයක් මේ වනතුරු අරගෙන නැහැ කියලා. ගරු ඇමතිතුමනි, මා ළඟ තිබෙනවා, ඔබතුමා 2026.04.03 දින "ඉලෙක්ට්‍රොනික විදේශ ගමන් බලපත්‍ර පුද්ගලාරෝපණය කිරීම සඳහා නිකුත් කිරීමේ පද්ධතිය සහ අදාළ Public Key Infrastructure - PKI - සංරචක ප්‍රසම්පාදනය කිරීම" කියන මාතෘකාව යටතේ ඉදිරිපත් කරපු අමාත්‍ය මණ්ඩල සන්දේශය. එහි අවසානයේ 3.3 යටතේ සඳහන්ව තිබෙනවා, "15%ක කාර්ය සාධන ඇපකරයක් ලබාගනිමින් Thales DIS Finland Oy/Just in Time Technologies ආයතනය සමඟ ගිවිසුම්ගත වීමේ ඉදිරි කටයුතු සිදු කිරීම" යනුවෙන්. ඒ වාගේම, 3.4 යටතේ සඳහන්ව තිබෙනවා, "ප්‍රසම්පාදන ලේඛනයේ 7 වෙනි පරිශිෂ්ටය (ගෙවීම් සඳහා නියමයන් සහ ක්‍රියා පටිපාටි) අනුව..." යනාදි වශයෙන්. කැබිනට් මණ්ඩලයෙන් අනුමැතිය ඉල්ලා තිබෙනවා, "ඉහත 3.2, 3.3 හා 3.4 යෝජනාවන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂා කරමි" කියලා. ගරු ආනන්ද විජේපාල ඇමතිතුමනි, ඔබතුමා අපේ මිත්‍රයා තමයි. නමුත්, ඔබතුමා එයට අත්සන් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඉහත කී යෝජනා සඳහා අනුමැතිය දෙන්න කියලා ඔබතුමා ඉල්ලා තිබෙනවා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔබතුමා මට පසුව කථා කරන්න. මම කියන්න කැමැතියි, මේවා,- *[බාධා කිරීමක්]* මගේ වේලාව අඩු කරන්න එපා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියෙව්වේ Cabinet Paper එකේ කොටසක්ද?

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඔව්, ඔව්.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)
Cabinet Paper එකේ ඊට ඉස්සෙල්ලා කොටසත් කියෙව්වා නම් හොඳයි. මේ PWPW සමාගම සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලය දුන්නු කාරණාව පිළිබඳව කැබිනට් මණ්ඩලයට කරුණු ඉදිරිපත් කරලා, ඒක ප්‍රසම්පාදන කොමිසමට යොමු කරන්න කැබිනට් මණ්ඩලය විසින් තීන්දුවක් අරගෙන තිබෙනවා. ප්‍රසම්පාදන කොමිසමේ තීන්දුව නැතුව ඔබතුමා කොහොමද කියන්නේ, ඒ ටෙන්ඩරය දීලා තිබෙනවා කියලා? Cabinet Paper එකක් ඉදිරිපත් කළ පමණින් ප්‍රසම්පාදන,- *[බාධා කිරීමක්]* මම දැන් කිව්වේ, ටෙන්ඩරය ප්‍රදානය කරලා නැහැ කියලා. ඒක තවමත් තිබෙන්නේ ප්‍රසම්පාදන කොමිසමේ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු ඇමතිතුමනි, මමත් ඔබතුමාට කලින් කැබිනට් මණ්ඩලයේ හිටපු මනුස්සයෙක්. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්න. එහෙම නම් යෝජනාව ඉදිරිපත් කරන්න ඕනෑ කොහොමද? ඔබතුමා කැබිනට් මණ්ඩලයෙන් කරන්න ඕනෑ ඉල්ලීම මොකක්ද? මේ සම්බන්ධව කොමිෂන් සභාවේ අවසරය ගන්න ඉල්ලන්න කියන එකයි. නමුත් ඔබතුමා මොකක්ද කරලා තිබෙන්නේ? ඔබතුමා ඒක ඉදිරිපත් කරලා අනුමැතිය ඉල්ලා තිබෙනවා, මේ සමාගමට දෙන්න කියලා. එච්චරයි කියලා තිබෙන්නේ. ඒක ගැන සාකච්ඡා කරලා, - *[බාධා කිරීමක්]*

සාමාන්‍යයෙන් කැබිනට් මණ්ඩලයේ ඉන්නකොට අපි කළේ, observations එවන එක. ඒ observations අනුව සාකච්ඡා කරලා කැබිනට් මණ්ඩලය තීන්දුවක් ගන්නවා, මොකක්ද කරන්නේ කියලා. හැබැයි, මෙතැනදී ඔබතුමා යෝජනා කරලා තිබෙනවා මේ සමාගමට දෙන්න කියලා. තව මොනවාද කථා කරන්න තිබෙන්නේ? ඊට පස්සේ කැබිනට් මණ්ඩලයෙන් ආව තීරණය මොකක්ද කියලා මම දන්නේ නැහැ. හැබැයි, ඔබතුමා ඉදිරිපත් කරලා තිබෙනවා, "මේකට ලබා දීම අනුමත කරනවා, ඒකට අනුමැතිය දෙන්න" කියලා. කැබිනට් මණ්ඩලය පසුව කියා තිබෙනවා, ඒකට අනුමැතිය දෙන්න බැහැ, - ඔබතුමා කියන විධියට - ඒක ප්‍රසම්පාදන මණ්ඩලයට යවන්න කියලා. ඒක වෙනම කාරණයක්. හැබැයි, ඇමතිවරයා විධියට ඔබතුමා මේ අනුමැතිය දීලා තමයි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා තිබෙන්නේ. විරාන් අලස් මහත්තයා හිටපු කාලයේ මේවා කරනකොට මේගොල්ලන් ඇවිත් පාර්ලිමේන්තුව දෙවනත් කළා. මේකට දුන්නාට, ඒ අය හොරු, කොල්ලකාරයෝ කියලා විශාල අර්බුදයක් මේ පාර්ලිමේන්තුවේත්, රටේත් ඇති වුණා. හැබැයි, අද මොකද කරලා තිබෙන්නේ? එහෙම කියපු කට්ටියටම අද ආපසු සද්ද නැතුව ඒ අයටම දුන්නා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ජර්මනිය, ප්‍රංශය, පෝලන්තය වැනි හැම රටක්ම European Union එකට මේ ගැන ලියලා තිබෙනවා. මේ, හොරකම් වහන්න ආපු ආණ්ඩුවක්. ලජ්ජයි! ඒකයි මම කිව්වේ. මෙතැනට ඇවිත් කියනවා, "අපි එහෙම එකක් ඉදිරිපත් කරලා නැහැ" කියලා. මේ තිබෙන්නේ ඒක තමයි. මම මේ කැබිනට් පත්‍රිකාව **සභාගත*** කරනවා. *[බාධා කිරීමක්]* ඔව්. GSP එකත් නැති වන තත්ත්වයක් මේ ඇති වෙලා තිබෙන්නේ.

අනෙක් කාරණය තමයි digital ID එක. ඉන්දියාව ලබා දුන් මුදල්වලින් දැන් digital ID එක හදන්න දෙන්න යනවා, Madras

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

Security Printers Private Limited එකට. මේ කාරණය ගැන අනුර දිසානායක මැතිතුමා 2023 අගොස්තු 11වන දා කළ ප්‍රකාශයක් මම කියවන්නම්. මේක Madras Security Printers Private Limited එකට ලබා දීම නිසා රජයට රුපියල් බිලියන 1.2ක් පාඩුවෙලා තිබෙනවාය කියනවා.

ඊට අමතරව මෙසේද කියා තිබෙනවා:

"එම ස්ටිකරය ව්‍යාජ ලෙස මුද්‍රණය කිරීමෙන් රජයට රුපියල් බිලියන 60ක -රුපියල් කෝටි 6,000ක- සුරා බදු අහිමි වීමෙන් පාඩු සිදු වූ බව පසු ගිය දෙසැම්බර් මාසයේදී අධිකරණ අමාත්‍යවරයාම මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළා."

තවදුරටත් එතුමා සඳහන් කර තිබෙනවා,

"කෙන්යාව, සුඩානය සහ ලයිබීරියාව ඇතුළු රටවල් ගණනාවක් සැක කටයුතු ගනුදෙනු හේතුවෙන් මැඩ්‍රාස් සිකියුරිටි ප්‍රින්ටර්ස් සමාගම අසාධු ලේඛනගත කර තිබෙනවා." යනුවෙන්.

ඒ සමාගමට තමයි දැන් දෙන්න හදන්නේත් digital ID එක මුද්‍රණය කිරීමේ කටයුත්ත. තමුන්නාන්සේලා මොනවාද මේ කරන්නේ? මේකටද මේ ආණ්ඩුව ගත්තේ? මේකටද හොරකම් නතර කරනවා, දූෂණය, කොල්ලය නතර කරනවා කියලා පටන් ගත්තේ? ලජ්ජාවේ බැහැ. ඒ නිසා digital ID කටයුත්ත, e-passport කටයුත්ත වාගේ හැම ක්‍රියාදාමයක්ම එහෙම පිටින්ම වංචා සහගත ලෙස තමයි ඉදිරියට යන්නේ කියන කාරණය සඳහන් කළ යුතුයි. ඒකයි අර රටවල් යුරෝපා සංගමයට පැමිණිලි කරලා තිබෙන්නේ. මේවා ගැන විදේශ කටයුතු අමාත්‍යාංශයට කථා කරලා තිබෙනවා.

පැහැදිලිවම අද මේ ඇමතිතුමා පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. මොකක්ද එතුමා කිව්වේ? එතුමා කිව්වා මෙහෙම එකක් ඉදිරිපත් කරලා නැහැ කියලා. මගේ අතේ තිබෙන මේ කැබිනට් පත්‍රිකාව මම සභාගත කළා. දැන් එතුමා කියනවා, "මම මේක ඉදිරිපත් කළාට, කැබිනට් මණ්ඩලය එහෙම කළේ නැහැ" කියලා. ඇමති නේ, මේ සියල්ල පිටුපස ඉන්නේ. ඇමති නේ, check කරන්න ඕනෑ, මේක හරියට සිද්ධ වුණාද කියලා. ඇමති නේ, මේ කැබිනට් පත්‍රිකාව දෙන්න කලින් මේ කොම්පැනි ටික හරියට ගියාද, ටෙන්ඩර් එක හරියට ගියාද, කාටද මේක දෙන්නේ කියලා තීරණය කරන්න ඕනෑ. එහෙම තීරණය කරලා නේ, කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්නේ. නමුත් එහෙම ඉදිරිපත් නොකර කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා, "මේකට අනුමැතිය දෙන්න" කියලා ඇමති ඉල්ලුවාට කැබිනට් මණ්ඩලයේ ඉන්නා සියලුදෙනාම මේකට කැමැති වෙන්නේ නැහැ. ඒ නිසා ඒගොල්ලන් සාකච්ඡා කරලා කියනවා, මේක ප්‍රසම්පාදන මණ්ඩලයට යොමු කරන්න කියලා. එච්චරයි. හැබැයි, ඇමතිවරයා මේ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා තිබෙනවා. තමුන්නාන්සේලා නඩු දමන්න. තමුන්නාන්සේලාගේ නේ, CID එක. අජිත් පෙරේරා මහත්තයාට නඩු දමනවා නම්, අපි බලාගන්නම් ඒක. මොකද, මේ විධියට ජරා වැඩ කරන්න ඉඩ තියන්න හොඳ නැහැ, තමුන්නාන්සේලාගේ අතින්. අපි හිතුවේ නැහැ මෙහෙම වෙයි කියලා. දැන් Madras Security Printers Private Limited එකට දෙන්න යනවා, අපේ digital ID එක මුද්‍රණය කරන එක. ඒ, එක කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාහුල් සමන්ත හෙට්ටිආරච්චි කියන්නේ මාධ්‍යවේදියෙක්. Airbus A330-200 ගනුදෙනුව සම්බන්ධයෙන් - මේ තව ගනුදෙනුවක්. හොරු ගණනාවක් මතු වෙලා තිබෙන්නේ. මම ඒවා ගැන කියන්නම්. මේ ආණ්ඩුවේ හොරකම්, කොල්ලකෑම්, දූෂණය කියන කාරණාවලට විරුද්ධව අද වෙනකොට කුරුණෑගල මහ නගර සභාවේ ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරයෙක් ඉල්ලා අස් වෙලා තිබෙනවා. මොකක්ද ඔහු කියන්නේ? "මෙම ආයතනය තුළ පවතින අවිධිමත් පාලනය, වංචාව, දූෂණය හා නාස්තිය අවම කර ගැනීමට අසමත් වීම නිසා මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමට තීරණය කළෙමි" යනුවෙන් ඔහු කියා තිබෙනවා. අනවසර වෙළෙඳාම්, අනවසර ඉදිකිරීම්, අවිධිමත් ඉන්ධන භාවිතය, අවිධිමත් අතිකාල ගෙවීම්, සේවයට වාර්තා කර පිටව යෑම, නගරය පිරිසිදුව පවත්වා ගෙන යෑමට නොහැකි වීම හා තවත් විවිධ හේතු නිසා නාගරික මන්ත්‍රී බී.ඩබ්ලිව්. ප්‍රේමචන්ද්‍ර මහත්මයා ඉල්ලා අස් වන බව ලිපියකින් දන්වා යවා තිබෙනවා. මේ ආණ්ඩුවේ පහළ සිටින මිනිස්සු දැන් ඉල්ලා අස්වෙන්න ලෑස්ති වෙලා ඉන්නේ. මොකද, මේ අය මේ කියපු වංචා, දූෂණ වෙනුවෙන් මොකක්වත් කරන්නේ නැහැ. ඒකම වංචා, දූෂණය බවට පත් වෙලා තිබෙනවා.

මම කියන්නම්, එයාර්බස් ගැන. මහ ලොකුවට මෙතැන ඇවිල්ලා අඬ අඬා කිව්වා, ඇස්වලට කඳුළු ආවා කියලා. මේ එයාර්බස් එක උඩ පියාසර කරනකොට මට රට ගැන විශාල කැක්කුමක් ආවා කිව්වා. අඬන්න හිතෙනවා කිව්වා. කඳුළු වගුර වගුර මෙතැනදී බිමල් රත්නායක මහත්මයා තමයි කිව්වේ. නමුත් මේ තොරතුරු දෙන්නේ නැතිව මාස 9ක් වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට අපි ස්තුතිවන්ත වෙනවා. ඒගොල්ලන් පිටු 32ක නියෝගයක් ලියලා තිබෙනවා. මාස 9ක් මේ තොරතුරු දෙන්නේ නැතිව හිටියා. මොකක්ද කියන්නේ? වාණිජ කාර්යය සඳහා මේක දෙන්න බැහැ කියලා තමයි කියලා තිබෙන්නේ. හැබැයි, අන්තිමට මොකද වෙලා තිබෙන්නේ? අවුරුදු 14ක් පරණ එයාර්බස් එකක් තමයි අරගෙන තිබෙන්නේ. අවුරුදු 14ක්! එතැනින් පස්සේ තව අවුරුදු 8කට ගිවිසුම් ගහනවා. ඩොලර් මිලියන 2යි දශම 6කට මේක ගන්නේ. එක මාසයකට ඇමෙරිකානු ඩොලර් 275,000ක් අපි මේකට ගෙවනවා. මෙතැනින් පස්සේ මොකද වෙන්නේ? සාමාන්‍යයෙන් අවුරුදු 15න් පස්සේ මේ යානයක් පියාසර කරන්න දෙන්නේ නැහැ. ඊට පස්සේ ඒගොල්ලන් ආපසු Civil Aviation Authority එකට දමන්න ඕනෑ, අවුරුදු 3ක approval එකකට. ඊළඟ අවුරුදු 8ත් එක්ක මේ එයාර්බස් එකට අවුරුදු 21ක්. අවුරුදු 21ක් පරණ එයාර්බස් එකක් තමයි තමුන්නාන්සේලා අරගෙන තිබෙන්නේ. ඒ කියන්නේ, අවුරුදු 14ක් පරණයි. අවුරුදු 8ක් බදු ගෙවලා. නමුත් මේක අපිට අයිති වෙන්නෙත් නැහැ. මේක ආපසු ඒ කොම්පැනියටම දෙන්න ඕනෑ. හැබැයි, එතකොට අපි ඩොලර් මිලියන **2.6ක්** ගෙවලා ඉවරයි.

ඒ විතරක් නොවෙයි, මේක ආපහු දෙනකොට අපි මොනවාද කරන්න තිබෙන්නේ? මාසයකට අපි 275,000 ගණනේ ගෙවන්න ඕනෑ. Engine overhaul එකක් ආවොත් අපි maintenance කර ගන්න ඕනෑ, avionics, hydraulic systems අපි බලන්න ඕනෑ. එච්චර පරණ එකක් අපට නඩත්තු කරන්න කරන්න බැහැ. Maintenance cost එකක් යනවා. Line maintenanceවලට යනවා. Metal fatigue එක, ඒ කියන්නේ, මේ යානයේ තිබෙන තහඩු අඩි 35,000ක් උඩට යනකොට ඔරොත්තු දෙනවාද? මේ වාගේ එයාර්බස් එකක් ගෙන ඒම නිසා තමයි අතිවිශාල දූෂණයක් සිද්ධ වෙලා තිබෙන්නේ කියලා අපි කියනවා. අපි ඇයි එහෙම කියන්නේ? තව අවුරුදු 8ක් ගියාම අවුරුදු 21ක් වනවා, මේ එයාර්බස් එකට. සාමාන්‍යයෙන් අවුරුදු 21ක් ගියාම එයාර්බස් පාවිච්චි කරන්නේ නැහැ, ලෝකයේ කිසිම රටක්. එහෙම නොවෙයි කියලා පුළුවන් නම් මට ඔප්පු කරලා පෙන්වන්න. මේවා දැන දැන තමයි කරන්නේ. ඇවිල්ලා කොහොමද ඒ ගැන කෑ ගැහුවේ? ඇවිල්ලා කථා කළේ, අනේ මට හරි සන්තෝෂයි, අපිටම කියලා එකක් තිබෙනවා කිව්වා. අපිටම කියලා එකක් නොවෙයි, මේ අරගෙන තිබෙන්නේ බදු ක්‍රමයට, on wet lease. මතක තබා ගන්න, තමුන්නාන්සේලාගේ දූෂණ දවස ගාණේ එකින් එක ඔප්පු වන බව.

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

අද උදේ කථානායකතුමා මට වෙලාව දුන්නේ නැහැ. මොකක්ද ප්‍රශ්නය? හර්ෂණ සූරියප්පෙරුම මේ රටේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්. හර්ෂණ සූරියප්පෙරුම මහත්මයා සම්බන්ධව බරපතළ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙනවා. දැන් මොකක්ද කථානායකතුමා කියන්නේ? එතුමා කියනවා, මේ කරුණු ප්‍රමාණවත් නැහැ ලු. කරුණු 19ක් මෙතැන අඩංගු වෙනවා. මම මේක සභාගත කරනවා, උදේ වරුවෙත් මම මේක සභාගත කළා. මේ ප්‍රශ්නය ගන්න ඕනෑ. මොකද, මෙකේ තිබෙනවා බරපතළම කාරණා දෙකක්. එකක් තමයි, හර්ෂණ සූරියප්පෙරුම මහත්මයා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විධියට පොරොන්දුවක් වෙලා තිබෙනවා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට ඔහු යටතේ ඉන්න නියෝජ්‍ය ලේකම්වරු තුන්දෙනාගෙන් එක්කෙනෙක් එවනවා කියලා. හැබැයි, කමිටු රැස්වීම් තුනකට එක්කෙනෙක්වත් ආවේ නැහැ, මුදල් අමාත්‍යාංශයෙන්. එතකොට කොහොමද මුදල් අමාත්‍යාංශය නැතිව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වැඩ කටයුතු කරන්නේ?

ඊළඟට මම කිව්වා, එතුමා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149 සහ 150 ව්‍යවස්ථා උල්ලංඝනය කර තිබෙනවා කියලා. මේ ඩොලර් මිලියන 2.5ක් ඕස්ට්‍රේලියානු සමාගමකට, නැත්නම් කොම්පැනියකට ගියා නම්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විධියට රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට - COPF එකට - ඒක වාර්තා කරන්න ඕනෑ. ඒක තමයි ඔහුගේ වගකීම. හැබැයි, ඔහු ඒක ඉෂ්ට කරන්නේ නැහැ. එය මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව බරපතළ ලෙස උල්ලංඝනය කිරීමක්. නමුත් කථානායක කියනවා, ඒක පෙනෙන්නේ නැහැලු. එතුමාට මදිලු ඒක. මේක පුදුම කාරණයක්. කරුණු 19ක් යටතේ මම මෙය ඉදිරිපත් කර තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මට තව තත්පර කිහිපයක් දෙන්න.

අනෙක් කාරණය මෙකයි. ඔහු CIT 100096534 අංක දරන 2010.09.13 දින නිකුත් කරන ලද සහතිකය අනුව ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔහුට කොහේ හරි රටක පුරවැසිභාවයක් තිබෙනකොට තමයි ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ගන්න ඕනෑ. ඔහු ඕස්ට්‍රේලියාවේ citizen කෙනෙක්. ඕස්ට්‍රේලියාවේ citizenship එක තිබේද්දී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ගන්නවා. හැබැයි, ඊළඟට පාර්ලිමේන්තුවට ආපු ගමන් ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය අත් හැරියා නම්, එතුමා කල්ලතෝනියෙක් - සමාවෙන්න එහෙම කිව්වාට - alien කෙනෙක්, රටක් නැති මිනිහෙක් වෙනවා. රටක් නැති මිනිහෙක් මේ රටේ නියෝජ්‍ය මුදල් ඇමති වෙලා තිබෙනවා, මාස ගණනාවක්. ඔහුට ලජ්ජාවක් තිබෙන්න ඕනෑ. එතුමා ඇවිල්ලා අපට ඒක කියන්න ඕනෑ. ඒක තමයි මම ප්‍රශ්නය ඉදිරිපත් කරලා කිව්වේ. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කමිටුව හමුවට ඇවිල්ලා එතුමා කියන්න ඕනෑ, "ඔව්, මම ඕස්ට්‍රේලියාවේ පුරවැසියකු විධියට හිටියා, මට ඒක තිබුණා, මට ඒක නැති වුණා" කියලා. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න. කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ඇත්තටම එතුමා ලංකාවේ එක්කෙනෙක්ද කියලා කියන්න ඕනෑ. පැහැදිලිවම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91වන ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් තමයි මේ ක්‍රියාදාමය යන්නේ. විදේශයක පුරවැසියෙක්ද කියලා සොයා ගන්න බැරි මිනිහෙක් ලංකාවේ පාර්ලිමේන්තුවට එනවා. ඉතින්, මේක වැදගත් නැද්ද? මේක කථානායකවරයාට පේන්නේ නැද්ද? ඇයි මේ වරප්‍රසාද ප්‍රශ්නයට ඉඩ දෙන්නේ නැත්තේ? මතක තියා ගන්න, මම මේක අන්තර් පාර්ලිමේන්තු සංගමයට - IPU එකට - වාර්තා කරනවා. කථානායකට අද පිට රටකට යන්න බැරි වෙලා තිබෙන්නේ මේ තත්ත්වයත් එක්ක, මේගොල්ලන් කරන වැඩ හින්දා. මේක විනාඩි කිහිපයක වැඩක්. කවුද මේකට ඉඩ දෙන්න එපා කිව්වේ, කවුද හිස හොළවලා කිව්වේ? ඊයේ මේ සභාවේ ඉන්නකොට මම දැක්කා බිමල් රත්නායක මහත්මයා හිස හොළවනවා. එහෙම කළ හැටියේ කථානායකතුමා මේකට ඉඩ දුන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව යටතේම මේ රටේ දූෂණ, වංචා සිද්ධ වීම ගැන කනගාටු වෙමින්, මගේ වචන කිහිපය අවසන් කරනවා.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අබුබකර් ආතම්බාවා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.59]

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின்கீழ் அவசரகால நிலையை நீடிக்கும் விவாதத்தில் கலந்து கொள்வதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

இந்த நாட்டில் 2025ஆம் ஆண்டு நவம்பர் மாதம் ஏற்பட்ட 'தித்வா' புயல் காரணமாக மத்திய மாகாணம் உட்பட பல்வேறு பிரதேசங்களும் பாதிக்கப்பட்டதை நாம் அறிவோம். இந்தப் புயல் காரணமாக கடும் மழை, பெருவெள்ளம் மற்றும் மண்சரிவு ஏற்பட்டன. இவற்றால் மத்திய மலை நாட்டுப் பிரதேசத்தில் அதிக பாதிப்புகள் ஏற்பட்டதை நாங்கள் பார்த்தோம். நூற்றுக்கணக்கானோர் உயிரிழந்ததுடன், ஆயிரத் துக்கும் மேற்பட்டோர் தங்களுடைய சொத்துக்களையும் வாழ்வாதாரத்தையும் வீடுவாசல்களையும் இழந்தார்கள். கண்டி, பதுளை, கேகாலை, நுவரெலியா போன்ற மாவட் டங்களில் 'தித்வா' புயலின் தாக்கம் அதிகமாக இருந்தது. இதனால் பாதிக்கப்பட்ட மக்கள் இடைத்தங்கல் முகாம்களில் தங்கவைக்கப்பட்டனர்.

பொலிஸார், இராணுவத்தினர், பொதுமக்கள் மீட்புப் பணிகளில் ஈடுபட்டதை நாங்கள் பார்த்தோம். இந்தியா உட்பட பல நாடுகள் எமது நாட்டுக்கு நிவாரணங்களை வழங்கி, உதவி செய்தன. கடந்த ஆட்சியாளர்களின் ஊழல் மற்றும் மோசடி காரணமாக வீழ்ச்சியடைந்த இலங்கையின் பொருளாதாரத்தை நாங்கள் கட்டியெழுப்பிக்கொண்டு வந்த சந்தர்ப்பத்தில்தான் எமது நாட்டில் 'தித்வா' புயல் தாண்டவமாடியது. எமது நாட்டின் பொருளாதாரத்தைக்

கட்டியெழுப்பியதை சர்வதேச சமூகம் பாராட்டி இருக்கின்றது. 'தித்வா' புயலால் எமது நாட்டுக்குப் பாரிய இழப்புகள் ஏற்படுமென உள்நாட்டு மற்றும் சர்வதேச செய்திகள் குறிப்பிட்டன.

கடந்த ஆட்சியாளர்களால் வங்குரோத்து நிலையை அடைந்திருந்த பொருளாதாரத்தைக் கட்டியெழுப்பியதன் பிரகாரம், 'தித்வா' புயலின் தாக்கத்தை எங்களால் ஈடுசெய்யக்கூடியதாக இருந்தது. சர்வதேசத்திலே ஏற்பட்ட, குறிப்பாக மத்திய கிழக்கிலே ஏற்பட்ட - அமெரிக்கா, ஈரான், இஸ்ரேல் நாடுகளுக்கிடையில் ஏற்பட்ட - யுத்தத்தின் காரணமாக எங்களுடைய நாட்டிலும் பாதிப்புகள் ஏற்பட்டன. குறிப்பாக, எரிபொருளுக்கான தட்டுப்பாடு மற்றும் எரிவாயுவுக்கான தட்டுப்பாடு நிலவிய சந்தர்ப்பத்தில், நாங்கள் நாட்டின் பொருளாதாரத்தைக் கட்டியெழுப்பியதன் பிரகாரம் எமது கையிருப்பிலிருந்த டொலரைப் பயன்படுத்தி மக்களுக்குத் தேவையான எரிபொருளையும் எரிவாயுவையும் சர்வதேசத்திலிருந்து இறக்குமதி செய்யக்கூடியதாக இருந்தது. என்றாலும், எமது நாட்டிலும் QR code systemஐ அறிமுகப் படுத்த வேண்டியிருந்தது.

இந்த நாட்டில் ஏற்பட்ட இழப்புகளை ஈடுசெய்கின்ற நிகழ்ச்சித்திட்டங்களை எமது அரசாங்கம் ஏற்பாடு செய்திருந்தது. குறிப்பாக, 'தித்வா' புயலின் காரணமாக ஏற்பட்ட அனர்த்தங்களுக்கான இழப்பீடுகளை வழங்கு வதற்காக அது தொடர்பான தகவல்களைப் பெற்றுக்கொண்டு பல்வேறு நிகழ்ச்சித்திட்டங்களை நாங்கள் செய்துகொண்டு இருக்கின்ற சந்தர்ப்பத்தில் உள்ளூராட்சி மன்றங்கள், திணைக்களங்களுடைய செயற்பாடுளும் பாதிக்கப்பட் டிருந்தன. வேலைப்பளுவுக்கு மத்தியில் இந்த இழப்பீடுகளைச் செலுத்துவதில் அரசாங்கம் மும்முரமாகச் செயற்பட்டதைப் பார்க்கக்கூடியதாக இருந்தது. குறிப்பாக, மீனவர்கள், விவசாயிகள், உற்பத்தியாளர்கள், தொழிலா ளர்கள் எனப் பல்வேறு தரப்பினரும் பாதிக்கப்பட்டிருந்தார்கள். இவர்களுக் கான இழப்பீடுகளை வழங்குவதற்கும் பாதுகாப்பு மையங்களி லிருந்த மற்றும் பாதிக்கப்பட்ட மாகாணங்களில் இருந்த மக்களைப் பாதுகாத்தல், அவர்களுக்கான புனர்நிர்மாணம், வீடுவாசல்களைக் கட்டிக்கொடுத்தல் போன்ற வற்றுக்கும் இந்த அரசாங்கம் கோடிக்கணக்கான நிதியை ஒதுக்கியிருந்தது.

அதுமாத்திரமல்ல, விவசாயிகளுடைய விவசாய நிலங்கள் பாதிப்படைந்தன; bunds உடைந்தன; விவசாய வீதிகள் பாதிக்கப்பட்டன. கட்டுமான ரீதியாக இவற்றையும் உயர்த்த வேண்டிய தேவை காணப்பட்டது. "Rebuilding Sri Lanka" போன்ற நிகழ்ச்சித்திட்டங்கள் மூலமாக நாட்டைக் கட்டியெழுப்புவதிலே இந்த அரசாங்கம் மிகவும் மும்முரமாக ஈடுபட்டுக்கொண்டு இருக்கின்ற இந்தச் சந்தர்ப்பத்தில் NBRI, பிரதேச செயலகங்கள், மாவட்ட செயலகங்களின் செயற்பாடு களில் காலதாமதம் ஏற்பட்டதையும் பார்க்கக் கூடியதாக இருந்தது. இவற்றையெல்லாம் சரியான முறையிலே சீர்செய்துகொண்டு எமது நாட்டை முன்கொண்டு செல்கின்ற விடயத்தில் எமது அரசாங்கம் முன்நிற்பதை நாங்கள் பார்க்கின்றோம்.

அதுமாத்திரமல்ல, நாட்டின் பொருளாதாரம் வீழ்ச்சி யடைந்த நிலையில்கூட, அதனைக் கட்டியெழுப்பிக்கொண்டு அபிவிருத்தியை மேற்கொள்கின்ற சந்தர்ப்பத்தை நாங்கள் பார்க்கின்றோம். 'தித்வா' புயல், அதேபோன்று சர்வதேசத்திலே ஏற்பட்ட குழப்பநிலை காரணமாக எமது பொருளாதாரம் பாதித்துவிடுமோ என்ற நிலைப்பாடு காணப்பட்டது. இருந்தாலும், அவற்றைத் தாங்கிக்கொண்டு சர்வதேசம் போற்றுகின்ற அளவுக்கு இந்த நாட்டை நாங்கள் மாற்றியிருப்பதை எமது மக்கள் சந்தோசப்படுகின்ற ஒரு விடயமாக நாங்கள் பார்க்கின்றோம். இவ்வாறான நிலைமை யிலும், எதிர்க்கட்சியில் இருக்கின்றவர்கள் காலையில் வந்தால் அவர்களுக்கு இருக்கின்ற உரிமைகளைப் பயன்படுத்தி, பொய்யை எழுதிக்கொண்டுவந்து இங்கு பல விடயங்களைச் சொல்கின்றார்கள். எம்மால் இந்த நாட்டை முன்கொண்டு செல்ல முடியாது என்று சொல்கிறார்கள்.

ஏனென்றால், அவர்களைப் போன்று நாங்களும் ஊழல், மோசடிகளில் ஈடுபடுகின்றவர்களாக இருக்கிறார்களா என்ற கேள்வியை அவர்களாகவே கேட்டுக்கொண்டு இருக்கின் றார்கள். மக்களுக்கு நம்பிக்கை மிகுந்த ஆட்சியாக இந்த ஆட்சியை நாங்கள் பார்க்கின்றோம். அந்த வகையில், இந்த நாட்டில் மக்கள் எதிர்பார்க்கின்ற விடயங்களை நிச்சயமாக எங்களால் எதிர்காலத்தில் செய்யக்கூடியதாக இருக்கும்.

இந்த நாட்டு மக்களுடைய கட்டுமானமாக இருக்கலாம், அவர்களுடைய அபிவிருத்தியாக இருக்கலாம் அல்லது அவர்களுடைய இழப்பீடுகள் வழங்குகின்ற விடயமாக இருக்கலாம். இவற்றில் எதைச் செய்வதாக இருந்தாலும், மக்கள் எதை எதிர்பார்க்கின்றார்களோ, எதை விரும்பு கின்றார்களோ, அதற்கேற்ற வகையிலே மக்களுடைய அபிவிருத்தியை நோக்கியதான செயற்பாடாக பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானத்தைப் பயன்படுத்துகின்ற விடயத்திலே நாங்கள் மிகவும் கவனமாக இருந்து, அவர்களுடைய தேவைகளை நிறைவேற்றுவதில் எமது இந்த அரசாங்கம் முனைப்புக் காட்டுவதை நாங்கள் பார்க்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අබූබකර් අතම්බාවා මහතා**
(மாண்புமிகு அபூபக்கர் ஆதம்பாவா)
(The Hon. Aboobucker Athambawa)
හොඳයි. මම ඉක්මණින් අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

எதிர்க்கட்சிகள் எங்கள்மீது பல்வேறு குற்றச்சாட்டுகளை முன்வைக்கின்றன. எனினும், எது உண்மை, எது பொய் என்று மக்களுக்குத் தெரியும்! எங்களுடைய அம்பாறை மாவட்டத்தில் 'தித்வா' புயலால் பலர் பாதிக்கப்பட்டார்கள். அவர்களுக்கான இழப்பீடுகளை அரசாங்கம் வழங்கி வருகின்றது. பண்ணை யாளர்களுக்கு ஏற்பட்ட இழப்பீடுகளாக இருக்கலாம், விவசாயிகளுக்கான இழப்பீடுகளாக இருக்கலாம், மீனவர் களுடைய வாழ்வாதாரம் மற்றும் அவர்களுக்கான இழப்பீடு களாக இருக்கலாம், அவை எல்லாவற்றையும நாங்கள் வழங்கிக்கொண்டு இருக்கின்றோம்.

அது மாத்திரமல்ல, கொழும்பையும் மட்டக்களப்பையும் இணைக்கின்ற புகையிரதப் பாதை, அதுபோன்று யாழ்ப் பாணத்தையும் மட்டக்களப்பையும் இணைக்கின்ற புகையிரதப் பாதை என்பன அண்மையில் ஏற்பட்ட 'தித்வா' புயலால் பாதிக்கப்பட்டபோதிலும், அவற்றையும் நாங்கள் இப்போது புனர்நிர்மாணம் செய்து இருக்கின்றோம். இந்த நாட்டில் இருக்கின்ற மக்கள் இந்த அரசாங்கத்தை விரும்பிக்கொண்டு இருக்கின்றார்கள்; அவர்கள் எதிர்பார்க்கின்ற விடயம் இந்த நாட்டிலே நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. குறிப்பாக,

[ගරු අබූබකර් අතම්බාවා මහතා]

இதுவரை 292 வீதிகள் பாதிக்கப்பட்டிருப்பதாக அடையாளம் காணப்பட்டிருக்கின்றன. அந்த வீதிகளில் 288 வீதிகள் போக்குவரத்துக்காகச் சீர்செய்யப்பட்டு மக்கள் பயன்பாட்டுக்காக வழங்கப்பட்டு இருக்கின்றன. அது மாத்திரமல்ல, எமக்குக் கிடைக்கப்பெற்ற அறிக்கைகளின்படி, பல்வேறு பிரதேசங்களில் விவசாயத் துறைசார்ந்த சுமார் 1,777 குளங்கள், 483 அணைக்கட்டுக்கள், 1,936 கால்வாய்கள், 328 வேளாண்மைச் சாலைகள் சேதம் அடைந்துள்ளதாக அறியக் கூடியதாக இருக்கின்றது. ஆகவே, இவற்றைப் படிப்படியாகச் சீரமைத்து மக்களுக்கு வழங்குகின்ற விடயத்திலே எங்களுடைய இந்த அரசாங்கம் முன்நிற்கின்றது. மேலும், 137,265 ஏக்கருக்கும் மேற்பட்ட நெற் காணிகள் சேதமடைந்திருந்தன. அதற்குரிய இழப்பீடுகளையும் படிப் படியாக இந்த அரசாங்கம் வழங்கிக்கொண்டிருப்பதை நாங்கள் பார்க்கிறோம். பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானத்தை நடைமுறைப்படுத்துவதன் மூலமாக, மக்கள் எதிர்பார்க்கின்ற அடைவு மட்டத்தை நாங்கள் எட்ட முடியுமென எதிர்பார்க்கின்றோம்.

அது மாத்திரமல்ல, தீவின் சாலை அமைப்பில் 22 பாலங்கள் சேதமடைந்துள்ளன. அவற்றில் 6 பாலங்கள் ஊவா மாகாணத்திலும், 4 பாலங்கள் வடமேல் மாகாணத்திலும், 12 பாலங்கள் மேல் மாகாணத்திலும், 2 பாலங்கள் மத்திய மாகாணத்திலும், 2 பாலங்கள் கிழக்கு மாகாணத்திலும் வடமத்திய மாகாணத்தில் ஒரு பாலமுமாகப் பல பாலங்கள் சேதமடைந்துள்ளன. இவற்றையும் இந்த அரசாங்கம் படிப்படியாக சீர்செய்து, மக்களுக்கு வழங்குகின்ற நடவடிக்கைகளில் ஈடுபடுவதை நாங்கள் பார்க்கக்கூடியதாக இருக்கின்றது. அந்த அடிப்படையிலே, மக்கள் எதிர்பார்க்கின்ற இலக்கை அடைவதற்கு மற்றும் அரசாங்கத்தின் செயற்பாடுகளுக்கு எதிர்க்கட்சியில் இருக்கின்றவர்களும் ஒத்துழைப்பு வழங்க வேண்டுமென இச்சந்தர்ப்பத்தில் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.11]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා.

අද දවසේ හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ කිරීමේ විවාදයක් පැවැත්වෙනවා. සාමාන්‍ය නීතිය යටතේ කළ හැකි දේවල්වත් නොකරන ඔබතුමන්ලා හදිසි නීතිය යටතේ, හදිසි තත්ත්වය යටතේ ඒ දේවල් කරයි කියලා අපට විශ්වාසයක් තියන්න බැහැ. ඒ නිසා අපි විශේෂයෙන්ම ඔබෙන් ඉල්ලීමක් කරනවා, අඩුම ගාණේ සාමාන්‍ය නීතිය යටතේ කළ හැකි කාරණාවත් කරන්න උත්සාහ ගන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මොහොතේ විශේෂයෙන් පවතින ගැටලුවක් පිළිබඳව සභාවේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. අපි දන්නවා, දුම්රිය කියන ප්‍රවාහන මාධ්‍යය මේ රටේ සාමාන්‍ය ජනතාව, මධ්‍යම පාන්තිකයන් ගමනාගමනය සඳහා පාවිච්චි කරන බව. අද දුම්රිය භාවිත කරන මේ රටේ ජනතාව විශාල ගැටලුවකට මුහුණ දී සිටිනවා. අපි දැක්කා, පසුගිය කාලයේ වූ දුම්රිය පීලි පැනීම් සහ යම් යම් කාර්මික දෝෂ නිසා ඔවුන් ගැටලු රාශියකට මුහුණ දෙන ආකාරය. ඒ හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවේ රියැදුරු මහත්වරුන් වැඩ තහනමට පවා ලක් කළා. නමුත් දැන් ඔවුන් නැවත සේවයේ පිහිටුවා තිබෙනවා. හැබැයි, අද දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරන රියැදුරු මහත්වරුන් වේග සීමා අනුව දුම්රිය ධාවනය කරන තැනට පත් වෙලා තිබෙනවා. අප සියලුදෙනාම දන්නවා, අතීතයේ ඉඳන් දුම්රිය දෙපාර්තමේන්තුවේ රියැදුරු මහත්වරුන් තමන්ගේ රැකියාව පසෙක තියලා, තමන්ගේ රැකියාව අවදානමේ තියලා නිවැරදි වෙලාවට මගීන් අවශ්‍ය ස්ථානවලට ගෙන යාමේ කටයුත්ත කළා කියන එක.

විශේෂයෙන්ම රජයේ සේවක මහත්ම මහත්මීන්, පෞද්ගලික අංශයේ සේවක මහත්ම මහත්මීන් ඇතුළු පාසල් දරුවන් පවා අද ගමනාගමන කටයුතු වෙනුවෙන් දුම්රිය භාවිත කරනවා. ඒ ජනතාවට අද නියමිත වෙලාවට තමන්ගේ ගමනාන්තයට යන්න බැරි වෙලා තිබෙනවා. අද සෑම දුම්රියක්ම පැය භාගයක්, විනාඩි හතළිස්පහක්, පැයක පමණ කාලයක් පමා වනවා. ඒ පමාව නිසා අද රජයේ සේවක මහත්ම මහත්මීන්ට රතු ඉර වදිනවා. ඒ රතු ඉර වදින්නේ ඔවුන්ගේ වරදක් නිසා නොවෙයි, දුම්රිය වෙලාවට ගමනාගමනය සිදු නොකරන නිසායි. ඒ නිසා අපි විශේෂයෙන් ඔබෙන් ඉල්ලීමක් කරනවා, ඒ පිළිබඳව දුම්රිය දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කරලා මේ මොහොතේ පවතින ඒ ගැටලුවට විසඳුමක් දෙන්න කියලා. එහෙම නැත්නම් දුම්රිය භාවිත කරන රජයේ සේවක මහත්ම මහත්මීන් ඇතුළු පෞද්ගලික අංශයේ සේවක මහත්ම මහත්මීන් සම්බන්ධයෙන් වෙනත් තීන්දුවක් අරගෙන ඔවුන්ට යම් ඉඩක් දෙන්න කටයුතු කරන්න කියන කාරණය මා ඉල්ලා සිටිනවා.

පසුගිය මැයි දින වේදිකාවේ සහ මේ දින කිහිපයේදී පාර්ලිමේන්තුවේදීත් ඔබතුමන්ලා නීතිය ගැන කථා කළා, නඩු ගැන කථා කළා, දින ගැන කථා කළා, තීන්දු ගැන කථා කළා, වැරදිකරුවන් ගැන කථා කළා සහ වංචා, දූෂණ ගැන කථා කළා. ඔබතුමන්ලාට ආණ්ඩුව දීලා තිබෙන්නේ ඒ වංචා, දූෂණ ගැන සොයන්න, ඒවා කරපු අයට දඬුවම් කරන්න. එහෙම නැතිව විපක්ෂයේ ඉන්නවා වාගේ ඒවා ගැන කථා කර කර ඉන්න නොවෙයි. ඒ නිසා ඔබ ඒ වගකීම ඉෂ්ට කරාවි කියලා මේ රටේ ජනතාව බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඔබට ජන වරම දුන්නේ ඒකට. හැබැයි ඔබ අද කථා පවත්වන එක පමණයි කරමින් සිටින්නේ. ඔබට එල්ල වන වංචා, දූෂණ පිළිබඳව ඔබට අවබෝධයක් නැහැ. ඔබ කථා කරන්නේ අනුන් පිළිබඳව, අනුන්ගේ ආණ්ඩු පිළිබඳව, පැවති ආණ්ඩු පිළිබඳව, ඒවායේ වැරදි අඩුපාඩු පිළිබඳව. හැබැයි ඔබ කවදාවත් ඔබෙන් සිදු වෙච්ච වැරදි අඩුපාඩුවක් පිළිගත්තේවත්, ඒ පිළිබඳව කථා කළේවත් නැහැ.

ඔබේ ආණ්ඩුවේ මේ අවුරුදු එකහමාර ඇතුළත ඔබට වංචා, දූෂණ පිළිබඳව වාගේම වැරදි ටෙන්ඩර් පටිපාටි අනුගමනය කිරීම පිළිබඳව එල්ල වූ චෝදනාවලින් කීපයක් මම ඉතා කෙටියෙන් කියන්න කැමැතියි. විශේෂයෙන් බාල ගල් අඟුරු ආනයනය නිසා සිදු වූ අලාභය රුපියල් බිලියන 19යි, මහා භාණ්ඩාගාරයේ මංකොල්ලය රුපියල් බිලියන 0.8යි, ඩීසල් බැරලයක් රුපියල් 286ක ඉහළ මිලකට මිලදී ගැනීමේ අලාභය, ඒ වාගේම NDB බැංකුවේ හොරකම රුපියල් කෝටි 1,320යි, ඒ වාගේම තැපැල් දෙපාර්තමේන්තුව විසින් වැරදි ගිණුමකට මුදල් යැවීම නිසා සිදු වූ අලාභය ඇමෙරිකානු ඩොලර් ලක්ෂ 6යි. ඒක ගැන විතරයි ඔබතුමන්ලාගේ ජනමාධ්‍ය ඇමතිවරයා මේ සභාවේදී මාධ්‍ය ප්‍රකාශකතුමා විදියට සඳහන් කළේ. ඒ වාගේම Sri Lanka

Insurance, බැඳුම්කර මගඩිය නිසා සිදු වූ අලාභය රුපියල් බිලියන 10යි. ඒ වාගේම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්කරුවන්ට දෙවරක් රුපියල් කෝටි 38ක් ගෙවා තිබෙනවා. ඊළඟට, අස්වැසුම දීමනාව දෙවරක් ගෙවීම නිසා රුපියල් බිලියන 5ක අලාභයක් සිදු වුණා. අවුරුද්දයි මාස 7ක් ඇතුළත ඩොලරයේ අගය රුපියල් 293 ඉඳන් රුපියල් 322ක් දක්වා රුපියල් 29කින් අවප්‍රමාණය වුණා. අවුරුද්දයි, මාස 7ක් ඇතුළත උද්ධමනය සෘණ 3 සිට ධන 5.4 දක්වා වැඩි වුණා. රටේ විදේශ ආයෝජන කිසිවක් නැහැ, රටේ නව ව්‍යාපෘති නැහැ. "දිට්වා" සුළි කුණාටුවෙන් විනාශ වෙච්ච මහා මාර්ග, දුම්රිය මාර්ග තවම අලුත්වැඩියා කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. "දිට්වා" සුළි කුණාටුවෙන් පසුව එකතු වුණු මුදල් නීත්‍යානුකූල නොවන ගිණුමකට දමා තිබෙනවා. ඒ වාගේම රටේ ටෙන්ඩර් පටිපාටිය දූෂිතයි කියලා පෝලන්තය යුරෝපීය සංගමයට පැමිණිලි කරන්න යනවා.

ඒ වාගේම අවුරුද්දයි, මාස 4කට එක කථානායකවරයෙක් ඉවත් කළා. අනෙක් කථානායකතුමාට චෝදනා එල්ල වනවා. ඒ වාගේම මේ වනකොට ඇමතිවරුන් 6දෙනෙකුට වංචා, දූෂණ චෝදනා එල්ල වනවා. ඒ වාගේම බලශක්ති ඇමතිවරයා ඉල්ලා අස් වෙලා තිබෙනවා, මැති ඇමතිවරුන්ගේ අසීමාන්තික වත්කම් හෙළි වෙලා තිබෙනවා. ඒ වාගේම භාණ්ඩාගාරයේ මුදල් මංකොල්ලයට අදාළව මිය ගිය මුදල් අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂවරයාගේ මරණයත් අභිරහසක්. ඒ විතරක් නොවෙයි. හිටපු කථානායකවරයාගේ සුදුසුකම් පිළිබඳවත් ගැටලුවක් මතු වුණා. ඒ වාගේම පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වුණු අයට රජයේ ඇමතිකම් සහ තනතුරු දීලා තිබෙනවා. ඊළඟට, පළාත් සභා මැතිවරණය කල් දමා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
සහල් මෝල් හිමියන්ගේ අවශ්‍යතා අනුව ඔබ කටයුතු කරමින් ඉන්නවා. ආණ්ඩුවට මුදල් ලබා දෙන ව්‍යාපාරිකයින් අයථා ලෙස ලබා ගත් රජයේ රක්ෂිත ඉඩම් තුළ පවත්වාගෙන යන ව්‍යාපාර සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොකිරීම වාගේම මහ බැංකු වංචාවේ ප්‍රධාන සැකකරුවන් නීතිය ඉදිරියට පැමිණවීමට නොහැකිවීම, රජයේ වාහන වෙන්දේසියේදී ඉතා අඩු තක්සේරුවකට දේශපාලන මිතුරන්ට ඒවා ලබා දීම, පොරොන්දු වූ පරිදි අමාත්‍යවරුන්ගේ නිල නිවාස සංචාරක ව්‍යාපෘති සඳහා යොදා නොගැනීම නිසා දිරාපත් වීමට ඉඩ හැරීම, ජනතා මුදල් අවභාවිත කරමින් එළදායිතාවෙන් තොරව රිළා-වඳුරු සංගණනය කිරීම, පාස්කු ප්‍රහාරයේ පරීක්ෂණ වාර්තා සැඟවීම, රතු ලේබල් සහිත කන්ටේනර් පෙට්ටි 323ක් මෙරටට අනීතික ලෙස ගෙන්වා වරායෙන් මුදා හැරීම කියන චෝදනාත් ඔබට එල්ල වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කරුණාකර කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
ඒ විතරක් නොවෙයි. රටේ මහජනතාවගේ ආරක්ෂාව අඳුරේ දැමීම, ත්‍රිවිධ හමුදාවට වියළි ආහාර ලබා දීමේ ටෙන්ඩරයෙන් සිදු වූ රුපියල් බිලියන 2ක වංචාව සම්බන්ධයෙන් ද කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් නොගැනීම, "දිට්වා" සුළි කුණාටුව නිසා සිදු වූ පාඩුව වෙනුවෙන් පාර්ලිමේන්තුවේ අනුමත කර වෙන් කළ මුදල් නිසි පරිදි ජනතාවට ලබා නොදීම, ඇමෙරිකානු බදු මුදල්වලින් නිදහස් වීමට රටේ ජාතික ස්වෛරීත්වය හා මෙරට ආර්ථිකයේ ස්වාධීනත්වයට හානිකර ගිවිසුම්වලට එළඹීම, සම්මුඛ පරීක්ෂණවලින් සමත් උප පොලිස් පරීක්ෂකවරුන් 100කට ඔවුන්ගේ රැකියා ලබා නොදීම, ඇමෙරිකාව සමඟ එකඟ වූ බදු කොන්දේසි රටට හෙළි නොකිරීම වැනි චෝදනා ද ඔබතුමන්ලාට එල්ල වනවා. ඒ වාගේම ඉන්දියාව සමඟ අත්සන් කළ ගිවිසුම් රටට හෙළි නොකිරීමත් තිබෙනවා. මේ ලේඛනයේ තවත් බොහෝ කරුණු තිබෙනවා. ඔබතුමිය මට නියමිත කාලය අවසන් යැයි පවසන නිසා මට මේ සියලු කාරණා පවසන්න නොහැකි වූ බවත් සිහිපත් කරමින් මා නිහඬ වනවා. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි එකහමාරක කාලයක් අමතරවත් ලබා දී තිබෙනවා.

මීළඟට, ගරු දේවානන්ද සුරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.18]

**ගරු දේවානන්ද සුරවීර මහතා**
(மாண்புமிகு தேவானந்த சுரவீர)
(The Hon. Dewananda Suraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මූලිකවම, අද දවසේ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි නීතිය ක්‍රියාත්මක කිරීම, නැත්නම් තවදුරටත් හදිසි නීතිය දීර්ඝ කර ගැනීම සම්බන්ධයෙන් පැවැත්වෙන පාර්ලිමේන්තු විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුට ප්‍රකාශ කරනවා.

වර්තමාන රජයට - විශේෂයෙන්ම ජනාධිපතිතුමාට - හදිසි නීතිය පනවන්න මූලිකම හේතුව බවට වුණේ අපේ රටට දැවැන්ත විනාශයක් සිදු කරනු ලැබූ "දිට්වා" සුළි කුණාටුව බව අපි කවුරුත් දන්නවා. ඒකේ ප්‍රතිඵලයක් විධියට තමයි අපේ රටේ වර්තමාන ජනාධිපතිතුමාට නොවැම්බර් මාසයේ 29වැනි දා හදිසි නීති තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන්නට සිදු වුණේ. විශේෂයෙන්ම මේ හදිසි නීති තත්ත්වය ප්‍රකාශයට පත් කිරීම තුළින් වර්තමාන ආණ්ඩුව බලාපොරොත්තු වෙන්නේ අපේ රටේ සිදු වූ මේ දැවැන්ත විනාශයත් එක්ක ඇති වුණු මේ ක්‍රියාවලිය හදිසි නීතිය පාවිච්චි කරලා මර්දනය කිරීමයි. මොකද, ඉතිහාසය තුළ මේ හදිසි නීතිය භාවිත කරපු කණ්ඩායම් අද දවසේ වර්තමාන ආණ්ඩුවට චෝදනා නඟනවා. නමුත්, පැහැදිලි වගකීමක් සහිතව රටේ ජනතාවට වග කියන දේශපාලන ව්‍යාපාරයක් විධියට රටේ ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කිරීම, වෘත්තීය සමිති ක්‍රියාමාර්ග තහනම් කිරීම, ජනතාව එක්රැස් වීම තහනම් කිරීම ඉලක්ක කරගෙන නොවෙයි වර්තමාන ආණ්ඩුව මේ හදිසි නීති තත්ත්වය ප්‍රකාශයට පත් කරලා තිබෙන්නේ.

"දිට්වා" සුළි කුණාටුව විසින් මේ රටට දරා ගන්න බැරි දැවැන්ත විනාශයක් සිදු කරනු ලැබුවා. ඒ නිසා "දිට්වා" සුළි කුණාටුව විසින් සිදු කරනු ලැබූ විනාශයෙන් නැවත ගොඩ ඒම සඳහා රටක් විධියට අපි බොහොම ඉක්මනින් ප්‍රතිසංස්කරණ කටයුතුවලට යා යුතුයි. අන්න ඒ ප්‍රතිසංස්කරණ කටයුතුවලට යාම ඉලක්ක කරගෙන තමයි ප්‍රසම්පාදන ක්‍රියාවලිය වේගවත් කිරීම මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේ එක අරමුණක් වන්නේ. ප්‍රසම්පාදන

[ගරු දේවානන්ද සුරවීර මහතා]

ක්‍රියාවලිය වේගවත් කිරීමට අපිට ඕනෑකම තිබෙනවා. ආපදාවෙන් විනාශ වුණු පාරවල්, පාලම් සහ බෝක්කු ඉතා වේගවත් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවක් අපිට තිබෙනවා. ඒ නිසා තවදුරටත් අපිට ඉදිරියට මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වේගවත්ව කරගෙන යාමට හදිසි නීතිය අත්‍යවශ්‍ය වෙනවා.

ඒ වාගේම ඉඩම් වෙන් කිරීමේ කටයුත්ත ගැනත් මම කථා කරන්න ඕනෑ. විශේෂයෙන්ම අවතැන් වූ ජනතාවට ඉතා ඉක්මනින් ඉඩම් ටික ලබා දීම සඳහා වර්තමාන ආණ්ඩුවට මේ හදිසි නීතිය මේ මොහොතේදී දීර්ඝ කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

ඒ වාගේම තමයි, අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යෑම. විදුලිය, ඉන්ධන, ගෑස්, සෞඛ්‍ය සහ ප්‍රවාහනය ආදී අත්‍යවශ්‍ය සේවා ටික ජනතාවට ලබා දීමේ වගකීම වර්තමාන ආණ්ඩුවට පැවරී තිබෙනවා. ඒ නිසා අපිට ඕනෑකම තිබෙනවා, හදිසි නීතිය පනවා ඒ අත්‍යවශ්‍ය සේවාවන් ටික ජනතාවට ලබා දීමට. මෙන්න මේ කරුණු කාරණා පදනම් කරගෙන මේ ක්‍රියාවලියේදී බොහොම කාර්යක්ෂමව වැඩ කිරීමට රාජ්‍ය නිලධාරින්ට ආරක්ෂාව ලබා දීම වැදගත් වනවා. එම නිසා ඒ වෙනුවෙන් නීතිමය රාමුවක් හදා දීමට ඕනෑකම තිබෙනවා. පොදුවේ ඒ කරුණු කාරණා පදනම් කරගෙන තමයි මේ මොහොතේදී අපට මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කර ගැනීමේ වුවමනාව තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටට ආපු "දිට්වා" සුළි කුණාටුවත් එක්ක රජයක් විදියට අපි ඉතා ඉක්මනින් ජන ජීවිත නඟාසිටුවීම සඳහා ඔවුන්ට සහන ලබා දෙන්න කටයුතු කළා. "දිට්වා" සුළි කුණාටුවක් ආවාද, නැද්ද කියන මට්ටමට අපිට ඒ කටයුතු ක්‍රියාත්මක කර ගන්න පුළුවන්කම ලැබුණේ මේ හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කරපු නිසායි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අද විපක්ෂයේ මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුව භාවිත කරමින් රටේ ජනතාව නොමඟ යවන්නට මොන තරම් උත්සාහ කළත් ඒගොල්ලන් මේ හදිසි නීතිය පාවිච්චි කළේ මොකටද? ඉතිහාසය අපිට මතකයි. ඒගොල්ලන් මේ හදිසි නීතිය පාවිච්චි කළේ ඇත්තටම අපේ රටේ ජනතාව මර්දනයට සහ පීඩනයට ලක් කරන්නයි. වර්තමාන ආණ්ඩුව රටේ ජනතාව මර්දනය කිරීමට, එහෙම නැත්නම් වෘත්තීය සමිති මර්දනය කිරීමට හදිසි නීතිය පාවිච්චි කරන්නේ නැහැ.

අපට මතකයි, මේගොල්ලන් රොෂේන් චානකව මරා දානවා. ඒ වාගේම වතුර ඉල්ලපු ජනතාවට වෙඩි තැබුවා, හදිසි නීතිය පාවිච්චි කරලා. හැබැයි, දැන් අපි මාස තුනක් එක දිගට මේ හදිසි නීතිය දීර්ඝ කර ගනිමින් යනවා. නමුත්, ප්‍රජාතන්ත්‍රවාදයට අපි හානි කරලා නැහැ. මහජන රැස්වීම්වලට අපි හානි කරලා නැහැ. උද්ඝෝෂණවලට අපි බාධා කරලා නැහැ. අපේ සමස්ත අදහසම ගැබ් වෙලා තිබෙන්නේ "දිට්වා" සුළි කුණාටුවත් එක්ක කඩා වැටුණු අපේ රට යථා තත්ත්වයට පත් කර මේ රටේ සියලු දේවල් ප්‍රතිසංස්කරණය කරන්නයි. ඒ ප්‍රතිසංස්කරණ ඉලක්ක කරගෙන තමයි මේ හදිසි නීති තත්ත්වය විශේෂයෙන්ම අපි දීර්ඝ කිරීමට බලාපොරොත්තු වෙන්නේ. ඇත්තටම මේ රටේ ප්‍රතිසංස්කරණ කටයුතු ශීඝ්‍ර ලෙස ඉස්සරහට ගෙන යන්න කල්පනා කරනකොට, ඒකට අදාළ කරන හදිසි නීති තත්ත්වය දීර්ඝ කර ගන්නට සංවාද, සාකච්ඡා පවත්වාගෙන යනකොට අද විපක්ෂය මොනවාද කියන්නේ?

මේක උත්තරීතර පාර්ලිමේන්තුව කියලා තමයි අපි අර්ථ කථනය කරන්නේ. අපේ රට විනාශයක් කරා ගෙන ගිය විනාශකාරී කණ්ඩායම තමයි අද උත්තරීතර පාර්ලිමේන්තුව තුළ විපක්ෂයේ ඉන්නේ. මේ රටේ කාලාන්තරයක් තිස්සේ බලය හොබවපු, ඇමතිවරු, මන්ත්‍රීවරු හැටියට මේ රට පාලනය කරපු ඒ විනාශකාරී කණ්ඩායම අද ඉන්නේ විපක්ෂයේ. ඔවුන් විපක්ෂයේ ඉඳගෙන අද කරන්නේත් ඒ විනාශකාරී ක්‍රියාවලියම තමයි. ඇයි ඒ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇයි මේ විවේචන? විවේචනවලට හය දේශපාලන ව්‍යාපාරයක් නොවෙයි, අපි. අපි හොඳ විවේචන හොඳ ලෙස ගන්නා දේශපාලන ව්‍යාපාරයක්. හැබැයි, විපක්ෂය අද වෙඩි කාපු ඌරන් මට්ටමට පත් වෙලා ඉන්නේ. ඔවුන් වෙඩි කාලා වාගේ ඉන්නේ.

මීට පෙර කථා කරපු මන්ත්‍රීතුමා මොකක්දෝ ලැයිස්තුවක් කියවා ගෙන, කියවා ගෙන ගියා. එතුමා ඒ කිව්වේ රාජපක්ෂ පාලන කාලයේ කරපු විනාශයන් ටික. මේ රට විනාශ කළේ, ණය අරගෙන බිලියන ගණනක, ට්‍රිලියන ගණනක වත්කම් නැති කළේ කවුද? රාජපක්ෂලා. මේ, රාජපක්ෂලා නන්නත්තාර කරපු රට; රාජපක්ෂලා විනාශ කරපු රට. රාජපක්ෂලා හදිසි නීතිය භාවිත කරමින් මේ රටේ හාමුදුරුවන් ඇතුළු සමස්ත ජනතාවම විනාශ කළා. එලෙස මේ රට විනාශ කරපු කණ්ඩායම් සමාජයේ යහපතට එරෙහිව කටයුතු කරනවා. අපි තුන්වැනි වතාවට තමයි මේ හදිසි නීතිය දීර්ඝ කරන්නේ. ඇයි, ඒ? මේ රට ශීඝ්‍ර ලෙස සංවර්ධනය කරා ගෙන යන්න ඕනෑ නිසා. සංචාරක ව්‍යාපාරය ඉලක්ක කර ගත්ත, ආයෝජකයන් ඉලක්ක කර ගත්ත, ඒ වාගේම අපේ රටේ ආපදාවට පත් වෙච්ච ජනතාවට ඉතාම ඉක්මනින් සහන ලබා දීම ඉලක්ක කර ගත්ත වැඩ පිළිවෙළකට අපි යා යුතුව තිබෙනවා. ඒ නිසා අපි මේ හදිසි නීතිය භාවිත කරන්නේ මේ රට සංවර්ධනය කිරීමේ දිසාවට අරගෙන යෑමටයි.

අද දවසේ විපක්ෂය මේ සභාවේ ඉඳගෙන කිව්වේ මොනවාද? විපක්ෂයට පුළුවන්, පාර්ලිමේන්තුව ඇතුළේ ඉඳගෙන රටේ ජනතාවට news මවන්න විතරයි. රටේ ජනතාව වෙනුවෙන් ඒගොල්ලන්ට ඊට වඩා එහා දෙයක් කරන්න පුළුවන්කමක් නැහැ. එම නිසා වර්තමාන ආණ්ඩුවට බොහොම පැහැදිලි, ශ්‍රේෂ්ඨ අරමුණක් කරා යන ගමනක් තිබෙනවා. ඒ ගමන තුළ මේ විපක්ෂය බරපතළ ලෙස අසරණ වෙලා ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ අසරණ වීම කොතෙක්ද කිව්වොත්, පාර්ලිමේන්තුවේ කථා කරන්න ඕනෑ මොනවාද, කථා නොකළ යුත්තේ මොනවාද කියන එකවත් තේරුම් ගන්න බැරි දෙකොන පටලවා ගත්ත තැනකට තමයි අද විපක්ෂය පත් වෙලා තිබෙන්නේ. එම නිසා මම අවසාන වශයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට කියනවා, ඔබතුමන්ලා ඔය යන ගමන වැරැදියි, ඔබට නිවැරදි වෙන්න ඕනෑ නම්, ඔබට මීට එහා ගමනක් යා යුතු නම්, සාධනීය විවේචන ගෙනෙන්න කියලා. නිකම් දවසින්, දෙකෙන් මැකී යන, කිසිම හරයක් නැති, රටේ ජනතාව අන්දන විවේචන ගෙනෙන්නේ නැතුව සැබෑ විවේචන ගෙනෙන්න. ඒ විවේචන ඇතුළේ තමයි ඔබට ව්‍යාපාරයක් විදියට ඉස්සරහට යන්න පුළුවන් වන්නේ. එම නිසා අපි කියනවා, මොන තත්ත්වයන් තුළ හෝ අපි මේ රට ගොඩනඟනවාය කියන එක. ඒ සඳහා අපි යන ගමන විපක්ෂයේ මේ කෑ කෝ ගැසීම්වලින් නවත්වන්න බැහැ.

අද දවසේ මෙම විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Hon. Faiszer Musthapha. You have six minutes.

[අ.භා. 2.29]

**ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி பைஸர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha, PC)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආණ්ඩුවේ මන්ත්‍රීවරු දිගින් දිගටම කිව්වා, අපි හදිසි නීතිය පාවිච්චි කරලා ජනතාව මර්දනය කරන්නේ නැහැ කියලා. හදිසි නීතිය කියන්නේ මොකක්ද කියලා මම තමුන්නාන්සේලාට කියන්න කැමතියි. සාමාන්‍ය නීතිය අත්හිටුවලා හදිසි නීති රෙගුලාසි අනුව කටයුතු කිරීමේ හැකියාව හදිසි නීතිය යටතේ තිබෙනවා. ජනතාව මර්දනය කරන්නේ නැහැ කියලා තමුන්නාන්සේලා කියනවා නම් අපි ඒක පිළිගන්නම්. හැබැයි, හදිසි නීතිය යටතේ ජනතාව මර්දනය කිරීමේ වාතාවරණය තිබෙනවා. ජනතාවට මර්දනය කිරීමේ බිය තිබෙනවා.

සුළි කුණාටුවක් ආවාම හදිසි නීතිය අවශ්‍යද? ඒ වාගේම, තමුන්නාන්සේලාට මේ සභාවට කියන්න පුළුවන්ද, "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ විනාශය අඩු කරන්න හෝ rehabilitate කරන්න මේ හදිසි නීතිය තුළින් සාර්ථක වෙලා තිබෙන්නේ කොහොමද කියලා? මම තමුන්නාන්සේලාට කියනවා, රාජ්‍ය යන්ත්‍රණය හරියට ක්‍රියාත්මක වෙනවා නම් හදිසි නීතියක් අවශ්‍ය නැහැ කියන එක. එම නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, හදිසි නීතිය ගෙනෙන එක පිළිබඳව නැවත සලකා බලන්න කියලා. ඒකට හේතුව මේකයි. මේ රටේ සාමාන්‍ය නීතියක් තිබෙනවා; නීති පද්ධතියක් තිබෙනවා; අධිකරණ ක්ෂේත්‍රයක් තිබෙනවා; රාජ්‍ය නිලධාරින් ඉන්නවා. එම නිසා මා විශ්වාස කරනවා, "දිට්වා" සුළි කුණාටුව තුළින් ඇති වූ විනාශය ප්‍රතිසංස්කරණය කරගෙන යෑමට හදිසි නීතියක් අවශ්‍ය නැහැ කියලා.

Hon. Presiding Member, I would like to bring to your notice another very important issue. As much as there had been destruction due to that national disaster, there has also been a very dangerous phenomenon. We have to talk about economic security or economic stability. In recent times, we heard that US Dollars 2.5 billion in the Treasury had gone missing and suddenly, money from banks had gone missing. So, I respectfully urge the Government to take this very seriously since economic security is important as much as national security. Also, various overpayments had been made by some government institutions. This is a very dangerous phenomenon, because when foreigners want to come and invest in Sri Lanka, the first thing they would look at is economic stability. If our Treasury loses US Dollars 2.5 billion, if our banks cannot maintain their deposits and if there is a run on in the banks, there is going to be a major calamity. So, economic security or economic stability is important as much as national security. So, therefore, I respectfully urge this Government to take serious note of and show concern for that. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක දේශපාලන කථාවක් නොවෙයි. අපේ ආර්ථිකය ආරක්ෂා කිරීමට අපි පියවර ගන්න ඕනෑ. ළඟදී වුණු සිදුවීම් දෙස බලනකොට, අපේ ආර්ථිකය is in a grave danger. Today, if I deposit money in a bank and if I am not sure that that money would be safe there or if the money in the Treasury, which is supposed to be the most secure place for government money, would not be secure, there is a serious issue.

ඒ වාගේම, මේ දූෂණ, වංචාවලට වගකිව යුතු උදවිය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුයි; we should hold them responsible. They may not be fraudsters, but if they are holding high office, they have to take responsibility. In Japan, if a train gets late for a minute, the Minister concerned resigns. So, therefore, I respectfully urge this Government to deal with whoever officials who are responsible for these issues. They may not be corrupt, but once they are appointed and they take over responsibility, they are obliged to keep those institutions secure. Therefore, I humbly beg the government to look into these. This is not politics. We are in a grave danger. We cannot bring in foreign direct investments to this country, if we continue like this. So, I respectfully urge the Government to be very proactive. We talk about digitalization. However, if banks are not able to protect themselves in fund transfers and if money is being sent out of banks to fraudsters, there is a serious issue. If government departments are making overpayments, that is a serious issue. So, I respectfully urge this Government to appoint a special task force to look into this because this is more serious than terrorism. Unless our economy is secure. we cannot move forward. If money is taken out of the Treasury like this, how could you expect people to have confidence in us? The Central Bank has a duty to monitor because they charge Rs. 50 million to Rs. 100 million a month to supervise banks. There are serious lapses in all quarters and therefore, there needs to be focus.

මෙතැන එක් එක්කෙනාට ඇඟිල්ල දිගු කරලා වැඩක් නැහැ. අතීතය ගැන කථා කරලා වැඩක් නැහැ. අපි අනාගතය ගැන කථා කරනකොට යථාර්ථවාදී වෙලා මේ ප්‍රශ්නවලට විසඳුම් සොයන්න ඕනෑ. හැම දාම මෙතැනදී ආණ්ඩුව කියන්නේ ගිය ආණ්ඩු කරපු වැරදි ගැන. ජනතාව තමුන්නාන්සේලාව බලයට පත් කළේ පසුගිය ආණ්ඩු කරපු වැරදි නිවැරදි කරන්න. තමුන්නාන්සේලාට ඒ වගකීම තිබෙනවා. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, හැම වෙලාවේම ඉතිහාසය ගැන කථා කරන්න එපා කියලා. අවුරුදු 75ක සාපය ගැන කථා කරන්න එපා. ජනතාව තමුන්නාන්සේලාට බලය දීලා තිබෙන්නේ මේ රට සුබදායී කරන්නයි; ඒ වගකීම හරියාකාරව භාරගෙන ඒ සැබෑ වෙනස ඇති කරන්නයි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චතුරි ගංගානි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.35]

**ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) எம்.ஏ.சீ.எஸ். சத்துரி கங்கானி)
(The Hon. (Mrs.) M.A.C.S. Chathuri Gangani)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2වන වගන්තිය ප්‍රකාරව හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය තමයි මේ අවස්ථාවේ පැවැත්වෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මීට අවුරුද්දයි මාස පහකට පෙර ආණ්ඩුව භාර ගන්නකොට

[ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය]

කොයි වැනි රටක්ද අපි භාර ගත්තේ කියන එක සම්බන්ධයෙන් මේ රටේ මහජනතාවටත්, අපිටත් අවබෝධයක් තිබෙනවා. සමස්ත වශයෙන් - ආර්ථික වශයෙන්, දේශපාලන වශයෙන්, සමාජයීය වශයෙන් - කඩා වැටුණු රටක් තමයි අපි භාර ගන්නේ. එහෙම බංකොලොත්භාවයට පත් වෙච්ච රටක ආණ්ඩුව අරගෙන අවුරුද්දක් ඇතුළත තමයි නිශ්චිත වශයෙන් ලංකා ඉතිහාසයේ සිදුවුණු දැවැන්තම ස්වාභාවික ආපදාවට අපට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඇත්තටම බංකොලොත් වෙච්ච රටක සිදු වූ ඒ ස්වාභාවික ආපදාවට ඉතාම ශක්තිමත් විධියට මුහුණ දෙන්න පුළුවන් වාතාවරණය අපි අවුරුද්දක් ඇතුළත හදාගෙන තිබුණා. ආර්ථික ස්ථාවරභාවය හා අපි බලාපොරොත්තු වුණාට වඩා සියලු ක්ෂේත්‍රයන්හි ආදායම් තත්ත්වය ඉහළ මට්ටමකට අරගෙන ඒම නිසා තමයි අපේ රටේ මේ ව්‍යසනයට පත්වෙච්ච ජනතාවගේ ජීවිත නඟා සිටුවීම වෙනුවෙන් අපට වැඩ කරන්න පුළුවන්කම ලැබුණේ.

අපි මීට කලින් දැකලා තිබුණු ස්වාභාවික ව්‍යසනය තමයි සුනාමිය. ඒකේ හානිය ගත්තොත්, ඩොලර් බිලියන එකක වාගේ හානියක් තමයි වෙලා තිබෙන්නේ. ලෝක බැංකුව කළ සමීක්ෂණයකට අනුව, "දිට්වා" ආපදාවෙන් යටිතල පහසුකම්වලට සිදුවුණු බලපෑම විතරක් ඩොලර් බිලියන 4.1ක් ලෙසට වාර්තා වෙලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. සුනාමිය වාගේ හතර ගුණයක හානියක් අපට මේකෙන් සිද්ධ වෙලා තිබෙනවා. ඒක දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4ක් බවට තක්සේරු වෙලා තිබෙනවා. 2026.04.17වැනි දා වෙනකොට ආපදා කළමනාකරණ ඒකකයේ නවතම දත්ත අනුව, බලපෑමට ලක් වූ පවුල් ගණන 64,901ක් වෙනවා. ඒ වාගේම පුද්ගලයින් ප්‍රමාණය ගත්තොත්, 220,044ක ප්‍රමාණයක් හානියට පත් වෙලා තිබෙනවා. පුද්ගල මරණ 687ක් වාර්තා වෙලා තිබෙනවා. අතුරුදහන් වීම් 147යි. මේ වෙනකොට සුරක්ෂා මධ්‍යස්ථාන 20ක අපේ ආදරණීය ජනතාව ජීවත් වෙනවා. සම්පූර්ණ වශයෙන් හානියට පත් වෙච්ච නිවාස ප්‍රමාණය 5,866ක් වෙනවා. නිවාස 109,629ක ප්‍රමාණයක් අර්ධ වශයෙන් හානි වෙලා තිබෙනවා. මෙන්න මේ හානිය කළමනාකරණය කර ගැනීම වෙනුවෙන් ආණ්ඩුවක් හැටියට, රජයක් හැටියට අපට ආකාර තුනකින් පුද්ගලයින්ගේ ජීවිතවලට, මිනිසුන්ගේ ජීවිතවලට මැදිහත් වෙන්න සිද්ධ වුණා.

පළමුවැනි අදියර විධියට ජීවිත ගලවා ගැනීමේ ක්‍රියාන්විතයට අපට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඒ ජීවිත ගලවා ගැනීමේ ක්‍රියාන්විතය ඇතුළේ මේ රටේ සියලු ආරක්ෂක අංශ, සැලකිය යුතු ප්‍රමාණයක රජයේ නිලධාරින්, ඒ ප්‍රදේශවල වෙසෙන ජනතාව, දේශපාලන අධිකාරිය හැටියට, ආණ්ඩුව හැටියට අපිත් විශාල වගකීම් ප්‍රමාණයක් ඉටු කරලා තිබෙනවා. ජීවිත ගලවා ගැනීමේ මෙහෙයුම් මේ වෙනකොට අවසන් වෙලා තිබුණත්, අපට තව ප්‍රශ්න දෙකක් උත්තර හොයන්න ඉතිරි වෙලා තිබෙනවා. අවශ්‍ය පිරිස වෙත සහන ලබා දීමේ කාර්යභාරයේ සැලකිය යුතු ප්‍රමාණයක් අපට කරන්න ඉතිරි වෙලා තිබෙනවා. ඒ වාගේම ආපදාවෙන් හානියට පත් රට නැවත ගොඩට ගැනීමේ කාර්යභාරය අපේ කර මත, උර මත පැටවිලා තිබෙනවා.

විශේෂයෙන්ම ගත්තොත්, අද දවසේ විවාදයට භාජන කරන හදිසි නීතිය ක්‍රියාත්මක වන කාල සීමාව දීර්ඝ කිරීමේ ප්‍රධාන පරමාර්ථය බවට පත් වෙලා තිබෙන්නේ මම ඔය කියපු අවසන් ඉලක්ක දෙක කෙසේ හෝ ජය ගැනීමයි. මෙන්න මේ තත්ත්වය කළමනාකරණය සඳහා ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව විධියට අපි ක්‍රියාමාර්ග කිහිපයක් අරගෙන තිබෙනවා. පළමු අදියරේදී 2464/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කර තිබෙනවා. තුන්වැනි වතාවට තමයි අප අද දවසේ මේ හදිසි තත්ත්වය දීර්ඝ කර ගැනීම සිද්ධ කරන්නේ. හදිසි නීති රෙගුලාසි නිකුත් කර තිබෙනවා. ඉහත කී ආපදා තත්ත්වය හේතුවෙන් පීඩා විඳින ජනතාව වෙනුවෙන් සපයන අත්‍යවශ්‍ය සේවාවන් මොනවාද කියන එක ප්‍රකාශයට පත් කර තිබෙනවා. ජනතාවගේ ජීවිත නඟා සිටුවීම සඳහා අවශ්‍ය සියලු සේවා ඇතුළත් කරමින්, සේවාවන් 15ක් අත්‍යවශ්‍ය සේවා හැටියට නම් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙකු අපි මේ කටයුත්තට පත් කර තිබෙනවා. ඒ විතරක් ද නොවෙයි. ජාතික ව්‍යසන පාත්‍ර ප්‍රදේශ ලෙස දිස්ත්‍රික්ක 22ක් මේ ව්‍යසනය ඇතුළේ හානියට පත් වෙලා කියලා අපි ප්‍රකාශයට පත් කර තිබෙනවා. යළි රට ගොඩනැඟීම වාගේම, පශ්චාත් ආපදා ප්‍රතිසාධන කටයුතු විධිමත්ව මෙහෙයවීම සඳහා "Rebuilding Sri Lanka" නමින් ජනාධිපති කාර්යසාධක බලකායක් පිහිටුවා තිබෙනවා. අපි එයින් ද නතර වෙලා නැහැ. ජනතාවට දෙන්න ඕනෑ සියලු සහන සැපයීම සඳහා අපි කිසිදු ක්ෂේත්‍රයක් මඟ හැරෙන්නේ නැති වෙන්න විශේෂ උපකමිටු 8ක් පත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ ව්‍යසනයට මුහුණ දුන්නු ජනතාවගේ ජීවිත යථාවත් කිරීම වෙනුවෙන් අපි 2025 අවුරුද්දේ දෙසැම්බර් මාසයේදී රුපියල් කෝටි 7,200ක මුදලක් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 2026 වර්ෂය ගත්තොත්, රුපියල් කෝටි 50,000ක මුදලක් අපි වෙන් කර තිබෙනවා. ඇත්තටම රටේ මහ ජනතාවට මේක සතුටට කාරණයක්. කඩා වැටුණු රටක මේ තරම් ස්ථාවර විධියට ජනතාවට ප්‍රතිලාභ දෙන්න හැකියාව ලැබුණේ මේ ආණ්ඩුවේ ශක්තිමත්භාවය නිසාමයි. විශේෂයෙන්ම ගත්තොත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව මෙවැනි අවස්ථාවකදී අපට ලබා දෙන්න පුළුවන් වෙන්නේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 4.2ක වාගේ ප්‍රමාණයක්. ඒක මුදලින් ගත්තොත්, රුපියල් බිලියන 1,380ක්. අපි 2026 අවුරුද්දේ අය වැයෙන් වෙන් කර තිබෙන්නේ බිලියන 1,380කින් හතරෙන් එකක වාගේ කොටසක්. ඒ කියන්නේ, අය වැයෙන් වෙන් කළාටත් වඩා වැඩි මුදලක් අපි මේ රටේ මේ ව්‍යසනයට මුහුණ දුන් ජනතාවගේ ජීවිත නඟාසිටුවීම වෙනුවෙන්, අවශ්‍ය සියලු යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් වෙන් කර තිබෙනවා.

ගරු විපක්ෂ නායකතුමා ඇහුවා රුපියල් 50,000 ඒවා කීයක් දීලා තිබෙනවාද, රුපියල් 15,000 ඒවා කීයක් දීලා තිබෙනවාද, රුපියල් 25,000 ඒවා කීයක් දීලා තිබෙනවාද, රුපියල් ලක්ෂ 50 ඒවා කීයක් දීලා තිබෙනවාද කියලා. එතුමා එහි ප්‍රගතිය විමසුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කනගාටුවට කාරණාව නම් ලෝකයේ සියලු තොරතුරු, සියලු ක්ෂේත්‍ර පිළිබඳව දන්නා අපේ ගරු විපක්ෂ නායකතුමා මේ කරුණු නොදැන සිටීමයි. ඒ නිසා, මම මේ අවස්ථාවේ මේ දත්ත ඉදිරිපත් කරන්න කැමැතියි. නිවාස යථාවත් කිරීම සඳහා රුපියල් 25,000 බැගින් දෙන දීමනාව අපි මේ වෙනකොට සියයට 99.81කට දීලා තිබෙනවා; රුපියල් 50,000ක දීමනාව සියයට 99.6කට දීලා තිබෙනවා; රුපියල් 15,000ක දීමනාව සියයට 99.75කට දීලා තිබෙනවා; කුලී නිවාස දීමනාව සියයට 90කට දීලා තිබෙනවා; ජීවනෝපාය අහිමි වීමේ දීමනාව සියයට 83.93කට දීලා තිබෙනවා; මරණ වන්දි ගෙවීම සියයට 85.18කට දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ දත්ත පිරික්සීමේදී අපට පෙනෙනවා මේ සහන පැකේජය ඇතුළේ තවත් යම් ප්‍රමාණයකට සහන ලබා දෙන්න ඉතිරි වෙලා තිබෙන බව. ඒ වාගේම, විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරපු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ගත්තාම, අපට තව railways හදන්න තිබෙනවා, මහාමාර්ග හදන්න තිබෙනවා. අන්න ඒ සියල්ල කළමනාකරණය කර ගනිමින් කටයුතු කරන්න තමයි අද දවසේ අපි මේ හදිසි නීතිය තවදුරටත් දීර්ඝ කර ගන්නේ. මේ ප්‍රගතිය

ගැන අහන විපක්ෂ නායකතුමා ප්‍රමුඛ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම මේ කාරණයත් කියන්න කැමැතියි. බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කැලිපනාවෙල කියන්නේ මම ඉපදුණු ගම. 2023.12.09වැනි දා සිදු වුණු නාය යෑමෙන් එම ප්‍රදේශයේ පවුල් 10කට සම්පූර්ණයෙන්ම නිවාස අහිමි වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. කනගාටුවට කාරණාව නම්, අද ප්‍රගතිය විමසන අයට ඒ මිනිසුන් වෙනුවෙන් රුපියලක්වත් ගෙවන්න බැරි වීමයි. 2025 අවුරුද්දේ අප ඒගොල්ලන්ට වන්දි දීලා නිවසක් තනා දීමේ ක්‍රියාවලිය ආරම්භ කරන තෙක් ඒ මිනිසුන් ජීවත් වුණේ පොදු ක්‍රීඩාංගණයක ටකරම් පැල්පත්වල. ඒ ජනතාවට එහෙම ඉන්න සලස්වපු මිනිස්සු තමයි අද දවසේ අපෙන් ප්‍රගතිය විමසන්නේ. ඒ විතරක් නොවෙයි, ජනාධිපති අරමුදලින් මහජනතාවට සේවය කරන්න තිබෙන මුදල් එදා සාක්කුවට දාගත්තු අය තමයි අද අපෙන් අහන්නේ, "ලජ්ජා නැද්ද?" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ එකම පරමාර්ථය, අපේ එකම බලාපොරොත්තුව වෙලා තිබෙන්නේ, මේ හදිසි නීතිය දීර්ඝ කිරීමේදීත් අපේ එකම පරමාර්ථය වෙලා තිබෙන්නේ අපේ රටේ මිනිසුන්ට සේවය කිරීමයි. මේ "දිට්වා" ව්‍යසනය ඇතුළේ ජීවිත අහිමි වුණු අයට ජීවිතය යළි දෙන්න අපට බැහැ. හැබැයි, ඒ ඉතිරි වෙච්ච ජීවිතවල සමස්තය නඟා සිටුවීම වෙනුවෙන් තමයි අපි ප්‍රතිපාදන, ප්‍රතිලාභ, සහන හඳුන්වා දී තිබෙන්නේ. ඒ සියල්ල මහ ජනතාවට ලබා දීම වෙනුවෙන් තමයි අද දවසේ මේ හදිසි නීතිය දීර්ඝ කිරීමටත් අප කටයුතු කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි මහ ජනතාව වෙනුවෙන් වැඩ කරන, මහජන වරමින් ඇවිල්ලා ඉන්න කණ්ඩායමක්. අපේ පළමුවැනි ක්‍රියාවලියත්, දෙවැනි ක්‍රියාවලියත්, තුන්වැනි ක්‍රියාවලියත් මහ ජනතාව වෙනුවෙන් සේවය කිරීමයි. ඒ සඳහා විශේෂයෙන්ම අද දවසේ සිදු කරන මේ හදිසි නීතිය දීර්ඝ කිරීම, ආණ්ඩුකරණය තුළ සිදු කරගෙන යන ඉදිරි ක්‍රියාවලිය ඇතුළුව සමස්තයම මහ ජනතාව වෙනුවෙන්මයි කියන ප්‍රකාශය කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.46]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, බොරු කියනවා කියලා, පච කියනවා කියලා මෙහෙමත් පච කියන්න පුළුවන්ද කියලායි මම මේ කල්පනා කළේ. කලින් කිව්වා, ලංකා ඉතිහාසයේ වෙච්ච ලොකුම ස්වාභාවික ආපදාව මේ "දිට්වා" සුළි කුණාටුවයි කියලා. එතකොට "සුනාමිය" මොකක්ද? *[බාධා කිරීමක්]* "සුනාමිය" මොකක්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වගේ බොරු කිය කියා මිනිසුන් අන්දලා, ඒකට විරුද්ධව මිනිස්සු කෑ ගැහුවාම බය කරන්න තමයි මේ හදිසි නීතිය දීර්ඝ කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මෙන්න මේ කාරණය කියන්න කැමැතියි. ජනතාව හීන ලෝකයට එක්කගෙන ඇවිල්ලා මෙන්න මේ විධියට තමයි මේ අය හැමදාම කටයුතු කළේ. හැබැයි, අපි විපක්ෂය විධියට විපක්ෂයේ කාර්යභාරය ඉටු කරපු නිසා තමයි රන්වලගේ බොරුව එළි දක්වලා මාස 3ක් යන්න කලින් රන්වලට තනතුරෙන් අයින් වෙන්න සිද්ධ වුණේ. ඒ වාගේම අපි කන්ටේනර් 323 වංචාව පිළිබඳවත් හෙළි කළා. මේ අය එතැනදීත් අපේ කට වහන්න හැදුවා. ඒක හරිගියේත් නැහැ. හරි ද? ජනාධිපතියි, ඇමතියි කමිටුව ඉදිරියට ගේන එක බහුතරය පාවිච්චි කරලා අද නැවැත්තුවාට, ආණ්ඩුව මාරු වෙච්ච දවසට ඒක නවත්වන්න හම්බ වෙන්නේ නැහැ කියන එක අපි කියන්න ඕනෑ. ඒ වාගේම, ව්‍යාපාරිකයන්ගේ අල්ලේ නැටවෙන ආණ්ඩුවක් විධියට මේ ආණ්ඩුව, එක ව්‍යාපාරිකයෙකුට මල්ටිප්ලග් හරහා ඩීල් එක දාද්දී ඒකත් හෙළි කෙරුවේ මේ විපක්ෂය මේ ආණ්ඩුවට බය නැති නිසයි. ගල් අඟුරු වංචාව හරහා නැව් 9ක පාඩුව විතරක් රුපියල් මිලියන 8,497යි. තව ගල් අඟුරු නැව් 9ක පාඩුව එළියට එන්න තිබෙනවා. ඒක තවත් සති දෙකකින් එළි වේවි. ගල් අඟුරු වංචාව ගැන එළි කරපු නිසා තමයි මෙතැන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අන්තිමට ඇමති ධුරයෙන් ඉල්ලා අස් වෙන්න සිද්ධ වුණේ. ජනාධිපතිතුමාත් ඇවිල්ලා බේරා ගන්න හැදුවා. ඒත් හරිගියේ නැහැ. මේ රටේ මහ ජනතාව පෙළ ගැහුණාම ඇමතිවරයාට ඉල්ලා අස් වෙන්න සිදු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ විතරක් නොවෙයි, දැන් අලුත්ම වංචාවක් ඇවිල්ලා තිබෙනවා. හැකර් ගැනත් මම කියන්නම්, අන්තිමට. අලුත්ම වංචාව මේකයි. පසුගිය ආණ්ඩු කාලයේ මේ රටට පිරිපහදු නොකළ පොල්තෙල් ගේනකොට VAT එක දාන්න යෝජනා කරලා තිබුණා. මේ ආණ්ඩුව ආවාට පස්සේ ඒක අය කරන්නේ නැහැ. ගිය අවුරුද්දේ පෙබරවාරි මාසයේ 5වන දා මම අගමැතිතුමියගෙන් ප්‍රශ්නයක් ඇහුවාම අගමැතිතුමිය පිළිගත්තා, "ඒක අය කර ගන්න ඕනෑ; අය කරනවා" කියලා. මේ වනකොට අවුරුද්දකුත් මාස 3ක් ගිහිල්ලාත් තවම අය කර ගන්න බැරි වෙලා තිබෙනවා. පොල්තෙල් කිලෝග්‍රෑම් මිලියන 63,000ක් ගෙනැල්ලා තිබෙනවා. කිලෝවකට රුපියල් 120 ගණනේ රුපියල් මිලියන 8,000ක් බදු අය කර ගන්න ඕනෑ. එය අය කර ගන්න ඕනෑ කියන එක මෙතැනදී අගමැතිතුමියත් පිළිගෙන, වසන්ත සමරසිංහ වෙළෙඳ ඇමතිවරයාත් පිළිගෙන, අනිල් ජයන්ත නියෝජ්‍ය මුදල් ඇමතිවරයාත් පිළිගෙන තිබියදීත් මාස 15ක් තිස්සේ ඒ කියපු රුපියල් මිලියන 8,000 අය කර ගන්නේ නැත්තේ, ඒ අය පැලවත්තේ අරමුදලට උදව් කරනවාද දන්නේ නැහැ; එහෙම නැත්නම් ඒ අයගෙන් වෙන කාට කාට හරි මොනවා හෝ උදව් ලැබෙනවාද දන්නේ නැහැ. අගමැතිතුමිය පාර්ලිමේන්තුවේදී කිව්වා, "මේක අය කර ගත යුතුයි; අය කර ගන්නවා" කියලා. නමුත්, අඩුම ගාණේ ඒ සමාගම්වලට තක්සේරුවවත් තවම යවලා නැහැ. ඇයි? ඒ නිසා මේ රුපියල් මිලියන 8,000 - බිලියන 8 - වංචාවක් කියලා තමයි අපට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "76 අවුරුද්දේ ශාපය, ශාපය, ශාපය!" කියාගෙන තමයි මේ අය බලයට ආවේ. මේ 76 අවුරුද්දේ ණය ගෙවලා තිබෙනවා, ඕනෑ තරම්. හරිද?

මහා ලොකු ඇවිදින පුස්තකාල ගෙනාවා. මුදල් ලේකම් ආනයනය කළා ඕස්ට්‍රේලියාවේ ඉඳලා. මුදල් ලේකම් ආනයනය කළා. හැබැයි, මේ ඩොලර් මිලියන 2.5 යනකල් ඒ මුදල් ලේකම් දන්නේ නැහැ. හැකර්ලු! මාර නාට්‍යයක්! හැකර් නම්, හැකර් system එක ඇතුළට ඇවිල්ලා, system එක ඇතුළෙන් කාගේවත් අනුමැතියකින් තොරව සල්ලි ගන්නේ. මේ හැකර් ඇවිල්ලා 14දෙනෙකුගෙන් අනුමත කරලා තමයි අරගෙන තිබෙන්නේ. මේ හැකර් අනුමත කරලා තමයි අරගෙන තිබෙන්නේ! එතකොට

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

තැපැල් දෙපාර්තමේන්තුවෙන් යවපු ඩොලර් ලක්ෂ 6ත් හැකර්ද? අස්වැසුමෙන් දෙපාරක් ගෙවපු මිලියන 500ත් හැකර්ද? ඒ වාගේම NDB එකෙන් ගෙවපු මිලියන 13,500ත් හැකර්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙනකොට මහ බැංකුව හරහා මේ වාගේ මුදල් ජනතාවට අහිමි වෙලා තිබෙනවා. එක්කෝ, ඒවා කාගේ හරි සාක්කුවට ගිහිල්ලා තිබෙනවා. මේ නොහැකියාව සහ දුර්වලකම නිසා වංචා හරහා මිලියන 18,220ක් අහිමි වෙලා තිබෙනවා. NDB එකෙන් දෙපාරක් ගෙවීමේදී, RDA එකේ ඒවා ලංකා බැංකුව හරහා ගෙවීමේදී, තැපැල් දෙපාර්තමේන්තුවේ payment එකේදී, - ඒවා එකතු කළාම - රුපියල් මිලියන 18,200ක් අහිමි වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කරුම වැඩේ කියන්නේ ජනාධිපතිතුමාගේ යාළුවන්ට තමයි මේ ඔක්කෝම චෝදනා තිබෙන්නේ. ගල් අඟුරු වංචා චෝදනාවත් තිබෙන්නේ ජනාධිපතිගේ යාළුවෙකුට. මහ බැංකුවේ මුදල් අහිමි වීමේ චෝදනාව තිබෙන්නේත් ජනාධිපතිතුමාගේ යාළුවා, ඕස්ට්‍රේලියාවේ ඉඳලා ආනයනය කරපු එක්කෙනාට. ඒ නිසා අපි පැහැදිලිව කියන්න කැමැතියි, මෙහෙම සුරංගනා කථා කියලා, මේ හදිසි නීතිය ගෙනැල්ලා මේ කටවල් වහන්නත් බැහැ, නවත්වන්නත් බැහැ කියලා. හර්ෂණ සූරියප්පෙරුම මුදල් ලේකම් මේකට වග කියන්න ඕනෑ. ඔහු ඉල්ලා අස් විය යුතුයි. හර්ෂණ සූරියප්පෙරුම මුදල් ලේකම් ඉල්ලා අස් විය යුතුයි. දැන් එයාලා තමයි හැන්ඩ්ල් කරන්නේ අර "Rebuilding Sri Lanka" අරමුදලත්. දෙවියන්ගේ පිහිටයි ඒකටත්! තවත් ටික දවසක් යනකොට තමයි ඒක එන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගිය ආණ්ඩුවලට බැණලා බැණලා, වැරදි කරන්නේ නැහැ කිව්වා. මෙන්න, මම කියන්නම් තවත් එකක්. මෙන්න තිබෙනවා, අහගන්න. ගිය ආණ්ඩුව කාලයේ United Solar කියන කොම්පැනියට, ඊපීඑෆ්, ඊටීඑෆ් ගෙවා ගන්න බැරුව උසාවියේ නඩු තිබෙන කොම්පැනියකට සෝලා බැටරි දමන්න පූනකරි ප්‍රදේශයේ අක්කර 1,200ක් යෝජනා කරලා තිබුණා. මේ හිටපු ඇමති ජයකොඩි, ඒක ඒ විධියටම තවත් ද්‍රවිඩ පක්ෂ නායකයෙක් එක්ක එකතු වෙලා, එහෙමම දීලා තිබෙනවා. මෙන්න ඒ documents. ඕනෑ නම් දෙන්නම් බලන්න, කවුරු හරි ඉල්ලනවා නම්. ඒක ඇතුළේත් ලොකු වංචාවක් තිබෙනවා. ඒක තවත් විස්තරාත්මකව අපි ඉදිරියේදී හෙළිදරව් කරනවාය කියලා මම කියනවා.

දැන් මේ කාලයේ තමයි හැකර්ලා NDB එකට ගහන්නේ, මහ බැංකුවට ගහන්නේ, අස්වැසුමට ගහන්නේ. එහෙම තියෙද්දී විවිධ රටවල ඉන්න අයත් මෙහේට ඇවිල්ලා ටෙලිකොම් වංචා කරනවා. මේ ටෙලිකොම් වංචා ලංකාවේ ආර්ථිකයට විශාල පාඩුවක්; විශාල අභියෝගයක්. සෘජු විදේශ ආයෝජන ලංකාවට ගෙනෙන්න තිබෙන ලොකුම බාධාවක් ඒක. ඒ නිසා ඔබතුමන්ලාගේ නොහැකියාව වහගන්න, හොරකම වහගන්න, වංචාව වහගන්න හදිසි නීතියි නොවෙයි, මොන නීතිය ගෙනාවත් ඒකට විරුද්ධව මහජනයා නැඟිටින එක නවත්වන්න බැහැ.

ඒ වාගේම අපට ජනාධිපතිතුමා විවිධ අවස්ථාවල අභියෝග කළා, මාධ්‍ය හමු නැතුව මහජනතාව ගෙනැල්ලා පුළුවන් නම් රැස්වීමක් තියලා පෙන්වන්න කියලා. අපි කරලා පෙන්නුවා, මැයි දිනේ. අපි කරලා පෙන්නුවා, මැයි දිනේ. දැන් කැලිවලට කඩා කඩා වත්ත වටේ - ඔහොම තමයි වියත් මඟේ අයත් හිනා වෙවී හිටියේ. අන්තිමට ගෝඨා පැනලා ගියේ. ගෝඨා පැනලා ගියේ, ඇප නැති වෙලා. ඒ නිසා හිනා වෙන්න ඕනෑ තරම්. ලබන පාර පාර්ලිමේන්තු එන්න හම්බ වෙන්නේ නැහැ ඔබතුමාට. අර රැල්ලට ගහගෙන යන රොඩු තිබෙන්නේ. ඒ රොඩු වාගේ තමයි ඔබතුමාත්. ඔය වාගේ රොඩු ඕනෑ තරම් තිබෙනවා. හෝදනකොට රොඩු ඔක්කෝම හේදිලා යනවා. මම ඒ පිළිබඳව ඊට වඩා දීර්ඝව කථා කරන්නේ නැහැ.

ජනාධිපතිවරයාගේ මිත්‍රයෝ තමයි මේ චෝදනාවලට ලක් වෙලා තිබෙන්නේ. ඒ නිසා ජනාධිපතිතුමාට තිබෙනවා වගකීමක්. තමන්ගේ ආත්ම ගෞරවය බේරා ගන්න, තමන්ගේ quality එක බේරා ගන්න, ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඕනෑ. අපිත් හිතුවා අනුර කුමාර දිසානායක මැතිතුමා ජනාධිපති වෙනකොට, ඔන්න අපේ පන්තියේ මිනිහෙක් ජනාධිපති වෙලා තිබෙනවා, ඒ පන්තියට සාධාරණයක් වෙයි කියලා. පන්තියට මොන සාධාරණයද? හාල් මිලේ ඉඳලා, ප්ලේන්ටියේ ඉඳලා, කරන්ට් බිලේ ඉඳලා, බෙහෙත් මිලේ ඉඳලා, පොත් පත්වල මිලේ ඉඳලා ඔක්කෝගෙන්ම වැඩේ දුන්නේ පොඩි එකාට. පොඩි එකාට වැඩේ දීලා, එතුමාගේ යාළුවන්ට -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
අවසාන වශයෙන් මම කියනවා. ජනාධිපතිතුමනි, මේ රුපියල් මිලියන 18,200ට හර්ෂණ සූරියප්පෙරුම මුදල් ලේකම් වග කියන්න ඕනෑ. ඔහු ඉල්ලා අස් කරගන්න. නැත්නම් ජාමේ බේරා ගන්න හම්බ වෙන්නේ නැහැ කියමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් රණසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.54]

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා (නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ - வீடமைப்பு, நிர்மாணிப்பு மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. (Dr.) Susil Ranasinghe - Minister of Housing, Construction and Water Supply)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මරික්කාර් මන්ත්‍රීතුමා කියන කාරණා ඔක්කෝම අපි විශ්වාස කරනවා, එතුමා හෝමාගම මහජන බැංකුවේ නැන්දම්මාගේ ගිණුමේ අංකය ඇතුළු විස්තරේ කියනවා නම්.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ඒක ජයකොඩිගෙන් අහන්න.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
නැහැ, නැහැ. එයාගෙන් අහන්න නොවෙයි. ඔබතුමා නේ ඒක කිව්වේ. *[බාධා කිරීම්]* හෝමාගම මහජන බැංකුවේ නැන්දම්මාගේ ගිණුමේ විස්තරය කියන්න. *[බාධා කිරීම්]* ඒ විස්තරේ කිව්වොත් අපි ඔය සියල්ල විශ්වාස කරනවා. ඒ නිසා පාර්ලිමේන්තුවේ මෙතැනට ඇවිල්ලා බොරු ඇද බාලා, මඩ ගහලා හයියෙන්, සද්දෙන් කථා කරලා යන්න එපා. ඕවා හොඳයි කිසිම අවබෝධයක් නැති මිනිස්සුන්ට.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 15ක කාලයක් ලැබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කිව්වේ, එහෙම එකක් වෙලා තිබෙනවා, හොයලා බලන්න කියලා. ඒගොල්ලන්ට හොයා ගන්න බැරි නම් අන්න ඉන්නවා, ජයකොඩි. ගිහිල්ලා අහගන්න, එයාගෙන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොරු කියන්න එපා අනේ. උපතින්ම බොරුව.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ඔබතුමා කිව්වා, හදිසි නීතිය දීර්ඝ කරනවා, මේවා කරන්නේ මිනිස්සුන්ගේ කටවල් වහන්න කියලා. අපි කට වහන්නේ නැහැ. අපි මරික්කාර්ගේ කට වහන්නේ නැහැ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
වහන්න බැහැ. වහන්න බැහැ.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
අපි මරික්කාර්ගේ කට වහන්නේත් නැහැ. ඔය කට වැහුවොත් අපට තමයි පාඩු. ඔය කට ඇරලා තිබෙනතෙක් අපට වාසියි. මේ පාර්ලිමේන්තුවේ ඔය වාගේ බොරු දෙසා බාද්දී මිනිස්සු තේරුම් ගන්නවා, ඇත්ත තත්ත්වය.

මරික්කාර් කියන්නේ අපේ රටේ හිටපු හොඳ මාධ්‍යවේදියෙක්; ගවේෂණශීලි මාධ්‍යවේදියෙක්. මට මතකයි, ඒ දවස්වල "සිරස" රූපවාහිනියේ මැතිවරණ විකාශනවලදී ඉතිහාසයේ කරුණු, තොරතුරු අරගෙන විශ්ලේෂණය කරමින් විග්‍රහ කරනවා. ඒ, අපි දැනගෙන හිටපු මරික්කාර්. මරික්කාර්ට මන්ත්‍රී ධුරයක් දීලා මරික්කාර් නැති කළා. මරික්කාර්ගේ කට වහලා මරික්කාර් තවදුරටත් ආරක්ෂා කරන්න අපට ඕනෑ නැහැ. *[බාධා කිරීමක්]* කට ඇරලා තිබ්බොත් මරික්කාර් කවුද කියලා රටට තව පෙනෙනවා. *[බාධා කිරීම්]* අපට කිසි කෙනෙකුගේ කට වහන්න ඕනෑ නැහැ. *[බාධා කිරීම්]* එතුමා කියනවා, මහජන නැඟිටීමක් නවත්වන්න බැහැලු. *[බාධා කිරීම්]* මහජන නැඟිටීම නොවෙයි, මැයි පළමුවැනි දා සජබ මැයි රැලියේ නායකතුමාගේ කථාව අහන්නේ නැතිව මහජනතාව නැඟිටලා ගියේ. ඔන්න, මහජනතාව නැඟිටිනවා! ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයාගේ කථාව අහන්නේ නැතිව මහජනතාව නැඟිටිනවා. *[බාධා කිරීම්]* එහෙම තමයි මහජනතාව නැඟිටින්නේ. *[බාධා කිරීම්]* තවදුරටත් බොරු පුරාජේරු කියලා, අපි තමයි විපක්ෂය, අපි තමයි නායකයෝ, අපට තමයි බලය හම්බ වෙන්න තිබෙන්නේ, අපි තමයි ජනාධිපති වෙන්න ඉන්නේ කියලා කිව්වාට තමන්ගේ පාක්ෂිකයෝ නැඟිටලා යනවා. මැයි රැලියට ආපු සජබ පාක්ෂිකයෝ මැයි රැලියෙන් එළියට ඇවිල්ලා කියනවා, මේ ආණ්ඩුව හොඳයි කියලා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 15ක කාලයක් ලැබෙනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දෙකයි පනහේ වැඩ කරන්න එපා කියන්න. මගේ කට වහන්න බැහැ. මම නඟපු තර්ක, හැකර්ලාගේ කථාව බොරු නම් බොරුයි කියන්න. "අස්වැසුම" දීමනාව දෙපාරක් ගෙවපු එක බොරු නම් බොරුයි කියන්න. NDB එක ගෙවපු එක බොරු නම් බොරුයි කියන්න. තැපැල් දෙපාර්තමේන්තුව ගෙව්වේ නැහැ කියනවා නම් ඒක බොරුයි කියන්න. නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්වේ ගෙව්වා කියලා. මම නොවෙයි කිව්වේ, නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්වේ. ඒ නිසා ඒ නඟපු තර්කවලට උත්තර දෙන්න. ඔබතුමාට කොහොමත් බැහැ අපේ කට වහන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සුසිල් රණසිංහ ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නිවෙන්න, නිවෙන්න, නිවෙන්න. කෑ ගහන්න එපා. මම කිව්වේ අපි මරික්කාර්ගේ කට වහන්නේ නැහැ කියලා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
වහන්න බැහැ.

**ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) சுசில் ரணசிங்ஹ)
(The Hon. (Dr.) Susil Ranasinghe)
වහන්නේ නැහැ, අපි. වහන්නේ නැහැ. අපි නොවෙයි පව කිව්වේ. ඔබතුමා හෝමාගම මහජන බැංකුවේ නැන්දම්මාගේ ගිණුමේ විස්තර කියන්න. *[බාධා කිරීමක්]* අපි කුමාර ජයකොඩි මහතාගෙන් අහගන්නම්. *[බාධා කිරීමක්]* කුමාර ජයකොඩි මහතාගෙන් අහගන්න ඕනෑ නම් ඔබතුමා පාර්ලිමේන්තුවේ මේ ගැන කියන්න ඕනෑ නැහැ නේ. *[බාධා කිරීමක්]* ඒක තමයි කියන්නේ. සද්දෙට බොරු කිව්වාට අපේ රටේ ජනතාව අහු වෙන්නේ නැහැ. ඒක මිනිස්සු දන්නවා. ඔබතුමන්ලා මැයි දිනය පැවැත්වුවා නේ. මැයි දිනය පැවැත්වුවා, ground එකක හට් එකක මිනිස්සු දාලා. ප්‍රබල විපක්ෂය! ඇයි, දහස් ගණන් මිනිස්සු ආවේ නැත්තේ? නායකයා කථා කරද්දී ආපු මිනිස්සු දහස් ගාණම

[ගරු (වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා]

නැඟිටලා යනවා, හෝ ගාලා. *[බාධා කිරීමක්]* ඔබතුමා කථා කරනවා, මහජන නැඟිටීමක් ගැන. ඔන්න, මහජනයා නැඟිටිනවා. *[බාධා කිරීම්]* නායකයාගේ කථාව අහන්නේ නැතිව මහජනයා නැඟිටිනවා. මහජනයා නොවෙයි, පාක්ෂිකයෝ. ඒ ගැන හිතන්න. ඒ නිසා සද්දෙට බොරු කිව්වාට අපේ රටේ මිනිස්සු රැවටෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හදිසි නීතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් තමයි මේ විවාදය තිබෙන්නේ. අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුව ආවාට පස්සේ,- *[බාධා කිරීමක්]* එතුමා තව කථාවක් කිව්වා. "දිට්වා" සුළි කුණාටුව තමයි අපේ රටට ආපු දැවැන්තම ස්වාභාවික ව්‍යසනය කියන එක පිළිගන්නේ නැහැ කියලා. එතුමා "සුනාමි" ගැන කිව්වා. සුනාමි ආවාද කොළඹට? සුනාමි ආවාද, ඔබතුමාගේ ආසනයට? සුනාමි ආවේ සීමිත දිස්ත්‍රික්ක කිහිපයකට. හැබැයි, මේ "දිට්වා" සුළි කුණාටුවෙන් මුළු රටේ හැම දිස්ත්‍රික්කයකටම අලාභ හානි සිද්ධ වුණා. දවස් දෙක, තුනක් ඇතුළත මුළු රටම වැටුණා. මුළු රටම වැටිලා ජන ජීවිතය අඩාළ වුණා. අපි රජයක් විධියට ඒ දේවල් කළමනාකරණය කරපු නිසා, අවශ්‍ය පියවර ගත්ත නිසා, සේවා අත්‍යවශ්‍ය සේවා බවට පත් කරලා ඒ සඳහා මැදිහත් වෙච්ච නිසා අපට සතියක්, දෙකක් යන්න කලින් ජන ජීවිතය නැවත ස්ථාපිත කරන්න පුළුවන් වුණා.

"දිට්වා" සුළි කුණාටුව නිසා කැඩිච්ච, බිඳිච්ච නිවාස, මිනිස්සුන්ගේ යටිතල පහසුකම් නැවත ගොඩනැඟීම සඳහා අපි අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ඒ සඳහා වටපිටාව සකස් කර ගන්න, ඒ සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය පහසුකම් සලසන්න තමයි මේ හදිසි නීති තත්ත්වය දීර්ඝ කරන්න ජනාධිපතිතුමා තීරණය කර තිබෙන්නේ. සේවාවන් 15ක් අත්‍යවශ්‍ය සේවාවන් බවට පත් කරලා තිබෙනවා. ඒ නිසා තවදුරටත් මේ සේවාවන් පවත්වාගෙන ගිහිල්ලා, ආපදාවට පත් වෙච්ච ජනතාවට පහසුකම් සලසන්න අපට පුළුවන්.

මැදපෙරදිග යුද තත්ත්වයක් ඇතිවෙලා තිබෙන බව අපි දන්නවා. ඒ යුද තත්ත්වය හේතුවෙන් ඇතිවෙලා තිබෙන තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා, ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා මේ සේවාවන් පාවිච්චි කරන්න පුළුවන්. මේ හදිසි නීති තත්ත්වය දීර්ඝ කිරීමෙන් අපි කිසිම කෙනෙකුගේ කට වහලා නැහැ. කිසිම කෙනෙකුව මර්දනය කරලා නැහැ. අපි කිසිම කෙනෙකුගේ මාධ්‍ය නිදහස හෝ ප්‍රකාශනයේ නිදහස හෝ වෙනත් කිසිම දෙයක් නැති කරලා නැහැ. එහෙම කරලා තිබෙනවා නම්, කරුණු කාරණා සහිතව අපට පෙන්වන්න. අර ගිණුම වාගේ නොවෙයි. හරියට කරුණු කාරණා සහිතව පෙන්වන්න. ඒ නිසා අපි මේ මාස කිහිපය ඇතුළත ප්‍රජාතන්ත්‍රවාදය අගයන රජයක්, ආණ්ඩුවක් විධියට ආදර්ශයක් ලබා දීලා තිබෙනවා. අපි මේ තත්ත්වය දීර්ඝ කරලා අකටයුතුකම් කරලා නැහැ. ජනතාවගේ අත්‍යවශ්‍ය සේවාවන් සපයා ගැනීම සඳහා, ඒ වාගේම "දිට්වා" සුළි කුණාටුව නිසා ආපදාවට පත් වෙච්ච ජනතාවගේ යටිතල පහසුකම් වාගේම ඔවුන්ගේ නිවාස ඇතුළු අනෙකුත් දේවල් නැවත ගොඩනැඟීම සඳහා තමයි මේ තත්ත්වය පාවිච්චි කර තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "දිට්වා" සුළි කුණාටුව නිසා නිවාස 1,10,000ක් පමණ අර්ධ වශයෙන් හානියට පත් වුණා. ඒ වාගේම නිවාස 6,000ක් විතර සම්පූර්ණයෙන් විනාශයට පත් වුණා. අපි ඔවුන්ට වන්දි ගෙවීම සඳහා ඉතා විශාල සහන පැකේජයක් හඳුන්වා දුන්නා. සම්පූර්ණයෙන් හානි වෙච්ච නිවාසයක් සඳහා රුපියල් ලක්ෂ 50ක් ලබා දෙන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ කටයුතු ඉදිරියට සිදුවෙමින් පවතිනවා. මේ වෙනකොට රට පුරා පූර්ණ නිවාස හානි වෙච්ච පවුල් දහසකට ආසන්න සංඛ්‍යාවකට මූල්‍යාධාර ලබා දීමේ කටයුතු ආරම්භ කර තිබෙනවා. එම නිවාස ගොඩනැඟීමේ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. 2026 සිංහල-හින්දු අලුත් අවුරුදු දවසේ ජනාධිපතිතුමා අවුරුදු චාරිත්‍ර සැමරුවේ "දිට්වා" සුළි කුණාටුවෙන් හානියට පත්ව නැවත ගොඩ නඟන ලද නිවසකයි. ඒ පවුලේ අයත් එක්ක තමයි එතුමා අවුරුදු චාරිත්‍ර චාරිත්‍ර ඉටු කළේ. අපි ඒ නිවාස ගොඩනැඟීමේ කටයුතු වේගවත් කරලා තිබෙනවා. සමහර පවුල්වලට තිබුණු ඉඩමේ නිවස හදාගන්න බැහැ. ඒ පවුල් සඳහා රජයේ ඉඩම් ලබා දීලා තිබෙනවා. ඉඩම් ලබා දෙන්න යනකොට අපි දන්නවා, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය දීර්ඝයි කියලා. සාමාන්‍යයෙන් අවුරුදු ගණනක් ගතවෙනවා. නමුත් මේ තිබෙන හදිසි තත්ත්වය මත අපි අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙක් පත් කරලා තිබෙනවා. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාට පුළුවන්, ඒ කටයුතු පහසු කරන්න. ඒ නිසා, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය දීර්ඝ ක්‍රියාවලියක් කරගන්නේ නැතිව මේ නීතිය, මේ තත්ත්වය පාවිච්චි කරලා කඩිනමින් ඉඩම් බෙදා දීමේ කටයුතු පහසු කරගෙන තිබෙනවා.

සමහර පවුල්වලට තිබුණු ඉඩමේ ගෙයක් හදාගන්න බැහැ. ඒ නිසා මේ ලද මුදලින් ඔවුන් හොඳ නිවසක්, ඉදිකර ගත් නිවසක් අරගෙන තිබෙනවා. අපි පූර්ණ නිවාස හානි වෙච්ච පවුල් දහසකට ආසන්න ප්‍රමාණයකට මේ වෙනකොට ආධාර මුදල් ලබා දීලා තිබෙනවා. සමහර පවුල් නිවසක් මිලදී ගෙන තිබෙනවා. සමහර පවුල්වලට රජයෙන් ඉඩම් ලබා දීලා තිබෙනවා. ඒවායේ ඉදිකිරීම් කටයුතු සිදුකරගෙන යනවා. ඒ වාගේම අර්ධ හානි වුණු නිවාස 10,000කට ආසන්න පවුල් සංඛ්‍යාවකට ආධාර මුදල් ගෙවීමේ කටයුතු මේ වෙනකොට අවසන් කරලා තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුව වෙලාවේදී අපි ප්‍රකාශයට පත් කළා, ගංවතුර ගෙදරට ආවා නම් රුපියල් 25,000ක දීමනාවක් ලබාදෙන බව. ගෙදර ගෘහ භාණ්ඩවලට හානියක් සිදු වුණොත් රුපියල් 50,000ක දීමනාවක් ලබා දුන්නා. ඒ වාගේම දුවා දරුවන්ගේ පොත්පත් හානියට පත් වුණා නම් රුපියල් 10,000ක දීමනාවක් ජනාධිපති අරමුදලෙන් ලබා දුන්නා. ඒ වාගේම තමන්ගේ නිවසේ ජීවත්වෙන්න බැරි පවුල්වල අය කුලියට හෝ නෑදෑ ගෙදරක නැවතුණොත් මාසයකට රුපියල් 25,000ක් ලබා දෙන්න කටයුතු කළා. ඒ විධියට දීමනා ගොඩක් දුන්නා. මේ දීමනා සියල්ල ගෙවන්න සිද්ධ වුණේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරි යාන්ත්‍රණය හරහායි. ඒ නිසා ඔවුන්ට මාස ගණනක් යනකම් විවිධ දීමනා විවිධ ප්‍රමාණයන්ගෙන් ගෙවන්න සිදුවුණා. සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පවුල් සිය ගණනකට දීමනා ලබා දෙන්න සිද්ධ වුණු නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට වැඩ වැඩි වුණා.

මැදපෙරදිග යුද තත්ත්වය ඇති වුණාට පස්සේ අපි ඉන්ධන සඳහා ඉන්ධන කෝටා ක්‍රමය, QR ක්‍රමය හඳුන්වා දුන්නා. සමහර කණ්ඩායම්වලට ඉන්ධන නිකුත් කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය ඕනෑ වුණා. ඒ නිසා ප්‍රාදේශීය කාර්යාලවල වැඩ වැඩි වුණා. ඒ නිසා හානි වෙච්ච නිවාස වෙනුවෙන් වන්දි ගෙවීමේ ක්‍රියාවලිය යම් අඩාළත්වයකට පත් වුණා. ජනාධිපතිතුමාම ඒකට මැදිහත් වෙලා, ඒ සියලුදෙනා එකතු කරගෙන, දිස්ත්‍රික් ලේකම්වරුන් එක්කත් කිහිප වතාවක්ම සාකච්ඡා කරලා මේ කටයුතු වේගවත් කර තිබෙනවා. මැයි මාසය ඇතුළත - අප්‍රේල් අවුරුද්දෙන් පස්සේ සති කිහිපය ඇතුළත - නිවාස හානි සඳහා කරන ගෙවීම් වේගවත් වෙලා තිබෙනවා. එහි වර්ධනයක් තිබෙනවා. මේ මාසය ඇතුළත නිවාස පිළිසකර කර ගැනීම සඳහා තවත් පවුල් විශාල සංඛ්‍යාවකට වන්දි ලබා දෙන්න, ඒවායේ වැඩ කටයුතු වෙනුවෙන් උදවු කරන්න අපට පුළුවන් වෙයි කියලා අපි හිතනවා.

විශේෂයෙන්ම නිවාස වන්දි ගෙවීමේදී යම් ප්‍රමාදයක් තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් වැඩ වැඩි බව ඇත්ත; සංකීර්ණ ක්‍රියාවලියක් තිබෙන බව ඇත්ත; ලක්ෂ ගණනක්, මිලියන ගණනක්, කෝටි ගණනක් වන්දි ගෙවනකොට

ඔවුන් පරිස්සම් විය යුතු බව ඇත්ත. නමුත්, සමහර තැන්වල සමහර නිලධාරීන් තවමත් හිතාගෙන ඉන්නවා, මේ ගෙවන වන්දි ප්‍රමාණය වැඩියි කියලා. සමහර කට්ටියට ඒක දරාගන්න බැරි වෙලා තිබෙනවා. ඔය කියන ප්‍රකාශ ඇතුළේ තිබෙන්නේ ඒක. අපි "දිට්වා" ව්‍යසනයෙන් ජනතාවට ලබා දුන් සහන, ජනතාව දිහා බලපු විධිය සමහර අයට දරාගන්න බැහැ. ඒ නිසා අපි කරන මේ කටයුතු ගැන වහන්න උත්සාහ කරනවා. විවිධ චෝදනා, විවිධ බොරු කතන්දර ගොතලා මේ ආණ්ඩුව විසින් ජනතාව සඳහා කරන වැඩ කටයුතු විවිධ දේවල් හරහා වළක්වන්න හදනවා. මෙහෙම නේ ගරු මන්ත්‍රීතුමනි, සමහර ඒවා තිබෙනවා අසත්‍ය දේවල් කියන්න පුළුවන්. හැබැයි, ඒ කාරණාව අපට ඔප්පු කරන්න පුළුවන්. හෝමාගම නැන්දම්මාගේ ගිණුමත් ඒ වාගේ එකක්. කිව්වා, ඔප්පු කරගන්න බැහැ. දැන් කුමාර ජයකොඩිගෙන් අහන්න කියනවා, දෙකයි පනහේ වැඩ කරන්න එපා කියනවා, මගේ කට වහන්න එපා කියනවා. ඒවා බොරු. තවත් සමහර ඒවා තිබෙනවා, අසත්‍ය මතවාද. අසත්‍ය මතවාද ගෙනාපුවාම තිබෙන්නේ තර්කයක්; ඒ ගැන සාකච්ඡාවක්; කරුණු දැක්වීමක්. මේ විපක්ෂය හරි සමත්, මෙවැනි මතවාද ගොඩ නහන්න.

ගුණාත්මකභාවයෙන් අඩු ගල් අඟුරු ගෙනාවා කියන එකට "ගල් අඟුරු වංචාවක්" කියලා පුන පුනා කියලා සමාජයට දැම්මා. ඊට පස්සේ ඒකට එක එක කෑලි ඇමුණුවා; එක එක කතන්දර ගෙතුවා. ඒක මහා කතන්දරයක් විධියට කියනවා, කියනවා, කියනවා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් පූර්ණ බලැති කොමිෂන් සභාවක් පිහිටුවා තිබෙනවා. ඒ නිසා ඒ දේවල් ඒකට කියන්න. අපි බලාගෙන ඉන්නවා. මෙතැනදී කිව්වා, කුමාර ජයකොඩි ඇමතිතුමා කප්පම් ගත්තා කියලා. කොමිස් ගත්තා කියලා කිව්වා. එම කොමිෂන් සභාවට ගිහිල්ලා ඒවා කියනවාද, නැද්ද කියලා අපි බලාගෙන ඉන්නවා. හෝමාගම නැන්දම්මාගේ ගිණුම ගැන කියනවාද, නැද්ද කියලා අපි බලාගෙන ඉන්නවා. ඒවා කිව්වේ නැත්නම්, "එදා කිව්වේ බොරු නේද, ඒවා කොමිෂන් සභාවට කිව්වේ නැහැ නේද, ජනතාව රැවැට්ටුවා නේද?" කියලා අපි සදාකාලිකව ප්‍රශ්න කරනවා; හැමදාම ප්‍රශ්න කරනවා. ගල් අඟුරු සිද්ධිය සම්බන්ධයෙන් පූර්ණ බලැති කොමිෂන් සභාවක් පත් කළාට පස්සේ ඒකෙන් පැනලා යන්න වෙන කථාවකට මාරු වෙන්න එපා. මහා භාණ්ඩාගාරයේ ඩොලර් මිලියන 2.5ක ප්‍රශ්නයත් එහෙමයි. සාමාන්‍ය ජනතාවට මේවා තේරෙන්නේ නැහැ. මේක සංකීර්ණ ක්‍රියාවලියක්. මේවා විශේෂිත වූ ආයතනවල සිදුවන ගනුදෙනු. මේ සම්බන්ධයෙන් හැමෝටම අත්දැකීම් නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ප්‍රබන්ධයක් ගොඩ නහන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් ප්‍රබන්ධයක් ගොඩ නහනවා; කතන්දර ගොඩ නහනවා. මේක හැමදාම වචනවා.

අර සිද්ධිය සම්බන්ධයෙන් බොරු JMO report එකක් පෙන්වමින්, විශේෂඥ අධිකරණ වෛද්‍යවරු හතරදෙනෙකුගේ කමිටුවකින් කරපු පරීක්ෂණය මෙතැනදී challenge කරනවා. එම නිලධාරියාගේ බිරිඳ පොලීසියට පැමිණිලි කළා කියලා බොරු කියනවා. මට කියන්න, මේ postmortem එකෙන් පස්සේ පැමිණිලි කර තිබෙනවාද නැද්ද කියලා. සාමාන්‍ය සමාජයට, සාමාන්‍ය මිනිස්සුන්ට තේරෙන්නේ නැති, ගෝචර වෙන්නේ නැති දේවල් ඇදගෙන මහා මිථ්‍යාවක් ගොඩ නහනවා. ඒ නිසා බොරු කිව්වොත් අපට ඔප්පු කරන්න පුළුවන්. අසත්‍ය මතවාදයක් ගෙනාවොත් ඒකට සාකච්ඡාවක් දෙන්න ඕනෑ. මේ විපක්ෂය හරි ශක්තිමත්, හරි වාචාලයි, හරි සද්දෙට එවැනි කථා කියන්න පුළුවන්. එකක් ඉවර වෙනකොට එකක්; එකක් ඉවරවෙනකොට එකක්. මතක තියාගන්න, ජාතික ජන බලවේගය අවුරුද්දයි මාස හතක් ඇතුළත පසුගිය අවුරුදු හතර පහක කාලය තුළ අපේ රටේ වෙච්ච නැති වැඩ කරලා තිබෙන බව.

ඔබතුමන්ලා කිව්වා, 76 වසරක සාපය ගැන. 76 වසරක සාපය තමයි රට බංකොලොත් කරලා නතර වුණේ. ඒක තමයි සාපය. ඒ බංකොලොත් කරපු ආර්ථිකය ගොඩ ගත්තේ අපි. 2025 වසරේ ආර්ථිකය පිළිබඳ ශේෂ පත්‍රය බලන්න. ඒ සංඛ්‍යා දත්ත බලන්න. අපි ආර්ථිකය ස්ථාවර කරලා තිබෙන්නේ. නතර වෙලා තිබුණු හැම දැවැන්ත සංවර්ධන ව්‍යාපෘතියක්ම නැවත ආරම්භ කරලා තිබෙන්නේ. 2026 වසර කියන්නේ දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ඉදිරියට ගෙන යන වසරක්. 2027 වසර කියන්නේ අපේ රටේ සංවර්ධනයේ නැවුම් පිම්මක් පනින වසරක්. ඒවා දරාගන්න බැහැ. ඒ නිසා කතන්දර කියන්න. ඔය කතන්දර ජනතාව අහන්නේ නැත. ඒකට ප්‍රතිචාරය තමයි, ලොකු උන්නැහේ නැඟිට්ටාම පාක්ෂිකයෝ නැඟිටලා යන එක. ප්‍රතිචාරය තේරුම් ගන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ නම ප්‍රකාශ කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තත්පර 30ක කාලයක් ලැබෙනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මගේ නම ප්‍රකාශ කළා, මරික්කාර් මන්ත්‍රීතුමා. මම හිතන විධියට, පව කියන එකේ උපත. 2024, - *[බාධා කිරීම්]* නැහැ, මට වෙලාව දෙන්න, ඔබතුමාගේ බොරුව, - *[බාධා කිරීම්]* මගේ නම කිව්වා. මම United Solar එකට award එකක් දුන්නා කියලා කිව්වා. මම මේ සභාවේදී අභියෝග කරනවා, පුළුවන් නම් ඔය කොළ ටිකත් අරගෙන ගිහිල්ලා CID එකට complain කරලා, මට විරුද්ධව පැමිණිල්ලක් කරන්න කියලා. මම නොකරපු දෙයක්. පුළුවන් නම් මෙතැන සභාගත කරන්න, ඔය ලියකියවිලි. *[බාධා කිරීමක්]* 2024 වසර වනකොට එම සමාගම, ඒකට ලබාගෙන තිබුණු provisional approval එකත් expire වෙලා සම්පූර්ණයෙන් ඉවත් වෙලා තිබෙන්නේ. බොරුවට මම දුන්නා කියලා මගේ නම ප්‍රකාශ කළා, ඔබතුමා. *[බාධා කිරීමක්]* සභාගත කරන්න. සභාගත කරලා පුළුවන් නම් CID එකට complain එකක් දාන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඒ නඩු වෙනයි. ඕක වෙනුවෙන් ගිහිල්ලා පුළුවන් නම් නඩුවක් දාන්න. මම අභියෝග කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.11]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පළමුවෙන්ම මම කියන්න ඕනෑ, ඉස්සෙල්ලා කථා කරපු ඇමතිවරයා ඊයේ පෙරේදා ඉපදුණාද දන්නේ නැහැ කියන එක. මොකද, එතුමන්ලා ආවාට පස්සේලු, මේ ආර්ථිකය සංවර්ධනය වුණේ කියලා කිව්වා. මම හිතන විධියට, මෙහෙම ඇමතිවරයෙක් ඉන්නවාද කියලා දන්නේත් එතුමා කථා කරනකොට විතරයි. පෙනෙන්න නැහැ.

[ගරු ජේ.සී. අලවතුවල මහතා]

නිවාස ඇමති කොහේද දන්නේ නැහැ ගෙවල් හැදුවේ. "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා දැන් මාස හයක් ගතවෙලා තිබෙනවා. මාස හයක් ගත වෙලා තිබෙනවා, නමුත් ඒ තත්ත්වයට හසු වුණු පුද්ගලයින් අදත් තවම අනාථභාවයට පත් වෙලා ඉන්නේ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා මේ අය අද ලජ්ජා වෙන්න ඕනෑ, හදිසි නීතිය නම් දිගු කරනවා. අපිත් කුණාටුව ආපු වෙලාවේ කිව්වා, ඒ සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාදාමය ගන්න, මෙවැනි හදිසි අවස්ථාවක් ප්‍රකාශ කරන්න කියලා. දැන් මේක දිගින් දිගටම මාස හයෙන් හයට දිගු කරගෙන යනවා. නමුත් කුණාටුවට අහුවුණු ජනතාවට වෙච්ච සෙතක් නැහැ. මේ වනකොට ඒ අය ඉතාම අසහනකාරී තත්ත්වයකට පත් වෙලා තිබෙනවා.

මුලින්ම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් මේ අයට කිව්වා, ඔවුන්ගේ ගෙවල්වල ජීවත් වෙන්න එපා කියලා. ඒ නිසා ඒ අය කුලී ගෙවල්වලට ගියා. ටික කාලයක් ඒකට ගෙවීම් කළා. ඊට පස්සේ ආපසු වාර්තා දීලා දැන් ඒ අයට නැවත හිටපු තැන්වලට යන්න වෙලා තිබෙනවා. ආපසු වැස්සක් එනකොට මේ නාය ගිය ප්‍රදේශවල ඒ හැම කෙනාටම ඉතාම බයෙන් තමයි ජීවත් වෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මේක තමයි ඇත්ත කථාව. ආණ්ඩුව ලජ්ජා වෙන්න ඕනෑ, මාස හයක් ගිහිල්ලාත් මේ සුළි කුණාටුවට හසු වුණු වින්දිතයින්ට, එහෙම නැත්නම් ඒ අසාධාරණයට ලක් වූ අයට සාධාරණයක් ඉෂ්ට කර ගන්න බැරි වීම ගැන. මෙතැන ඇවිල්ලා කථා කළා, ලජ්ජා වෙන්න ඕනෑ අර ඇමතිවරයා. නිවාස ඇමති කියලා කියනවා. එක ගෙයක් හදලා ජනාධිපතිතුමා ගිහිල්ලා, අවුරුදු කෑවා. නමුත් මේ ව්‍යසනය නිසා කොච්චර නිවාස ප්‍රමාණයකට හානි වෙලා තිබෙනවාද?

අපේ ප්‍රදේශය ගත්තාම නිවාස විතරක් නොවෙයි, ඒ ගම්මානවලට යන මාර්ග පවා විනාශ වෙලා තිබෙනවා. මගේ මාවතගම ආසනයේ එදිරිගුණරත්න මාර්ගය සකස් කරන්න හිතලාවත් නැහැ. ඒ ප්‍රදේශවල ජනතාව ඉන්න ගම්මාන ගණනාවක් තිබෙනවා. මේ මාර්ගය එහෙමපිටින්ම කඩාගෙන ගිහිල්ලා තිබෙනවා. තව උදාහරණ ඕනෑ තරම් තිබෙනවා. හිරියාල ආසනය, දොඩම්ගස්ලන්දේ මීරිස්සල, බඹරාකන්ද ප්‍රදේශවලට යන මාර්ග තිබෙනවා. මේ ගම්වල අයට තමන්ගේ අත්‍යවශ්‍ය කාරණා ඉෂ්ට කර ගන්න තවම යන්න බැරි තත්ත්වයක් තිබෙන්නේ, මාර්ග අවහිර වෙලා තිබෙන නිසා. මේ එකකවත් වැඩ මේ කියපු ආකාරයට ආරම්භ කරලා නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සම්බන්ධීකරණ රැස්වීම්වලට ගියාම අපට පැහැදිලිව පෙනෙනවා, නිවාස අහිමි වෙච්ච අයට ඒ නිවාස හදන්න තවම ඉඩම්වත් තෝරලා නැහැ කියන එක. දැන් මාස හයක් ගත වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ, මේ නොහැකියාව තුළ ජනතාව විශාල අමාරු තැනකට වැටිලා තිබෙනවා.

මේ ආණ්ඩුව පත් වෙලා අවුරුදු එකහමාරක් යනකොට - අවුරුදු දෙකක් ගතවීමට මත්තෙන් - අද මොන තරම් ප්‍රශ්න ගණනාවක් ඇවිල්ලා තිබෙනවාද? දැන් ඇමතිවරයෙක් ගල් අඟුරු ගැන කථා කළා. ගල් අඟුරු ගැන කථා කරද්දි මුලින්ම කිව්වේ මේ බාල ගල් අඟුරු නොවෙයි කියලායි. එහෙම එකක් නැහැ කිව්වා. මේ වනකොට රුපියල් කෝටි ගණනක, බිලියන ගණනක පාඩුවක් වෙලා තිබෙනවා. හෙට අනිද්දා විදුලි බිල වැඩි කරන්න යනවා. අනිවාර්යයෙන්ම ඒ විදුලි බිල වැඩි කරන්න වෙන්නේ, මෙලෙස බාල ගල් අඟුරු ගෙන්වලා ඇති කරපු විනාශය නිසායි.

අද විපක්ෂයට චෝදනා කරනවා, බොරු කියනවා කියලා. තමුන්නාන්සේලා තමයි බොරු කියලා මේ රටේ ජනතාව රැවැට්ටුවේ. තමුන්නාන්සේලා බලයට ආවාම ඉන්ධන මිල අඩු කරනවා කිව්වා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 500කට ආසන්න වෙලා තිබෙනවා. ඒ නිසා අද ජනතාව ඉතාම අමාරු තැනකට වැටිලා තිබෙන්නේ. තමුන්නාන්සේලා ඒක පිළිගන්න ඕනෑ. අද ජනතාවට ජීවත් වෙන්න බැරි වාතාවරණයක් උදා වෙලා තිබෙනවා. මේ රටේ දුප්පතුන්ගේ ප්‍රමාණය තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ආවාට පස්සේ, හිටියාට වඩා විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. අද මේ රටේ වැඩ කරන ජනතාව, විශේෂයෙන්ම රාජ්‍ය සේවකයා පවා දුප්පත් ගණයට වැටිලා තිබෙනවා. මොකද, ඒ අයට ජීවත් වෙන්න බැරි තැනට භාණ්ඩ මිල ඉහළ යන නිසා. අද වනකොට ගෑස් මිල ආයෙත් වැඩි වෙලා තිබෙනවා. ජනතාවට එදිනෙදා ජීවත් වන්න අවශ්‍ය හැම භාණ්ඩයකම වාගේ මිල තමුන්නාන්සේලා බලයට ආ පසු ඉහළ ගිහිල්ලා තිබෙනවා ජනතාවට මේවා සම්බන්ධයෙන් සහන දෙන්න කටයුතු කරනවා වෙනුවට තමුන්නාන්සේලා අද මොකක්ද කරන්නේ?

අද භාණ්ඩාගාරයේ ඇති වෙලා තිබෙන ඩොලර් මිලියන 2.5ක සිද්ධිය තමුන්නාන්සේලා පිළිගන්නේ නැතුව, ඒ පිළිබඳව පාර්ලිමේන්තුව දැනුවත් කරන්නේ නැතුව කටයුතු කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් ඕනෑම කෙනෙකුට තේරෙනවා, එතැන වංචාවක් සිදු වෙලා තිබෙනවා කියලා. ඒ සම්බන්ධයෙන් අහිංසක නිලධාරියෙකුගේ ජීවිතය නැති වුණා.

ඒ වාගේම අපි දැක්කා, මේ වනකොට තැපැල් දෙපාර්තමේන්තුවේත් ගෙවීම් සම්බන්ධයෙන් වැරදි ගණනාවක් සිද්ධ වෙලා තිබෙන බව. මේ වනකොට තමුන්නාන්සේලා යටතේ තිබෙන හැම අමාත්‍යාංශයකම වැරදි ගණනාවක් සිදු වෙලා තිබෙනවා. ගිය අප්‍රේල් මාසයේ සහනාධාර ගෙවීමේදී කුරුණෑගල දිස්ත්‍රික්කයට හා කෑගල්ල දිස්ත්‍රික්කයට තමුන්නාන්සේලා වැරදි විදියට ගෙවලා තිබෙනවා. ඒ ප්‍රදේශවල ජනතාවගෙන් ඇහුවාම වැඩියෙන් ලැබුණේ නැහැ කියනවා. නමුත්, රුපියල් මිලියන 500කට වැඩි මුදලක් තමුන්නාන්සේලා භාණ්ඩාගාරයෙන් වැඩියෙන් ගෙව්වා කියලා සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා හැම අමාත්‍යාංශයකම ජනතාවගේ මුදල්, ජනතාවට ලැබෙන්න තිබෙන දේවල් තමුන්නාන්සේලාගේ වැරදි නිසා, එහෙම නැත්නම් වංචාව නිසා අස්ථානගත වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඔබතුමාට වෙන් වූ කාලය අවසන්. දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මම පැහැදිලිවම කියනවා, තමුන්නාන්සේලාගෙන් ජනතාව බලාපොරොත්තු වුණේ මේක නොවෙයි කියන එක. තමුන්නාන්සේලා බලයට ආවේ 76 වසරක් ගැන කථා කරලායි. ජනතාවට සහන දෙනවා කියලායි ආවේ. නමුත් අද කිසිම ජන කණ්ඩායමකට, එහෙම නැත්නම් මේ රටේ ජීවත් වන සාමාන්‍ය ජනතාවට, රජයේ සේවකයින් ඇතුළු අනෙකුත් කිසිම කෙනෙකුට සහනයක් ලබා දෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න තමුන්නාන්සේලාට බැරි වෙලා තිබෙනවා. "දිට්වා" සුළි කුණාටුවෙන් අසරණභාවයට පත් වුණු අයට තමුන්නාන්සේලා ලබා දෙනවා කියපු කිසිම දෙයක් මේ වනකොට ලබා දීලා නැහැ.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.19]

**ගරු ක්‍රිෂ්ණන් කලෛයිචෙල්වි මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) கிருஷ்ணன் கலைச்செல்வி)
(The Hon. (Ms.) Krishnan Kalaichelvi)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, பொதுமக்கள் பாதுகாப்புச் சட்டத்தின் கீழான தீர்மானம், அத்தியாவசிய பொதுச் சேவைகள் சட்டத்தின் கீழான தீர்மானம் ஆகியவை தொடர்பான விவாதம் ஆரம்பித்திருக்கும் வேளையில், இவை சம்பந்தமாகப் பேசுவதற்கு முன்பாக தற்போது மலையக மக்களுக்கு அங்குள்ள நிருவாகங்கள் கொடுக்கும் அச்சுறுத்தல் தொடர்பாக ஒருசில வார்த்தைகள் கூறலாமென நினைக்கின்றேன்.

சென்ற மாதம் 21ஆம் திகதி இரத்தினபுரி மாவட்டத்தில் நீலகாமம் என்ற தோட்டத்திலுள்ள தோட்டத்தொழிலாளி ஒருவருடைய வீட்டை குண்டர்களை அனுப்பி உடைத்து அடாவடித்தனமாக தேவையற்ற வேலையைச் செய்திருந் தார்கள். இது நாட்டிலுள்ள அனைவருக்கும் தெரியும். இன்று மலையக மக்கள் தொடர்பாக மாபெரும் குரல்கொடுத்துக் கொண்டிருக்கும் எதிர்க்கட்சியிலுள்ள மலையகத்தைப் பிரதிநிதித்துவம் செய்யும் தலைவர்களுக்குக் கூறவேண்டிய ஒன்றிருக்கின்றது. அதாவது, இந்தப் பிரச்சினை ஏற்பட்ட வுடனேயே பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் பிரதி அமைச்சர் கௌரவ சுந்தரலிங்கம் பிரதீப் அவர்களுடன் இரத்தினபுரி மாவட்டப் பாராளுமன்ற உறுப்பினர்கள் பலர் ஒன்றிணைந்து அவ்விடத்துக்குச் சென்று அப்பிரச்சினை தொடர்பாக ஆராய்ந்துபார்த்து அதற்கான தீர்வைப் பெற்றுக் கொடுப்பதற்கான நடவடிக்கையை ஆரம்பித்திருந்தார்கள். அது மாத்திரமல்ல, எமது நீதி அமைச்சருடன் கதைத்து, அடாவடித்தனமாகச் செயற்பட்ட அந்தத் தோட்ட முகாமையாளருக்கு எதிராக சட்டரீதியான நடவடிக்கையையும் எடுத்துள்ளார்கள்.

இன்று காலையில் மஸ்கெலியா, மொக்கா தோட்டத்தில் மிட்லோஜன் என்ற பிரிவில் காவற்காரரை அந்தத் தோட்டத்தின் உதவி முகாமையாளர் தாக்கியதால் தற்போது அவர் மஸ்கெலியா வைத்தியசாலையில் சிகிச்சை பெற்று வருகின்றார். இந்தப் பிரச்சினை ஏற்பட்டபோதும் அந்தப் பிரதேசத்திலுள்ள தேசிய மக்கள் சக்தியின் பிரதேச சபை உறுப்பினர்கள், அமைப்பாளர்கள் மற்றும் அகில இலங்கை தோட்டத் தொழிலாளர் சங்கத்தின் தலைவர் என அனைவரும் ஒன்றிணைந்து சென்று அவரை வைத்தியசாலையில் அனுமதித்து, அது தொடர்பாக எமது நீதித்துறை அமைச்சரிடம் பேசி, சம்பந்தப்பட்ட பொலிஸ் நிலையத்துக்கு அறிவித்து, தாக்கியவரையும் கைதுசெய்து நீதிமன்றத்தில் ஆஜராக்கி யுள்ளார்கள். இதுபோன்ற சம்பவங்கள் ராகலை, டெல்மார் தோட்டத்திலும் நடந்திருக்கின்றன. மலையக மக்களுக்குத் தொடர்ச்சியாக அச்சுறுத்தல் கொடுக்கும் தோட்ட நிருவாகத்துக்கு எதிராக பெருந்தோட்டத்துறைக்குப் பொறுப் பான அமைச்சரும் பிரதி அமைச்சரும் அதேபோல் அந்தந்தப் பிரதேசங்களிலுள்ள மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் உறுப்பினர்களும் ஒன்றிணைந்து இவ்வாறான பிரச்சினைகள் தொடர்பாக உரிய நடவடிக்கைகளை மேற்கொண்டு வருகின்ற வேளையிலே, எதிர்க்கட்சியில் இருக்கும் எமது மலையகத் தலைவர்கள் இவ்விடத்தில் மாபெரும் சத்தத்துடன் மலையக மக்களின் பிரச்சினை தொடர்பாகக் குரல்கொடுப்பதைப் பார்க்கின்றோம்.

இது விளையாட்டுத்தனம் என்றால் மிகையாகாது. இவ்வளவு காலமும் மலையக மக்களை எவ்வாறு இந்த மலையகத் தலைவர்கள் பயன்படுத்தினார்கள் என்பது பற்றி உங்கள் அனைவருக்கும் தெரியும்! இலங்கையின் வரலாற்றில் முதன்முறையாக, மலையக மக்களைப் பிரதிநிதித்துவம் செய்யும் அனைத்துத் தொழிற்சங்கங்களையும் கட்சிகளையும் பின்தள்ளிவிட்டு, மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமை யில் மலையக மக்கள் அனைவரையும் ஒன்றிணைத்து, கடந்த 01ஆம் திகதி மாபெரும் தொழிலாளர் தினக் கூட்டத்தை நுவரெலியா மாவட்டத்தில் நாங்கள் நடாத்தினோம். மலையக மக்கள் இந்த அரசாங்கத்தை எதிர்க்கின்றார்கள், அவர்களது பிரச்சினைகள் தீர்க்கப்படவில்லையெனக் கூக்குரலிடும் மலையகத் தலைவர்களுக்கு நாங்கள் இதனை விசேடமாகக் கூற வேண்டும். தனித்தனியாக அல்ல, ஒன்றிணைந்துகூட தொழிலாளர் தினத்தைக் கொண்டாட முடியாத அளவுக்கு எமது மலையக மக்கள் மலையக அரசியல்வாதிகளைப் புறக்கணித்துள்ளார்கள் என்பதுதான் உண்மை! அதனால்தான் அவர்கள் இவ்விடத்தில் சத்தம் போட்டு, "இதுதான் மலையக மக்களின் பிரச்சினை!" என்று கூறுகின்றார்கள். இன்று இந்தச் சபையில் சத்தமிடும் மலையகத் தலைவர்கள் சென்ற அரசாங்கங்களில் அமைச்சர்களாக, பிரதி அமைச்சர்களாக இருந்தவர்கள் என்பது எங்கள் எல்லோருக்கும் தெரியும்! இவர்கள் இப்போது தேசிய மக்கள் சக்தி - NPP - அரசாங்கத்துக்குக் கொடுக்கும் அழுத்தத்தைச் சென்ற காலங்களில் கொடுத்திருந்தால், மலையகத்தில் வாழும் நாங்கள் இதைவிடவும் சந்தோசமானதொரு வாழ்க்கையை வாழ்ந்திருப்போம். அப்போது அமைதியாக இருந்துவிட்டு, இன்று மலையக மக்களின் பிரச்சினைகளுக்குத் தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டுமென தேசிய மக்கள் சக்தி அரசாங்கத்துக்கு அழுத்தம் கொடுக்கிறார்கள்.

மலையக மக்கள் தொடர்பாகப் பேசும் இவர்கள் சென்ற காலங்களில், தேசிய மக்கள் சக்தி - NPP - அரசாங்கத்தில் மலையக மக்களுக்குச் சம்பள உயர்வு கிடைக்காது என்றார்கள். ஆனாலும், நாங்கள் அதனை வழங்கியுள்ளோம். அவர்களது அரசியல் இருப்பு மலையகத்தில் தங்கியுள்ளதால், அரசாங்க உறுப்பினர்கள் தலையிட்டு மலையக மக்களின் பிரச்சினைகளைத் தீர்த்துக்கொண்டு வரும்பொழுது, அந்தப் பிரச்சினைகள் தொடர்பில் கதைத்து, ஊடகங்கள் மூலம் தமக்கான பிரசித்தத்தைப் பெற்றுக்கொள்ள முயற்சிக்கி றார்கள். தற்பொழுது, மலையக மக்கள் மிகத் தெளிவாக இருக்கிறார்கள்; இந்த நாட்டின் மாண்புமிகு சனாதிபதி அவர்கள்மீது முழு நம்பிக்கை வைத்திருக்கிறார்கள் என்பதை அவர்களுக்குக் கூற வேண்டும். தங்களின் பிரச்சினைகளைத் தீர்க்கக்கூடிய ஒரே அரசாங்கம் தேசிய மக்கள் சக்தி அரசாங்கம் என்ற நம்பிக்கையுடன் மலையக மக்கள் இருந்ததனால்தான் இம்மாதம் 01 ஆம் திகதி அவர்கள் அனைத்து மலையக அரசியல்வாதிகளுக்கும் தக்கதொரு பாடத்தைப் புகட்டினார்கள்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் அவசரகாலச் சட்டத்தை நீடிப்பது தொடர்பான விவாதம் நடைபெறுகின்றது. கடந்த காலங்களில் அவசரகாலச் சட்டம் இந்த நாட்டில் எவ்வாறு பயன்படுத்தப்பட்டது என்பதை நாங்கள் குறிப்பிட வேண்டிய அவசியமில்லை. இன்று எமது அரசாங்கத்துக்கு விரல்நீட்டு பவர்கள் சென்ற காலங்களில் இச்சட்டத்தை எதற்காகப் பயன்படுத்தினார்கள் என்பது எங்களுக்கு நன்றாகவே

[ගරු ක්‍රිෂ්ණන් කලෙයිචෙල්වි මෙනෙවිය ]

தெரியும். மாணவர்கள், தொழிலாளர்கள், பெண்கள் தமது உரிமைகளைக் கேட்டு வீதிக்கு இறங்கும்பொழுது, அவர்களை அடக்குவதற்காகவே அவசரகாலச் சட்டத்தைப் பயன்படுத்தினார்கள்.

கௌரவ சத்துரி கங்கானி அவர்கள் கூறியதுபோல, இந்த நாட்டில் ஏற்பட்ட 'சுனாமி' அனர்த்தத்தைவிடவும் 2025ஆம் ஆண்டு ஏற்பட்ட 'தித்வா' சூறாவளியால் முழு நாடும் பாதிப்படைந்தது. இதனால் 2-3 நாட்கள் நாடு ஸ்தம்பித மடைந்து இருந்தது. 'தித்வா' சூறாவளியால் பாதிக்கப்பட்ட மக்களின் தேவைகளை ஒவ்வொன்றாகக் கூற நேரம் போதாமல் உள்ளது. ஓரிரு நாட்களுக்குள் அவர்களுக்கு இயல்பு வாழ்க்கையை ஏற்படுத்திக் கொடுப்பதற்கு இந்த அவசரகாலச் சட்டம் பயன்படுத்தப்பட்டது. எதிர்காலத்தில் இந்த வேலைத்திட்டங்களைச் சரியான முறையில் கொண்டுசெல்ல வேண்டுமென்றால், அவற்றை அரச அதிகாரிகள்மூலம் துரிதப்படுத்த வேண்டுமென்றால் கட்டாயம் இந்த அவசரகாலச் சட்டத்தை நீடிக்க வேண்டும். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அவசரகாலச் சட்டத்தை நீடிக்கும் இந்தத் தீர்மானமானது, நாட்டின் இன்றைய முக்கிய தேவையாகவே கருதப்படுகின்றது. எனவே, நாம் அவசரகாலச் சட்டத்தைக் கட்டாயம் நீடித்துக்கொள்ள வேண்டும். 'தித்வா' சூறாவளியால் பாதிக்கப்பட்ட மக்களுக்கான திட்டங்களைச் சரியாக நடைமுறைப் படுத்துவதற்குக் கொண்டுவரப்பட்டுள்ள இந்தத் தீர்மானம் வரவேற்கக்கூடியது எனக் கூறி, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු කේ. සුජිත් සංජය පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நிஹால் அபேசிங்ஹ)
(The Hon. (Dr.) Nihal Abeysinghe)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු තුෂාරි ජයසිංහ මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) துஷாரி ஜயசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. (MRS.) THUSHARI JAYASINGHA left the Chair and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 3.30]

**ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு கே. சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. K. Sujith Sanjaya Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කිරීමට අදාළ යෝජනාව ඉදිරිපත් කළ ඇමතිතුමාත්, ඒ සම්බන්ධව අදහස් පළ කළ ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු හැම කෙනාමත් හදිසි නීතිය දීර්ඝ කිරීම සාධාරණීකරණය කරන්න තමයි කථා කළේ. අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුව ඇති වුණු අවස්ථාවේදී හදිසි නීතිය උපයෝගී කර ගන්න ඕනෑය කියලා අදහස් දැක්වූයේ ගරු විපක්ෂ නායකතුමා බව. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේත්, අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේත් සහයෝගයෙන් තමයි තමුන්නාන්සේලාට මේ කටයුත්ත කරන්න අවකාශය ලැබුණේ. අපි දන්නවා, "දිට්වා" සුළි කුණාටුවට අපේ රට මුහුණ දීලා මේ වනවිට මාස හයක් පමණ ගත වී තිබෙන බව. නමුත් එයින් හානියට පත් වුණු ජනතාවට තමුන්නාන්සේලාගෙන් බලාපොරොත්තු වුණු සේවාව ලබා දෙන්න පුළුවන්කම ලැබුණාද කියන එක ගැන අපි කාටත් හිතන්න වෙනවා. මේ සම්බන්ධව අදහස් දැක්වූ හැම කෙනාම කථා කළේ, රුපියල් 25,000ක් දෙන්න කටයුතු කළා; රුපියල් 50,000ක් දෙන්න කටයුතු කළා කියලායි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, මේ කාරණයත්. ඔබතුමන්ලා රුපියල් 25,000 සහ රුපියල් 50,000 ගණනේ දුන්නත්, විශේෂයෙන්ම ආපදාවට ලක් වුණු, ගෙවල් හානියට ලක් වුණු අයට රුපියල් ලක්ෂ පහක දීමනාවක් දෙනවා, ඒ වාගේම එවැනි හානිවලට ලක් වුණු අයට කිසිම තක්සේරුවකින් තොරව අදාළ මුදල් ලබා දෙනවා කියලා තමුන්නාන්සේලා එදා මේ රටේ ජනතාවට පොරොන්දු වුණා. ඊට අමතරව අපට මතකයි ගරු ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා කිව්වේ මොකක්ද කියලා. ඉඩමට රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා. ඒ වාගේම ගෙයක් හදා ගැනීම සඳහා තව රුපියල් ලක්ෂ 50ක් දෙනවා කිව්වා. නමුත් අද වනවිට මේ එකක්වත් යථාර්ථයක් බවට පත් වෙලා නැති බව තමුන්නාන්සේලා දන්නවා.

අපි දන්නවා, රුපියල් 25,000, රුපියල් 50,000 බැගින් ලබා දුන්නත්, විශේෂයෙන්ම අධිඅවදානම් ලෙස තහවුරු කර ඒ තැන්වලින් ඉවත් වෙන්න කියා නියෝග ලබා දී තිබෙන පවුල් ගණනාවක් අපේ පැතිවල ඉන්න බව. ඒ කිසිම කෙනෙකුට තවම ඉඩමක් ලබා දෙන්නවත්, නිවාසයක් ලබා දෙන්නවත් තමුන්නාන්සේලාට හැකියාවක් ලැබී නැති බව මම කියන්න ඕනෑ. විශේෂයෙන්ම මා නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ, යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විතරක් පවුල් 335කට අධික සංඛ්‍යාවක් සිටින ප්‍රදේශ අධිඅවදානම් සහිතයි කියා සලකුණු කර තිබෙනවා. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනවිට එක පවුලකට විතරයි නිවසක් ලබා ගන්න අවස්ථාව සැලසී තිබෙන්නේ කියන එක කනගාටුවෙන් වුණත් මට කියන්න සිදු වෙනවා. නොයෙකුත් ආකාරයේ සහන සැලසුවා කියා ඔබතුමන්ලා කිව්වාට, මේවා සම්බන්ධව අවධානය යොමු වෙලා නැහැ. ඒ නිසා අදාළ ගරු ඇමතිතුමන්ලාගෙන් මා ඉල්ලා සිටින්න කැමැතියි, මේවා ගැන සොයා බලන්න කියලා. ඒ වාගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ගොස් අධිඅවදානම්ය කියා ඉවත් කිරීමට ලකුණු කර තිබෙන පවුල්වලට සාධාරණ විධියට ඉඩමක් ලබා ගන්නට ඔබතුමන්ලා පොරොන්දු වුණු ආකාරයට මුදල් ලබා දීමේ වැඩ පිළිවෙළ කඩිනමින් ක්‍රියාත්මක කරන්න කියා තමයි මට කියන්න තිබෙන්නේ.

මීට මාස ගණනකට ඉස්සෙල්ලාත් අපි මේ තත්ත්වය සම්බන්ධව තමුන්නාන්සේලාට පැහැදිලි කර දුන්නා. නමුත් තමුන්නාන්සේලා කිව්වේ මොකක්ද? "අපි මේක ලබන මාසයේ කරනවා. ඊළඟ මාසය වෙනකොට මේ සියලු දේවල් සම්පූර්ණ

කරනවා" කියලා තමයි කිව්වේ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කියන්න තිබෙන්නේ මේකයි. තව මාස හයක් නොවෙයි, තව අවුරුද්දක් යනකම් මේ හදිසි නීතිය දීර්ඝ කර දුන්නා වුණත්, "දිට්වා" සුළි කුණාටුවෙන් හානි වුණු අයට සහන සලසන්න නම් තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ අනෙක් කටයුතු වාගේම තමයි මේකත්. මේ ආණ්ඩුව බලයට පත් වෙලා අද වනවිට අවුරුදු එකහමාරක් පමණ ගත වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා මේ රටේ ජනතාවට පොරොන්දු රාශියක් දුන්නා. නමුත් ඒ පොරොන්දු එකක්වත් තමුන්නාන්සේලාට ඉෂ්ට කරන්න බැරි වුණා. ඒ අනුව මේ නිවාස ලබා දීමේ වැඩ පිළිවෙළත් ඒ ආකාරයෙන්ම තමයි ක්‍රියාත්මක වෙන්නේ කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

මට කලින් කථා කළ මන්ත්‍රීතුමිය වතු කම්කරු ජනතාව ගැන සඳහන් කළා. වතු කම්කරු ජනතාවට සහන සැලසුවාලු; පඩි වැඩි කළාලු. ඒවා ඔක්කෝම හරි. නමුත් මම කියන්න ඕනෑ, ඔබතුමන්ලා විතරක් නොවෙයි, ඒ අයට පඩි වැඩි කර දුන්නේ කියන කාරණයත්. ඔබතුමන්ලා රුපියල් 400කින් පඩි වැඩි කළා තමයි. ඒකෙනුත් රුපියල් 200ක් තමයි කොම්පැනියෙන් දෙන්නේ. අනෙක් රුපියල් 200 දෙන්නේ රජයෙන්. මට කියන්න ඕනෑකම තිබෙන්නේ මේකයි. තමුන්නාන්සේලා දන්නවා, 2018, 2019 වාගේ කාලයේ වතු කම්කරුවෙකුගේ දෛනික වැටුප තිබුණේ රුපියල් 1,000ට බව. නමුත් අපි දන්නවා පසුගිය රජය විසින් රුපියල් 350කින් එකවර ඒ අයගේ වැටුප වැඩි කළ බව. පුළුවන් නම් තමුන්නාන්සේලා ඒක නැහැ කියන්න. රුපියල් 350ක් වැඩි කළා මීට අවුරුදු දෙකකට පමණ ඉස්සෙල්ලා. තමුන්නාන්සේලා මේ සම්බන්ධව ලොකු ප්‍රචාරයක් දීලා, වතු කම්කරුවන්ගෙන් ගෞරවයක් ලබා ගන්න උත්සාහ ගත්තාට, මම වතු කම්කරුවන්ට කියන්න කැමැතියි, මීට අවුරුදු ගණනකට ඉස්සෙල්ලා රුපියල් 350ක් තමුන්නාන්සේලාට වැඩි කර දුන්නේ නැද්ද කියා කල්පනා කර බලන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තව කාරණයක් කියන්න ඕනෑ. මේ අය වතු කම්කරුවන් ගැන කථා කරනවා. ඔබතුමාත් දන්නවා ඇති, ගෙවල් නැති වතු කම්කරුවන් පවා ඉන්නා බව. අපි දන්නවා, ඒ අය ලැයිම් කාමරවලින් ඉවත් කිරීමට තීරණය කර තිබෙන බව. මම නියෝජනය කරන යටියන්තොට මැතිවරණ කොට්ඨාසයේ පවුල් 50ක් ඉන්නවා, එක වත්තක. ඒ වාගේම මෙතුමියලා කථා කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ වෙවැන්ඩන් වත්තේත් පවුල් ගණනාවක් ඉන්නවා ඉවත් කරන්න ඕනෑය කියා තීරණය කරපු. නමුත් ඒ අයට තවම සාධාරණයක් ඉෂ්ට කරන්න කටයුතු කර නැහැ. ඒගොල්ලන්ට ගෙවල් දොරවල් හදා ගන්න විධියක් නැහැ. තමුන්නාන්සේලා නිකුත් කර තිබෙන චක්‍රලේඛ ඒකට හරස් වෙලා තිබෙනවා. ඒ චක්‍රලේඛවල තිබෙන නීතිමය තත්ත්වය අනුව ප්‍රාදේශීය ලේකම්වරුන්ට, අනෙක් අයට පුළුවන්කමක් ලැබිලා නැහැ, අද තමුන්නාන්සේලා කියන ආකාරයට ඉඩම් ටික, ගෙවල් ටික වතු කම්කරුවන්ට ලබා දෙන්න. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, මම ඉල්ලා සිටින්නේ, තමුන්නාන්සේලාගේ චක්‍රලේඛවල තිබෙන නීති රීති, අණ පනත්වල තිබෙන වගන්ති වෙනස් කරලා වතු කම්කරුවන්ටත් ඉඩමක් ගන්න, එහෙම නැත්නම්, ගෙයක් හදා ගන්න පුළුවන් වාතාවරණය ඇති කරන්න කියලායි.

වතු කම්කරුවන් ගැන වාගේම වතු කම්කරුවන්ගේ ආරක්ෂාව ගැනත් මීට ඉස්සෙල්ලා අපේ මන්ත්‍රීවරු කථා කළා. අපි දැක්කා, ඊයේ පෙරේදා පැල්මඩුල්ල ප්‍රදේශයේ වෙච්ච සිදුවීම. ගෙයක් හැදුවා කියලා වත්තේ ඉන්න නිලධාරි මහත්වරු ඇවිල්ලා පහර දුන්නා. ඊයෙත් අපි දැක්කා සිද්ධියක් වෙලා තිබෙනවා, මස්කෙළිය ප්‍රදේශයේ "මොකා" වත්තේ. ඒ වාගේම, නුවරඑළිය ඩෙල්මා වත්තේ වතු කම්කරුවන්ටත් පහර දීලා තිබෙනවා. මැයි දින රැලි තියලා, වතු කම්කරුවන් ගැන කථා කරලා කිඹුල් කඳුළු හෙළනවා. හැබැයි, තමුන්නාන්සේලාට වතු කම්කරුවන්ට ගෙයක් හදලා දෙන්න විධියක් නැහැ, ඉඩමක් දෙන්න විධියක් නැහැ. අඩුම ගාණේ වතු කම්කරුවන්ට ආරක්ෂාව සලසන්නවත් පුළුවන්කමක් ලැබිලා නැහැ. ඒ නිසා සොච්චම් පඩියක් වැඩි කරලා තමුන්නාන්සේලාට වතු කම්කරුවන් තවදුරටත් රටවාගෙන ඉන්න පුළුවන් වෙයි කියලා මම හිතන්නේ නැහැ. තව ටික දවසක් යනකොට වතු කම්කරුවන් ටික සැබෑ තත්ත්වය අවබෝධ කර ගන්නවා. වතු කම්කරුවන් දන්නවා, තමුන්නාන්සේලාගේ බොරුව, ප්‍රෝඩාව. වතු කම්කරුවන්ට රුපියල් 200, 300 වැඩි කළාට අනෙක් පැත්තෙන් ඒක පොකට් ගහනවා, වතු සමාගම්.

මට ඊයේ පෙරේදා වතු කම්කරුවන් කිහිපදෙනෙකු ඇවිල්ලා කිව්වා, ඒගොල්ලන්ට දවස් 26ක් වැඩ කරන්න කිව්වාට, දවස් 24ක් වැඩ කරන්න කිව්වාට වැඩක් නැහැ කියලා. පඩිපත ගත්තාම තිබෙන්නේ කීයක්ද? සමහර වෙලාවට දින 2ක පඩිය අඩු කරලා. වරුවක පඩිය දීලා. ඒ විධියට වතු කම්කරුවන්ගේ ශ්‍රමය සූරා කන බව තමුන්නාන්සේලා දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ කිලෝග්‍රෑම් 15ක් ගෙනෙන්න කියලා නම දෙන්නම් කියනවා. ඊළඟට, තේ කිලෝග්‍රෑම් 15 ගෙනාවාම කිලෝග්‍රෑම් 17ක් ගෙනෙන්න කියනවා. රබර් කිරි කපන මිනිහාට කියලා තිබෙනවා, ගස් 300ක් කපන්න කියලා. ඊට පස්සේ ඒගොල්ලන්ට කියනවා, රුපියල් 400 පඩිය වැඩි කරලා දෙන්න ඕනෑ නම් ගස් 325ක් කපන්න කියලා. ඒ වාගේම කිරි කිලෝ ගණන වැඩි කරලා ගෙනෙන්න කියලා තිබෙනවා. එහෙමයි තමුන්නාන්සේලා පඩි වැඩි කරලා වතු කම්කරුවන් සූරාගෙන කන්නේ. ඒ නිසා වතු කම්කරුවන් ගැන තමුන්නාන්සේලා කථා කරන්න එපා. වතු කම්කරුවන් වෙනුවෙන් අපි අනන්ත දේවල් කරලා තිබෙනවා. තමුන්නාන්සේලා මොනවාද කළේ? වතු කම්කරුවන්ගේ ෆැක්ටරි ටිකට ගිනි තිබ්බා, ලයිට් කණු ටික කැඩුවා, බස් ටිකට ගිනි තිබ්බා. වතු කම්කරුවන් ගැන කථා කළාට එහෙම තමයි තමුන්නාන්සේලා වතු කම්කරුවන්ට සැලකුවේ. ගිහිල්ලා බලන්න, වතුවල ෆැක්ටරි ටික ගිනි තියලා තිබෙන හැටි. මහ ලොකුවට වතු කම්කරුවන් ගැන කථා කළාට වැඩක් නැහැ, ඒවා යථා තත්ත්වයට පත් කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් වටගල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.37]

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Sunil Watagala, Attorney-at-Law - Deputy Minister of Public Security and Parliamentary Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි නීතිය දීර්ඝ කරන මේ විවාදයේදී මුලින්ම මම කාරණා දෙකක් මේ ගරු සභාවේ අවධානයට යොමු කරනවා. අපි හදිසි නීතිය ක්‍රියාත්මක කරලා අද වනකොට දින 90ක් පමණ වනවා. මේ දින 90 සම්පූර්ණ වන වෙලාවේ තමයි හදිසි නීතියට අදාළ මේ විවාදය අපි පවත්වන්නේ.

දැන් අභියෝගාත්මකව එක කාරණයක් කියනවා. විපක්ෂයෙන් කියනවා, අපි බොරු කිව්වා, බොරුව කරන්නේ,

[ගරු නීතිඥ සුනිල් වටගල මහතා]

මාර වැඩක් නේ මේ වෙන්න යන්නේ වාගේ දේවල්. මෙහිදී මම එක අභියෝගාත්මක කාරණයක් අහනවා. හදිසි නීතිය ප්‍රකාශයට පත් කරලා තිබෙනවා. ඒ හදිසි නීතිය පාවිච්චි කර ගන්නේ මහජනයාගේ උපයෝගිතාව වෙනුවෙන්. එකක්, "දිට්වා" සුළි කුණාටුවත්, එයින් පසුව පැන නැඟෙන යම් ආනුෂංගික කාරණා ප්‍රමාණයකටත් පමණයි අපි හදිසි නීතිය උපයෝගී කරගෙන තිබෙන්නේ. අපි කියනවා, ජනතාවගේ අයිතිවාසිකම් මර්දනය කිරීම සඳහා, මූලික අයිතිවාසිකමක් යටපත් කිරීම සඳහා හදිසි නීතිය අවභාවිත කරපු එක උදාහරණයක් මේ ගරු සභාවේ සභාගත කරලා පෙන්වන්න කියලා. මම හිතන විධියට, මෙතෙක් ආපු විවාදයේදී නම් එකම උදාහරණයක්වත් ඉදිරිපත් කරන්න විපක්ෂය අසමත් වෙලා තිබෙනවා. අසමත් කියන්නේ, එහෙම එකක් නැහැ. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව නීතියක් සම්බන්ධයෙන් යමක් කිව්වා නම් අපි තහවුරු කරපු එක උදාහරණයක් තමයි, මේ. පුළුවන් නම් කියන්න.

**ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා**
(மாண்புமிகு ஜீ.ஜீ. பொன்னம்பலம்)
(The Hon. G.G. Ponnambalam)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)
තමුන්නාන්සේගේ වෙලාවෙදි කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අනෙක් පැත්තේ අය කියන කථාවක් තිබෙනවා. විපක්ෂයේ අයගේ ගොඩක් කථාවලදී කියනවා, අපි ප්‍රකාශ කරන්නේ බොරු කියන පොදු කාරණාව. ඒවාට උදාහරණ විධියට ගත්තේ "දිට්වා" සුළි කුණාටුවට අදාළව පහසුකම් සැලසීමේ ගැටලුයි. ඒ පිළිබඳව විවේචනයක් ඉදිරිපත් කළා. මා හිතන විධියට, ඒ විවේචනය සාධාරණ විවේචනයක් නොවෙයි. අපි අදාළ පහසුකම සලසා තිබෙනවා. ඊට අමතරව, අපි තවමත් ඒ කටයුතු කරමින් සිටිනවා; එහි පාත්‍ර වර්ගයාට අදාළ සහනය ලබා දෙමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම ලෝක යුද තත්ත්වය සම්බන්ධ කරගෙන බලශක්ති අර්බුදය පිළිබඳව විපක්ෂය ලොකු කතිකාවක් මැව්වා. සිංහල-හින්දු අලුත් අවුරුද්දට විදුලිය කැපෙයි, ජලය කැපෙයි වාගේ භයංකර චිත්‍ර ටිකක් මැව්වා. නමුත් රජය විධියට අපි නිශ්චිත කළමනාකරණයක් ඇතුළේ ඒවාට අදාළ සියලු පහසුකම් ටික මහජනතාවට ලබා දෙන්න සමත් වෙලා තිබෙනවා. ඒකෙන් ඔය කියන බොරු සියල්ල අඩපණ වෙලා යනවා.

ඒ විතරක් ද නොවෙයි. විපක්ෂය පසුගිය දවස්වල වචන 100ක් කථා කළා නම්, ඒවායෙන් වචන 80ක්ම ගල් අඟුරු ගැනයි. අපි ඒ ගැනත් තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. ගල් අඟුරු පිළිබඳව සාකච්ඡාවක් ආවා. ප්‍රසම්පාදන ක්‍රියාවලියට යටත්ව අපි ඒ ක්‍රියාවලිය කරලා තිබෙනවා. හැබැයි, ගැටලුවක් තිබෙනවා කියලා ඔබතුමන්ලා කිව්වා. ඔන්න දැන් පත් කර තිබෙනවා, කොමිසමක්. ඒ කොමිසම පත් කර තිබෙන්නේ, මේ නිශ්චිත කාරණයට පමණක් නොව, 2009 ඉඳලාම ගල් අඟුරු පිළිබඳව ක්‍රියාවලි පිරික්සන්නයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාටුන් එකක ඇඳලා තිබෙනවා මම දැක්කා, ඒ කොමිසම ගැන කිව්වා විතරයි, ගල් අඟුරු සම්බන්ධව මෙතෙක් හිටපු විෂය භාර අමාත්‍යවරු ඔක්කෝම ගජරාමෙට අනෙක් පැත්තට දුවනවා. ඇයි එහෙම දුවන්නේ? ප්‍රශ්නයක් තිබෙනවා හෘදය සාක්ෂිය ඇතුළේ. තමුන්නාන්සේලාට තිබෙන ඔක්කෝම කරුණු කාරණා කොමිසමට ඇවිල්ලා කියන්නකෝ දැන්. අපි විනිවිද නැත්නම් එහෙම කොමිසමක් දාලා අපි ඒ අභියෝගය බාර ගනීවිද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? නැහැ. අපි විනිවිද නිසා තමයි අදාළ කොමිසම දාලා තිබෙන්නේ; පූර්ණ බලැති කොමිසමක් දාලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මුදල් අමාත්‍යාංශයේ සිද්ධියත් පාදක කරගෙන විපක්ෂය දැන් විවිධ කථා නිර්මාණය කරනවා. ඒ ගැන කියන්න තවම වෙලාසන වැඩියි. නමුත් ආණ්ඩුව ඊට නිසි පිළිතුරු ලබා දෙමින් යනවා. ඒ වාගේම, "කන්ටේනර්, කන්ටේනර්!" කිය කියා මෙතැන මතුර මතුරා හිටියා. දැන් ඒකට අදාළව ඔබතුමන්ලාගේත් සහයෝගය සහිතව කමිටුවක් පත් කර තිබෙනවා. ඒ කමිටුව කමිටු කාමර අංක 2හි හැම සතියකම බදාදා රැස් වෙලා සාකච්ඡා කරනවා. අන්න එහිදී ඕනෑම හරස් ප්‍රශ්නයක් අහන්න පුළුවන්. අපි ඒකට අදාළවත් සාධාරණත්වය ඉෂ්ට කරනවා. විපක්ෂයේ කට වැහුණා, ඒ කමිටුව දැම්මාට පසුව. මොකද, ඒ අය ඒකේ විනිවිදභාවය දැක්කා; ඒකට අපේ සම්බන්ධයක්, දේශපාලන සම්බන්ධයක් නැහැ කියලා දැක්කා.

ඊට පස්සේ ගජබින්නයක් අත් හැරියා, මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුමෙන් ඩබල් ගෙවලා කියලා. හැබැයි, අපි කරුණු සහිතව ඔප්පු කළා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගියා විතරයි ඒ ප්‍රකාශය කරපු සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරයා ඒ ප්‍රකාශය බාල කර ගත්තා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගියා විතරයි, 'ඒක එහෙම නොවෙයි, මෙහෙමත් වෙන්න පුළුවන්' කියලා වෙන පැත්තකට හරවලා නිකම් හිටියා.

ඊට අමතරව, අද දවසේත් ගජබින්නයක් අත් හරිමින් යනවා මම දැක්කා, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ - පොහොට්ටුවේ - මන්ත්‍රීවරයා. එතුමා මේ ගරු සභාවේ කියනවා මම දැක්කා, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලොකු පොහොර මගඩියක් තිබෙනවා කියලා. දැන් ඒකට අදාළ නීතිමය කටයුත්ත සූදානම් වෙමින් තිබෙනවා. කරුණාකර ඇවිල්ලා ඒවාට උත්තර දෙන්න. අපි ඒ සියලු කරුණු කාරණාවලට අදාළව කටයුතු කරන්නේ නෛතික පසුබිමක් සහිතවයි; ආවාට ගියාට නොවෙයි. ඔබතුමන්ලා ඕනෑ තරම් කියමින් ඉන්න, දවසේ බොරු, දවස් දෙකේ බොරු, සතියේ බොරු. මාසයක් නම් අල්ලාගෙන යන්න පුළුවන් බොරුවක් තවම ආවේ නැහැ. උපරිම, සතියේ බොරු කියමින් වුන් වෙච්ච ඔහොම පවත්වාගෙන යන්න. මොකද, නැත්නම් ඔයගොල්ලන්ට දේශපාලනය කරන්න බැහැ නේ. ඒක නිසා ඔන්න analyse කරලාම පෙන්නුවා. පුළුවන් නම් මේ ගරු සභාවේ කියන්න, අපි හදිසි අවස්ථා තත්ත්වය පාවිච්චි කරලා නීති උල්ලංඝනය කරපු එක අවස්ථාවක්.

ඒ වාගේම තමයි, මා අර කියපු උදාහරණ පෙළ ඇතුළේ ආණ්ඩුව ලෙස අපි අපේ විනිවිදභාවය පෙන්වා තිබෙනවා, කිසිදු ආකාරයකට ප්‍රශ්න කරන්න බැරි මට්ටමින්. ඒ විතරක් නොවෙයි, විපක්ෂය මේ ගරු සභාවේත්, එළියේත් ලොකු විවාදයක් හදලා තිබෙනවා. නීතිඥ සංගමය නීතිය හා සම්බන්ධ කාරණාවකට අදාළව යම් ගැටලුවක් යොමු කර තිබෙනවා මම දැක්කා. එය නීතියේ බලය සම්බන්ධයෙන් වන කාරණාවක්. ඒකම අරගෙන විපක්ෂයේ මන්ත්‍රීවරු මේ ගරු සභාවේ හඬ නැඟුවා. ඒ විතරක් නොවෙයි, දැන් ඒක පදනම් කරගෙන තමුන්නාන්සේලා; සමගි ජන බලවේගය Motion එකක් ඉදිරිපත් කර තිබෙනවා. මා හිතන විධියට, ඒක ගැන Parliamentary Business Committee එකේ සාකච්ඡා වීමට නියමිතව තිබෙනවා. ප්‍රශ්නයක් නැහැ. නීතිඥ

සංගමයට අපි ගරු කරනවා. නීතිඥ සංගමයත් එක්ක එකතු වෙලා අපි ඉතිහාසයේ සටන් කරලා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට යන කොට, ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයට ලක් වන කොට, ඒ සෑම අවස්ථාවකදීම නීතිඥ සංගමය ඉස්සරහට ආවා. පෞද්ගලිකවම මමත්, නීතිඥ සංගමයත් ශිරානි බණ්ඩාරනායක මහත්මියගේ සිද්ධිය ඇතුළු තවත් සිද්ධි ගණනාවකදීම නීතියේ බලය වෙනුවෙන් පෙනී හිටියා. නීතිඥ සංගමය ඇත්ත වශයෙන්ම නීතියේ බලය වෙනුවෙන් පෙනී හිටියා. ඔවුන්ට නීතිය සම්බන්ධ එවැනි මොකක් හරි හැඟීමක් ඇති වන්නේ අතීත සිද්ධිවල තිබෙන භයංකාරත්වය නිසා; අතීත භාවිතාවේ ඇති වෙච්ච යම්කිසි භයංකාරත්වයක් නිසා. අපි නීතිඥ සංගමයට අවධාරණය කරලා කියනවා, අපේ ගැටුමක් නැති බව. මොකද, තමුන්නාන්සේලාත් නීතියේ බලය වෙනුවෙනුයි පෙනී සිටින්නේ. ආණ්ඩුවක් ලෙස අපිත් එහෙමයි; නීතියේ බලය වෙනුවෙනුයි පෙනී සිටින්නේ. තමුන්නාන්සේලා නීතියේ බලය පිළිබඳව යම්කිසි විශ්වාසයක් තැබුවාද, අපේ රටේ ජනාධිපතිවරයාත්, කැබිනට් මණ්ඩලයත්, මේ ආණ්ඩුවත් ඒ බරෙන්ම, ඒ විධියටම මේ රටේ නීතියේ බලය මේ වනකොටත් තහවුරු කරලා, රැකලා, ඔප්පු කරලා තිබෙනවා. මා ඒ බව මේ වෙලාවේ තමුන්නාන්සේලාට මතක් කරනවා. මම විපක්ෂයට කියනවා, මේක ඇතුළේ නිකම් වෙන වෙන යක්කු මවන්න හදන්න එපා කියලා; භයංකර චිත්‍ර මවන්න හදන්න එපා කියලා. අපි, කථාවෙන් නොවෙයි, භාවිතාව ඇතුළේ වැඩ කරලා ඔප්පු කරපු මිනිස්සු. Motion එකක් දැම්මාට නම් කමක් නැහැ. ඒකට අදාළව කථානායකවරයා තීන්දු තීරණ ගනීවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතියේ බලය අප කොච්චර දුරකට රකිනවාද කියන කාරණාව ගත්තොත්, අපි මේ රටේ ජනතාවට තහවුරු කරලාම කියනවා, ජාතික ජන බලවේගයේ මැතිවරණ ප්‍රකාශයේ දැක්වෙන ආකාරයටම, ස්වාධීන, කාර්යක්ෂම, විනිවිදභාවයෙන් යුත් හා මහ ජනතාවට දැරිය හැකි අධිකරණ පද්ධතියක් ඇති කිරීම අපේ රජයේ ඉලක්කය වන බව සහ මහ ජනතාව බලාපොරොත්තු වන සාධාරණය හා යුක්තිය අධිකරණය හරහා ලැබෙන බවට වන ජනතා අපේක්ෂාව අපි ඉෂ්ට කරන බව. ඒක ගැන සහතික වෙනවා කියන කාරණාව අදටත් අපි මේ ගරු සභාවේ කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ කරන මේ විවාදයේදී මම කරුණු යළිත් සාරාංශ කරලා කියන්නම්. එය පනවා අද වන විට දින 90කට වැඩි කාලයක් ගත වෙමින් යනවා. හැබැයි ඒ දින 90ට වැඩි කාලය පුරාවටම තිබෙන්නේ සුජාතභාවයක්. අපි අතීත ආණ්ඩු වාගේ එකක් පෙන්නලා තව දෙයක් කරපු ආණ්ඩුවක් නොවෙයි. අතීතයේ ආණ්ඩු නම් එහෙමයි. ඒ අය හදිසි අවස්ථාව පෙන්නලා තමන්ගේ කැත, මඩර, පටු, අවස්ථාවාදී දේශපාලනය cover කර ගත්තා. හැබැයි අපි කෙදිනකවත් එහෙම දේවල් කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ මේ ගරු සභාවෙන් ප්‍රශ්න කරලා බලන්න. මේ දින 90 ඇතුළේ ක්‍රියාත්මක වෙච්ච හදිසි නීතිය ජනතාවගේ අභිලාෂයන්, ජනතාවගේ මූලික අවශ්‍යතා ඉෂ්ට කරන නියම වෙනුවෙන් පමණක් භාවිත කරපු එකක්. එවැනි හදිසි අවස්ථාවක් තමයි මේ තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු නීතිඥ සුනිල් වටගල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சுனில் வட்டகல)
(The Hon. Sunil Watagala, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

විපක්ෂය එක එක භයංකර චිත්‍ර මැව්වාට ජාතික ජන බලවේගය ආණ්ඩුව අපේ භාවිතාව ඇතුළේ මේ රටේ නීතියත්, නීතියේ බලයත්, නීතියේ ක්‍රියාත්මක භාවිතාවත් මේ රටේ මහ ජනයාගේ ප්‍රයෝජනය තකා පමණයි පවත්වාගෙන යන්නේ. අපි ඒ කාරණය තහවුරු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.50]

**ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ.எஸ். இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.S. Radhakrishnan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் இச்சபையில் அவசரகாலச் சட்ட நீடிப்புத் தொடர்பான விவாதம் நடைபெறுகின்றது. அரசாங்கமானது அவசரகாலச் சட்டத்தை மூன்று மாத காலமாக நீடித்து வருகின்றது. இதற்குக் காரணம், இந்த நாட்டில் ஏற்பட்ட 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கு நிவாரணம் வழங்க வேண்டும் என்பதுதான். எது எப்படி இருந்தாலும், பெருந்தோட்டப் பகுதியில் 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கு இதுவரை எந்தவிதமான நிவாரணமும் போய்ச் சேரவில்லை. மாண்புமிகு சனாதிபதி அவர்கள் இங்கு சொன்னார், கூரையின் ஒரு தகரம் பறந்தாலும் 10 இலட்சம் ரூபாய் தருவதாக. இந்த நிவாரணம் இதுவரை தோட்டங் களிலுள்ள எவருக்கும் போய்ச் சேரவில்லை என்பதை நான் இந்தச் சபைக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் எதிர்வரும் 13ஆம் திகதி நுவரெலியாவுக்கு வந்து இதற்கான நடவடிக்கைகளை எடுப்பதாக எங்களிடம் சொல்லி யிருக்கிறார். தோட்டப்பகுதிகளில் வாழுகின்ற மக்களுக்கு இவ்வாறான பிரச்சினைகள் ஏற்படுவதற்குக் காரணம், அவர்களுக்குத் தோட்டத்தில் இடம் சொந்தமாக இல்லாததுதான். எனவே, தோட்டப்புறங்களில் வாழ்கின்ற எமது மக்களுக்குக் காணி உரிமை வேண்டும் என்பது எங்களுடைய பிரதான கோரிக்கையாக இருக்கின்றது. இது எங்களுடைய தமிழ் முற்போக்குக் கூட்டணி கடந்த காலங்களிலிருந்து சொல்லி வருகின்ற ஒரு விஷயமாகவும் இருக்கின்றது. எங்களுடைய மக்கள் காணி உரிமையைப் பெற்றுக்கொண்டால், ஏனையவை தானாக வந்து சேரும்.

அவசரகாலச் சட்டம் நடைமுறையில் இருக்கின்ற காலகட்டத்தில்தான் பல்வேறு இடங்களிலும் தோட்ட துரைமார் தொழிலாளர்களைத் தாக்குகின்றார்கள். அண்மை யில் இரத்தினபுரி மாவட்டத்திலுள்ள நீலகாமம் தோட்டத்தில் குண்டர்களை வைத்து அங்குள்ள மக்களைத் தாக்கி, அவர்களது கூடாரங்களைப் பிரித்தெடுத்து, அவர்களுக்கு அநியாயம் செய்ததை நாங்கள் பார்க்கக்கூடியதாக இருந்தது. இதற்கெதிராகப் பல போராட்டங்கள் நடந்தன. நேற்று முன்தினம் மொக்கா தோட்டத்தில் தோட்ட அதிகாரி ஒருவர் அங்கிருக்கின்ற காவற்காரரை அடித்து துன்பத்தை ஏற்படுத்தி இருக்கிறார். அதேபோல, Delmar Estateஇன் Middle Divisionஇல் இருக்கின்ற ஒரு தொழிலாளியை சின்னதுரை ஒருவர் அடித்திருக்கிறார். இது தொடர்பில் பொலிஸில்

[ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා]

முறைப்பாடு செய்யப்பட்டு இருப்பதாகவும், குறித்த நபரை பொலிஸார் arrest பண்ணி இருப்பதாகவும் காலையில் இங்கு பேசிய பொதுமக்கள் பாதுகாப்பு அமைச்சர் அவர்கள் சொன்னார். அதற்காக நன்றி சொல்ல வேண்டும்.

இவ்வாறான சம்பவங்கள் இடம்பெறும்போது, 'சட்டம் எல்லோருக்கும் சமம்' என்ற அடிப்படையில் நடவடிக்கைகள் எடுக்கப்பட வேண்டும் என்பதை நான் இங்கு சொல்லிக் கொள்ள விரும்புகின்றேன். தோட்டத் தொழிலாளர்களைத் தாக்குகின்ற, அராஜகம் செய்கின்ற தோட்ட துரைமாருக்கு எதிராக நீங்கள் நடவடிக்கை எடுத்தால்தான் எதிர்காலத்தில் உங்களுடைய அரசாங்கத்தைக் காப்பாற்றக்கூடிய நிலை ஏற்படும். அதை நீங்கள் மறந்துவிடக் கூடாது. உங்களுக்கு அதிகமாக வாக்களித்தவர்களில் தோட்டத் தொழிலாளர்களும் இருக்கிறார்கள் என்பதை நீங்கள் மறந்துவிடக் கூடாது. எனவே, நீங்கள் இந்த விடயம் தொடர்பில் சற்று சிந்தித்துச் செயற்பட வேண்டுமென அன்பாகக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, அண்மையில் இந்தியாவில் நடைபெற்ற தமிழ்நாடு சட்டமன்றத் தேர்தலில் திரு. விஜய் அவர்கள் அதிகமான ஆசனங்களைப் பெற்று, தமிழகத்தின் முதல்வராக வருவதற்கான வாய்ப்புகள் இப்பொழுது ஏற்பட்டு இருக்கின்றன. நான் நினைக்கின்றேன், இன்று அல்லது நாளை அவர் முதல்வராகப் பதவியேற்பதற்கான சந்தர்ப்பம் இருக்கிறது என்று. அவருக்கு உறுதுணையாக இருந்த திரு. செங்கோட்டையன் அவர்களுக்கு நாங்கள் வாழ்த்துகளைச் சொல்ல வேண்டும். விஜய் அவர்களின் இந்த வெற்றிக்கு உறுதுணையாக இருந்த திரு. செங்கோட்டையன் அவர்கள் 2018ஆம் ஆண்டு இலங்கைக்கு வருகைதந்து, யாழ். நூலகத்துக்கு கிட்டத்தட்ட 100,000 புத்தகங்களையும் மட்டக்களப்பு நூலகத்துக்கு 50,000 புத்தகங்களையும் வழங்கினார். அதுமாத்திரமன்றி, கண்டியில் நடைபெற்ற எம்.ஜி.ஆர். நூற்றாண்டு விழாவிலும் கலந்துகொண்டார் என்பதை நான் இந்த நேரத்தில் ஞாபகப்படுத்த விரும்புகின்றேன். நாங்கள் தொடர்ந்தும் இவர்களுடன் உறவை வைத்துக்கொள்வதால் தமிழ்நாட்டில் இடம்பெறும் விஜய் அவர்களுடைய ஆட்சியில் இலங்கையின் எதிர்கால அபிவிருத்திக்கு ஒரு பங்களிப்பைப் பெற்றுக்கொள்ளக் கூடியதாக இருக்குமென்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. எனவே, திரு. விஜய் அவர்களுக்கும் திரு. செங்கோட்டையன் அவர்களுக்கும் எனது வாழ்த்துகளை இந்நேரத்தில் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று நுவரெலியா மாவட்டத்தில் உருளைக்கிழங்குச் செய்கை பாதிக்கப்பட்டு இருக்கின்றது. இது நுவரெலியா மாவட்டத்தில் உருளைக்கிழங்கு அறுவடை செய்கின்ற காலமாகும். இந்தக் காலத்தில் வெளிநாட்டிலிருந்து உருளைக் கிழங்கை இறக்குமதி செய்வதாலும், உள்ளூரில் உற்பத்தி செய்யப்படும் உருளைக்கிழங்குக்கு விலை நிர்ணயம் செய்யாமல் இருப்பதாலும் எமது விவசாயிகளுக்குப் பாரிய பாதிப்பு ஏற்படுகின்றது. இப்பொழுது நுவரெலியா மாவட்டத்தில் கிட்டத்தட்ட 5,000 ஹெக்டெயார் நிலம் உருளைக்கிழங்குப் பயிர்ச்செய்கைக்காக ஒதுக்கப்பட்டு இருக்கின்றது. යල කන්නය, මහ කන්නය ஆகிய இரண்டு போகங்களிலும் உருளைக்கிழங்குச் செய்கையில் ஈடுபடுகின்ற விவசாயிகளுக்கு ஒரு கிலோகிராம் உருளைக்கிழங்கை உற்பத்தி செய்ய 200 ரூபாய் செலவாகின்றது என்பதை நாங்கள் மறுக்க முடியாது. எனினும், அதனை 190 ரூபாய்க்கு விற்க வேண்டிய சூழ்நிலை அவர்களுக்கு ஏற்பட்டிருக்கின்றது.

ඊයේ මම ගරු සමරසිංහ මැතිතුමා එක්ක මේක ගැන පැහැදිලිව කථා කළා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමාටත් මම මේක ගැන ඊයේ හවස කිව්වා. මේකට ස්ථිර විසඳුමක් සහිත වැඩ පිළිවෙළක් හදන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඒ වෙනුවෙන් යම්කිසි වැඩ පිළිවෙළක් කරනවා නම් ඒකට සම්පූර්ණ සහයෝගය අපි ලබා දෙනවා කියලාත් මම මේ අවස්ථාවේ කියන්න කැමතියි.

அண்மையில் factory in Brookside Estate ஒன்று தீக்கிரையாகி விட்டது. இது கந்தப்பளையிலிருந்து கிட்டத்தட்ட 6 கிலோமீற்றர் தூரத்திலும் ராகலையிலிருந்து கிட்டத்தட்ட நான்கு கிலோமீற்றர் தூரத்திலும் இருக்கின்றது. அங்கு தீ ஏற்பட்டபோது, தீயை அணைப்பதற்கான இயந்திரம் அங்கு இல்லாமல் இருந்தது மிகவும் வருத்தத்துக்குரியது. Factories அமைந்திருக்கின்ற நகரங்களுக்கு அண்மையில் இருக்கின்ற பிரதேச சபைகளுக்குத் தீயணைப்பு இயந்திரங்களை வழங்குவது மிகவும் முக்கியமானது. ஒரு பெரிய factory தீக்கிரையானால் அது எவ்வளவு அநியாயம்? எனவே, வலப்பனை, ராகலை போன்ற பகுதிகளிலுள்ள உள்ளூராட்சிச் சபைகளுக்குத் தீயணைப்பு இயந்திரங்களைக் கொடுத்து, அதன்மூலம் அங்கு ஏற்படுகின்ற தீயைக் கட்டுப்படுத்துவதற்கு நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்த நேரத்தில் வலியுறுத்த விரும்புகின்றேன். இந்த நாட்டில் தொடர்ந்து ஏற்படுகின்ற இவ்வாறான செயல்கள்மூலம் ஏற்படும் பின்னடைவுகளை அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டும்.

இப்பொழுது சிலர் சொன்னார்கள், "நாங்கள் நுவரெலியாவில் அதிகளவான மக்களைக்கொண்டு மே தினத்தைக் கொண்டாடினோம்" என்று. நாங்கள் எத்தனையோ மே தினங்களைக் கொண்டாடி இருக்கின்றோம். எவ்வளவோ மக்களைக் கூட்டத்துக்குக் கொண்டுவந்து இருக்கின்றோம். இதெல்லாம் 'ஜுஜுபி'! நீங்கள் இதை மறந்து விடக்கூடாது. இந்த வருடம் மே தினத்தைக் கொண்டாடியதுதான் பெரிய விஷயம் என்று நீங்கள் பறைசாற்றக் கூடாது என்பதைச் சொல்லி, என்னுடைய பேச்சை நிறைவு செய்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ශාන්ත පද්මකුමාර මහතා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.58]

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මගේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මූලාසනයේ සිටීම ගැන මම සතුටු වෙනවා.

ඇත්තටම හදිසි නීතිය දීර්ඝ කිරීමේ මේ විවාදයට එක්වෙමින් මුලින්ම මම මේ කාරණය කියන්න ඕනෑ. මෙහි අවශ්‍යතාව පෙරේදාත් ඔප්පු වුණා. රත්නපුර දිස්ත්‍රික්කයේ, ඕපනායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්වත්ත ග්‍රාම නිලධාරි වසමේ අසමාන කන්ද කියන රක්ෂිතය නාය ගියා. පවුල් 30ක් අවදානම් තත්ත්වයේ තිබුණා. උපුල් වසන්ත කුමාර මන්ත්‍රීතුමා ඇතුළු රාජ්‍ය නිලධාරීන් සියලුදෙනා මැදිහත් වෙලා ඒ පවුල් 30ම එතැනින් ඉවත් කරලා, දැනට අධිඅවදානම් තත්ත්වයේ සිටින පවුල් 11ක පිරිස් 17 දෙනෙකුත් ඕපනායක මැටිහක්වල පන්සලේ ආරක්ෂිතව රඳවලා ඒගොල්ලන්ට අවශ්‍ය මූලික දේවල් සිදු

කරමින් ඉන්නවා. ඒ නිසා මම මේ ගරු සභාවට අවධාරණය කරන්න කැමතියි, හදිසි නීතිය දීර්ඝ කරන්න තිබෙන අවශ්‍යතාව දැඩියි කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මේ සාකච්ඡාව පුරාවටම "දිට්වා" කුණාටුව ගැන, ඒ සහන සැපයීම ගැන කථා කළා. හැම දාමත් විපක්ෂයේ සුපුරුදු අඬ ඇඬියාව තමයි තිබෙන්නේ. මම ඔබෙන් අහන්න කැමතියි, අපි ලංකා ඉතිහාසයේ අම්මා, මුත්තා කාලයේවත් සහන පැකේජ ගැන අහලා තිබෙනවාද කියලා. හැබැයි, අපි අහලා තිබෙනවා දියුණු රටවල - ඕස්ට්‍රේලියාව වාගේ රටවල - විවිධ අවස්ථාවල සිදු වන හදිසි තත්ත්ව තුළ දෙන මෙවැනි සහන පැකේජ ගැන. හැබැයි, ඉතිහාසයේ පළමු වතාවට ගරු අනුර දිසානායක ජනාධිපති සහෝදරයාගේ ආණ්ඩුව යටතේ, අපේ ආණ්ඩුව යටතේ තමයි ශ්‍රී ලංකාවේ සියලුදෙනාම සහන පැකේජ ගැන දැන ගත්තේ. ඒක විශාල සහන පැකේජ් එකක්. කෝටි 50,000ක සහන පැකේජ් එකක් අපි "දිට්වා" සුළි කුණාටුවට අදාළ කටයුතුවලට යොදවන්න යෝජනා කළා. ඒ ගැසට් එක ගහපු දවසේම පහුව දා ගිහිල්ලා සජිත් ප්‍රේමදාස මහත්තයා මිනිස්සුන්ගෙන් ඇහුවා, "හම්බ වුණාද, හම්බ වුණාද?" කියලා. මම හිතන්නේ එදා සෙනසුරාදා හෝ ඉරිදා. මම සජිත් ප්‍රේමදාස මහත්තයාගෙන් අහන්න කැමතියි, 2017දී එතුමන්ලාගේ ආණ්ඩුව තිබුණේ. 2017දී රත්නපුර දිස්ත්‍රික්කයේ සිද්ධ වෙච්ච දේවල් ගත්තොත්, තවම අවදානම් පවුල් 1,724කට නැවත පදිංචි කිරීම් නැහැ. එවැනි තත්ත්වයකදී තමයි සජිත් ප්‍රේමදාස මහත්තයා මාස දෙක, තුනක් ඇතුළත අරක කළාද, මේක කළාද කියලා අහන්නේ. කනගාටුයි.

ඊළඟට ගත්තොත් දැන් කහවත්ත, නීලගම ගැන කථා කරනවා; නුවරඑළිය ගැන කථා කරනවා. මලෙයහම් ජනතාව ගැන මාර සංවේදීකමකින්, පට්ට දුකකින් කථා කරනවා. මම කල්පනා කළා, සජිත් ප්‍රේමදාසලාට, සුන්බුන් විපක්ෂයට මලෙයහම් ජනතාව ගැන මෙච්චර හෘද වස්තුව උණු වෙන්නේ ඇයි කියලා. හරිම පැහැදිලියි. හේතුව තමයි පසුගිය මැයි දිනය.

ජාතික ජන බලවේගය විධියට අනුර දිසානායක සහෝදරයාත් සම්බන්ධ වෙලා නුවරඑළියේදී දැවැන්ත මැයි දිනයක් පැවැත්වූවා. අපි දන්නවා, නුවරඑළිය මලෙයහම් ජනතාවට බොරු පොරොන්දු දීලා, මේ සුන්බුන් විපක්ෂය ඒගොල්ලන්ව වෙනම ගොනු කරගෙන හිටියා කියලා. නමුත් ටිකින් ටික නොවෙයි, පදාස පිටින් ගැලවිලා ජාතික ජන බලවේගය, නැත්නම් ආණ්ඩුව වටා එකතු වෙමින් සිටින මොහොතක තමයි මේ අඬ ඇඬියාව තිබෙන්නේ.

මොකක්ද කහවත්ත සිද්ධිය? කහවත්ත සිද්ධිය මේකයි. කහවත්ත නීලගම වතුයායේ පෞද්ගලික ආරක්ෂකයෝ ටිකක් රඳවාගෙන ඉන්නවා. ඒකේ යම් වුවමනාවකුත් තිබෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. අනවසර පතල් ගැරීම් තිබෙනවා. අනවසර ඉඩම් ඇල්ලීම් තිබෙනවා. ඒක නිසා පෞද්ගලික ආරක්ෂකයෝ ඒ වත්තේ තියාගෙන ඉන්නවා. හැබැයි, ඒගොල්ලන් පාවිච්චි කරලා මේ අහිංසක මලෙයහම් ජනතාවට පහර දෙනවා. එහෙම පහර දෙන්න ඒගොල්ලන්ට කිසිදු අයිතියක් නැහැ. හැබැයි, අපි මොකක්ද කළේ? පහර දීමත් එක්ක ඒ ප්‍රදේශය නියෝජනය කරන අපේ නියෝජ්‍ය ඇමති සුන්දරලිංගම් ප්‍රදීප් මැතිතුමා, ඒ වාගේම එම ප්‍රදේශය නියෝජනය කරන සුනිල් රාජපක්ෂ මන්ත්‍රීතුමා එතැනට සම්බන්ධ වෙලා පොලීසිය සම්බන්ධ කරගෙන පැය හයක් ඇතුළත නව දෙනෙක් අත්අඩංගුවට ගන්නවා. ඒ විතරක් නොවෙයි, ඒ වතු සමාගමට අවවාද කරනවා. ඉදිරියේදී ඒ වතු සමාගම ගෙන්වලා අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරනවා. ඒ විතරක් නොවෙයි. ඒ ජනතාවට, පවුල් 22කට ඉඩම් සහ නිවාස ලබා දෙන්නත් මේ වෙනකොට අමාත්‍යාංශය පැත්තෙන් මැදිහත් වීමක් කරනවා. අපි සජිත් ප්‍රේමදාස ඇතුළු සුන්බුන් විපක්ෂයෙන් මේ කාරණය අහනවා. 1992දී වේවැල්වත්ත ප්‍රදේශයේ මලෙයහම් ජනතාවගේ ගෙවල් පිච්චුවා. 1992දී කවුද බලයේ හිටියේ? ප්‍රේමදාස මහත්තයාගේ ආණ්ඩුව තිබුණේ. හැබැයි, තවම ඒගොල්ලන්ට සාධාරණයක් ඉෂ්ට වෙලා තිබෙනවාද? ඒකට පොලීසිය ක්‍රියාත්මක වෙනකොට, ඒ වෙනකොට ඒ පැත්තේ හිටපු තලතා අතුකෝරල ලා ඇමතුම් දීලා නැවැත්වූවා. සජිත් ප්‍රේමදාසලාට කණ්ණාඩියක් ළඟට ගිහිල්ලා තමයි මේ ප්‍රශ්නය අහන්න වෙන්නේ. අපි හරි පැහැදිලිව, පැය හයක් ඇතුළත කහවත්ත සිද්ධිය සම්බන්ධයෙන් මැදිහත් වෙලා ඒ පිරිස අත්අඩංගුවට අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ඒ වාගේ දේවල් නැවත සිද්ධ නොවෙන්න අපි කටයුතු කරනවා කියලාත් සහතික වෙනවා.

නුවරඑළියත් එහෙම තමයි. නුවරඑළිය අපි පවත්වාගෙන යන්නේ සාමයේ නගරයක් ලෙසයි. සිංහල, දෙමළ, මුස්ලිම් ප්‍රජාව ඉතාම සාමකාමීව එහි ජීවත් වෙනවා. ඒකට ගිනි තියන්න තමයි මේ හදන්නේ. මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේක මේ සුන්බුන් විපක්ෂයට පුරුදුයි. 1983 කළු ජූලිය වෙද්දී කවුද ආණ්ඩුවේ හිටියේ? ඔය විපක්ෂ නායකතුමාගේ තාත්තා වන රණසිංහ ප්‍රේමදාස, ජේ.ආර්. ජයවර්ධන, සිරිල් මැතිව්, නන්ද මැතිව්, ඒ අය තමයි කළු ජූලිය ආරම්භ කළේ. මෙතුමන්ලා දන්නවා, මලෙයහම් ජනතාවට ගහලා මරලා දේපළ විනාශ කරලා, දේපළ හොරකම් කරලා, රටිනුත් පිටුවහල් කළ බව. රටින් එළෙව්වා. ඒක අවුරුදු 30ක් තිස්සේ නොනවතින යුද්ධයක් දක්වා පරිවර්තනය වුණා. මරාගෙන මැරෙන බෝම්බ ගැටගහගෙන මහා විනාශ කරන තත්ත්වයට අහිංසක මිනිසුන් පරිවර්තනය කරපු මේ සුන්බුන් විපක්ෂයේ සජිත්ලා තමයි කහවත්තේ හුදෙකලා සිද්ධියයි, නුවරඑළියේ හුදෙකලා සිද්ධියයි ගැන කිඹුල් කඳුළු හෙළන්නේ. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි. පදාසයන් පිටින් ගැලවිලා ගැලවිලා ගිහින්, මලෙයහම් ජනතාව දැන් ඇත්ත තේරුම් ගනිමින් ඉන්නවා.

ජනාධිපතිතුමා අය වැය ප්‍රකාශ කරමින් කිව්වා, මලෙයහම් ජනතාවට පඩිය වැඩි කරනවා කියලා. අවුරුදු 200කට පස්සේ රුපියල් 400ක් වැඩි කළා. ආණ්ඩුවෙන් 200යි, සමාගමෙන් 200යි. ඒකට නොයෙක් ආඩපළි කියලා නවත්වන්න බැලුවා. බැරිම තැන මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරියක් උසාවියට යැව්වා, ඒක නවත්වාගන්න. එහෙමයි සුන්බුන් විපක්ෂය. ඒ සුන්බුන් විපක්ෂයේ මන්ත්‍රීවරුන් කියනවා, හොඳ මැයි දිනයක් සැමරුවා ලු. අපි දැක්කා නේ. ඒ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ සභාවේ නැහැ. අපි දැක්කා, සුන්බුන් විපක්ෂයේ මැයි දිනය. අපි ඔවුන්ට අභියෝග කරනවා. අපි ජාතික ජන බලවේගය විධියට, ආණ්ඩුව විධියට මැයි දින රැස්වීම් 21ක් දිස්ත්‍රික්ක 21ක පැවැත්වූවා. ඔයගොල්ලන්ගේ ඔක්කෝම එකතු කළත් අපේ එක දිස්ත්‍රික්කයක සෙනඟට වඩා - ජනතාවට වඩා - අඩුයි. සිරිසේන ක්‍රීඩාංගණයේ ඔය සුන්බුන් විපක්ෂයේ රැලියට අපේ ගම්වලින් ආපු දෙතුන් දෙනෙක් මට හම්බ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මාස කිහිපයකට කලින් - මාර්තු 8වැනි දා - අපි ඔය සිරිසේන ක්‍රීඩාංගණය කාන්තා සංගමයෙන් පුරවලා, ඒ වාගේ තව දෙගුණයක් එළියේත් පිරෙව්වා. ඔබතුමන්ලාට ඒක පුරවා ගන්න බැරි වුණා.

අපේ ගමෙන් සුන්බුන් විපක්ෂයට ගිය අයගෙන් මම ඇහුවා, "ඔබ ඔබේ නායකතුමා කථා කරනකොට නැඟිටලා ගියේ ඇයි?" කියලා. "අනේ මන්ත්‍රීතුමා, අපි එතැනට ගියේ AI සජිත් බලන්න" කියලා කිව්වා. ඇයි, ඔබතුමන්ලා මෙතැන සාකච්ඡා පවත්වනවා නේ. නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා නේ, එතැන සිටියේ AIවලින් හදපු සජිත් කියලා. AI සජිත් කොහොම කෙනෙක්ද කියලා බලන්නලු, ගියේ. විපක්ෂ නායකතුමා එතැනට ගිහිල්ලා

[ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා]

කථාව පටන් ගත්තා නේ. "දෙවි හාමුදුරුවනේ! කථාව පටන් ගත්ත ගමන් මේ ඉන්නේ AI සජිත් නොවෙයි, ඇත්ත සජිත් කියලා තේරුණා. ඒ නිසා අපි නැඟිටලා ආවා" කියලා කිව්වා. ඕක තමයි ඇත්ත කථාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවට බොරු ගෙනාවේ මේ සුන්බුන් විපක්ෂය කියලා අපි හිතනවා. සුන්බුන් විපක්ෂය තමයි බොරු ගෙනැල්ලා තිබෙන්නේ. ඒ තරම්, කියන්නේම බොරු.

අපි ආණ්ඩුව ගන්න කලින් කිව්වා, මේගොල්ලෝ ආවොත් අරවා වෙයි, මෙහෙම වෙයි, පෙරහැර නැති වෙයි, පන්සල් ගිනි තියයි, දානය නැති වෙයි, කඨින පිංකම් නැතිවෙයි කියලා. ඔය වාගේ නොයෙක් දේවල් කිව්වා. හැබැයි, දැන් ඒ කිසිවක් වෙලා නැහැ. ආර්ථිකය බිඳ වැටෙයි කිව්වා, සුද්දෝ මේ රට දාලා යයි කිව්වා, ඩොලරය රුපියල් 600 ගණනට නඟියි කිව්වා. ඒ මොකවත් වෙලා නැහැ. දැන්වත් ඒකෙන් මිදෙන්න බැහැ, බොරුව පත්තියන් වෙලා, තවමත් බොරුවෙන් යනවා. ඒක කොච්චර පත්තියන් වෙලාද කිව්වොත්, ඒක කොච්චර ඇබ්බැහි වෙලාද කිව්වොත්, මැයි දිනසටන් පාඨයේත් කිව්වා, "පව මදිවට හොරු" කියලා. ඇත්ත නේ, කතන්දරේ. දෛවයේ සරදමකට තමයි ඒ විධියේ සටන් පාඨයක් ගහගන්න වුණේ.  දැන් තත්ත්වය හරි පැහැදිලියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනුත් බොරු කිව්වා. කන්ටේනර් 323ක් ගැන කිව්වා. කෝ, දැන් ඒ ගැන සාකච්ඡා? දැන් සුන්බුන් විපක්ෂය කන්ටේනර්වලට යටවෙලා. ඊට පස්සේ තව බොරුවක් ගෙනාවා, ගල් අඟුරු පිළිබඳව. කෝ දෙයියනේ! දැන් ගල් අඟුරු ගැන කථා කරන්නේ නැහැ නේ. අර, ගල් අඟුරු මහත්මයා, - එතුමාගේ නම කියලා වැඩක් නැහැ - "කාර් මහත්මයා" මොකුත් කියන්නේ නැහැ. දැන් ඒ "කාර් මහත්මයා"ගේ කටේ ගල් අඟුරු හිරවෙලා. ඒ ගැන සොයන්න දැන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයෙක් ඇතුළු විනිසුරුවරු තුන්දෙනෙකුගෙන් සමන්විත  පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කරලා තිබෙනවා. ඒකට ගිහිල්ලා සාක්ෂි දෙන්නකෝ. ඒක පත් කරලා ගොඩක් දවස් නේ. ගිහිල්ලා තොරතුරු ඔක්කෝම ටික කියන්නකෝ. නැන්දම්මාගේ ගිණුම ගැනත් කියන්නකෝ. හොරා කෑව ඔක්කෝම ගැන කියන්නකෝ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් කියන්න බොරුත් නැතිවෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" සුළි කුණාටුව වෙන්න පුළුවන්, එහෙම නැත්නම් මැද පෙරදිග යුදමය තත්ත්වය වෙන්න පුළුවන්, ගරු ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඇතුළු අපේ ආණ්ඩුව නිසි වැඩ පිළිවෙළක් යටතේ ඒවායේ බලපෑම කළමනාකරණය කරලා තිබෙනවා. ඒක තමයි ඇත්ත කතන්දරය. එම නිසා ආණ්ඩු ගන්න නොවෙයි, විපක්ෂයේ හෝ ඉන්න ඕනෑ නම් යම් සදාචාරයක් සහිතව කටයුතු කරන්න, මීට වඩා පරිණත වෙන්න, බොරු කීම නවත්වන්න. එහෙම නැවැත්තුවොත් ඔබට විපක්ෂයේ කාර්යභාරය හෝ ඉෂ්ට කරන්න පුළුවන් වෙයි. නැත්නම් සදාකාලිකවම විපක්ෂයේ සැනසෙන්න තමයි සජිත් ප්‍රේමදාස මහත්මයා ඇතුළු සුන්බුන් විපක්ෂයට සිද්ධ වෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.10]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் விவாதத்துக்கு எடுத்துக்கொள்ளப்பட்டுள்ள பொதுமக்கள் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானமானது, கடந்த வருடம் ஏற்பட்ட 'தித்வா' புயலால் பாதிக்கப்பட்டவர்களுக்கு நஷ்டஈடுகளை, நிவாரணங்களை வழங்குவதற்காகக் கொண்டுவரப்பட்டு இருந்தாலும், அதற்குள் அவசரகாலச் சட்டத்தை நீடிக்கின்ற விடயமும் மறைமுகமாக உள்வாங்கப்பட்டு இருக்கின்றது என்பதை நாங்கள் மிகத் தெளிவாகக் கூறுகின்றோம்.

'தித்வா' புயலால் பாதிக்கப்பட்டவர்களுக்காக முன்வைத்த பல வேலைத்திட்டங்களைச் செய்து முடித்திருப்பதாகவும், அதற்கு மாறாக எதிரணியினர் பொய் கூறுகின்றனர் என்றும் "நாங்கள் உண்மை பேசுகின்றோம்" என்றும் ஆளும் தரப்பினரும், "நீங்கள் நீண்ட காலமாக பொய் சொல்லி வருகின்றீர்கள்" என்று எதிரணியினரும் சொல்லிக்கொண்டு இருக்கிறார்கள். இந்த ஆளுந்தரப்பு, எதிர்த்தரப்பினரின் பிரச்சினைக்குள் நாங்களும் சிக்குண்டு இருப்பதால், எங்களுடைய கருத்துகளைக் கூறுவதற்கு நேரம் போதாமல் இருக்கின்றது. 8 அல்லது 10 நிமிடங்கள் ஒதுக்கப்பட்டாலும், இறுதியில் 5 நிமிடங்களே வழங்கப்படுகின்றது. எது எவ்வாறு இருந்தாலும், சில உண்மைகளை நாங்களும் கூறவேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது.

'தித்வா' புயல் ஏற்பட்டபோது, பாதிப்புக்குள்ளான மக்களும் எதிர்க்கட்சியினரும் மற்றும் உலகளவில் விடயங்களை அவதானித்துக் கொண்டிருப்பவர்களும் இந்த அரசாங்கத்தின்மீது பழி சுமத்திவிடுவார்கள் என்பதற்காக, இந்த நாட்டின் மாண்புமிகு சனாதிபதி அவர்கள் திட்டமிட்ட வகையில், அவருக்கென இருக்கின்ற வழமையான பாணியில், கொந்தளிப்பு நிலையில் இருந்த மக்களை மிக இலகுவாக அமைதிப்படுத்துவதற்காக வீடுகளை இழந்தவர்களுக்கு 50 இலட்சம் ரூபாயும் காணியை இழந்தவர்களுக்கு 50 இலட்சம் ரூபாயும் வீட்டுக் கூரையின் தகரம் பறந்தால் 10 இலட்சம் ரூபாயும் இழப்பீடாக வழங்கப்படுமென வாக்குறுதி அளித்தார். அது உண்மையோ, பொய்யோ தெரியாது. யார் எப்படி வேண்டுமானாலும் எடுத்துக் கொள்ளுங்கள்! மாண்புமிகு சனாதிபதி அவர்கள் கொடுத்த வாக்குறுதிகளை நம்பி, அவற்றிலே மயங்கி, மக்கள் மிகவும் அமைதியானார்கள். தங்களுடைய பிரதேசத்திலும் 'தித்வா' புயலால் பாதிப்பு ஏற்பட்டிருக்கக் கூடாதா? என மனம் வருந்தியவர்களும் இருக்கிறார்கள். இன்று நிலைமை தலைகீழாக மாறியிருக்கின்றது. அந்த எண்ணத்தைக் கொண்டவர்கள் இன்று தங்கள் மனநிலையில் மாற்றத்தை ஏற்படுத்தி யிருப்பார்கள். இவ்வாறான நிலைமைகள் ஏற்படும்போது, மக்களை ஆசுவாசப்படுத்துவதற்காக சனாதிபதி அவர்கள் பாராளுமன்றத்துக்கு வருகைதந்து தன்னுடைய கருத்தை விதைத்துச் செல்வதை வழமையான ஒரு விடயமாகவே நாங்கள் பார்க்கின்றோம். 'தித்வா' புயலால் பாதிக்கப்பட்ட மக்களுக்கான நிவாரணம் முழுமையாக வழங்கப்பட்டு இருக்கிறதா? என்றால், இல்லை! இங்கு பேசிய மலையகத்தைச் சார்ந்த உறுப்பினர்கள் உட்பட அதிகமான உறுப்பினர்கள் இந்தக் கருத்தைத்தான் கூறினார்கள்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)

பேச ஆரம்பித்த உடனேயே நேரம் முடிவடையப் போவதாகச் சொல்கிறீர்கள்.

பொதுமக்கள் பாதுகாப்பு என்கின்றபோது நாங்கள் பொலிஸ் நிலையங்கள் பற்றி சற்றுப் பேசலாமென நினைக்கின்றேன். சாதாரண ஒரு குற்றம் சம்பந்தமாக முறைப்பாட்டைப் பதிவுசெய்வதற்காகப் பொலிஸ் நிலையங்களுக்குச் செல்லுகின்ற எல்லோரையும் அங்கிருக்கின்ற அதிகாரிகள் குற்றவாளிகளாகப் பார்ப்பதை அவதானிக்க முடிகின்றது. இதனால் உண்மையிலேயே பாதிக்கப்பட்ட மக்களால் பொலிஸ் நிலையத்துக்குச் சென்று முறைப்பாடுகளைச் செய்ய முடியாத ஒரு சூழல் இருக்கின்றது. மேலும், பொலிஸ் நிலையங்களுக்கு முறைப்பாடுகளை வழங்குவதற்கு வருகின்ற நூற்றுக்கணக்கான மக்களை அங்கேயே வைத்து, ஒன்றன் பின் ஒன்றாக அவர்களது முறைப்பாடுகளைப் பதிவுசெய்கின்ற நிலைமையும் அங்கு இல்லை. இந்த நிலைமையில் மாற்றத்தைக் கொண்டுவர வேண்டும். ஏனெனில், இது பொது மக்களுடைய பாதுகாப்பு சம்பந்தமான விடயமாகும்.

இந்த நாட்டில் வாழுகின்ற முஸ்லிம் சமூகம் இம்மாதம் 28ஆம் திகதி ஹஜ்ஜுப் பெருநாளைக் கொண்டாட இருக்கின்றது. ஹஜ்ஜுப் பெருநாள் என்பது தியாகத் திருநாள் ஆகும். இப்ராஹீம் ( அலை) அவர்கள் இறைவனுடைய கட்டளையை ஏற்றுப் பல தியாகங்களைச் செய்தார்கள். அவற்றை ஞாபகமூட்டும் வகையிலே இந்த ஹஜ்ஜுப் பெருநாள் கொண்டாடப்படுகின்றது. ஹஜ்ஜுப் பெருநாளுடன் அடுத்துவரும் 3 நாட்களில் 'குர்பான்' கொடுப்பது எங்களுக்கு கடமையாக்கப்பட்டு இருக்கின்றது. அதை விரிவாக விபரித்துக் கூற முடியாது. 'குர்பான்' கொடுப்பதால் கிடைக்கப் பெறும் நன்மைகள் அதிகம். நாங்கள் ஆடு, மாடு, ஒட்டகங்களை அறுத்து, அவற்றை ஏழை எளிய மக்களுக்கு உணவுக்காகக் கொடுக்க வேண்டிய தேவை இருக்கின்றது. இந்த வருடம் ஹஜ்ஜுப் பெருநாளை அண்டிய தினத்திலே 'வெசாக்' பண்டிகையும் வருவதால், குர்பானுக்காக மிருகங்களை அறுத்துப் பலியிடும்போது இரு சமூகங்களுக்கு இடையில் பிரச்சினைகள் ஏற்பட வாய்ப்பிருக்கின்றது. இவ்வாறான பல சம்பவங்கள் கடந்த ஆட்சிக் காலத்தில் நடந்தேறி இருக்கின்றன.

எனவே, இந்த விடயத்தை அரசாங்கம் மிகவும் நேர்த்தியான முறையில் கையாள வேண்டுமெனக் கோருகின்றோம். ஹஜ்ஜுப் பெருநாளானது, துல்-ஹஜ் மாதம் பிறை 10இல்தான் வரும். 'வெசாக்' பண்டிகை பிறை 14இல் வரும் என்றுதான் நான் நினைக்கின்றேன். எனவே, இடைப்பட்ட நான்கு நாட்களுக்குள் - பிறை 10,11,12,13க்குள் - 'குர்பான்' விடயத்தைச் செய்வதற்குரிய சந்தர்ப்பத்தை இந்த நாட்டில் இருக்கின்ற முஸ்லிம்களுக்கு ஏற்படுத்தித் தருமாறு தயவாகக் கேட்டுக் கொள்கின்றேன்.

உதய கம்மன்பில அவர்கள் மீண்டும் இந்த நாட்டில் இனவாதத்தைத் தூண்டுவதை நாங்கள் பார்க்கின்றோம். சஹ்ரான் ஹாசிம் அவர்களால் பயிற்றுவிக்கப்பட்ட 300 இஸ்லாமிய தீவிரவாதிகள் தலதா மாளிகைக்கும் ஏனைய 'பன்சலை'களுக்கும் குண்டு வைப்பதற்காக வெளியில் வந்திருக்கிறார்கள் என்ற வதந்தியைப் பரப்பி வருகின்றார். இவருக்கு எதிராக இந்த அரசு என்ன சட்ட நடவடிக்கை எடுத்திருக்கிறது? கொழும்பில் நபர் ஒருவர் சாதாரண sticker ஒன்றை ஒட்டியதற்காக அவரை PTAஇன்கீழ் கைது செய்தீர்கள். இனரீதியான குழப்பங்களை மீண்டும் ஏற்படுத்துவதற்குத் திட்டங்களைத் தீட்டுகின்றவர்களுக்கு எதிராக இந்த அரசாங்கம் என்ன நடவடிக்கை எடுக்கப் போகின்றது? எனக் கேட்கின்றேன். ஞானசார தேரரைப் போன்று 'ராவய' அமைப்பும் முஸ்லிம்களுக்கு எதிராக பிரச்சினைகளை ஏற்படுத்தி வருவதை நாங்கள் பார்க்கின்றோம். இந்த அரசாங்கம் இனவாதம் இல்லாத அரசாங்கம் என்றும் இந்த நாட்டில் இருக்கின்ற சகல இனத்தவரும் அவரவர் மதத்தின்படி வாழ வேண்டும் என்றும் மாண்புமிகு சனாதிபதி அவர்கள் அடிக்கடி கூறுகின்றார். அதனை நிரூபிக்கும் வகையில், எதிர்வரும் புனித ஹஜ்ஜுப் பெருநாளைத் தொடர்ந்து செய்யவேண்டிய 'குர்பான்' விடயத்தைப் பிரச்சினைகள் ஏதுமின்றி மேற்கொள்வதற்கு உரிய நடவடிக்கை எடுக்க வேண்டுமென இச்சந்தர்ப்பத்தில் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නෛනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.17]

**ගරු නෛනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ හදිසි නීති විවාදය වෙලාවේ මම ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. කල්පිටිය අර්ධද්වීපයේ සීගාඩි පුහුණු කඳවුර පිහිටි ප්‍රදේශය විශාල අනතුරකට ලක් වෙලා තිබෙනවා. සීගාඩි පුහුණු කඳවුරේ ගුවන් හමුදාව පුහුණු කරන නිසා ධීවර ජනතාව, ගොවි ජනතාව, සංචාරකයින් ඇතුළු කිලෝමීටර් 10ක්, 15ක් ඇතුළත ඉන්න ජනතාව අවදානම් තත්ත්වයක ඉන්නවා. මම මීට කලිනුත් ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාට මේ කාරණය පැහැදිලි කරලා කිව්වා. මේ හදිසි නීති විවාදය අවස්ථාවේ, සුළි කුණාටුවෙන් සිදු වූ හානිය සම්බන්ධව පියවර ගැනීම කොච්චර වැදගත් විධියට ඔයගොල්ලන් කල්පනා කරනවා වාගේම, මේ ප්‍රදේශයේ ජනතාවගේ ආරක්ෂාව ගැනත් මම ප්‍රශ්නයක් මතු කරනවා. ඇත්තටම ඒ පුහුණු කඳවුර නිසා බෝම්බ වැදිලා ගොවිතැන් කරන ජනතාවට, මුහුදු යන ධීවර ජනතාවට ලොකු ප්‍රශ්නයක්, හානියක් ඇති වනවා. ඒ වාගේම touristsලා ආවාමත් ලොකු අනතුරකට මුහුණ දෙනවා. ඒ අයගේ ආරක්ෂාව තහවුරු කර දෙන ලෙස මේ හදිසි නීති විවාදය අවස්ථාවේ මම ඉල්ලා සිටිනවා.

මගේ සහෝදර එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමාත් මේ කාරණය ප්‍රකාශ කළා. අපි "කුර්බාන්" දෙන වෙලාවේදී අන්තවාදීන් යම් යම් ප්‍රශ්න මතු කරනවා. මේ අවස්ථාවේ මේ හදිසි නීති තත්ත්වයත් උදව් කරගෙන අපේ ප්‍රදේශයට, අපේ රටට සාමය ලබා දෙන්න කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. මම විශේෂයෙන් ගරු ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේකට මැදිහත් වෙන්න කියලා. කල්පිටිය ප්‍රදේශය විශාල ආර්ථික

[ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා]

ප්‍රදේශයක්. ඔබතුමා මේ කාරණය පිළිබඳව පරීක්ෂා කර බලා ඒ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සාධාරණය ඉටු කරලා දෙන්න කියලා ඉල්ලා සිටින අතර, මට අවස්ථාව ලබා දුන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.19]

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින හදිසි නීතිය දීර්ඝ කිරීම සම්බන්ධයෙන් වූ නීතිමය විවාදයට මා සම්බන්ධ වනවා. ඇයි, අපට නැවත නැවත හදිසි නීතිය දීර්ඝ කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ? ඔව්, අප දන්නවා, "දිට්වා" ආපදාවෙන් පසුව රටේ සාමාන්‍ය ක්‍රියාකාරී යන්ත්‍රණය අඩාළ වුණා; ජනතාවට ඉතා ඉක්මනින් සහන ලබා දීම අවශ්‍ය වුණා; ඒ වෙනුවෙන් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස්වරයෙක් පත් කරන්නට වුණා කියලා. මේ වන විට අපට "දිට්වා" ව්‍යසනය ඈත මතකයක් බවට පත් වෙමින් ගියත්, අපට පැහැදිලිවම කියන්න පුළුවන්, තවමත් "දිට්වා" ආපදාවට ලක් වෙච්ච අයට නොයෙකුත් සහන ලබා දෙනවා, නිවාස හදා දෙනවා, ඔවුන් අවතැන් කඳවුරුවලින්, සුරක්ෂා කඳවුරුවලින් ඉවත් කරන වැඩ කටයුතු කරමින් යනවා කියලා. මෙම තත්ත්වය යටතේ නැවත වටයකින් ඔවුන්ගේ ප්‍රශ්න විසඳන්න හදිසි නීතිය අත්‍යවශ්‍ය වනවා.

ඒ වාගේම අපි දන්නවා, මේ වන විට මැද පෙරදිග ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳව. අපි දන්නවා, මැද පෙරදිග ඇතිවුණු තත්ත්වය නිසා ලෝකයේ සැපයුම් ජාලය, විශේෂයෙන්ම ඉන්ධන සැපයුම කොපමණ අඩාළ වෙලා තිබෙනවාද කියලා. ඉන්ධන ලබා ගැනීමේදී රට තුළ හදිසි තත්ත්වයක් ඇති වුවහොත්, ඒවා බෙදා හැරීමට හෝ අවශ්‍ය කටයුතු කිරීමට මේ පනත, මේ හදිසි නීතිය දීර්ඝ කිරීම අත්‍යවශ්‍ය වනවා.

දැනටත් මැද පෙරදිග පවතින යුද්ධය අවසන්ද, නැද්ද කියන කාරණාවවත් නිසි ලෙස ස්ථිර කර ගන්නට බැහැ. ඉන්ධන මිල දවසින් දවස චලනය වෙනවා. ඇමෙරිකාවෙන් කරන ප්‍රකාශ නිසා හෝ ඉරානයෙන් කරන ප්‍රකාශ නිසා හෝ නැවත යුද ගිනි ඇවිළේය යන බිය නිසා කියන කරුණු මත මේ ඉන්ධන මිල එහා මෙහා වීම සිද්ධ වෙනවා. ඒ වාගේම, ඒක බලශක්ති අර්බුදයටත්, අපේ රටේ බලශක්ති මිල ගණන් - පෙට්‍රල් මිල ආදිය - ඉහළ යෑමටත්, ගෑස් මිල ඉහළ යෑමටත් කෙළින්ම බලපානවා. මෙවන් තත්ත්වයක් තුළදී යම් හදිසි තත්ත්වයක් ඇති වුවහොත් එය කළමනාකරණය කර ගැනීම සඳහා මේ පනත අවශ්‍ය වෙනවා.

ඒ වාගේම, අපට පැහැදිලිව කියන්න පුළුවන්, මෙච්චර ගැටලු, ආපදා රාශියක් ආවත් අපේ රජය විසින් ජනතාවට අවශ්‍ය සහන අවශ්‍ය වෙලාවට ලබා දෙන්න කටයුතු කළ බව. ඉන්ධන අර්බුදය පවතිද්දී යම් රටවලට තමන්ගේ ඉන්ධන අර්බුදය කළමනාකරණය කර ගන්නට බැරිව පෙට්‍රල් ෂෙඩ් වහනකොට, ගෑස් පෝලිම් හැදෙනකොට අපේ රටේ ඒ දේවල් ක්‍රමවත්ව කරන්න අපට හැකියාව ලැබුණේ අපේ ආණ්ඩුවේ දැක්මත්, අපි මුදල් ඉතුරු කරගෙන තිබීමත්, මෙම හදිසි අවස්ථාවේ රෙගුලාසිත් නිසි ලෙස භාවිත කිරීමත් නිසායි.

මම හිතන විදියට, අදත් ඡන්දයක් තිබෙව්. මොකද, ප්‍රතිපත්තිමය වශයෙන් හදිසි නීතියට විරුද්ධ වන කොටසක් ඉන්නවා. ඒක ඔවුන්ගේ අයිතිය. නමුත්, අපේ රටේ කැත ඉතිහාසයක් තිබුණා, කලින් ආණ්ඩුවල. ඒක තමයි, හදිසි නීතිය මර්දනකාරී දේවල් සඳහා භාවිත කිරීම; ජනතාව මර්දනය කරන්න, අදහස් දැක්වීම මර්දනය කරන්න හදිසි නීතිය භාවිත කිරීම. මම ඔවුන්ට අභියෝග කරනවා. අපේ රජය විසින් පසුගිය මාස 3ක කාලය තුළ හදිසි අවස්ථා තත්ත්වය ප්‍රකාශ කර තිබුණාට එය භාවිත කළේ රටේ ජනතාවට සහන දෙන්නත්, උදවු සපයන්නත් විතරයි. හදිසි නීතිය භාවිත කර අපි කිසි පුද්ගලයෙකු අත්අඩංගුවට ගත්තේ නැහැ; කිසි පුද්ගලයෙකු මර්දනය කරන්න මේ හදිසි නීතිය යොදා ගත්තේත් නැහැ. ඒ නිසා මෙය අපි කියන ආකාරයට බටර් ගාන පිහියක් වාගෙයි. බටර් ගාන පිහියකින් හොඳ දේ කරන්නත් පුළුවන්; නරක දේ කරන්නත් පුළුවන්. බටර් ගාන පිහියෙන් පාන්වල බටර් ගාන්නත් පුළුවන්; කාට හෝ ඇනලා මරන්නත් පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නීතිය කියන්නේ ඒ වාගේ දෙයක්. ඒක රඳා පවතින්නේ ඒ පිහිය අතේ තිබෙන කෙනාගේ චේතනාව මත. අපේ රජයේ චේතනාව සහ අරමුණු අනුව මෙම හදිසි අවස්ථා තත්ත්වය පාලනය කිරීමේදී එයින් සිදු වන්නේ ජනතාවට යහපතක්, සුබසෙතක් පමණක් වන අතර, එම හේතුව නිසා මෙම හදිසි නීතිය දීර්ඝ කිරීමෙන් කිසිදු ආකාරයක මූලික හිමිකම් උල්ලංඝනය වීමක් හෝ ජනතාවගේ භාෂණයට ඇති අයිතියට හානි කිරීමක් සිද්ධ වෙන්නේ නැහැ.

මෑතකදී අන්තර්ජාතික දර්ශකයක් නිකුත් කර තිබෙනවා, මාධ්‍ය නිදහස සම්බන්ධයෙන්. අපි ආණ්ඩුව භාර ගත්තාට පසුව ඒ දර්ශකයේ 134වන ස්ථානයට අප ඉහළ ගොස් තිබෙනවා. ඒකෙන් පෙන්වන්නේ මොකක්ද? අපේ තිබෙන මාධ්‍ය නිදහස. මේ වනවිටත් අපි දන්නවා, විපක්ෂයේ කඳවුරුවලට ප්‍රතිපත්තියක් නැහැ, කියා ගන්න සටන් පාඨයක් නැහැ, රැස් කරන්න සෙනඟක් නැහැ කියන එක. ඒගොල්ලන්ට තිබෙන එකම දේ තමයි අපි කිව්වා යැයි සඳහන් කරමින් නොයෙකුත් විකෘති කරුණු සමාජගත කිරීම. මුහුණුපොත අරගෙන බැලුවත් දැන් මිනිස්සු ඒ දකින දේවල් විශ්වාස කරන්නේත් නැහැ. මොකද, එපමණකට බොරු සහ විකෘති කීම තමයි විපක්ෂයේ සමහර අයවලුන්ගේ දේශපාලනය වෙලා තිබෙන්නේ. ඒ ගැන කියන්නත් කනගාටුයි. ඔය කියන තරමම අපි නරක නම්, වැරදි නම්, ඒගොල්ලන්ගේ මැයි දින රැලියේදී නායකයා කථා කරනකොට සෙනඟ නැඟිටලා යන්නත්, අපේ මැයි රැලි 21හි සෙනඟ පිරෙන්නත් හේතුවක් තිබෙන්නට ඕනෑ. ඒ හේතුව තමයි, ඔවුන් අසත්‍ය කීම. නමුත්, අපි ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් මේ කටයුතු කරගෙන යනවා. ඉතින්, එහෙම ඉවසීමෙන් කටයුතු කරන අප අතින් මේ අවස්ථාවේදී නීතිය වැරදි ලෙස භාවිත වීමක් සිද්ධ වෙන්නේ නැහැ.

අපි සියලුදෙනාටම පැහැදිලිව කියන්න ඕනෑ, අප විසින් ජනතාවට දුන් පොරොන්දු ඉටු කරමින් යන බව. මේ වනවිට ඔවුන් කථාවක් ගොඩනඟමින් යනවා. ඒ, මොකක්ද? මේ ආණ්ඩුව අධිකරණයේ ස්වාධීනත්වයට අත පොවනවාය කියලා. එහෙම කියන කට්ටියට මතක නැහැ, මේ රටේ අග්‍ර විනිශ්චයකාරයන්ට ගල් ගහලා, එළවලා, කිරි බත් කාපු පාලකයෝ හිටපු බව; නඩුකාරයන්ගේ ගෙවල්වලට ගල් ගහපු දේශපාලනයක් තිබුණු කාලයක් මේ රටේ පැවැති බව. මම අහනවා, මොන පදනමින්ද ඒ කථාව කියන්නේ කියලා. එහෙම කියන්න කිසිදු පදනමක් නැහැ. ඔවුන්ට තිබෙන ප්‍රශ්නය සරලයි.

අපි ජනතාවට පොරොන්දුවක් දුන්නා, අප රජයට ආවාම වැරදි කරපු අය, දූෂිත අය, වංචනිකයන් අධිකරණය හමුවට පමුණුවනවාය කියලා. බලයට පත් වෙලා අවුරුදු එකහමාරක් ගත වනවිට ඒ තිබුණු ක්‍රමය හදාගෙන, විමර්ශන කරලා අපට අධිකරණවල නඩු පවරන්න හැකියාව ලැබිලා තිබෙනවා. අපි අධිකරණවල නඩු පැවරුවාට පස්සේ ඒ නඩුවලට තීන්දු දෙන එක ස්වාධීන අධිකරණයේ වැඩක්. ඒ සම්බන්ධයෙන් අධිකරණ ඇමතිවරයාටවත් කථා කරන්න බැහැ; ඇඟිලි ගහන්න බැහැ. අපි කාටවත් ඒ සම්බන්ධයෙන් බලපෑම් කරන්න බැහැ. නමුත් ඔවුන් කියනවා, අපේ කරීකයන් නඩු ගැන කථා කරනවා කියලා. ඔව්, අපි නඩු ගැන කථා කරන්න ඕනෑ. මොකද, මම අධිකරණ ඇමති වෙන්න කලින් මේ රටේ පුරවැසියෙක්; දූෂණයට විරුද්ධ පුරවැසියෙක්. මට විශාල වුවමනාවක් තිබුණා, මේ රටේ වැරදි කරපු අය, දූෂණ කටයුතු කරපු අය අධිකරණය ඉදිරියට පමුණුවන්න. තීන්දු දෙන්න නොවෙයි, තීන්දු දෙන්නේ උසාවියෙන්. ඒකට අපිට කරන්න දෙයක් නැහැ. ඒ ගැන අපි දන්නේත් නැහැ. අපිට ඒකට මැදිහත් වෙන්නත් බැහැ. අපි වාගේ මිනිස්සු අනිවාර්යයෙන්ම ඔය නඩුවල විස්තර මතක තියාගෙන ඉන්න ඕනෑ. නඩුව කැඳවන දවස මතක තිබෙන්න ඕනෑ. මොකද, ඒ සම්බන්ධයෙන් උනන්දුව තිබුණේ අපිට. ඒ වාගේම, අපේ පක්ෂයේ කෙනෙක් කියපු කිසිදු කරුණක් අධිකරණයේ තීන්දු සම්බන්ධයෙන් අදාළ නැහැ. පැහැදිලිවම කියන්නේ මේකයි. නඩු අංකය මොකක්ද, ඊළඟ දිනය කවද්ද කියන මේවා එකක්වත් රහස් තොරතුරු නොවෙයි. මේවා පොදු දැනුමට අදාළ කාරණා. ඒ පොදු දැනුමට අදාළ කාරණා හොයන්න උනන්දු නොවී හිටියා නම් තමයි මිනිස්සු අපිට බණින්න ඕනෑ. ඇයි, ඒ? රටක් භාර දුන්නාම, "ඔයගොල්ලන් මොකක්ද කරන්නේ?" කියලා ජනතාව අපෙන් අහවි. අපි දන්නේ නැහැ, මේ වනවිට නඩුවේ තීන්දුව මොකක්ද කියලා. ඒ තීන්දුව අධිකරණයෙන් දෙන්නේ. නමුත්, හොරා, වංචනිකයා දන්නවා, තමන් ඒ වරද කළාද, නැද්ද කියලා. එතකොට නඩුව දාපු ගමන්ම භය වෙලා මර ළතෝනි දීම අපේ වරදක් නොවෙයි. මොකද, තීන්දුව ලියලා නැහැ.

ඊයේ පෙරේදා ගරු මන්ත්‍රීවරයෙක් පාර්ලිමේන්තුවේදී කියනවා, "දැන්ම නියෝගය දීලා ඉවරයි නේ. ඒ නිසා මම නීතිඥයෝ ගන්නේත් නැහැ" කියලා. ඒ කියපු මහත්මයාගේ නඩුව තවම ආරම්භ කරලාත් නැහැ. හැබැයි, එතුමා කරපුවා එතුමාම දන්නවා ඇති නේ. ඒකයි මම මේ කියන්න උත්සාහ කරන්නේ. අපි නියෝග දෙන්න මැදිහත් වෙලාත් නැහැ; රටේ නීතියේ විධානයට මැදිහත්වීමක් කරලාත් නැහැ. නමුත්, ඒ, ඒ දේවල් කරපු අයට දැන් භයවීමක් තිබෙනවා. ඒකට ජනතාව අපට දොස් කියන්නේ නැහැ. ඒක නිසා තමයි මම කියන්නේ, ඔබතුමන්ලා මවන බිල්ලන් යම් දිනෙක ඔබතුමන්ලා පසුපසම එනවා කියලා. මොකද, අපි නීතියේ විධානය, ආධිපත්‍යය නිසි ලෙස ස්ථාපනය කරනවා කියලා ආපු ආණ්ඩුවක්. එතැනින් පරිබාහිරව අපි කටයුතු කරන්නේ නැහැ. අපි සුදු වෑන් දාලා මිනිස්සු ඔසවාගෙන යන්නේ නැහැ. අපට අකමැති ප්‍රවෘත්ති විකාශනය කරන television channelsවලට ගිනි තියන්න යන්නේ නැහැ; තහනම් කරන්න යන්නේ නැහැ. කොටින්ම කියනවා නම්, ඔය ගහන මඩවලටත් - fake postsවලටත් - අපි කියන්නේ මේකයි. අපි දේශපාලකයෝ වශයෙන් අනෙක් මිනිස්සුන්ට වඩා විවේචනවලට විවෘත වෙන්න ඕනෑ. අපට ඉවසීමේ හැකියාව තිබෙන්නට ඕනෑ. හැබැයි මතක තියා ගන්න, ඉවසීම කියන්නේ නොහැකියාවම නොවෙයි කියන එක. ඒ, අපි පෙන්වන්නා වූ ගුණාංග. මේ ගුණාංගයටත් යම් යම් සීමා තිබෙනවා. කෙසේ වෙතත්, අපි කියන්නේ මේකයි. නීතියේ විධානය, ආධිපත්‍යය රකින්න ආපු ආණ්ඩුවකට නීතියේ විධානය, ආධිපත්‍යය රකින්නේ නැහැ, නඩුවලට බලපෑම් කරනවා කියලා කියන්නේම මොකක් නිසාද? තමන් භයයි, තමන් කරපු වරද හෝ තමන්ගේ හිතවතෙක් කරපු වරදක් සම්බන්ධයෙන් ඉස්සර වාගේ ජනාධිපතිට කථා කරලා හෝ වෙන විධියකින් මුකුත් කරන්න බැහැ කියලා දන්නා නිසා. දැන් ජනාධිපති සමාව ගන්න බැහැ. මේ රටේ දැන් හැමෝටම නීතිය එක ලෙස ක්‍රියාත්මක වන තත්ත්වයක් තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවන් තත්ත්වයක් යටතේ අවසාන වශයෙන් මම කියනවා, ජනතාවට සේවය සැපයීම සඳහා මෙම හදිසි අවස්ථා තත්ත්වය දීර්ඝ කළ යුතුයි කියලා. කුමන ආකාරයකින් බැලුවත්, අපේ ආණ්ඩුව අද වනවිට මේ හදිසි අවස්ථා තත්ත්වය උපයෝගී කරගෙන ජනතාව මර්දනය කිරීමක් කරලා නැහැ. ඒ වාගේම, අපි මේ යන ගමනේදී අපට කොච්චර මඩ ප්‍රහාර එල්ල කළත්, කොච්චර කරුණු විකෘති කරලා කිව්වත්, ඉවසීමෙන් සහ සංයමයකින් යුතුව, අලුත් දේශපාලන සංස්කෘතියක් ගොඩ නඟමින් අප ඉදිරියට යනවා. මේ අවුරුදු 5 අවසන් වෙන්න කලින් අපේ මහන්සියේ ප්‍රතිඵල පෙනෙන්න ගන්නවා. අන්න එදාට තේරේවි, අපි ගිය මඟ නිවැරදි බව. එපමණයි මම කියන්නේ.

මට අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කිංස් නෙල්සන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

**ගරු කිංස් නෙල්සන් මහතා**
(மாண்புமிகு கிங்ஸ் நெல்சன்)
(The Hon. Kins Nelson)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද කථා කරන්නේ ඉතාම වැදගත් මාතෘකාවක් පිළිබඳවයි. රටේ ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව පිළිබඳව කථා කරන මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. විශේෂයෙන්ම මේ ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව කියන විෂයය යටතේ වැදගත් කාරණා ගණනාවක් තිබෙනවා. ආර්ථික ආරක්ෂාව, බලශක්ති ආරක්ෂාව, පරිසර ආරක්ෂාව, සෞඛ්‍ය ආරක්ෂාව, ආහාර සුරක්ෂිතතාව ඇතුළු සෑම එකක්ම අයිති වෙන්නේ මේ මහජන ආරක්ෂාව කියන විෂය යටතටයි.

ඉතින් අද අපි කථා කරන මාතෘකාව යටතේ රටේ ආර්ථික ආරක්ෂාව දිහා බැලුවාම, අපට ආර්ථික ආරක්ෂාව ගැන විශ්වාසයක් තිබෙනවාද කියලා තමයි අහන්න වෙන්නේ. විපක්ෂයේ මන්ත්‍රීවරු මේවා පෙන්වා දෙනකොට ආණ්ඩු පක්ෂය කියන්නේ අසත්‍ය චෝදනා එල්ල කරනවා කියලායි. මේ මාතෘකා කවුද අපට හදලා දෙන්නේ? මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ අපි කිසිම කෙනෙකුට බැහැ, පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාදවලට මුවා වෙලා බොරු කියන්න. ඒක අපි හැමෝම දන්නවා. බොරු කියන උදවියත් ඇති. හැබැයි බොරු කියන්නේ නැති අයත් මෙතැන ඉන්නවා. එතකොට ආණ්ඩුවෙන් මේ මාතෘකා හදලා දෙනකොට, ඒක පෙන්වා දෙන එක වැරැද්දක්ද? අපේ රටේ මහ බැංකුවේ ඩොලර් මිලියන 2.5ක් කවුරු හරි කෙනෙක් විසින් හොරකම් කරලා හරි මොනවා හරි දෙයක් වෙලා හරි දැන් විමර්ශනයක් වෙනවා නේ. එතකොට ඒක පෙන්වලා දෙන එක වැරැද්දක්ද? නිලධාරින් හතරදෙනෙක් එතැනදී අයින් කරනවා, සැකයි කියලා. එතකොට, ඒ නිලධාරින් හතරදෙනාට කවුද උපදෙස් දුන්නේ? පෞද්ගලික ආයතනයක් ගත්තොත්, ඒ පෞද්ගලික ආයතනයේ Director කෙනෙක් ඉන්නවා; Chairman

[ගරු කිංස් නෙල්සන් මහතා]

කෙනෙක් ඉන්නවා. ඊට පහළ ඉන්න peon කෙනෙකුට හරි අනෙක් සේවකයෙකුට හරි decision එකක් ගන්න බැහැ. ඉහළින් order එකක් එන්න ඕනෑ. එතකොට, මෙතැනදී පහළ ඉඳලා උඩට යනවාද, උඩ ඉඳලා පහළට යනවාද කියන එක මට තේරෙන්නේ නැහැ. ඒවා පෙන්වා දෙනකොට ඒවාට හරි උත්තරයක් දෙන්නේත් නැහැ. දැන් අපටත් එපා වෙලා තිබෙන්නේ, දිගින් දිගටම - අදට දවස් තුනයි - එකම මාතෘකාව ගැන අපි කථා කරනවා. මේ කිසිම කෙනෙක් මොකක්ද මේ වෙලා තිබෙන්නේ, මොකක්ද මේකට ගන්න යන පියවර කියන එක ගැන පැහැදිලි උත්තරයක් දෙන්නේ නැහැ.

